# සමාජ විග්‍රහ

## Samaja Viggraha

පළමුවන කාණ්ඩය - අටවන වෙළුම



සමාජ විද්‍යා අධ්‍යයනාංශය

කොළඹ විශ්වවිද්‍යාලය

# සමාජ විග්‍රහ

2022

**(REFEREED JOURNAL - විමර්ශිත සංග්‍රහය)**

**ISSN 2756-925X (e-ISSN)**

**ISSN 2362-0978 (Print ISSN)**

**පළමුවන කාණ්ඩය අටවන වෙළුම**

ප්‍රධාන සංස්කාරක

**ප්‍රේමකුමාර ද සිල්වා**

සහය සංස්කාරක

**ජගත් බණ්ඩාර පතිරගේ**
**හිරුනි කළුආරච්චි**

සංස්කාරක උපදේශක මණ්ඩලය

**එස්.ටී.හෙට්ටිගේ (සම්මානිත මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය**

**කාලිංග ටියුඩර් සිල්වා (සම්මානිත මහාචාර්ය) පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

**කේ.කරුණාතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) කැලණිය විශ්වවිද්‍යාලය**

**සරත් අමරසිංහ (සම්මානිත මහාචාර්ය) රුහුණ විශ්වවිද්‍යාලය**

**යසාංජලී ජයතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**චන්ද්‍රසිරි නිරිඇල්ල (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය**

**සුභාංගි හේරත් (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය**

**නිශාර ප්‍රනාන්දු (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය**

**ෆර්සානා හනීෆා (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය**

**ඉරේෂා ලක්ෂ්මන් (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය**

භාෂා සංස්කරණය
**නාලක ජයසේන**

පිරිසැකසුම් නිර්මාණය
**ප්‍රභාත් ගලගමගේ**
**හිරුනි කළුආරච්චි**

ප්‍රකාශනය
**සමාජ විද්‍යා අධ්‍යයනාංශය**
**කොළඹ විශ්වවිද්‍යාලය**
දුරකථන/ෆැක්ස් 011-2500452

# ප්‍රධාන සංස්කාරක සටහන

සමාජ විග්‍රහ ශාස්ත්‍රීය සඟරාවේ අටවැනි වෙළුම මාර්ගගත ව ඉදිරිපත් කිරීමට හැකිවීම පිළිබඳව අප සතුටු වන්නෙමු. ශ්‍රී ලාංකේය සමාජය තියුණු අභියෝගයන්ට මුහුණ දෙමින් සිටින සන්දර්භයක් තුළ සමාජ පර්යේෂණ මත පිහිටුවා රචනා කරන ලද ලිපි හයකින් යුත් මෙවර කලාපය නිකුත් කිරීමට සහයෝගය දුන් සැමට කෘතඥ වෙමු.

විශේෂයෙන්ම විවිධ වෘත්තීය ශ්‍රේණි වලට අයත් කාන්තාවන් මුහුණ දෙනු ලබන ගැටළු සාකච්ඡා කරනු ලබන ලිපි තුනක් ඊට ඇතුළත්ය. යුධ හමුදා සෙබළියන්, කාන්තා කළමණාකරුවන් සහ විශ්‍රාමික විශ්ව විද්‍යාල ආචාර්යවරියන් කේන්ද්‍ර කරගනිමින් මෙම රචනා ලියවී ඇත. මීට අමතරව ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනය තුළින් "විචාරශීලී චින්තකයින්" බිහි කිරීමට ඇති ශක්‍යතාවය පිළිබඳ විවේචනාත්මක ව විමසා බලන ලිපි දෙකක් ද අඩංගු වී ඇත. තරුණ ප්‍රජාව තුළ ලිංගික දර්ශන පරිභෝජනයට ඇති නැමියාව පිළිබඳ සමාජ විද්‍යාත්මක කියවීමක් මාර්ගගත සමීක්ෂණයක් හරහා රැස්කරගත් පර්යේෂණ තොරතුරු මත සම්පාදනය කොට ඇත.

සමාජ විද්‍යාවේ වත්මන් පර්යේෂණ ක්‍රමවේදයන්හි ව්‍යුහාත්මක වෙනසක් සිදුවෙමින් පවතින බව නොරහසකි. ක්ෂේත්‍ර පර්යේෂණ, ලේඛනාගාර පර්යේෂණ වල සිට ඩිජිටල් පර්යේෂණ දක්වා පුළුල් ක්ෂේත්‍රයක් මත සමාජ විද්‍යාත්මක පර්යේෂණ පදනම් වී ඇත. මෙම ක්‍රමවේදාත්මක වෙනස පිළිබඳ අප පාඨකයා දැනුවත් කිරීම සඳහා දහවන වෙළුම "ඩිජිටල් පර්යේෂණ" යනුවෙන් විශේෂ කලාපයක් ලෙස පළ කිරීමට බලාපොරොත්තු වෙමු.

අප විසින් පළ කරන ලද සෙසු වෙළුම් මෙන්ම මෙවර වෙළුමින්ද බලාපොරොත්තු වන්නේ සිංහල භාෂා සමාජවිද්‍යා ඥානය සම්පාදනය සඳහා යම් දායකත්වයක් සැපයීමයි. "සමාජ විග්‍රහ" පිළිබඳ ඔබගේ අදහස් උදහස් අප වෙත එවන්නේ නම් කෘතඥ වෙමි.

**ප්‍රධාන සංස්කාරක**

සමාජ විද්‍යා අධ්‍යයනාංශය,
කොළඹ විශ්වවිද්‍යාලය,
කොළඹ-03.
දුරකථනය/ෆැක්ස්: 011-2500452
විද්‍යුත් තැපැල: samajaviggraha@soc.cmb.ac.lk
වෙබ් අඩවිය: cmb.ac.lk/arts/socio/journal.htm

## ලිපි විමර්ශක මණ්ඩලය

- සම්මානිත මහාචාර්ය සිරි හෙට්ටිගේ
  සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය
- මහාචාර්ය ෆර්සානා හනීෆා
  සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය
- මහාචාර්ය ඉරේෂා ලක්ෂ්මන්
  සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය
- ආචාර්ය ජගත් බණ්ඩාර පතිරගේ
  සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය
- ආචාර්ය ගයාත්‍රී විජේසුන්දර
  සමාජ විද්‍යා දෙපාර්තුමේන්තුව, රුහුණ විශ්වවිද්‍යාලය
- ආචාර්ය හේමන්ත කුමාර
  සමාජ විද්‍යා දෙපාර්තුමේන්තුව, රුහුණ විශ්වවිද්‍යාලය

## පටුන

**අටවන වෙළුම** **පිටු අංකය**


1. තරුණ ප්‍රජාව අතර ලිංගික දර්ශන පරිභෝජනය පිළිබඳ අධ්‍යයනයක්
   **සුසිත් නිමන්ත සිරිවර්ධන** 06

2. යුධ හමුද වෘත්තීය ක්ෂේත්‍රය තුළ සෙබළියකට ඇතිවන අභියෝග පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් 26
   **හිරුනි කළුආරච්චි**

3. වැඩ-ජීවන සමතුලිතතාවය, අභියෝග සහ උපායමාර්ග: ඇගළුම් කර්මාන්තශාලාවක කාන්තා කළමනාකරුවන් පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් 42
   **ජේ. එම්. ආර්. ඩී. ජයකොඩි**

4. ශ්‍රී ලාංකීය රජයේ පාසල් විචාරශීලී චින්තකයින් බිහි කිරීමට සමත් ද?
   **ජේ. එම්. ආර්. ඩී. ජයකොඩි, එස්. ඒ. එස්. කේ. පෙරේරා** 62

5. විශ්‍රාමිකල වියපත්භාවීය සංසිද්ධියට මුහුණපාන කාන්තාවන්ගේ සමාජ ආර්ථික ගැටළු (විශ්‍රාමික විශ්වවිද්‍යාල ආචාර්යවරියන් ආශ්‍රයෙන් සිදුකරනු ලබන අධ්‍යනයක්) 77
   **ඒ.ආර්.එම්.ඩී.කේ අබේසිංහ**

6. ශ්‍රී ලාංකීය රාජ්‍ය පාසල් අධ්‍යාපනය සහ ක්‍රියාකාරිත්වය මඟින් විචාරශීලි චින්තකයින් බිහි කිරීමේ ශක්‍යතාවය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් 91
   **කේ. කේ. එච් පවිත්‍රා**

# සමාජ විග්‍රහ

**විමර්ශිත සංග්‍රහය**

**REFEREED JOURNAL**

**පළමු කාණ්ඩය, අටවන වෙළුම - 2022**

**ISSN 2362-0978 (print ISSN)**

**ISSN 2756-925X (e-ISSN)**

ලිපි අංක 01

## තරුණ ප්‍රජාව අතර ලිංගික දර්ශන පරිභෝජනය පිළිබඳ අධ්‍යයනය

[1]සුසිත් නිමන්ත සිරිවර්ධන
https://orcid.org/0000-0003-1585-0879

***ප්‍රධාන සංස්කාරක***

ප්‍රේමකුමාර ද සිල්වා

***සහය සංස්කාරක***

ජගත් බණ්ඩාර පතිරගේ
හිරුනි කළුආරච්චි

***සංස්කාරක උපදේශක මණ්ඩලය***

එස්.ටී.හෙට්ටිගේ (සම්මානිත මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
කාලිංග ටියුඩර් සිල්වා (සම්මානිත මහාචාර්ය) පේරාදෙණිය විශ්වවිද්‍යාලය
කේ.කරුණාතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) කැලණිය විශ්වවිද්‍යාලය
සරත් අමරසිංහ (සම්මානිත මහාචාර්ය) රුහුණු විශ්වවිද්‍යාලය
යසාංජලී ජයතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
චන්ද්‍රසිරි නිරිඇල්ල (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
සුභාංගි හේරත් (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
නිශාර ප්‍රනාන්දු (ආචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
ෆර්සානා හනීෆා (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
ඉරේෂා ලක්ෂ්මන්(මහාචාර්ය)කොළඹ විශ්වවිද්‍යාලය

***භාෂා සංස්කරණය***

නාලක ජයසේන

***පරිසැලසුම් නිර්මාණය***

ප්‍රභාත් ගලගමගේ
හිරුනි කළුආරච්චි

[1] බී.ඒ. (කොළඹ), සහකාර කථිකාචාර්ය, සමාජීය විද්‍යා අධ්‍යනංශය, රජරට විශ්ව විද්‍යාලය

# සමාජ විග්‍රහ

**විමර්ශිත සංග්‍රහය**
**REFEREED JOURNAL**
**පළමු කාණ්ඩය, අටවන වෙළුම - 2022**
**ISSN 2756-925X (e-ISSN)**
**ISSN 2362-0978 (print ISSN)**

ISSN 2756-925X 9 772756 925005 ISSN 0236-2090 9 770236 209782

This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License.

දැනුම වෙත ප්‍රවේශ වීමේ සීමා අතික්‍රමණය සඳහා ලොව බොහෝ ශාස්ත්‍රාලයීය ප්‍රකාශන සම්ප්‍රදායික ප්‍රකාශන අයිතිය පිළිබඳ නෛතික ආකෘතියෙන් විකල්ප ආකෘතියක් වන පොදු නිර්මාණ බලපත්‍ර ක්‍රමයට සංක්‍රමණය වී / වෙමින් ඇත. මේ අනුව විවාරාත්මක දැනුමට විවෘත ප්‍රවේශයක් ලබා දීමේ අරමුණින් "සමාජ විග්‍රහ" විමර්ශිත සංග්‍රහය, නිකුත් වන්නේ ඉහත පොදු නිර්මාණ බලපත්‍රය යටතේය.

## ලිපි විමර්ශක මණ්ඩලය

*සම්මානිත මහාචාර්ය සිරි හෙට්ටිගේ, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*මහාචාර්ය ෆර්සානා හනීෆා, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*මහාචාර්ය ඉරේෂා ලක්ෂ්මන්, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*ආචාර්ය ජගත් බණ්ඩාර පතිරගේ, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*ආචාර්ය ගයාත්‍රී විජේසුන්දර, සමාජ විද්‍යා දෙපාර්තුමේන්තුව, රුහුණ විශ්වවිද්‍යාලය*

*ආචාර්ය හේමන්ත කුමාර, සමාජ විද්‍යා දෙපාර්තුමේන්තුව, රුහුණ විශ්වවිද්‍යාලය*

## ප්‍රකාශනය

සමාජ විද්‍යා අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ-03
දුරකථනය/ෆැක්ස්: 011-2500452
විද්‍යුත් තැපැල: samajaviggraha@soc.cmb.ac.lk
වෙබ් අඩවිය: https://arts.cmb.ac.lk/sociology/

**සාරසංක්ෂේපය**

මිනිසුන් ලිංගික දර්ශන පරිභෝජනය කරන ආකාරය පිළිබඳ සංකීර්ණ අවබෝධයක් වර්ධනය කර ගැනීමට සමාජවිද්‍යාව සහ සමාජීය විද්‍යාවන් කේන්ද්‍රකරගත් පර්යේෂණ අවශ්‍ය වේ. මෙම අධ්‍යයනය ඔස්සේ ලිංගික දර්ශන පරිභෝජනය සඳහා බලපවත්වන සමාජ සහ සංස්කෘතික සාධක හඳුනාගැනීම ප්‍රධාන පර්යේෂණ අරමුණ වශයෙන් ගොඩනගන ලද අතර ලිංගික දර්ශන හරහා ලැබෙන අධ්‍යාපනික ප්‍රතිලාභ හඳුනාගැනීම සහ තරුණ ප්‍රජාවේ ලිංගික ආශාවන්, අනන්‍යතා සහ නව ලිංගික ක්‍රම ඉගෙනීම සම්බන්ධව ලිංගික දර්ශන පරිභෝජනයෙන් ලැබෙන දායකත්වය හඳුනාගැනීම සෙසු පර්යේෂණ අරමුණු වශයෙන් අධ්‍යයනය කරන ලදී. පර්යේෂණ සීමාවන් අතික්‍රමණය කිරීම සඳහා විද්‍යුත් ලිපිනය දත්තයක් වශයෙන් ගබඩා නොවන ආකාරයෙන් Google Forms ආකෘතිය ගොඩනගන ලද අතර, පූර්ව කොන්දේසි වශයෙන් ගොඩනගන ලද වයස අවුරුදු 19ත් 29ත් අතර, අවිවාහක යන පදනම්වලට යටත්ව තරුණයන් 25ක් සහ තරුණියන් 25ක් දත්ත දායකයන් වශයෙන් යොදාගනිමින් නියැදිය 50 දෙනෙකුගෙන් යුක්තව පර්යේෂණය සඳහා යොදාගන්නා ලදී. මෙම ගුණාත්මක පර්යේෂණය සමීක්ෂණ ප්‍රවේශය ඔස්සේ සිදුකරනු ලද අතර පර්යේෂණ දත්ත තේමාත්මක විශ්ලේෂණය ඔස්සේ විශ්ලේෂණය කරන ලදී. ලිංගික දර්ශන පරිභෝජනය අධ්‍යාපන කාරකයක් වශයෙන්, දැනුම් කාරකයක් වශයෙන්, විනෝදාස්වාදය සඳහා වන ප්‍රභවයක් වශයෙන් සහ ලිංගික දිශානතීන් සම්බන්ධ මෙහෙයුම් කාරකයක් වශයෙන් ලිංගික දර්ශන කෘත්‍යාත්මක වන බව අධ්‍යයනය ඔස්සේ අනාවරණය විය. එමෙන්ම ලිංගිකත්වය සහ ලිංගික චර්යාවන් සම්බන්ධ පරිකල්පනයන් නිවැරදි කිරීම, ලිංගික අත්දැකීමකට පෙර අවශ්‍ය කරනු ලබන ඇතැම් සාධනීය තත්වයන් සම්බන්ධව අනියම් අධ්‍යාපනයක් ලැබීම, ආතතිය දුරලීම, වැරදි ලිංගික චර්යාවන්ගෙන් සහ අපාගාමී චර්යාවන්ගෙන් ඉවත් වීම සහ අත්‍යවශ්‍ය ලිංගික දැනුම සම්පාදනය ලිංගික දර්ශන පරිභෝජනයේ සාධනීය තත්වයන් වශයෙන් හඳුනාගන්නා ලදී. ලිංගික දර්ශන පරිභෝජනය වර්තමානය වන විට සාමාන්‍යකරණය වූ චර්යාවක් බවට පත්වීම හරහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් සමාජ ගොඩනැගිම්වලින් කාන්තාවට කිසියම් නිදහස් අවකාශයක් ගොදනාගන බව පැහැදිලි විය. පවුල තුලින්, අධ්‍යාපන සංස්ථාව තුලින් හෝ ජනමාධ්‍ය හරහා සිදුනොවන කාර්යයක් ලිංගික දර්ශන පරිභෝජනය හරහා සිදුකරනු ලබන බවද, ලිංගික දර්ශන පරිභෝජනය සමාජ සංස්කෘතික සහ ආගමික හැඳින්වීම්වලින් සහ නිර්වචනයන්ගෙන් ගොඩනැගෙන සමාජ අපගාමී චර්යාවෙන් සහ දුෂ්කෘත්‍යයෙන් පරිබාහිරව අධ්‍යාපනික සහ සමාජීය කාර්යයක් සිදුකරන බවද අධ්‍යයනය ඔස්සේ හඳුනාගන්නා ලදී.

**මුඛ්‍ය පද: අධ්‍යාපනය, කෘත්‍යය, පරිභෝජනය, ලිංගික දර්ශන, විනෝදාස්වාදය**

**හැඳින්වීම**

ලිංගික දර්ශන පරිභෝජනය පිළිබඳ සංසිද්ධිය මතභේදාත්මක මාතෘකාවකි. Wilson (1973) සඳහන් කරන ආකාරයට ලිංගික දර්ශන පරිභෝජනය ප්‍රථම වරට සමාජ ප්‍රශ්නයක් බවට පත් වූයේ 1957 දී එක්සත් ජනපද ශ්‍රේෂ්ඨාධිකරණය පළමු සංශෝධන (FindLaw, 2008) යටතේ කාමුක දර්ශන ආරක්ෂා කර නොමැති බවට තීන්දු කළ විටය. පසුගිය දශක කිහිපය තුළ ලිංගික දර්ශන පරිභෝජනය සහ ආදායම ඝාතීය ලෙස ඉහළ ගොස් ඇති බැවින්, ලිංගික දර්ශන පරිභෝජනය සම්බන්ධව සදාචාරාත්මක ඇඟවුම් සහ විය හැකි හානිකර බලපෑම් පිළිබඳව වර්තමාන පර්යේෂකයන් වැඩිවශයෙන් සැලකිලිමත් වේ. "ලිංගික දර්ශන පරිභෝජනය අන් අයගේ යහපැවැත්ම අනතුරේ හෙළන බවට පොදු එකඟතාවයක්" ඇතත් FindLaw (2008) දක්වන පරිදි නිදහස් භාෂණය පිළිබඳ ප්‍රශ්න ලිංගික දර්ශන පරිභෝජනය කේන්ද්‍ර කරගනිමින් දිගටම පැන නගී. ලිංගික දර්ශන පරිභෝජනය ගෝලීය මහජන සෞඛ්‍ය ගැටලුවක් බවට ද තර්ක කෙරේ. ප්‍රතිපත්තිමය වශයෙන්, පුද්ගල අයිතිවාසිකම් කෙරෙහි අවධානය යොමු කිරීම වෙනුවට සමාජය ආරක්ෂා වන අයුරින් ලිංගික දර්ශන පරිභෝජනය හැසිරවිය යුතු බව යෝජනා වී ඇත (Perrin et al., 2008). අන්තර්ජාලය, කේබල් සහ සැටලයිට් රූපවාහිනියේ පැමිණීම ලිංගික දර්ශන පරිභෝජනය භෞතික හා සමාජීය බාධක ඉවත් කරයි. මිනිසුන්ට ඔවුන්ගේ ඇඟිලි තුඩු වලින් ලිංගික දර්ශන පරිභෝජනය සඳහා වර්තමානයේ ප්‍රවේශය ඇත (Cooper, 1998). ඔවුන්ට සඟරාවක් මිලදී ගැනීමට හෝ වීඩියෝවක් කුලියට ගැනීමට සාප්පුවකට යාමට අවශ්‍ය නැත, නැතහොත් කළු ප්ලාස්ටික් වලින් ඔතා ඇති සඟරාවක් තම නිවසට ලබා දීම අසල්වැසියන් දැකීමෙන් කරදර විය යුතු නැත. තවද, අන්තර්ජාලය විසින් රැකියා ස්ථානයේ අසභ්‍ය දර්ශන පරිභෝජනය සැලකිලිමත් විය යුතු අංශයක් බවට පත් කර ඇත මක්නිසාද යත් ලිංගික දර්ශන පරිභෝජනය වර්තමානය වන විට විවේක හැසිරීම් ක්ෂේත්‍රයට අයත් වන බැවිනි (Lighted Candle Society, 2008). නමුත් ඒ හා සංස්කෘතික වටිනාකම් බාධක ලෙස සීමාවන් ගොඩනැගීම තුළ ශ්‍රී ලංකා සමාජය මූලික කරගත් අධ්‍යයනයක අවශ්‍යතාව මනාව ඉස්මතු වේ.

ලිංගික දර්ශන යනු සමාජයේ ලිංගික ප්‍රකාශනය නියාමනය කිරීම පිළිබඳ විවාද සඳහා කේන්ද්‍රීය පසුතලයක් ගොඩනගන භාවිතාවක් වශයෙන් සැලකිය හැක. යුරෝපා සමාජය කේන්ද්‍ර කරගනිමින් 1970 දශකය වනවිට ලිංගික දර්ශන පිළිබඳ සුවිශේෂී විවේචනයක් වර්ධනය වී ඇති අතර අතර එය ස්ත්‍රී දූෂණය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අසමානතාවය වැනි සමාජ ගැටලු සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට බලපවත්නා තත්වයක් වශයෙන් නිර්වචනය වී ඇත (Dworkin, 1979). ලෝකයේ ලිංගික දර්ශන ඇතුලත් වෙබ් අඩවි නිරන්තරයෙන්ම ලොව පුරා වාර්ෂිකව වැඩිපුරම නරඹන වෙබ් අඩවි 50 අතර ඇතුලත් වේ. එමෙන්ම වර්තමාන ලෝක ජනගහනයෙන් බහුතරයක් එක් වරක් හෝ ලිංගික දර්ශන අන්තර්ජාලය ඔස්සේ පරිහරණය කර ඇත (Burtăverde et al., 2021). ලිංගික දර්ශන පරිභෝජනය, නරඹන්නාගේ ලිංගික සබඳතා තෘප්තිය ඇතුළුව,ඔවුන්ගේ ආකල්ප, හැසිරීම, ලිංගික භාවිතයන්ට බලපෑම් කරන බව පැහැදිලි වී ඇත (Wright & Randall, 2012). එනිසා, ලිංගික දර්ශන පරිභෝජනය සංසිද්ධිය වඩා හොඳින් අවබෝධ කර ගැනීමට සහ අවබෝධ කර ගැනීමේදී අධ්‍යාපනික අනුකූලතාවය සහ සමාජ විද්‍යාත්මක දෘෂ්ටි කෝණයකින් එය හඳුනාගැනීම වැදගත්ය (Hald, 2006). කෙසේ වෙතත්, අද වන විට, පර්යේෂකයන් වැඩි වශයෙන් අවධානය යොමු කර ඇත්තේ ලිංගික දර්ශන පරිභෝජනයේ බලපෑම් අධ්‍යයනය වෙතය (Hald & Malamuth, 2008). Burtăverde et al. (2021) දක්වන්නේ සමාජ විද්‍යා පර්යේෂණ සාහිත්‍යය සැළකීමේදී ලිංගික දර්ශන පරිභෝජනය කිරීමේ සෘණාත්මක බලපෑම් ගවේෂණය වැඩි වශයෙන් අවධානය යොමු කර ඇති බවය. කෙසේ වෙතත්, Attwood (2011) තර්ක කරනු ලබන්නේ, ලිංගික දර්ශන පරිභෝජනය සම්බන්ධව අධ්‍යයනය කරන ආකාරය සම්බන්ධයෙන් සුසමාදර්ශී වෙනසක් ආරම්භ කළයුතු බවයි:. එහිදී ලිංගික දර්ශන

පරිභෝජනයේ සංකීර්ණත්වය සහ වැදගත්කම හඳුනා ගන්නා පර්යේෂකයන් හා සාපේක්ෂව සැළකීමේදී ලිංගික දර්ශන පරිභෝජනයේ සෘණාත්මක ප්‍රතිඵලවලට හේතු සම්බන්ධතා සම්බන්ධව ගොඩනැගෙන අධ්‍යයනයන් ප්‍රමාණාත්මකව සහ විශයිය පදනමින් ඉහළ වේ (McKee, 2012). මෙම අධ්‍යයනය මෙම පර්යේෂණ හිඩැස ආමන්ත්‍රණය කරනු ලබන්නේ තරුණ තරුණියන් පනස් දෙනෙකුගෙන් යුක්ත අධ්‍යයනය නියැන්දියක් සමඟ පවත්වන ලද ගැඹුරු සම්මුඛ සාකච්ඡා විශ්ලේෂණය කිරීමෙනි. ඔවුන්ගේ ලිංගික දර්ශන භාවිතාව අවබෝධ කර ගැනීම සඳහා ප්‍රේරක විශ්ලේෂණාත්මක ප්‍රවේශයක් (Inductive analytic approach) අනුගමනය කරමින් අධ්‍යයනය සිදුකරන ලදී.

පසුගිය වසර දශක කිහිපය තුළ ලිංගිකත්වය සම්බන්ධ සැලකිය යුතු සමාජ ආකල්පමය වෙනසක් සිදුවී ඇත ( Burtăverde et al., 2021). අවිවාහක ලිංගිකත්වය පිළිබඳ ආකල්ප ලිහිල් වී ඇති අතර, විවාහය සම්බන්ධ වයස, යෝජිත විවාහ සහ ප්‍රේම සම්බන්ධතා ආශ්‍රිත විවාහ, අවිවාහකත්වය සම්බන්ධව සමාජ ආකල්ප සංස්කෘතික ගොඩනැගීම්වලින් පරිබාහිරව වර්ධනය වී ඇත. ලිංගික සංසර්ගය ප්‍රජනනය සඳහා පමණක් වන ආකල්පයෙන් බැහැරව විනෝදය සහ තෘප්තිය පදනම්කරගත් චර්යාවක් වශයෙන් නිර්වචනය කිරීම දෙසට සමාජය තුළ මූලික වෙනසක් ඇති වී ඇත (Treas et al., 2014). ලිංගික තෘප්තිය කෙරෙහි මෙම අවධානය යොමු කිරීම බොහෝ තරුණ සංස්කෘතීන් තුළ විශේෂයෙන් දෘශ්‍යමාන වේ, එහිදී ලිංගික සංසර්ගය, ස්වයං වින්දනය, ලිංගික තෘප්තිය යනු  සාමාන්‍යකරණය වූ හැසිරීමක් වශයෙන් නිර්වචනය වේ. තවද,  සාමාන්‍ය නොවන ලිංගික හැසිරීම් පිළිබඳ සමාජය තුළ මේ වනවිට සාකච්ඡාවක් ගොඩනැගෙමින් පවතී (Wignall & McCormack, 2015). මෙම ප්‍රවණතාවල ප්‍රතිඵලයක් වශයෙන්, ලිංගික දර්ශන පරිභෝජනය සාමාන්‍යකරණය වී ඇත. McNair (2013) මෙම ලිංගික දර්ශන පරිභෝජන ප්‍රවේශය හඳුන්වන්නේ '*ප්‍රධාන ධාරාවේ සංස්කෘතියේ නිර්වචනය වන අසභ්‍ය දර්ශන* නැරඹීම' ලෙසයි. අධ්‍යයනයන් හරහා ඇස්තමේන්තු කර ඇත්තේ අද්‍යතන සමාජයේ පිරිමින්ගෙන් සියයට 80%කට වඩා ප්‍රමාණයක් ලිංගික දර්ශන පරිභෝජනය කරන අතර කාන්තාවන් සඳහා 23%ක් පමණ වන තරමක් අඩු අනුපාතයක් පවතින බවයි (Rosser et al., 2012).

මෙම වැඩිවන ලිංගික දර්ශන පරිභෝජනයේ ප්‍රධාන සංරචකය වන්නේ අන්තර්ජාලය සහ පරිගණකය ඇතුළු උපාංග වේ. ලිංගික දර්ශන පරිකල්පනය සඳහා තරුණයන් පොළඹවන ලද ලිංගික දර්ශන ඇතුලත් පුවත්පත් ක්‍රමයෙන් භාවිතයෙන් ඉවත්ව ගොස් ඇත Edelman (2009), Bergner & Bridges (2002), Twohig & Crosby, (2010) සහ Wright & Randall (2012) තර්ක කරන්නේ අන්තර්ජාලය හරහා සෑම වයස් කාණ්ඩයකම පුද්ගලයන්ට ලිංගික අන්තර්ගතයන් සහ ලිංගික දර්ශන පරිභෝජනය කිරීමට ඉඩ දී ඇති බවත්, මෙය වැඩි වැඩියෙන් නව යොවුන් වියේ පසුවන අයට සාමාන්‍ය භාවිතාවක් වශයෙන් ගොඩනැගී ඇති බවත්ය. ඇතැම් වෙබ් අඩවිවලට මිනිසුන් තමන් විසින්ම ලිංගිකව එක්වන අයුරු පටිගත කරන ලද වීඩියෝ උඩුගත කරන ආධුනික කාමුක දර්ශන නැරඹීම සඳහා අවශ්‍ය කරන අන්තර්ජාලය පහසුකම් සලසා ඇති ආකාරය ද අවධාරණය කෙරේ ( Burtăverde et al., 2021) .

මෙම නිර්මාණය කරන ලද අන්තර්ජාල අන්තර්ගතය තාක්ෂණික බාධා පැමිණවීම් නොසලකා කටයුතු කිරීමට ක්‍රියාත්මක වේ. විශේෂයෙන් වයස අවුරුදු දහ අටෙන් ඉහළ පිරිස් සඳහා ඇතුලත් විය නොහැකි බව දක්වන පණිවුඩය එනම් වෙබ් අඩවි බාධකය බිඳ ඉදිරියට යාම සාමාන්‍ය සාක්ෂරතාවයක් සහිත පුද්ගලයෙකුට අපහසු නොවේ ( Burtăverde et al., 2021). එමෙන්ම එහිදී නියාමනයක් ගොඩනැගුවද එය පහසුවෙන් අතික්‍රමණය කිරීම සඳහා අවශ්‍ය දැනුම වර්තමානය තුල පවතී. විශේෂයෙන්ම ලිංගික දර්ශන හුවමාරු කිරීම සඳහා සමාජ මාධ්‍යය භාවිත කිරීම හරහා මෙහි භාවිතාව සාමාන්‍යකරණය වී ඇත (Wignall & McCormack, 2015). කෙසේ නමුත්, ලිංගික දර්ශන පරිභෝජනය වැඩි වීම සහ එහි 'සංස්කෘතික හානිය' පිළිබඳ නිරන්තර ප්‍රධාන

ධාරාවේ කතිකාවන් සමග සිදුවී ඇත (McGlynn & Rackley, 2007). ලිංගික දර්ශන පරිභෝජනය පිළිබඳ පර්යේෂණ සැලකිය යුතු ලෙස පුළුල් වී ඇති අතර, ලිංගික දර්ශන හරහා ඇති විය හැකි හානිය පිළිබඳ පූර්ණ අවධානය යොමු කිරීමේ සිට ලිංගික දර්ශන පරිභෝජනය කරන ආකාරය සහ මිනිසුන් එය නැරඹීමේ අත්දැකීම් අර්ථකථනය කරන සහ සැකසීමේ විවිධ ක්‍රම පිළිබඳ සමාජ ගතිකත්වය පිළිබඳ පුළුල් උනන්දුවක් දක්වා එම පර්යේෂණ ක්ෂේත්‍රය ත්‍රිව වී ඇත (Wignall and McCormack, 2015).

ලිංගික දර්ශන පිළිබඳ ප්‍රමුඛතම පර්යේෂණ ධාරාව එය මිනිසුන්ගේ ලිංගික හැසිරීම් සහ ලිංගිකත්වය කෙරෙහි සහ ආකල්ප කෙරෙහි ලෙස බලපාන ආකාරය පරීක්ෂා කර ඇත (Antevska & Gavey,2015).ලිංගික දර්ශන පහසුවෙන් පරිශීලනය කළ හැකි අතර ලිංගික සංසර්ගය පිළිබඳ අධ්‍යාපනය වඩාත් පුළුල් ලෙස විරල වන විට, ලිංගික සංසර්ගය අවබෝධ කර ගන්නා ආකාරය සහ ක්‍රියාත්මක කරන ආකාරය කෙරෙහි ලිංගික දර්ශන සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි බවට Antevska & Gavey (2015) තර්ක කෙරේ. කෙසේ නමුත් ලිංගික දර්ශන සම්බන්ධව ගොඩනැගෙන ඍණාත්මක බලපෑම කේන්ද්‍ර කරගත් සුසමාදර්ෂයන් තුළ, ලිංගික දර්ශන පරිභෝජනය කිරීමේදී මෙම හැසිරීම් වල ව්‍යාප්තිය අස්වභාවිකව වැඩි වනු ඇතැයි යන අදහස ඇතිව, ගුද සංසර්ගය සහ බහු හවුල්කරුවන් සමග ලිංගිකව හැසිරීම ඇතුළුව 'අවදානම්' යැයි සැලකෙන ලිංගික ක්‍රියාකාරකම් මාලාවක් සමග අසභ්‍ය දර්ශනවලට නිරාවරණය වීම සමාජ අවධානමක් ගොඩනගන බව Giosan et al. (2018)තර්ක කරයි. මෙම තර්කය තුළ විශේෂයෙන් ලිංගික චර්යාවන්ගේ අවදානම සහ ආරක්ෂාව කේන්ද්‍රකරගත් වෙන්කිරීමක් සමග ලිංගික ක්‍රියාකාරකම් නිර්වචනය කරනු ලබයි. ඒ හා සමානව, ස්ත්‍රී දූෂණ නිරූපිත ලිංගික දර්ශන නැරඹීම, තරුණ ප්‍රජාව අතර ප්‍රචණ්ඩකාරී ලිංගික මනඃකල්පිතයන් සහ ලිංගික දූෂණය සාමාන්‍යකරණය වීමට සහ පිළිගැනීමට හේතු වනු ඇතැයි පර්යේෂණ සාහිත්‍යය තුළ තර්ක කර ඇත (McGlynn & Rackley, 2007).

නව යොවුන් වියේ දරුවන්ගේ ලිංගික දර්ශන භාවිතය පරීක්ෂා කරන සමාජ විද්‍යාත්මක පර්යේෂණවල, ඍණාත්මක බලපෑම් සහිත සුසමාදර්ශය විශේෂයෙන් දැකගත හැක. ලිංගික දර්ශන පිළිබඳ 'අවශ්‍ය' හෝ 'අනවශ්‍ය' අත්දැකීම් එහිදී ගැඹුරින් අධ්‍යයනය කරනු ලබයි. යෞවනයන් කාමුක දර්ශන හිතාමතා සොයා පරිභෝජනය නොකරද නිරන්තර අන්තර්ජාල භාවිතාවේදී ඒවා අහම්බයක් වශයෙන් හෝ දකින අතර, කුතුහලය සහ ලිංගික අධ්‍යාපනයේ ප්‍රමාණාත්මකභාවය අවමවීම මත ඇබ්බැහිවිමක් ඇතිවිය හැක (Mitchell et al, 2003).

ලිංගික දර්ශන ආශ්‍රය කරගනිමින් ගොඩනැගෙන සමාජ පර්යේෂණවල ඍණාත්මක බලපෑම් සුසමාදර්ශය ප්‍රමුඛ වශයෙන් විවේචනයට ලක් වේ. නමුත් වර්තමාන පර්යේෂණ සාහිත්‍යය සම්බන්ධව අවධානය යොමුකිරීමේදී, සැලකිය යුතු වශයෙන් නව යොවුන් වියේ පසුවන්නන් අතර සාමාන්‍යය චර්යාවක් සහ භාවිතාවක් වශයෙන් ලිංගික දර්ශන පරිභෝජනය පිළිබඳ බහුවිධ ක්ෂේත්‍ර සහ පර්යාලෝකයන් ඔස්සේ අධ්‍යයනයන් ගොඩනැගී ඇත. උදාහරණයක් ලෙස, Luder et al. (2011) අන්තර්ජාලය ඔස්සේ ලිංගික දර්ශනවලට නිරාවරණය වීම සහ යෞවනයන් අතර අවදානම් සහිත ලිංගික හැසිරීම් අතර සම්බන්ධය පරීක්ෂා කරන ලදී. එහිදී ලිංගික දර්ශනවලට අන්තර්ජාලය හරහා නිරාවරණය වීම අවදානම් සහිත ලිංගික හැසිරීම් වලට හේතු නොවන බව පර්යේෂණ ප්‍රතිඵල හරහා දක්වා ඇත. ඒ හා සමානව, Sinkovic et al. (2013) කුඩා අවධියේදී ලිංගික දර්ශන පරිභෝජනය සහ අවදානම් ලිංගික හැසිරීම් අතර කිසිදු සහසම්බන්ධයක් නොවන බව දක්වා ඇත. Owens et al. (2012) නව යොවුන් වියේ පසුවන්නන් කෙරෙහි අන්තර්ජාලය ආශ්‍රිත ලිංගික දර්ශනවල බලපෑම පිළිබඳ ක්‍රමානුකූල සාහිත්‍ය සමාලෝචනය මගින් පෙන්වා දෙන්නේ, ලිංගික දර්ශන පරිභෝජනය සහ සමාජීය සහ සෞඛ්‍ය ප්‍රතිඵල අතර සහසම්බන්ධතා පිළිබඳ සාක්ෂි අවිනිශ්චිත බවය. කෙසේ නමුත් ලිංගික දර්ශන පරිභෝජනය සඳහා අධ්‍යාපනය, ආගම, සංස්කෘතිය, ස්ත්‍රී

පුරුෂ සමාජභාවය, වයස, විවාහක අවිවාහකබව සහ තරුණ අසහනය බලපවත්වන බව එම පර්යේෂණයේ සොයාගැනීම් අතරවන ප්‍රධාන සාධකයක් වේ.

සෘණාත්මක බලපෑම් සුසමාදර්ශය සැලකීමේදී ලිංගික දර්ශන පරිභෝජනයේ සෘණාත්මක බලපෑම් සොයාගෙන ඇත්තේ රසායනාගාර තත්වයන් තුළ පමණි, නමුත් මෙම අධ්‍යයනයන්ට පාරිසරික වලංගු භාවයක් නොමැත. McKee (2007) අවධාරණය කරන්නේ කාමුක දර්ශන ස්වේච්ඡා පදනමක් මත ස්වභාවික සැකසුම් තුළ විනෝදය සඳහා පරිභෝජනය කරන අතර, රසායනාගාර පර්යේෂණවල සහභාගිවන්නන්ට එහිදී ස්වයං පාලනයක් නොමැති බවයි. ඔවුන් නරඹන ලිංගික දර්ශන වර්ගය; ඔවුන් එය කොපමණ කාලයක් පරිභෝජනය කරයිද; ඔවුන් එය තනිවම හෝ අන් අය සමඟ බැලුවද; සහ ඔවුන්ට ස්වයං වින්දනයේ යෙදීමට අවසර තිබේද යන්න (බොහෝ විට එසේ නොවේ) වැදගත් ය. රසායනාගාර අධ්‍යයනවලින් සෘණාත්මක බලපෑම් පිළිබිඹු වන්නේ පරිභෝජනයේ සන්දර්භය මිස ලිංගික දර්ශනවල ස්වභාවික අන්තර්ගතය හෝ බලපෑම නොවන බව McKee (2007) තර්ක කරනු ලබයි.

පුළුල් පර්යේෂණ සන්දර්භය තුළ, ලිංගික දර්ශන පිටපත් කේන්ද්‍ර කරගනිමින් ගොඩනැගෙන අතර මිනිසුන්ගේ අන්තර්ක්‍රියා සමඟ ලිංගික දර්ශන බලපවත්වන ආකාරය සහ මිනිසුන්ගේ ලිංගික තෘප්තිය සහ ලිංගික අවශ්‍යතා සඳහා ලිංගික දර්ශන බලපවත්වන ආකාරයෙහි සංකීර්ණත්වය හඳුනා ගනී (Simon & Gagnon, 1986). කෙසේ නමුත් සෘණාත්මක බලපෑම් සම්බන්ධ සුසමාදර්ශයේදී තවදුරටත්, ලිංගික දර්ශන පරිභෝජනය සහ ඒ තුළ පවතින පිටපත් එදිනෙදා ජීවිතයට ආදර්ශනය සහ සක්‍රීය කිරීම අතර හේතු සම්බන්ධයක් උපකල්පනය කරයි .එනිසා, සෘණාත්මක බලපෑම් සුසමාදර්ශයේ න්‍යායික පදනම මගින් ලිංගික දර්ශන පරිභෝජනය අවබෝධ කරගැනීමට ගැනීමට අවශ්‍ය සංකීර්ණත්වය ස්පර්ශ නොකරන අතර, මිනිසුන් ලිංගික දර්ශන පරිභෝජනය කරන ආකාරය පිළිබඳ සංකීර්ණ අවබෝධයක් වර්ධනය කර ගැනීමට සමාජවිද්‍යාව සහ සමාජීය විද්‍යාවන් කේන්ද්‍රකරගත් පර්යේෂණ අවශ්‍ය වේ. ඒ අනුව තරුණ ප්‍රජාව අතර ලිංගික දර්ශන පරිභෝජනය පිළිබඳ අධ්‍යයනය ඔස්සේ ගොඩනගන්නේ එම පර්යේෂණ හිඩැස සම්පූර්ණ කිරීම සඳහා වන මැදිහත්වීම වේ.

මෙම අධ්‍යයනයේදී විශේෂයෙන්ම ස්ත්‍රී සහ පුරුෂ දෙපාර්ශවයම අධ්‍යයනය වෙත යොදාගැනීමේදී ඇතිවන පර්යේෂණ සීමාවන් අතික්‍රමණය කිරීම සඳහා විද්‍යුත් ලිපිනය දත්තයක් වශයෙන් ගබඩා නොවන ආකාරයෙන් Google Forms ආකෘතිය ගොඩනගන ලද අතර ඒ හරහා ප්‍රතිචාරිකයන්ගේ අනන්‍යතාවයන් කිසිසේත් අනාවරණය නොවන ආකාරයෙන් සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රශ්නාවලිය මුදාහැර දත්ත එක්රැස්කරගන්නා ලදී.

**අධ්‍යයනයේ අරමුණ**

McKee (2007) අවධාරණය කරන්නේ ලිංගික දර්ශන පරිභෝජනයට හේතු වන්නේ දිගු කාලීන සබඳතාවයක් තුළ භාවිතා කළ හැකි ලිංගිකත්වය සහ ලිංගික චර්යාව සම්බන්ධ නව ප්‍රවණතාවන් ඉගෙන ගැනීමට ඇති ආශාවේ ප්‍රකාශනයක් ලෙසය. එබැවින්, පවතින පර්යේෂණ සාහිත්‍යය තුළ අන්තර්ගතය සහ එහි සහසම්බන්ධතා සැලකිල්ලට ගනිමින්, ලිංගික දර්ශන පරිභෝජනය කෙටි කාලීන සංසර්ග දිශානතියක් ගොඩනැගීම සඳහා සිදුවන මානව භාවිතාවක් බවඋපකල්පනය කළ හැකිය. කෙටි කාලීන සංසර්ගයෙන් සංලක්ෂිත පුද්ගලයන්ට අනියම් ලිංගික හැසිරීම් වල යෙදිය නොහැකි සන්දර්භයන්හිදී සහ අවස්ථාවන්හිදී ලිංගික ආශාව තෘප්තිමත් කර ගැනීම සඳහා ලිංගික දර්ශන නැරඹීමට තෝරා ගත හැකිය. එනිසා, ලිංගික දර්ශන පරිභෝජනය, කෙටි කාලීන සංසර්ග දිශානතිය කේන්ද්‍රගතවන අතුරු නිෂ්පාදනයක් ලෙස වටහා ගත හැක.

ලිංගික දර්ශන පරිභෝජනය සඳහා මුඛ්‍ය වන අරමුණු අතර තවත් වැදගත් සාධකයක් වන්නේ ලිංගික කාර්ය සාධනය වැඩි දියුණු කිරීමයි. සහකරු හෝ සහකාරිය ආකර්ෂණය කර ගැනීමේ සම්භාවිතාව සහ, ව්‍යංගයෙන්, ප්‍රජනනය වීමේ සම්භාවිතාව වැඩි කරන උපක්‍රමයක් ලෙස තේරුම් ගත හැකි බවහඳුනාගත හැක. මෙම මානය "නව ලිංගික ඉරියව් ඉගෙන ගැනීම" සහ "ලිංගික කාර්ය සාධනය වැඩි දියුණු කිරීම" ලෙස නිර්වචනය කලහැක (McGlynn & Rackley, 2007). මෙම ගවේෂණාත්මක අධ්‍යයනයේ දී, ලිංගික දර්ශන පරිභෝජනය විවේක ක්‍රියාකාරකම් ආකාරයක් (leisure activity) ලෙස අවබෝධ කර ගැනීමට ආනුභවිකව පදනමක් ගොඩනැගීම ප්‍රධාන පර්යේෂණ ඉලක්කය විය. එහිදී ලිංගික දර්ශන පරිභෝජනය සඳහා බලපවත්වන සමාජ, ආර්ථික සහ සංස්කෘතික සාධක හඳුනාගැනීම ප්‍රධාන පර්යේෂණ අරමුණ වශයෙන් ගොඩනගන ලද අතර ලිංගික දර්ශන හරහා ලැබෙන අධ්‍යාපනික ප්‍රතිලාභ හඳුනාගැනීම සහ තරුණ ප්‍රජාවේ ලිංගික ආශාවන්, අනන්‍යතා සහ නව ලිංගික ක්‍රම ඉගෙනීම සම්බන්ධව ලිංගික දර්ශන පරිභෝජනයෙන් ලැබෙන දායකත්වය හඳුනාගැනීම සෙසු පර්යේෂණ අරමුණු වශයෙන් අධ්‍යයනය කරන ලදී. ඒ අනුව ලිංගික දර්ශන පරිභෝජනය සම්බන්ධව සාහිත්‍යය ඔස්සේ ගොඩනගනු ලබන ධනාත්මක සුසමාදර්ෂයන් කේන්ද්‍ර කරගනිමින් මෙම පර්යේෂණය තුළ අධ්‍යයන අරමුණු ගොඩනගා ඇත.

**පර්යේෂණ ක්‍රමවේදය**

සහභාගිවන්නන්ගේ ලිංගික අනන්‍යතා, ලිංගික ආකල්ප සහ  සහ ලිංගික දැනුම පිලිබඳ ක්‍රමවත් අධ්‍යයනයක් සිදුකිරීමේ අවශ්‍යතාවය සහ සහ පර්යේෂණ ආචාරධර්ම ආරක්ෂා කිරීම සඳහා වඩාත් යෝග්‍ය පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් සමීක්ෂණ ක්‍රමය යටතේ ප්‍රශ්නාවලි ක්‍රමය යටතේ දත්ත එක්රැස් කරන ලදී. නියැදිය සහ දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය සම්බන්ධව ගොඩනැගෙන ලද ආචාරධර්ම උභතෝකෝටිකය අතික්‍රමණය පිණිස ප්‍රශ්නාවලිය අන්තර්ජාලය ඔස්සේ Google Forms ආකෘතියක් වශයෙන් මුදාහරින ලද අතර, පූර්ව කොන්දේසි වශයෙන් ගොඩනගන ලද වයස අවුරුදු 19ත් 29ත් අතර, අවිවාහක යන පදනම්වලට යටත්ව තරුණයන් 25ක් සහ තරුණියන් 25ක් දත්ත දායකයන් වශයෙන් යොදාගනිමින් නියැදිය 50 දෙනෙකුගෙන් යුක්තව පර්යේෂණය සඳහා යොදාගන්නා ලදී. ප්‍රජාවිද්‍යාත්මක දත්ත ආවෘත ප්‍රශ්න වශයෙන්ද පර්යේෂණ අරමුණු කේන්ද්‍ර කරගත් ප්‍රශ්න විවෘත ප්‍රශ්න වශයෙන්ද ගොඩනගමින් ප්‍රශ්නාවලිය ගොඩනගන ලදී. ගුණාත්මක සහ ප්‍රමාණාත්මක දත්ත රැස්කිරීම සහ විශ්ලේෂණය සඳහා ඒ ඒ ප්‍රවේශයන් ආවරණය කරමින් තේමා අන්තර්ගත දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය සහ සාමාන්‍ය දත්ත ගණනය කිරීම් ඔස්සේ දත්ත විශ්ලේෂණය සිදුකරන ලදී.

**ප්‍රතිඵල සහ සාකච්ජාව**

**ලිංගික දර්ශන පරිභෝජනය සම්බන්ධ පූර්ව අත්දැකීම්**

ප්‍රතිචාරිකයන් බහුතරයක් නව යොවුන් වියේ සිටම ලිංගික දර්ශන නැරඹීම සඳහා යොමුවුවන් අතර, පළමු ලිංගික දර්ශනය නැරඹීමේ සාමාන්‍යය සැළකීමේදී එය පිරිමි ප්‍රතිචාරිකයන්ට වයස අවුරුදු 14 ක්ද, කාන්තා ප්‍රතිචාරිකයන්ට  වයස අවුරුදු 19ක්ද විය. ප්‍රතිචාරයන් අතර පළමු ලිංගික දර්ශන නැරඹීමේ අවම වයස අවුරුදු 12 වූ අතර ඉහළම වුඅස අවුරුදු 25ක් විය. ප්‍රතිචාරිකයන් බොහෝ දෙනෙකු සඳහා දෙමාපියන් විසින් ලිංගික දර්ශන නැරඹීමට ප්‍රවේශය සීමා කර තිබීම සහ අන්තර්ජාලය සහ ජංගම දුරකතනයන්ගෙන් පරිබාහිරව තැබීම මෙම ප්‍රවේශය සඳහා බලපවත්වන ලද ප්‍රධානතම සාධකය වශයෙන් දැක්විය හැක. විශේෂයෙන්ම ප්‍රතිචාරිකයන්ගෙන් වැඩි සංඛ්‍යාවක් (42) ප්‍රථම වරට ලිංගික දර්ශනයක් නරඹා තිබුයේ පෞද්ගලික සුහුරු ජංගම දුරකතනයක් (personal smart phone) භාවිත කිරීමට ආරම්භ කිරීමත් සමගය. එක් ප්‍රතිචාරිකයෙක් (22, පිරිමි) දක්වා තිබූ පරිදි,

*"මට ලිංගික දර්ශන කිසිසේත්ම නිවසේදී නරඹන්න බැහැ. අපේ කොම්පියුටරය තියෙන්නේ සාලය මැද්දේ, අපිට ලොකු ජනේලයක් තියෙනවා, මගේ නැන්දා පාරේ එහා පැත්තේ ජීවත් වෙනවා".*

තවත් ප්‍රතිචාරිකයෙකුට (20, පිරිමි) ඒ හා සමාන අත්දැකීමක් විය.

*"මම මගේ සහෝදරිය සමග කාමරයක් සහ මගේ පවුලේ අය සමග පරිගණකය බෙදා ගත්තා. ඒ නිසා යාන්තමින් හෝ ලිංගික දර්ශනයක් මම දැක්කේ රූපවාහිනියේ විතරයි".*

> *"මම ලිංගික දර්ශන බලන්න පටන් ගත්තේ 09 වසරේදී. අන්තර්ජාලයේ Browsing History (නැරඹුම් ඉතිහාසයක්) යනු කුමක්දැයි මම දැන සිටියේ නැහැ. ඒකයි මගේ අම්මයි තාත්තයි ඒ ගැන දැනගත්තෙ, එයාලට හොඳටම කේන්ති ගියා. මම ආයෙ 11 පන්තියෙදි බලල ආයෙමත් අල්ලගත්ත. ඊට පස්සේ මම Browsing History clearing ඉගෙන ගත්තට පස්සේ එයාලට අහුවුනේ නැහැ"* (23, පිරිමි).

මෙම ප්‍රතිචාර හරහා පැහැදිලි වන්නේ ලිංගික දර්ශන නැරඹීමට අවශ්‍යතාවයක් සහ ආශාවක් පෙන්නුම් කරද, දෙමව්පියන් සහ නිවසේ පිහිටීම මත ගොඩනැගෙන සීමාවන් හරහා ප්‍රවේශය නිතරම අවහිර කර තිබූ බවයි. කාන්තා ප්‍රතිචාරිකයන්ගේ අත්දැකීම් සම්බන්ධව අවධානය යොමුකිරීමේදී පිරිමි ප්‍රතිචාරිකයන්ගේ ප්‍රතිචාරයන්ට සාපේක්ෂව තරමක් සුවිශේෂී ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකිවිය.

> *"අසාවක් වගේම ලොකු කුතුහලයක් තිබුනා ලිංගික දර්ශනයක් නරඹන්න. ඒ වුණාට මට බයක් තිබුණා ගෙදරට අහුවුනොත් මොකද කරන්නේ කියල. මම මුලින්ම ලිංගික දර්ශනයක් බැලුවේ උසස් පෙළ කරන්න ඉස්කෝලේ හොස්ටල් එකට ආවට පස්සේ. එතන බයක් තිබුනේ නැහැ. අම්මලා කියල දෙන ලිංගික ත්වය සම්බන්ධ දේවල්වලට වඩා දෙයක් මෙතන තියෙනවා කියල මට හිතෙනවා"* (21, ගැහැණු).

> *"මම මුලින්ම ලිංගික දර්ශනයක් බැලුවේ මගේ පෙම්වතා එක්ක. එතකම් මට කිසිම අත්දැකීමක් තිබුණේ නැහැ. ලොකු බයක් තිබුණා කවුරුවත් දැනගනී කියල"* (28, ගැහැණු).

> *"මම අවුරුදු 17 දී මුලින්ම ලිංගික දර්ශනයක් බැලුවේ. මම බැලුව කියන එක මගේ අක්කට පස්සේ දවසක මම කිව්වා. එයා මට කිවුවා ඒ රඟපෑමක් විතරයි.ඒ හින්දා ඒ දේවල්වලින් ජීවිතේ ගැන තීරණය කරන්න යන්න එපා කියල. පස්සේ දවසක අම්ම ළඟදී මට ඒ ගැන කියවුණා. මම එක්ක අම්මා මාස දෙකක් වගේ කතාකරේ නැහැ තරහට"* (28, ගැහැණු).

දත්ත හරහා පැහැදිලි වන්නේ ප්‍රථම වරට ලිංගික දර්ශන නැරඹූ ප්‍රතිචාරිකයන් හට එසේ කිරීමට හැකි වූයේ ඔවුන්ට ඔවුන්ගේම පරිගණක ප්‍රවේශය හෝ අන්තර්ජාල භාවිතයේ පෞද්ගලිකත්වය හිමිවීමත් සමඟ. ප්‍රතිචාරිකයන්ගේ දත්ත සම්බන්ධව තවදුරටත් අවධානය යොමුකිරීමේදී, (26, පිරිමි) පැවසුවේ,

> "මම ස්වයං වින්දනය ගැන දැනගත්තේ අවුරුදු 16 දී, මට අවශ්‍ය වුනා ඒ සඳහා ලිංගික දර්ශන නරඹන්න. පරිගණකයක් තිබූ නිසා එය පහසු වුණා" ඒ හා සමානව ප්‍රතිචාර දක්වමින් 'අපට ඩෙස්ක්ටොප් එකක් තියෙනවා. එය මුලින් මගේ කාමරයේ තිබූ නිසා මම කරදරයක් නැතුව නැරඹුව" (23, ගැහැණු).

කෙසේ වෙතත්, මෙම ලිංගික දර්ශන පරිභෝජනයට බාධා ගොඩනැගීම සම්බන්ධව ප්‍රතිචාරිකයන් දක්වා තිබුණි. 'මගේ පවුලේ අය පරිගණකය භාවිතා කරන සෑම වේලාවකම ඔවුන් යමක් සොයා ගනීවි යැයි මම බයවෙලා හිටියා" (22, පිරිමි).

අන්තර්ජාලයේ නැරඹුම් ඉතිහාසය මකා දැමීම මෙම අවධානම ඉවත්කර ගන්නා ලද පොදු ක්‍රමයක් විය. නිදසුනක් වශයෙන්, (21, ගැහැණු) පැවසුවේ, ''මම ලිංගික දර්ශනවලට කැමතියි, නමුත් මගේ දෙමාපියන් එය දකිනු ඇතැයි මම නිතරම කලබල වුණා. මම හැම විටම මගේ පරිගණකය දෙපාරක් පරික්ෂා කරනවා. විශේෂයෙන්ම ගෙදරින් එළියට යන්න කලින්".

ඔවුන්ගේ නැරඹුම් ඉතිහාසය මකා දැමීමට අමතරව, ප්‍රතිචාරිකයන් ලිංගික දර්ශන නැරඹිය යුත්තේ කවදාද යන්න පිළිබඳව උපාය මාර්ගිකව සූදානම් වී ඇත. (26, පිරිමි) පැවසුවේ, ''මගේ අම්මාගේ කාලසටහන මම දැන සිටියා. මම ඉස්කෝලේ ඇරිලා ගෙදර එන වෙලාව සහ ඇය වැඩ ඇරිලා ගෙදර එන වෙලාව අතර පැය දෙකක කාලයක් මට තිබුණා".

'ළමා අහිංසකත්වය' (childhood innocence) අහිමි වීම පිළිබඳ සමාජ භීතියට සහ සමාජ සීමාවන්ට පටහැනිව, මුල් ලිංගික දර්ශන භාවිතය පිළිබඳ උත්සුකයන් ප්‍රතිචාරිකයන්ගේ ආඛ්‍යානවලින් පැහැදිලි නොවිය. බිය සහ ගැරහුම බොහෝ අවස්ථාවලදී ලිංගික ආශාවන් අතෘප්තිකර තත්වයක් වෙත ගෙනයනු ලබයි (Mulholland, 2013) විසින් පෙන්වාදෙන කරුණ මෙම ප්‍රත්චාරිකයන්ගේ බහුතරයකගේ ආඛ්‍යානයන්ගේ සාරාංශය බව පැහැදිලි වේ.

සහභාගී වූවන් 50දෙනාගෙන් 32 දෙනෙකු නව යොවුන්වියේ සිටම ලිංගික දර්ශන නැරඹීම පිළිබඳව සාකච්ඡා කළ අතර එය ගැටලුවක් නොවන බව පැහැදිලිවම ප්‍රකාශ කළ අතර, කිහිප දෙනෙකු එය සිය ලිංගික දිශානතීන් ගොඩනැගීම සහ පෞද්ගලික ආශයන් ගොඩනැගීම සඳහා ප්‍රයෝජනවත් වූ බව දක්වා තිබුණි.

නිදසුනක් වශයෙන්, (22, පිරිමි) පැවසුවේ, "ලිංගික දර්ශන මටනම් හොඳ දෙයක්. එය මට මා ගැන අවුල් සහගත තැන් ලිහාගන්න උපකාරී වුණා. ඒ වගේම සමහර දේවල් පොත්වලින් යාළුවන්ගෙන් අහල තිබුණට වඩා හුඟක් වෙනස්". ඇතැම් ප්‍රතිචාරිකයන් ලිංගික දර්ශන නැරඹීම"නව යොවුන්වියේ පසුවන්නන් සහ ළමයින් ලිංගිකත්වයට සංක්‍රමණය වීමට ඇති පොදු සහ හොඳම ක්‍රමය" බව තර්ක කළේය.

ලිංගික දර්ශන පරිභෝජනය අනවශ්‍ය සහ වැරදි ලිංගික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කරයි යන Brown & L'Engle (2009) දක්වන ලද අදහසට අභියෝග කරමින් ප්‍රතිචාරිකයන් මතුකරන ලද ප්‍රධානතම සාධක වුයේ ලිංගික දර්ශන යනු කනස්සල්ලට හේතු වන ප්‍රභවයක් වෙනුවට, ලිංගික දැනුම ලැබෙන ප්‍රපංචයක් වශයෙන් හඳුනාගත හැකි බවයි. එසේම ලිංගික අනන්‍යතාවයන්, ලිංගික හැසිරීම්, ලිංගික හැසිරීම් සඳහා වන හැඩතලයන් (position) හඳුනාගැනීමේදී මුල් වකවානුවේ අවබෝධයක් නොවුවද, එය ලිංගික දැනුම ක්‍රමවත්ම ලැබීමත් සමඟ තෝරාබේරා ගතහැකි බව ප්‍රතිචාරිකයන්ගේ අදහස විය. විශේෂයෙන්ම ඔවුන් දැක්වූ ප්‍රධාන සාධක කිහිපයක් වන්නේ, ලිංගිකත්වය සම්බන්ධ කුතුහලයන් නිරාකරණය කරගැනීමට, විවේක කාලය ගතකිරීමට, ආතතිය මගහරවා ගැනීමට, ලිංගික ගැටළු සඳහා විසඳුම් ලබාගැනීමට මෙන්ම සමවයස් කණ්ඩායම් අතර බහිශ්කරණය නොවීමට ලිංගික දර්ශන භාවිතය වැදගත් වූ බවයි.

**විවේක ක්‍රියාකාරකමක් (leisure activity) වශයෙන් ලිංගික දර්ශන පරිභෝජනය**

ලිංගික දර්ශන පරිභෝජනය විවේක ක්‍රියාකාරකමක් ලෙස ගොඩනැගිය හැකි භාවිතාවක් හැකිද යන්න පරික්ෂා කිරීම සඳහා අධ්‍යයනය තුළ විවේකය සම්බන්ධව නිර්වචනය වන ලක්ෂණ හයක් උකහා ගනිමු .

Stebbins (2001) විවේකය සම්බන්ධව නිර්වචනය කරන ලක්ෂණ ඇසුරින් තෝරාගන්නා ලදී. මෙම සාධක අතර, ක්ෂණික ප්‍රතිඵල ලැබෙන, කෙටි කාලීන භාවිතාව, ප්‍රසන්න, අලසබව දුරුකරන, විශේෂ පුහුණුවක් අවශ්‍ය නොවන, විශේෂ හැකියා අවශ්‍ය නොවන යන ලක්ෂණයන් විවේක කාලයේ සිදුකරන ක්‍රියාවන් (leisure activities) නිර්වචනය කරනු ලබයි. මෙම නිර්වචනය භාවිතා කරමින්, ලිංගික දර්ශන පරිභෝජනය විවේක ක්‍රියාකාරකමක් ලෙස නිර්වචනය කිරීම සහ එහි උපයෝගීතාව පවත්වා ගන්නේද යන්න ඇගයීමට ලක් කළ හැකිය.

ප්‍රතිචාර සම්බන්ධව අවධානය යොමුකිරීමේදී පළමුව, බහුතරයක් ප්‍රතිචාරිකයන් (34) ලිංගික තෘප්තිමත්භාවයක් ලබාගැනීමේ මාධ්‍යයක් ලෙස ලිංගික දර්ශන භාවිතා කළ අතර, එය ක්ෂණිකව සහ සහජයෙන්ම ප්‍රතිලාභදායක මෙන්ම සාපේක්ෂව කෙටි කාලීන විය. ලිංගික දර්ශන නැරඹුවේ මන්දැයි ඇසූ විට, (29, පිරිමි) පෙන්වා දුන්නේ, "මම හිතන්නේ ප්‍රධාන හේතුව සැනසීමක් සහ වෙනසක් ලබාගැනීම". අධ්‍යයනය තුළ ප්‍රතිචාරිකයන් ලිංගික තෘප්තිය ගැන සාකච්ඡා කළ අතර, බහුතරයක් ප්‍රතිචාරිකයන් ප්‍රමාණයක් ප්‍රකාශ කළේ ඔවුන් ස්වයං වින්දන මාධ්‍යයක් සහ උත්ප්‍රේරකයක් වශයෙන් ලිංගික දර්ශන භාවිත කරනු ලබන බවයි. එහිදී පිරිමි ප්‍රතිචාරිකයන් 25 දෙනාම සහ කාන්තා ප්‍රතිචරිකයන් 08 දෙනෙකු සඳහන් කරන ලද්දේ ස්වයං වින්දනය සඳහා ලිංගික දර්ශන උත්ප්‍රේරකයක් වශයෙන් එක්වරක් හෝ භාවිත කර ඇති බවයි.

ලිංගික දර්ශන පරිභෝජනය කිරීමේ ප්‍රසන්න සහ නැවුම් අත්දැකීමක් බව සහ ලිංගික තෘප්තියට අමතරව, ඇතැම් ප්‍රතිචාරිකයන් ඔවුන්ගේ භාවිතයේ 'ගුණාත්මකභාවය' පිළිබඳ වැදගත්කම ද සාකච්ඡා කළහ. උදාහරණයක් ලෙස, (21, ගැහැණු) පැවසුවේ, "මම හොඳ වීඩියෝවක් සොයාගෙන, ඒ සමඟ කාලය ගත කරන්න කැමතියි. ඉස්සර මම හමුවෙන ඕනෙම දර්ශනයක් බැලුවා. නමුත් මට දැන් තෝරාගැනීමක් තියෙනවා". (22, පිරිමි) සඳහන් කරන ලද්දේ, "මම කතාවක් සහිත ලිංගික දර්ශනවලට කැමතියි. ඍජු කාමුක දර්ශනවලට සාමාන්‍යයෙන් හොඳ පසුබිමක් නැහැ. ඒ වගේ දර්ශන හරිම ඒකාකාරී". එමෙන්ම තවදුරටත් (24, ගැහැණු) දක්වන ලද කරුණක් වන්නේ "ඔබට ක්‍රීඩාවක් කිරීමෙන් ලැබෙන්නේ එකම වගේ තෘප්තියක්, ක්‍රීඩාවත් අවශ්‍යයි, නමුත් මේ හරහා ලැබෙන දැනුම දවසින් දවස අලුත් වෙනවා වගේම හොඳ සම්බන්ධතාවක් ගොඩනගන්න උදව් වෙනවා" යන්නයි.

ප්‍රතිචාරිකයන් කිහිප දෙනෙකු ලිංගික දර්ශන හා සම්බන්ධ විශේෂිත රුචි අරුචිකම් ගැන සාකච්ඡා කිරීමේදී (21, පිරිමි) පැවසුවේ, "මම ලිංගික දර්ශන තෝරාගන්නේ හරි පරිස්සමට. සමහර websites (වෙබ් අඩවි) ආරක්ෂාවක් නැති ඒවා. මම හුගක් වෙලා ගන්න දර්ශන නරඹන්න කැමැත්තක් නැහැ. සමහර වෙලාවට මට දවසටම විවේකයක් ලැබෙන්නේ පැයක් විතර. ඒ මුළු කාලයම මේකට දෙන්න බැහැ"

ඔහු වඩාත් සතුටට පත්වන කාමුක දර්ශන වර්ගය විස්තර කරමින් (24, ගැහැණු) දක්වන ලද්දේ, තමා වඩාත් ප්‍රියකරන්නේ ප්‍රේමාන්විත දෙබස් සමඟ ඉදිරියට ඇදෙන ලිංගික දර්ශන සඳහා බවයි. ඇතැම් ලිංගික දර්ශනවල අස්වාභාවික සහ කෘතිම හැසිරීම් ඇය ප්‍රතික්ෂේප කරන බවත්, සාමාන්‍ය ලිංගික සම්බන්ධතාවයකදී කිසිසේත් එවැනි චර්යාවක් ළඟා කරගත නොහැකි බවත් ඇය දක්වා තිබුණි.

ප්‍රතිචාරිකයන් මෙහිදී ලිංගික දර්ශන සම්බන්ධ තෝරාගැනීම සහ මනාපය පැහැදිලි කිරීම සඳහා අව්‍යාජභාවය භාවිතා කිරීම එහි සාමාන්‍යකරණය වීම සහ විවේක කාලය ගතකිරීම සඳහා යෝග්‍ය බව ඔවුන්ගේ තෝරාගැනීම වඩාත් පැහැදිලි කරනු ලබයි. Morris සහ Anderson (2015) දක්වන්නේ අනන්‍යතා කළමනාකරණ භාවිතයන් සම්බන්ධ විෂය පථයන් පුළුල් ලෙස කතා කළ හැකි අතර, තෝරාගැනීම පුද්ගල බද්ධ සාධකයක් බැවින් එය සමාජ විද්‍යාව වැනි විෂය ක්ෂේත්‍රයක අනිවාර්ය අධ්‍යයනයක් වන බවයි. කෙසේ

වුවත්, ලිංගික දර්ශන සම්බන්ධ තෝරාගැනීම සහ මනාපය පිළිබඳ සාකච්ඡාව, එහි ගුණාත්මක භාවය සමඟින්, පරිභෝජනයේ ප්‍රසන්න ස්වභාවය ඉස්මතු කරයි.

අලසබවින් තොරව නියැලීමට හැකිවීම සම්බන්ධව සැලකීමේදී (25, පිරිමි) ප්‍රකාශ කර තිබුණේ, "මට කම්මැලි නම් සහ කරන්න වෙන දෙයක් නැත්නම්, මම සමහර වෙලාවට නොපැහැදිලි ජපන් ලිංගික දර්ශනබලනවා. පිස්සු අමුතු දේවල්. එය ආකර්ෂණයට වඩා හාස්‍යජනක දෙයක්. හැබැයි කම්මැලිකමක් දැනුනේ නැහැ". (19, ගැහැණු) දක්වන ලද්දේ "මටනම් ලිංගික දර්ශන බලන එක කම්මැලිකමක් නෙමෙයි. සමහර වෙලාවට අහුවෙයි කියල බයත් එක්ක දර්ශනයක් නරඹනවා කියන්නෙම හොඳ වෙනස් අත්දැකීමක්" ලිංගික දර්ශන නැරඹීම සහ ගොඩනැගෙන ලිංගික දර්ශන සම්බන්ධ සංස්කෘතික විවිධත්වය සම්බන්ධවද මෙහිදී අවධානය දැක්විය හැක. විශේෂයෙන් ලිංගික දර්ශන ප්‍රභේද (Categories) සම්බන්ධව පවතින අනන්‍යතා, ලිංගික චර්යා අනන්‍යතා, තාක්ෂණික අනන්‍යතා, කාලය සහ ප්‍රමිතිය සම්බන්ධ අනන්‍යතාවයන් වෙනස් අත්දැකීම් සපයන මාධ්‍යයක් බවට ලිංගික දර්ශන නිර්වචනය සඳහා යොදාගත හැක.

ඒ අනුව ලිංගික දර්ශන අලස බව තුරන් කිරීමේ හෝ ඵලදායිතාවයට උපකාර කිරීමේ මාර්ගයක් ලෙස ද නිර්මාණාත්මක ලෙස භාවිතා කල හැක වශයෙන් Smith et al. (2015) ගොඩනගන නිර්වචනය් තවදුරටත් පැහැදිලි කිරීමේදී (27, පිරිමි) පැවසුවේ, "ඇත්තටම මට ආතතිය වගේනම් මම ලිංගික දර්ශන නරඹමනවා, ඊට පස්සේ මට ගෙදර වැඩ හෝ යමක් කිරීමට තියෙන අකමැත්ත මඟහරවා ගන්න පුළුවන්". ලිංගික දර්ශන පරිභෝජනය් සඳහා අවශ්‍ය කරනු ලබන විශේෂ හැකියාවක් හෝ පුහුණුවක් නොමැතිබව මීට ඉහතදී සාකච්ඡා කළ පරිදි සහභාගිවන්නන්ගේ ලිංගික දර්ශන මුල් අවස්ථා පරිභෝජන ආකාරය අනුව පැහැදිලි වේ. ඒ අනුව, කායික හා චිත්තවේගීය උත්තේජනයන් සමඟින් විනෝදය, සමාජ බැඳීම සහ අලසබව තුරන් කිරීම සඳහා පහසුකම් සලසන ලිංගික දර්ශන විනෝදාත්මක විවේක ක්‍රියාකාරකමක් ලෙස සැලකිය හැකි ආකාරය මෙම ආඛ්‍යාන මගින් ඉස්මතු කරයි. ලිංගික දර්ශන පරිභෝජනය යනු නරඹන්නන් ලිංගිකව උද්දීපනය කිරීම සඳහා නිර්මාණය කරන ලද මාධ්‍ය වර්ගයකි. ඇතැමෙකුට, ලිංගික දර්ශන පරිභෝජනය කිරීම චිත්‍රපටයක් නැරඹීම හෝ පොතක් කියවීම වැනි විවේක කටයුත්තක් විය හැකිය. කෙසේ වෙතත්, ලිංගික දර්ශන පරිභෝජනය පුද්ගලයන්ට සහ සමස්තයක් ලෙස සමාජයට ධනාත්මක සහ ඍණාත්මක බලපෑම් ඇති කළ හැකි බව සැලකිල්ලට ගැනීම වැදගත්ය.

ලිංගික දර්ශන පරිභෝජනය සහ විවේක අධ්‍යයනයට කේන්ද්‍රීය වන්නේ එය අනියම් හෝ බැරෑරුම් ප්‍රකාර වශයෙන් අවබෝධකර ගත හැකිය යන මතයයි. බැරෑරුම් විවේකය යනු සැලකිය යුතු කාලයක් සහ ශක්තියක් අවශ්‍ය කරන ක්‍රියාකාරකම් ඇතුළත් වේ. Stebbins (2001) අනියම් විවේකයේ ක්‍රියාවක් යන්න නිර්වචනය කළේ 'සාපේක්ෂ වශයෙන් කෙටිකාලීන ප්‍රසන්න ක්‍රියාකාරකමක් වන අතර එය භුක්ති විඳීමට විශේෂ පුහුණුවක් අවශ්‍ය නොවේ' යනුවෙනි. එයට නිෂ්ක්‍රීය විනෝදාස්වාදය, ආහාර ගැනීම හෝ පානය කිරීම සහ සමාජ ක්‍රීඩාව ඇතුළත් වේ. Stebbins (2001) අනියම් විවේක ක්‍රියාකාරකමක ප්‍රධාන ලක්ෂණ හයක් හඳුනාගෙන ඇති අතර, ඒවායින් සමන්විත වන්නේ: (1) ක්ෂණිකව සහ සහජයෙන්ම විපාක දෙන; (2) සාපේක්ෂව කෙටි කාලීන; (3) ප්‍රසන්න; (4) සමාජශීලී; (5) කම්මැලිකම සමනය කරන සහ (6) භුක්ති විඳීමට කුඩා හෝ විශේෂ පුහුණුවක් අවශ්‍ය නොවේ යන සාධක වේ. උක්ත ප්‍රතිචාරයන් ඔස්සේ සළුත වන්නේ එම අනියම් විවේකයක ලක්ෂණ බව හඳුනාගත හැක.

ලිංගික දර්ශන පරිභෝජනය සහ විවේකය කළමනාකරණය යන දෙකම ඍජුව සහ වක්‍රව එකිනෙක හා සම්බන්ධ වේ. තවද, අලසකම සහ ලිංගික දර්ශන පරිභෝජනය මානසික අවපීඩනයේ සායනික ලක්ෂණවලට එකිනෙකට සම්බන්ධ වේ (Ybarra & Mitchell, 2005). පර්යේෂණ දත්ත වලට අනුව බොහෝ විට නිවසේ සහ විවේක කාලය තුළ ලිංගික දර්ශන පරිභෝජනය වැඩිවශයෙන් අවබෝධයක් හෝ අරමුණක් රහිතව

සිදුවේ (Dew et al., 2006). ලිංගික දර්ශන පරිභෝජනය පිළිබඳ පර්යේෂණ සම්බන්ධයෙන්, Zillman (2000) පෙන්වා දෙන්නේ ලිංගික දර්ශන පරිභෝජනය ලිංගික හැසිරීම් වර්ධනයට දායක වන සාධක වඩා හොඳින් තහවුරු කර ගැනීම සඳහා ප්‍රයෝජනවත් බවයි. එමෙන්ම ලිංගික දර්ශන පරිභෝජනය ඔස්සේ ලිංගිකත්වය සහ ලිංගික චර්යාවන් මානව ආචාරධර්මයක් ලෙස සලකන ලෙස යෝජනා කරන ලද අතර, ලිංගික දර්ශන පරිභෝජනය පුද්ගලික පෙළඹවීම්වල ආවේනික වෙනස්කම් ඔස්සේ ගොඩනැගෙන බව පැහැදිලිය.

විවේක ක්‍රියාකාරකමක් ලෙස ලිංගික දර්ශන පරිභෝජනය සඳහා වන සමහර තර්කවලට ඇතුළත් වන්නේ එය කෙනෙකුගේ ලිංගිකත්වය සහ ආශාවන් ගවේෂණය කිරීමේ මාර්ගයක් විය හැකි බවත්, විනෝදාස්වාදය හෝ ආතතියෙන් මිදීමට මූලාශ්‍රයක් විය හැකි බවත්, ලිංගික ශිල්පීය ක්‍රම හෝ මනාපයන් ගැන ඉගෙන ගැනීමට මාර්ගයක් විය හැකි බවත්ය. අනෙක් අතට, විවේක ක්‍රියාකාරකමක් ලෙස ලිංගික දර්ශන පරිභෝජනයට එරෙහි සමහර තර්කවලට ඇතුළත් වන්නේ එය ඇබ්බැහි වීමට හෝ බලහත්කාර හැසිරීමට මඟ පැදිය හැකි බවත්, සැබෑ ජීවිතයේ ලිංගික අත්දැකීම්වලට පුද්ගලයන්ව සංවේදී කළ හැකි බවත්, කාන්තාවන් සහ අනෙකුත් ආන්තික කණ්ඩායම් වෛෂයිකකරණයට සහ සූරාකෑමට දායක විය හැකි බවත්ය. විය හැකි අවදානම් සහ ප්‍රතිලාභ සැලකිල්ලට ගනිමින් විවේචනාත්මක සහ දැනුවත් ඉදිරිදර්ශනයකින් ලිංගික දර්ශන පරිභෝජනයට ප්‍රවේශ වීම වැදගත් වේ. ලිංගික දර්ශන නිෂ්පාදනය සහ බෙදා හැරීම සම්බන්ධ සදාචාරාත්මක හා නීතිමය ගැටළු සලකා බැලීම ද වැදගත් ය. අවසාන වශයෙන්, විවේක ක්‍රියාකාරකමක් ලෙස ලිංගික දර්ශන පරිභෝජනය කිරීමට තීරණය කිරීම දැනුවත්ව සහ සැලකිල්ලෙන් ගත යුතු පුද්ගලික තීරණයකි.

**ලිංගික දර්ශන පරිභෝජනයේ අධ්‍යාපනික සහ ගවේෂණාත්මක භාවිතයන්**

ප්‍රතිචාරිකයන් ලිංගික තෘප්තිය සඳහා සහ විවේක ක්‍රියාකාරකමක් ලෙස ලිංගික දර්ශන භාවිතය සම්බන්ධව ප්‍රතිචාර සඳහා ඉස්මතු කළ අතර, Albury (2014) දක්වන ආකාරයට එය අවිධිමත් අධ්‍යාපන මාධ්‍යයකි. විශේෂයෙන්ම ලිංගික දර්ශනවල අධ්‍යාපනික පැතිකඩ පර්යේෂණයේදී හඳුනාගත් විට, එය බොහෝ විට පාසල් පදනම් වූ ලිංගික අධ්‍යාපනයේ හිඟකම විවේචනය කිරීමට වඩාත් යෝග්‍ය විකල්ප උපකරණයක් ලෙස යොදාගත හැක. ප්‍රතිචාරිකයන් මෙහිදී ඔවුන්ගේ ලිංගික දර්ශන පරිභෝජනය සම්බන්ධව ධනාත්මක ප්‍රවේශ ඔස්සේ ප්‍රතිචාර දක්වන ලද අතර, Albury (2014) දක්වන ආකාරයට එය අධ්‍යාපනික ක්‍රම ත්‍රිත්වයක් සම්බන්ධව විස්තර කරයි: ලිංගික ආශාවන් ගවේෂණය කිරීම; නව ලිංගික ක්‍රියාකාරකම් ගවේෂණය කිරීම; සහ තමන්ගේ ලිංගික අනන්‍යතාවය අවබෝධ කර ගැනීමේ මාධ්‍යයක් ලෙස ලිංගික දර්ශන යොදාගත හැක. මෙහිදී, ප්‍රතිචාරිකයන්ට අනන්‍ය ලිංගික දිශානතියක් පවත්වාගෙන යාම පැහැදිලිවම වැදගත් වන අතර, ඒ සඳහා ලිංගික දර්ශන ඔස්සේ ගොඩනැගෙන දායකත්වය මෙහිදී හඳුනාගත හැක.

ඇතැම් ප්‍රතිචරිකයන් 'කුතුහලය' (curiosity) කේන්ද්‍ර කරගනිමින් විවිධ ලිංගික දර්ශන ගවේෂණය කිරීම සම්බන්ධ අත්දැකීම් විස්තර කළහ. එහිදී සමලිංගික ලිංගික දර්ශන සම්බන්ධව මතුකරමින් (22, ගැහැණු) පැවසුවේ, "මම එය ඉතා කුතුහලයෙන් නැරඹුවා. මට හිතාගන්න බැරිවුනා සමලිංගික සම්බන්ධතාවක් එතරම් රොමැන්ටික් වුනේ කොහොමද කියලා. ඒ සම්බන්ධය මම හිතින් මවාගෙන උන්න සම්බන්ධයකට වඩා වෙනස්" මේ සම්බන්ධව ප්‍රතිචාර දක්වමින් (27, පිරිමි) ප්‍රතිචාර දැක්වූයේ "ඒ කුමක්ද? මේ ගැටළුව මට හැමදාම තිබුණා. සමහර වෙලාවට යාළුවො ඉස්සරහ මට කතාකරගන්න දෙයක් තිබුනේ නැහැ. අපි කොහොමත් එකතු වුනාම සෙක්ස් ගැන කතාකරනවා. ඇත්තටම විවිධ; ලිංගික සම්බන්ධතා වර්ගයන් ගවේෂණය කිරීම විනෝදජනකයි"

පර්යේෂණ ප්‍රතිඵල අනුව සියලුම ප්‍රතිචාරිකයන් මුලදී විෂමලිංගිකයන් ඉලක්ක කරගත් ලිංගික දර්ශන නරඹා ඇති අතර බහුතරයක් (34) එක් වරක් හෝ සමලිංගික දර්ශන නරඹා ඇත. ඔවුන්ගේ ලිංගික මනාපයන්ට

ගැලපෙන ලිංගික දර්ශන සොයා ගැනීමේ ප්‍රවනතාවක් ප්‍රතිචාරිකයන් අතර දක්නට ඇත. එමෙන්ම ලිංගික අවයව සම්බන්ධව ඔවුන්ගේ දැනුම් වර්ධනයද මෙහිදී සුවිශේෂී වේ. (22, ගැහැණු) දක්වා ඇති පරිදි පුරුෂ ලිංගය සම්බන්ධව ඇය දරන ලද චිත්ත රූපය සම්පූර්ණයෙන් වෙනස් බව ඇය දක්වයි. විශේෂයෙන්ම ඇය විසින් ප්‍රමාණය සම්බන්ධව ගොඩනගා ගත ඇතැම් දුර්මතයන් ලිංගික දර්ශන හරහා වැරදි බව ප්‍රත්‍යක්ෂ වූ බව දක්වයි. එමෙන්ම බොහෝ පිරිමි ප්‍රතිචරිකයන් (19) ක් ප්‍රකාශ කර සිටියේ යෝනිය සහ කාන්තා ලිංගික අනන්‍යතාවන් සම්බන්ධව පැවති බොහෝ පරිකල්පනයන් සහ දුර්මතයන් මේ හරහා අහෝසි වූ බව. එමෙන්ම සුරාන්තය වැනි සාධක සම්බන්ධව අත්දැකීමක් නොමැති බැවින් ඒ සම්බන්ධව ලිංගික දර්ශන ආශ්‍රයෙන් ලබාගත් දැනුම වැදගත් බව (20, පිරිමි) ප්‍රකාශ කරන ලදී. පූර්ව ලිංගික ක්‍රියාකාරකම් සහ සංවේදී ස්ථානයන් සම්බන්ධව ලිංගික දර්ශන හරහා ලබාගන්නා ලද දැනුම සුවිශේෂී බව මෙහිදී ප්‍රතිචරිකයන් දක්වන ලදී. විශේෂයෙන්ම ශ්‍රී ලංකා සමාජයේ ලිංගික අධ්‍යාපනය පද්ධති ක්‍රියාකාරිත්වය, ලිංගාශ්‍රිත රෝග සහ ආරක්ෂාව වැනි සීමාසහගත තේමාවන් වෙත පමණක් කේන්ද්‍රගත වන බැවින් ලිංගික දර්ශන හරහා ලැබෙන අධ්‍යාපනය සුවිශේෂී බව ඔවුන් දක්වයි. Albury (2014) දක්වන පරිදි ලිංගික දර්ශන හරහා ලැබෙන අධ්‍යාපනය විධිමත් අධ්‍යාපනයක් ලෙස පරිවර්තනය කළ හැකිනම් එය තාරුණ්‍යයේ සුවිශේෂී භාග්‍යයක් වනු ඇත.

ලිංගික දර්ශන නව ලිංගික ක්‍රියාකාරකම් සහ ශිල්පීය ක්‍රම ගවේෂණය කිරීමේ මාධ්‍යයක් ලෙස Weinberg et al. (2010) දක්වනු ලබයි. සාරාංශයක් ලෙස, අධ්‍යාපනික සැකසුම් තුළ ඉගෙනීමේ මෙවලමක් ලෙස ලිංගික දර්ශන භාවිතා කිරීම ගැටළු සහගත විය හැකි නමුත් පන්ති කාමරය තුළ ගවේෂණය කරන ලද ලිංගිකත්වය සම්බන්ධව කරුණු සම්බන්ධව ගොඩනැගෙන ආඛ්‍යාන ඔස්සේ ලිංගික ජීවිතය අවබෝධ කර ගැනීමේදී ලිංගික දර්ශනවල ධනාත්මක අංශ ඉස්මතු කවන බව පැහැදිලිය.

මෙම පර්යේෂණය මගින් ලිංගික  දර්ශන නැරඹීම පුද්ගලයන්ගේ ජීවිතයට සහ අනන්‍යතාවයට බලපා ඇති ආකාරය පරීක්ෂා කිරීම සඳහා ගොඩනගන ලදී. පර්යේෂණ සාහිත්‍යය තුළ සෘණාත්මක බලපෑම් සුසමාදර්ශය ලෙසින් හැඳින්වූ ලිංගික දර්ශන පරිභෝජනය හරහා ගැටළු සහගත තත්වයන් වර්ධනය වන තර්කයට අභියෝග කරමින් එය අධ්‍යාපනික බව දක්වනු ලබයි.  මෙම පර්යේෂණයේ විෂය පථය ගවේෂණාත්මක වන අතර, ලිංගික දර්ශන විවේක ක්‍රියාකාරකමක් ලෙස සැලකිය යුතු බව ප්‍රමුඛ වශයෙන් ඉස්මතු කරයි. එහිදී අනියම් විවේකයේ ලක්ෂණ ආශ්‍රය කරගනිමින් ලිංගික දර්ශන පරිභෝජනයේ පවතින විවේකය කේන්ද්‍ර කරගනිමින් සිදුවන ක්‍රියාකාරකමක් වශයෙන් නිර්වචනය කළහැක. ලිංගික තෘප්තිය සඳහා මූලික වන මූලාශ්‍රයකට අමතරව, අලසබව දුරලන, අන්තර් සම්බන්ධතා වර්ධනය කරනු ලබන සහ සහ විනෝදය සඳහා මූලිකවන මූලාශ්‍රයක් ලෙසද ලිංගික දර්ශන භාවිතා කරන ප්‍රතිචාරිකයන් විසින් නිර්වචනය කරනු ලබයි. මෙම පර්යේෂණය හරහා ගොඩනැගෙන ප්‍රධාන තර්කයක් වූයේ ලිංගික දර්ශන කේන්ද්‍ර කරගනිමින්  සමාජ හානියක් ගොඩනැගීමට හෝ සංස්කෘතික පරිහානියක් ගොඩනැගීමට වඩා හානියක් නිශ්චිත සහ ගැඹුරු ලිංගික දැනුමක් නොමැතිවීම නිසා පුද්ගලබද්ධ වශයෙන් සිදුවන බවයි.

Smith et al. (2015) දක්වන පරිදි ලිංගික දර්ශන පරිභෝජනය අධ්‍යාපනික මෙන්ම දැනුම් ප්‍රභවයක් වශයෙන් සමාජ කෘත්‍යයක් ඉටුකරනු ලබයි. කෘත්‍යාත්මක පදනමක් ඔස්සේ ලිංගික දර්ශන පරිභෝජනයේ කාර්යයන් කොටස සම්බන්ධව මෙම අධ්‍යයනය තුළ ගෙනහැර දක්වන ප්‍රධානතම තර්කයක් වන්නේ දෛනික විවේක කාලය ගතකිරීම සඳහා වන කාර්යයක් වශයෙන්ද, අධ්‍යාපනික හා දැනුම් කාර්යයක් සිදුකරනු ලබන ප්‍රභවයක් වශයෙන්ද, ලිංගික දිශානතීන් පුද්ගලබද්ධ වශයෙන් ගොඩනගන අවිධිමත් අධ්‍යාපනයක් වශයෙන්ද කෘත්‍යයන් ගොඩනැගෙන බවයි. සමාජානුයෝජනය පිළිබඳ අවධානය යොමු කරමින් Smith et al. (2015) පවසන්නේ පවුල තුලින්, අධ්‍යාපන සංස්ථාව තුලින් හෝ ජනමාධ්‍ය හරහා සිදුනොවන කාර්යයක් ලිංගික දර්ශන පරිභෝජනය හරහා සිදුකරනු ලබන බවයි.

පසුගිය දශක කිහිපය තුළ ලිංගිකත්වය සම්බන්ධ සැලකිය යුතු සමාජ වෙනසක් සිදුවී ඇත. අවිවාහක ලිංගිකත්වය පිළිබඳ ආකල්ප සමාජය විසින් කිසියම් ආකාරයකට ලිහිල් කර ඇත. එමෙන්ම ලිංගික සංසර්ගය සඳහා වන තාර්කිකත්ව ප්‍රජනනයෙන් බැහැරව විනෝදය සහ තෘප්තිය සම්බන්ධ සාධකයක් වශයෙන් හඳුනාගැනීම දෙසට සමාජය තුළ ප්‍රවණතාවයක් ගොඩනැගී ඇත. ලිංගික තෘප්තිය සහ ලිංගික හැසිරීම සාමාන්‍යකරණය වීම තුළ පුරුෂ සහ කාන්තා දෙපාර්ශවයම කිසියම් ආකාරයකට ලිංගික දර්ශන පරිභෝජනය තාරුණ්‍යය අනන්‍යතාවක් එසේත් නැතිනම් නව යොවුන්වියේ අවශ්‍යතාවයක් වශයෙන් නිර්වචනය කරනු ලබයි (Bogle, 2008).

ලිංගිකත්වය සහ ලිංගික සබඳතා අවබෝධ කර ගැනීම සහ සාකච්ඡා කිරීම සෑම ආකාරයකින්ම තරුණ තරුණියන්ට වැදගත් වන අතර, බාහිර සමාජයේදී හෝ විධිමත් අධ්‍යාපනය ඔස්සේ පහසුවෙන් ලබා ගත නොහැකි ලිංගිකත්වය පිළිබඳ තොරතුරු සෙවීමට අන්තර්ජාලය ඔවුන්ට ප්‍රවේශය ලබා දෙයි. ලිංගික දර්ශන පරිභෝජනය ඒ අනුව නව ලිංගික අධ්‍යාපනය බවට පත්වෙමින් පවතින බව පර්යේෂණ සොයාගැනීම් ඔස්සේ උපකල්පනය කළහැක.

නූතන විධිමත් ලිංගික අධ්‍යාපනය බොහෝ රටවල සීමා කර ඇති අතර සම්ප්‍රදායිකව ලිංගිකත්වය සහ සබඳතා පිළිබඳ තොරතුරු දේශීය සංස්කෘතික ආයතන හරහා පරම්පරා අතර හුවමාරු වීම මන්දගාමී සහ අවිධිමත් ස්වරූපයක් ගනු ලබයි. විශේෂයෙන්ම සංස්කෘතික වශයෙන් විවේචනයට ලක්වන ලිංගික ප්‍රවේශයන් සහ අනන්‍යතාවයන් සම්බන්ධව පෞද්ගලික මට්ටමින් අවබෝධ කරගැනීමට ලිංගික දර්ශන පරිභෝජනය වැදගත් වන බව අධ්‍යයනය ඔස්සේ පැහැදිලි වේ.

ඓතිහාසික වශයෙන්, සදාචාරාත්මක භීතිකාවන් ලිංගික දර්ශන පරිභෝජනය කෙරෙහි පොදු සමාජය තුළ කේන්ද්‍රගත කර ඇත. සාමාන්‍යයෙන් ලිංගික මාධ්‍යවල බලපෑම පරිභෝජන තත්වයෙන් ඉවත් කිරීම පහසු නැත. ලිංගිකත්වය සම්බන්ධ නව දැනුම ලබාගැනීමේ ප්‍රවේශයක් වශයෙන් ලිංගික දර්ශන පරිභෝජනය වැදගත්වන මානයන් කිහිපයක් අධ්‍යයනය ඔස්සේ පිළිඹිබු වේ. නව ලිංගික දිශානතීන් සහ ප්‍රවනතාවයන් සම්බන්ධව දැනුවත් වීමේ කැමැත්ත සහ ලිංගික අවබෝධය සම්බන්ධව සම වයස් කණ්ඩායම් අතර පවත්නා සාකච්ජාව ප්‍රධාන වශයෙන්ම ලිංගික දර්ශන පරිභෝජනය කෙරෙහි නව යොවුන් ප්‍රජාව සහ තරුණ ප්‍රජාව දිරිගන්වනු ලබයි. විශේෂයෙන්ම ඔවුනොවුන් අතර ලිංගිකත්වය සම්බන්ද අවිධිමත් දැනුම හුවමාරු වීමේදී අත්වන බහිශ්කරණය මගහරවා ගැනීම සඳහා ලිංගික දර්ශන පරිභෝජනය සම්බන්ධව වැඩි ප්‍රවණතාවයක් ගොඩනැගී පවතී. එමෙන්ම ශ්‍රී ලංකාවේ ලිංගික අධ්‍යාපනය ඔස්සේ ආවරණය නොවන සහ දැනුවත්භාවයක් නොලැබෙන බොහෝ සාධක පසුකාලීන ලිංගික චර්යාවන් සඳහා අත්‍යවශ්‍ය වන බව වර්තමාන තාරුණ්‍යය විසින් තර්ක කරනු ලබයි. ලිංගික ඉරියව් සම්බන්ධ අධ්‍යාපනය, ලිංගික අවයව සම්බන්ධ අධ්‍යාපනය, ලිංගික සුරාන්තය සහ පූර්ව ලිංගික චර්යාවන් සම්බන්ධ අධ්‍යාපනය, ලිංගික චර්යාව හා සම්බන්ධ තෘප්තිය සම්බන්ධ ආශය යන කරුණු ප්‍රජනනය සඳහා ලිංගිකව එක්වීම යන අවශ්‍යතාවයෙන් පරිබාහිරව ක්‍රියාකරයි.

මිනිසුන් ලිංගික දර්ශන පරිභෝජනය සම්බන්ධ ගොඩනගනු ලබන ස්ථාවරයන් බොහෝ අවස්ථාවලදී ඉතා පෞද්ගලික ය. ලිංගික දර්ශන පරිභෝජනය සම්බන්ධ හානිය හෝ ප්‍රතිලාභ පිළිබඳ විශ්වාස පද්ධති බොහෝ අවස්ථාවලදී මෙම බලපෑම්කාරී ප්‍රතිචාරවල සාධාරණීකරණයන් ලෙස සංවර්ධනය කර භාවිතා කර ඇත. මෙම බලපෑම්කාරී ප්‍රතික්‍රියා පැන නගින්නේ පුද්ගලික ලිංගික සංවේදනයන්ගෙන් පමණක් නොව, ලිංගිකත්වය සම්බන්ධයෙන් පුද්ගලයාගේ සමාජගත වීමෙනි (Fisher, 1995). ලිංගිකත්වය සහ ලිංගික චර්යාවන් සම්බන්ධව ගොඩනැගෙන උපකල්පනයන් සහ ගැටළු විසඳා ගැනීමේ ප්‍රවේශයක් වශයෙන් පෞද්ගලික මට්ටමින් සිදුවන අධ්‍යාපන කාර්යයක් ලිංගික දර්ශන පරිභෝජනය ඔස්සේ සිදුවේ. විශේෂයෙන්ම අධ්‍යයනය ඔස්සේ හඳුනාගත් ප්‍රධානතම ලිංගික ගැටළු කිහිපයක් වශයෙන්, ලිංගේන්ද්‍රිය සම්බන්ධ ප්‍රමාණය, හැඩය සහ වර්ණය සම්බන්ධ

ගැටළු, ලිංගික එක්වීමේ ක්‍රියාවලිය සම්බන්ධ ගැටළු, ස්වයං වින්දනය, මුඛ සංසර්ගය, සුරාන්තය සහ ශුක්‍ර මෝචනය සම්බන්ධ ගැටළු මෙන්ම සමලිංගික චර්යාවන් සම්බන්ධ ගැටළු සඳහා සාධනීය දැනුමක් ලබාගැනීමට ප්‍රතිචාරිකයන්ට හැකිව තිබුණි. විශේෂයෙන්ම බොහෝ ප්‍රතිචාරිකයන් විරුද්ධ ලිංගික අවයව ප්‍රථමයෙන් දර්ශනය කර තිබුණේ ලිංගික දර්ශන පරිභෝජනය ඔස්සේය. ලිංගික චර්යාවන්ගේ සහ ලිංගිකව එක්වීමේදී කාන්තාව සම්බන්ධ ගොඩනැගෙන දැනුම ලිංගික දර්ශන පරිභෝජනය ඔස්සේ වර්ධනය වූ තවත් සාධනීය තත්වයක් බව අධ්‍යයනය ඔස්සේ හඳුනාගත හැකි විය. විශේෂයෙන් ලිංගික එක්වීමේදී කාන්තාවගේ සක්‍රිය දායකත්වය සහ සහයෝගය සම්බන්ධ දැනුම මේ ඔස්සේ ප්‍රතිචාරිකයන් හඳුනාගෙන තිබුණි.

Perry (2017) දක්වන පරිදි ලිංගික දර්ශන පරිභෝජනය  පිරිමින්ට හෝ කාන්තාවන්ට සහජයෙන්ම හානිකර නොවේ. නමුත් දූලිංගික දර්ශන පරිභෝජනය පුද්ගලයෙකුගේ තේරීම මත පදනම්ව, ලිංගිකත්වය හෝ මිනිසුන් කැමති දේ හෝ  "ක්‍රියා කිරීමට" බලාපොරොත්තු වන්නේ කෙසේද යන්න පිළිබඳ යථාර්ථවාදී නොවන අපේක්ෂාවන් ලිංගික දර්ශන පරිභෝජනය ඕසේ වර්ධනය කර විය හැකිය. ලිංගික දර්ශන පරිභෝජනය ප්‍රමිතිකරණය වියයුතුය යන්න ඒ ඔස්සේ Perry (2017) මතුකරනු ලබන ප්‍රධාන සාධකය වේ.

ලිංගික දර්ශන පරිභෝජනය සම්බන්ධව Zilman & Bryant (1988) සඳහන්  කරන පරිදි ඒ ඔස්සේ නිසැකවම ප්‍රතිලාභ ලබා ගත හැකිය. උපදේශකයින් සමහර විට එය යෝජනා කරන්නේ මිනිසුන්ට හෝ ඔවුන්ගේ සහකරුට තිබිය හැකි විශේෂිත ෆැන්ටසියක් සමඟ සුවපහසු වීමට උපකාර කිරීම සඳහා මගපෙන්වන මාර්ගයක් වශයෙනි. ලිංගික දර්ශන පරිභෝජනය ඔස්සේ යුවළකගේ ඇල්මැරුණු ස්වභාවයෙන් ගතකරන ලිංගික ජීවිතය නැවත ආරම්භ කළ හැකිය. එය නව අදහස් සහ ෆැන්ටසි ලබා දිය හැකිය, නැතහොත් ලිංගික දර්ශන පරිභෝජනය ඔස්සේ ලිංගික ජීවිතය සක්‍රීය කරන දේ සමඟ සම්බන්ධ වීමට උපකාරී වියහැක. මේ කුමන ස්වරූපයෙන් ගත්තද එය අනියම් අධ්‍යාපනයක් වශයෙන් හඳුනාගත හැක. විශේෂයෙන්ම ලිංගික අධ්‍යාපන දුර්වල රාජ්‍යයක ලිංගික අධ්‍යාපනය අනියම් අධ්‍යාපනයක් වීම වළක්වාලිය නොහැක. එසේ වළක්වාලීම තවදුරටත් ලිංගික ගැටළු සහ තෘප්තතාවයේ ගැටළු වර්ධනය කරනවා වියහැක.

ලිංගික දර්ශන පරිභෝජනය ඔස්සේ ලබන අධ්‍යාපනය පුද්ගල බද්ධ වේ. ඒ සියල්ල රඳා පවතින්නේ පරිභෝජනය කරනු ලබන්නා නැරඹීමට තෝරා ගන්නා දේ මතය. ලිංගික දර්ශන පරිභෝජනය සඳහා ඇබ්බැහි වීම විය නොහැක. එය තුළට යොමුවීම ඇතැම්විට කෙනෙකුගේ ජීවිතයේ අසමබර සහ අතෘප්තිකර අවස්ථාවන් මගහැරීමට අවස්ථාව ගොඩනගනවා විය හැකිය. එය පෞර්ෂය වර්ධනයට අවස්ථාවන් ඇතිකරනවා විය හැක (Sun et al., 2016).

ලිංගිකත්වය සහ ලිංගික චර්යාවන් සම්බන්ධ පරිකල්පනයන් නිවැරදි කිරීම, ලිංගික අත්දැකීමකට පෙර අවශ්‍ය කරනු ලබන ඇතැම් සාධනීය තත්වයන් සම්බන්ධව අනියම් අධ්‍යාපනයක් ලැබීම, ආතතිය දුරලීම, වැරදි ලිංගික චර්යාවන්ගෙන් සහ අපාගාමී චර්යාවන්ගෙන් ඉවත් වීම සහ අත්‍යවශ්‍ය ලිංගික දැනුම සම්පාදනය මෙන්ම ලිංගික දර්ශන පරිභෝජනය වර්තමානය වන විට සාමාන්‍යකරණය වූ චර්යාවක් බවට පත්වීම ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් සමාජ ගොඩනැගීම්වලින් කාන්තාවට කිසියම් නිදහස් අවකාශයක් ගොඩනැගීම ඒ අනුව ලිංගික දර්ශන පරිභෝජනය ඔස්සේ අධ්‍යාපන කාර්යය අභිබවමින් සිදුවූ සාධනීය තත්වයන් බව අධ්‍යයනය ඔස්සේ හඳුනාගත හැක.

**නිගමනය**

ලිංගික දර්ශන පරිභෝජනය පිරිමින්ට හෝ කාන්තාවන්ට සහජයෙන්ම හානිකර නොවේ. නමුත් ලිංගික දර්ශන පරිභෝජනය හා සාපේක්ෂව ලිංගික අධ්‍යාපනයක් ගොඩනැගෙන්නේ නොමැතිනම් එම තේරීම මත පදනම්ව යථාර්ථවාදී නොවන අපේක්ෂාවන් වර්ධනය විය හැකිය. එසේ නොවන්නේනම් ලිංගික දර්ශන

පරිභෝජනය නිසැකවම ප්‍රතිලාභ ලබා ගත හැකිබව අධ්‍යයනය ඔස්සේ පැහැදිලි වේ. එය ඇතැම් අවස්ථාවලදී පෞද්ගලික ලිංගික ජීවිතයේ විශේෂිත මනඃකල්පිතයක් සමඟ සුවපහසු වීමට දායකත්වය සපයනු ලබයි. එසේත් නැතිනම් පුද්ගලයෙකුගේ  ලිංගික ජීවිතය නැවත ආරම්භ කිරීමට හෝ ලිංගික තෘප්තිය සම්බන්ධව ආකල්ප යාවත්කාලින කිරීමට පරිසරයක් ගොඩනගනු ලබයි. පර්යේෂණ ප්‍රතිඵල සම්බන්ධව ගැඹුරින් අධ්‍යයනය කිරීම ඔස්සේ පැහැදිලි වන්නේ අධ්‍යාපන කාරකයක් වශයෙන්, දැනුම් කාරකයක් වශයෙන්, විනෝදාස්වාදය සඳහා වන ප්‍රභවයක් වශයෙන් සහ ලිංගික දිශානතීන් සම්බන්ධ මෙහෙයුම් කාරකයක් වශයෙන් ලිංගික දර්ශන කෘත්‍යාත්මක වන බවයි. එමෙන්ම ලිංගික දර්ශන පරිභෝජනය හරහා ගොඩනැගෙන තවත් සාධනීය කරුණු කිහිපයක් මෙසේ සාරාංශ කළහැක. ලිංගිකත්වය සහ ලිංගික චර්යාවන් සම්බන්ධ පරිකල්පනයන් නිවැරදි කිරීම, ලිංගික අත්දැකීමකට පෙර අවශ්‍ය කරනු ලබන ඇතැම් සාධනීය තත්වයන් සම්බන්ධව අනියම් අධ්‍යාපනයක් ලැබීම, ආතතිය දුරලීම, වැරදි ලිංගික චර්යාවන්ගෙන් සහ අපාගාමී චර්යාවන්ගෙන් ඉවත් වීම සහ අත්‍යවශ්‍ය ලිංගික දැනුම සම්පාදනය ඒ අතර වේ. එමෙන්ම ලිංගික දර්ශන පරිභෝජනය වර්තමානය වන විට සාමාන්‍යකරණය වූ චර්යාවක් බවට පත්වීම ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් සමාජ ගොඩනැගිම්වලින් කාන්තාවට කිසියම් නිදහස් අවකාශයක් ගොඩනගනු ලබයි. විශේෂයෙන්ම ලිංගික කාර්යයේදී පුරුෂයාගේ සමස්ත චර්යාවට යටත් වීම වෙනුවට එය පුද්ගලබද්ධ තෘප්තිය අරමුණු කරගත් කාර්යයක් දක්වා පරිණාමය වීම ලිංගික දර්ශන පරිභෝජනය හරහා සිදුවූ තවත් යහපත් වෙනසකි. සමස්තයක් වශයෙන්, බොහෝ විට ලිංගික දර්ශන පරිභෝජනය කරන පිරිස්  ඔවුන්ගේ ලිංගික ජීවිතය පිළිබඳ අඩු තෘප්තියක් වාර්තා කරයි. සැබෑ ජීවිතයේ සහකරුවන් අන්තර්ජාලයේ දකින පරමාදර්ශී රූපවලට අනුව ජීවත් නොවීම, සහකරුට එම දර්ශන ප්‍රතිනිර්මාණය කිරීමට අවශ්‍ය නැතිනම් බලාපොරොත්තු සුන්වීම, දකින ලිංගික නව්‍යතා පරාසය ලබා ගැනීමට නොහැකි වීමෙන් ඇතිවන බලාපොරොත්තු සුන්වීම හේතුවෙන් ලිංගික දර්ශන පරිභෝජනය ලිංගික තෘප්තිය අඩු කළ හැකිය යන්න ප්‍රධාන තර්කයන් අතර වුවද මෑත කාලීන අධ්‍යයනයන් සහ උක්ත අධ්‍යයන ප්‍රතිඵල මත ගොඩනැගෙන සාධකයන් පරස්පර වේ. ඒ ඔස්සේ මතුවන්නේ ලිංගික දර්ශන පරිභෝජනය ගොඩනගනු ලබන අධ්‍යාපනය සහ විනෝදය මානව අවශ්‍යතාවයක් වශයෙන් විශාල කාර්යයක් ඉටුකරනු ලබන බවයි. වඩා වැදගත් වන්නේ ලිංගික දර්ශන පරිභෝජනය වළක්වාලීමට වඩා නිවැරදි සහ ක්‍රමානුකූල සහ යාවත්කාලින ලිංගික අධ්‍යාපනයක් ඔස්සේ ලිංගික දර්ශන පරිභෝජනය ඔස්සේ ගොඩනැගිය හැකි අහිතකර සාධක වේනම් ඒවා පාලනය කරගැනීමේ උත්සාහය වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


Albury K. (2014). Porn and sex education, porn as sex education. *Porn Studies 1*: 172–181.

Antevska A & Gavey N. (2015) Out of sight and out of mind. *Men and Masculinities* 18(5): 605–629.

Attwood F. (2011).  After the paradigm shift: Contemporary pornography research. *Sociological Compass 5*: 13–22.

Bergner, R. M., & Bridges, A. J. (2002). The significance of heavy pornography involvement for romantic partners: Research and clinical implications. Journal of Sex & Marital Therapy, 28(3), 193–206.

Bogle K. (2008) Hooking Up. New York: New York University Press.

Brown, J. D., & L'Engle, K. L. (2009). X-rated: Sexual attitudes and behaviors associated with US early adolescents' exposure to sexually explicit media. *Communication research*, *36*(1), 129-151.

Burtăverde, V., Jonason, P. K., Giosan, C., & Ene, C. (2021). Why Do People Watch Porn? An Evolutionary Perspective on the Reasons for Pornography Consumption. Evolutionary Psychology, 19(2). https://doi.org/10.1177/14747049211028798

Cooper, A. (1998). Sexuality and the Internet: Surfing into the new millennium. *CyberPsychology & Behavior*, 1(2), 181-187.

Dew, B., Brubaker, M., & Hays, D. (2006). From the altar to the internet: Married men and their online sexual behavior. Sexual Addiction & Compulsivity, 13, 195-207.

Dworkin, R. (1981). Is there a right to pornography? *Oxford J. Legal Stud.*, *1*, 177.

Edelman, B. (2009). Markets: Red light states: Who buys online adult entertainment?. *Journal of Economic Perspectives*, *23*(1), 209-20.

FindLaw (2008). U.S. Supreme Court ROTH v. UNITED STATES, 354 U.S. 476 (1957). http://caselaw.lp.findlaw.com/cgi-bin/getcase.pl?court=us&vol=354&invol=476

Flood, M. (2009). The harms of pornography exposure among children and young people. *Child Abuse Review: Journal of the British Association for the Study and Prevention of Child Abuse and Neglect*, *18*(6), 384-400.

Hald, G. M., & Malamuth, N. M. (2008). Self-perceived effects of pornography consumption. Archives of sexual behavior, 37(4), 614–625. https://doi.org/10.1007/s10508-007-9212-1

Lighted Candle Society (2008). *The porn stats: Everything you need to know about the vice that's overwhelming our world—Ugly stats*. http://www.lightedcandle.org/pornstats/stats.asp

Luder, M. T., Pittet, I., Berchtold, A., Akré, C., Michaud, P. A., & Surís, J. C. (2011). Associations between online pornography and sexual behavior among adolescents: Myth or reality? *Archives of sexual behavior*, *40*(5), 1027-1035.

McGlynn, C., & Rackley, E. (2007). Striking a balance: Arguments for the criminal regulation of extreme pornography. *Criminal; Law Review*, 677.

McKee, A. (2012). Pornography as entertainment. *Continuum*, *26*(4), 541-552.

McNair, B. (2013). *Porno? Chic!: How pornography changed the world and made it a better place*. Routledge.

Mitchell, K. J., Finkelhor, D., & Wolak, J. (2003). The exposure of youth to unwanted sexual material on the Internet: A national survey of risk, impact, and prevention. *Youth & Society*, *34*(3), 330-358.

Morris, M., & Anderson, E. (2015). 'Charlie is so cool like': Authenticity, popularity and inclusive masculinity on YouTube. *Sociology*, *49*(6), 1200-1217.

Owens, E. W., Behun, R. J., Manning, J. C., & Reid, R. C. (2012). The impact of Internet pornography on adolescents: A review of the research. *Sexual Addiction & Compulsivity*, *19*(1-2), 99-122.

Perrin, P.C., Madanat, H. N., Barnes, M. D., Carolan, A., Clark, R. B., Ivins, N., et al. (2008). Health education's role in framing pornography as a public health issue: Local and national strategies with international implications. *Promotion & Education*, 15(1), 11-18.

Perry, S. L. (2017). Does viewing pornography reduce marital quality over time? Evidence from longitudinal data. Archives of Sexual behavior, 46, 549-559.

Rosser, B. R., Grey, J. A., Wilkerson, J. M., Iantaffi, A., Brady, S. S., Smolenski, D. J., & Horvath, K. J. (2012). A commentary on the role of sexually explicit media (SEM) in the transmission and prevention of HIV among men who have sex with men (MSM). *AIDS and Behavior*, *16*(6), 1373-1381.

Simon, W., & Gagnon, J. H. (1986). Sexual scripts: Permanence and change. *Archives of sexual behavior*, *15*(2), 97-120.

Sinković, M., Štulhofer, A., & Božić, J. (2013). Revisiting the association between pornography use and risky sexual behaviors: The role of early exposure to pornography and sexual sensation seeking. *Journal of sex research*, *50*(7), 633-641.

Schenk, Casey B., "Pornography as a Leisure Behavior: An Investigation of Pornography Use and Leisure Boredom" (2009). *Theses and Dissertations*. 1976.

Smith, C., Barker, M., & Attwood, F. (2015), Why do people watch porn? In: Comella L, Tarrant S. (eds) *New Views on Pornography*.Praeger: Oxford.

Stebbins, R. A. (2001). Serious leisure. *Society*, *38*(4), 53.

Sun, C., Bridges, A., Johnson, J. A., & Ezzell, M. B. (2016). Pornography and the male sexual script: An analysis of consumption and sexual relations. *Archives of sexual behavior*, 45(4), 983-994.

Treas, J., Lui, J., & Gubernskaya, Z. (2014). Attitudes on marriage and new relationships: Cross-national evidence on the deinstitutionalization of marriage. *Demographic research*, *30*, 1495.

Twohig, M. P., Crosby, J. M., & Cox, J. M. (2009). Viewing Internet pornography: For whom is it problematic, how, and why? Sexual Addiction & Compulsivity, 16(4), 253–266.

Weinberg, M. S., Williams, C. J., Kleiner, S., & Irizarry, Y. (2010). Pornography, normalization, and empowerment. *Archives of sexual behavior*, *39*(6), 1389-1401.

Wignall, L., & McCormack, M. (2017). An exploratory study of a new kink activity: “Pup play”. *Archives of Sexual Behavior, 46*(3), 801-811.

Wilson, C. W. (1973). Pornography: The emergence of a social issue and the beginning of psychological study. *Journal of Social Issues*, 29(3), 7-17.

Wright, P. J., & Randall, A. (2012). Internet pornography exposure and risky sexual behavior among adult males in the United States. Computers in Human Behavior, 28(4), 1410-1416. https://doi.org/10.1016/j.chb.2012.03.003

Ybarra, M. L., & Mitchell, K. J. (2005). Exposure to Internet pornography among children and adolescents: A national survey. CyberPsychology & Behavior, 8(5), 473-486.

Zillman, D. (2000). Influence of unrestrained access to erotica on adolescents’ and young adults’ dispositions towards sexuality. Journal of Adolescent Health, 27, 41-44.

Zillman, D., & Bryant, J. (1988). Pornography's impact on sexual satisfaction. *Journal of Applied Social Psychology*, 18(5), 438-453.

# සමාජ විග්‍රහ

**විමර්ශිත සංග්‍රහය**

**REFEREED JOURNAL**

**පළමු කාණ්ඩය, අටවන වෙළුම - 2022**

**ISSN 2362-0978 (print ISSN)**

**ISSN 2756-925X (e-ISSN)**


ලිපි අංක 02

## යුධ හමුදා වෘත්තීය ක්ෂේත්‍රය තුළ සෙබළියකට ඇතිවන අභියෝග පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්


[2]හිරුනි කළුආරච්චි

https://orcid.org/0000-0003-3148-600X



***ප්‍රධාන සංස්කාරක***

ප්‍රේමකුමාර ද සිල්වා

***සහය සංස්කාරක***

ජගත් බණ්ඩාර පතිරගේ

හිරුනි කළුආරච්චි

***සංස්කාරක උපදේශක මණ්ඩලය***

එස්.ටී.හෙට්ටිගේ (සම්මානිත මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය

කාලිංග ටියුඩර් සිල්වා (සම්මානිත මහාචාර්ය) පේරාදෙණිය විශ්වවිද්‍යාලය

කේ.කරුණාතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) කැලණිය විශ්වවිද්‍යාලය

සරත් අමරසිංහ (සම්මානිත මහාචාර්ය) රුහුණු විශ්වවිද්‍යාලය

යසාංජලී ජයතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

චන්ද්‍රසිරි නිරිඇල්ල (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය

සුභාංගි හේරත් (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය

නිශාර ප්‍රනාන්දු (ආචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය

ෆර්සානා හනීෆා (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය

ඉරේෂා ලක්ෂ්මන්(මහාචාර්ය)කොළඹ විශ්වවිද්‍යාලය

***භාෂා සංස්කරණය***

නාලක ජයසේන

***පරිසැලසුම් නිර්මාණය***

ප්‍රභාත් ගලගමගේ

හිරුනි කළුආරච්චි


[2]බී.ඒ. (කොළඹ), සහකාර කථිකාචාර්ය, සමාජ විද්‍යා අධ්‍යනාංශය, කොළඹ විශ්ව විද්‍යාලය

# සමාජ විග්‍රහ

**විමර්ශිත සංග්‍රහය**
**REFEREED JOURNAL**
**පළමු කාණ්ඩය, අටවන වෙළුම - 2022**
**ISSN 2756-925X (e-ISSN)**
**ISSN 2362-0978 (print ISSN)**

This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License.

දැනුම වෙත ප්‍රවේශ වීමේ සීමා අතික්‍රමණය සඳහා ලොව බොහෝ ශාස්ත්‍රාලයීය ප්‍රකාශන සම්ප්‍රදායික ප්‍රකාශන අයිතිය පිළිබඳ නෛතික ආකෘතියෙන් විකල්ප ආකෘතියක් වන පොදු නිර්මාණ බලපත්‍ර ක්‍රමයට සංක්‍රමණය වී / වෙමින් ඇත. මේ අනුව විචාරාත්මක දැනුමට විවෘත ප්‍රවේශයක් ලබා දීමේ අරමුණින් "සමාජ විග්‍රහ" විමර්ශිත සංග්‍රහය, නිකුත් වන්නේ ඉහත පොදු නිර්මාණ බලපත්‍රය යටතේය.

## ලිපි විමර්ශක මණ්ඩලය

*සම්මානිත මහාචාර්ය සිරි හෙට්ටිගේ, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*මහාචාර්ය ෆර්සානා හනීෆා, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*මහාචාර්ය ඉරේෂා ලක්ෂ්මන්, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*ආචාර්ය ජගත් බණ්ඩාර පතිරගේ, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*ආචාර්ය ගයාත්‍රී විජේසුන්දර, සමාජ විද්‍යා දෙපාර්තුමේන්තුව, රුහුණ විශ්වවිද්‍යාලය*

*ආචාර්ය හේමන්ත කුමාර, සමාජ විද්‍යා දෙපාර්තුමේන්තුව, රුහුණ විශ්වවිද්‍යාලය*

## ප්‍රකාශනය

සමාජ විද්‍යා අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ-03
දුරකථනය/ෆැක්ස්: 011-2500452
විද්‍යුත් තැපැල: samajaviggraha@soc.cmb.ac.lk
වෙබ් අඩවිය: https://arts.cmb.ac.lk/sociology/

**සාරසංක්ෂේපය**

යුධ හමුදව සම්බන්ධව අවධානය යොමු කිරීමේදී තිස් වසරක කුරිරු ත්‍රස්තවාදී යුද්ධයක් හමුවේ යුධ සෙබළාගේ සහ යුධ සෙබළියගේ වෘත්තීය භූමිකාව අමතක කළ නොහැකිය. විශේෂයෙන් එවැනි වාතාවරණයන් හමුවේ පශ්චාත් යුධ සමය තුල ලාංකීය සමාජයේ වැඩි අවධානයක් යොමු කෙරුනේ පුරුෂ හමුද සෙබළ භූමිකාව සම්බන්ධව අධ්‍යයනය කිරීමටයි. ඒ අනුව ස්ත්‍රී හමුද වෘත්තීය භූමිකාව වන සෙබළිය පිළිබඳ ඔවුන් මුහුණ දෙන්නා වූ ගැටළු අභියෝග සම්බන්ධව අවධානය යොමු නොවීමේ රික්තකය පිරවීමේ අදිටනින් ඒ පිළිබඳ මෙසේ සමාජ විද්‍යාත්මකව අධ්‍යයනය කරන ලදී. ලොව ස්ථාපිත නිල හමුදවන් අතර මෙලෙස වෙනම වූ ඒකකයක් ලෙස කාන්තා හමුද බලකායක් ස්ථාපිතව ඇත්තේ ශ්‍රී ලංකාවේ වීමද සුවිශේෂි වේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවී ඒකාකෘති වලට අනුගතව සමාජානුයෝජනය වන කාන්තාව පුරුෂ කේන්ද්‍රීය වෘත්තීය පරිසරයක් වන යුධ හමුද වෘත්තියෙහි නියැලීමේදී මතුවන්නා වූ අභියෝගාත්මක තත්ත්වයන් අධ්‍යයනය කෙරෙහි මෙහිදී අවධානය යොමු ව ඇත. එහිදී හමුද සාමාජිකත්වය, විවාහය සහ පවුල, ලිංගිකත්වය සහ එදිනෙද ජීවිතය යන ක්ෂේත්‍රයන් ඇසුරින් ප්‍රතිචාරික දත්ත විශ්ලේෂණය කර ඇත. ශ්‍රී ලංකා යුධ හමුද කාන්තා බලකායේ බොරැල්ල මූලාස්ථානය කේන්ද්‍ර කරගනිමින් නියැඳි ඒකක 25කින් සමන්විත නියැඳියක් නිලධාරී නිල සහ සෙසු නිල යන කාණ්ඩ ද්විත්වය නියෝජනය වන සේ යොද ගනිමින් අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ජා ක්‍රමය ඔස්සේ අදල දත්ත රැස්කර එම දත්ත තේමා විශ්ලේෂිත ක්‍රමය ඔස්සේ විශ්ලේෂණය කර ඇත. හමුද ස්ත්‍රිය, සිය ස්ත්‍රීත්වය හේතුවෙන් මෙම සන්දර්භය තුළ අභියෝගයන්ට මුහුණ දෙනු ලබයි. විශේෂයෙන් බලය යන සාධකය මත පදනම්ව මෙම නියැඳිය තුළ සිටින වින්දිතයින් බහුතර අභියෝගයන්ට මුහුණ දෙන බව පැහැදිලි වූ අතර විනය බලය, පුරුෂාධිපත්‍ය බලය සහ නිලබලය යන්න එහිදී කැපී පෙනෙන සාධක වේ. නිලබලවාදී පූර්ණ ආයතනයක් වන යුධ හමුදව තුළ සේවය කරන්නන්ට තම ජීවිතය පාලනය කිරීමේ අයිතිය ගිලිහී යන අතර දැඩි විනයානුකූල රාමුවකට හා ආරක්ෂක පද්ධතියකට යටත්ව සිය ජීවිත පාලනය කිරීමේ අයිතිය ආයතනයට පවරා ඇත. මෙවන් තත්ත්වයක් තුළ යුද සෙබළියට සාමාන්‍ය ජීවිතය හා වෘත්තීය ජීවිතය සමපාතව පවත්වා ගෙන යාමේදි සිය අස්මිතාමය අනන්‍යතාවට අභියෝගයන් මතුවන බව මෙම අධ්‍යයනය හරහා අනාවරණය විය. එහිදී "මා" සහ "මම" අතර වන අන්තර්ක්‍රියාවේ ස්වරූපය සහ "සුවිශේෂී අනෙකා" ගේ බලපෑම තුළ වූ අභියෝගාත්මක අවකාශය අධ්‍යයනය හරහා සාකච්ඡාවට ලක් කර ඇත.

**මුඛ්‍ය පද - ස්ත්‍රී පුරුෂ සමාජභාවී ඒකාකෘති, විනය බලය, පුරුෂාධිපත්‍ය බලය, නිල බලය, අස්මිතාමය අනන්‍යතාවය.**

**හැඳින්වීම**

යුධ හමුදාව යන්න හැඳින්වීමේ දී ගොෆ්මන් පවසන පරිදි යුධ හමුදාව යනු සමස්ත ආයතනයකි. ඒ අනුව සමස්ත ආයතනයක් යනු සංවෘත සමාජ පද්ධතියක් වන අතර එහි ජීවිතය දැඩි සම්මතයන්, නීතී රීතී හා උපලේඛන මඟින් සංවිධානය වී ඇති අතර එහි සිදු වන්නේ කුමක්ද යන්න තීරණය කරනු ලබන්නේ නීති රීතී ක්‍රියාත්මක කරනු ලබන කාර්ය මණ්ඩලය විසින් සිදු කරනු ලබන තනි අධිකාරියක් විසිනි. එමෙන්ම මෙම සංවෘත සමාජ පද්ධති තුළට ඇතුළු වීමට හෝ පිට වීමට විශේෂ අවසරයක් අවශ්‍ය වන අතර ඒ තුළ වෙනස් වූ හෝ නව සමාජ භූමිකාවන් වෙත මිනිසුන් නැවත සමාජගත කරනු ලබයි. ඒ අනුව මෙවැනි ලක්ෂණ වලින් සමන්විත සමස්ත ආයතනයක් ලෙස යුධ හමුදාව හඳුන්වනු ලබයි (Goffman,1961). හමුදාව සම්බන්ධව අවධානය යොමු කිරීමේදී අතීතයේ පටන් ලොව බොහෝ රටවල සාම්ප්‍රදායික සටන් ශිල්ප ආශ්‍රයෙන් විවිධ සන්නද්ධ කණ්ඩායම් ගොඩනඟා ගෙන තිබූ නමුත් ඉහත ගොෆ්මන් පෙන්වා දෙන ලක්ෂණයන්ගෙන් සමන්විත හමුදාවක් නිල වශයෙන් ආරම්භ වන්නේ බටහිර රාජ්‍යයන් කේන්ද්‍ර කර ගෙනය. එනම් ප්‍රථමයෙන් ලෝක යුධ සමයේ ඇමරිකා එක්සත් ජනපදය තුළ ආරම්භ වූ අතර පසුව ක්‍රමයෙන් යුරෝපා අධිරාජ්‍යවාදී රටවල ද ආරම්භ විය. මෙලෙස ආරම්භ වූ යුධ හමුදාව ඇසුරින් යටත්විජිත කාල පරිච්ඡේදය තුළ ලන්දේසි, පෘතුගීසී සහ බ්‍රිතාන්‍යන් විසින් විවිධ ආකාර බලකායන් ලාංකීය සන්දර්භය තුළ ස්ථාපිත කළ නමුත් නිල වශයෙන් ලාංකීය හමුදා නිත්‍ය බලකායක් ආරම්භ වූයේ 1949 ඔක්තෝම්බර් 10 වන දිනය. කාලයත් සමඟ එය පුළුල් වෙමින් ත්‍රිවිධ හමුදාවන් බිහි වූ අතර යටත් විජිත කාලපරිච්ඡේදයෙන් බොහෝ කලකට පසු කාන්තාවගේ දායකත්වය හමුදාව කෙරෙහි යොදා ගැනීමට අවධානය යොමු විය. ඒ අනුව 1979 සැප්තැම්බර් 01 වන දින ආරම්භ වන ශ්‍රී ලංකා යුද්ධ හමුදාව කාන්තා බලකාය නිත්‍ය බලඇණි 2කින් සහ ස්වෙච්ඡා බලඇණි 5කින් යුක්ත ව ආරම්භ විය. හමුදාව යන වචනයට බොහෝ අර්ථයන් ඇති අතර කෙටියෙන් එය ආරක්ෂක බලවේග ලෙස අර්ථ දක්වන අතර දැඩි ධූරාවලිගත සංවිධානයක් වන මෙය බාහිර ලෝකය සමඟ ඇත්තේ සංවිධානාත්මක මැදිහත් වීමකි. එහිදී මෙවැනි සන්දර්භයක් තුළ සේවයෙහි නියුක්ත පිරිස ප්‍රධාන කොටස් ද්විත්වයක් යටතේ වර්ගීකරණය කළ හැකිය. එනම් සෙබළුන් සහ සෙබළියන්ය. එහිදී ප්‍රධාන වශයෙන් මෙම පර්යේෂණය ඔස්සේ අවධානය යොමු කරනුයේ සෙබළියන් (women Soldier) පිළිබඳවය. (සෙබළිය යන්න සෙසු නිල සහ නිලධාරී නිල යන ප්‍රධාන කාණ්ඩ ද්විත්වයක් යටතේ වර්ගීකරණය කරනු ලබයි) සෙබළ (Soldier) යන්නනෙහි පොදු අර්ථය බැලූ කල, සොල්දාදුවෙකු යනු තම රජය වෙනුවෙන් ආයුධ රැගෙන සටන් කරන අතර එම ක්‍රියාවලියේදී ජීවිතය පරදුවට තබන පුරුෂයා හෝ ස්ත්‍රියයි (Merriam-Webster, n.d.).

ඒ අනුව සෙබළෙකුගේ වෘත්තීය ස්ත්‍රී භූමිකාව සෙබළිය වන අතර එහිදී සෙබළියකගේ කාර්යභාරය සාම්ප්‍රදායික කාන්තාවකගේ කාර්යභාරයෙන් පැහැදිලිවම වෙනස් වේ.

> "කාන්තාව ගෘහස්ථයට අයත් කාර්යභාරයන් සියල්ලේම නීත්‍යානුකූල වගකීම දරන්නා ලෙස සැලකේ. දරුවන් බිහිකිරීමේත් දරුවන්ට මව්කිරි දී පෝෂණය කිරීමේත් ජීව විද්‍යාත්මක කාර්යභාරය ඇයගේ සමාජ වගකීමේ ප්‍රධාන කාර්ය ලෙස සලකන අතර ඊට අමතරව ආහාර පිළියෙල කිරීම, දරුවන් රැක බලා ගැනීම, ඔවුන්ගේ සියළු අවශ්‍යතා ඉටු කිරීම, සැමියාගේ අවශ්‍යතා ඉටු කිරීම, නිවසේ අනෙකුත් පිරිමින්, වැඩිහිටියන්ගේ අවශ්‍යතා ඉටු කිරීම, ආගන්තුක සත්කාරය, ශුද්ධ පවිත්‍ර කිරීම, රෙදි සේදීම, නිවසේ ජීවත් වන්නන්ගේ පවිත්‍රතාව සොයා බැලීම හා ක්‍රියාකාරී වීම, අලංකරණය ආදී දහසක් කටයුතු වල මූලික වගකීම පැවරෙන්නේ කාන්තාව වෙතය" (හේරත්, 2002, පි. 7-8).

නමුත් ඉහත සඳහන් කාන්තාවගේ කාර්යභාරයට වඩා පැහැලිදිවම වෙනස් වූ කාර්ය කොටසක් යුධ හමුදා සන්දර්භය තුළ සෙබළියකට උරුම වේ. එනම් ඉහත සඳහන් කරන ලද හමුදාවේ කාර්යභාරය සෙබළියකගේ

භූමිකාව තුළට ඇතුළත් වේ. එහිදී සාම්ප්‍රදායික කාන්තාවකගේ කාර්යභාරය හා සෙබළියකගේ කාර්යභාරය යන ද්විත්වයම තුළ නියැලීමට සිදු වීමේදී ඒ තුළ ප්‍රතිවිරෝධතා මතු විය හැකිය. එම ප්‍රතිවිරෝධතා මත විවිධ අභියෝගයන්ට මුහුණ දීමට සිදු වේ. තවද Cynthia Enloe ට අනුව හමුදාවේ මූලික අනන්‍යතාවට ආන්තික ජීවීන් ලෙස කාන්තාවන් නිර්වචනය කරනු ලබයි. (Ferguson, 2001).

ශ්‍රී ලාංකික සමාජානුයෝජන ක්‍රියාවලියේදී සංස්කෘතිය යනු කේන්ද්‍රීය සාධකයකි. ඒ තුළ ස්ත්‍රී භූමිකාව ගොඩ නගනු ලබන්නේ පුරුෂ භූමිකාවට සාපේක්ෂව හාත්පසින් වෙනස් වූ රාමුවක් තුළය. ඒ අනුව කාන්තාවට අනන්‍ය වූ වගකීම්, හැසිරීම්, භූමිකාවන් සහ පුරුෂයින්ට අනන්‍ය වූ වගකීම්, හැසිරීම්, භූමිකාවන් ආදී ලෙස විවිධාංගීකරණයක් දක්නට ලැබේ. එහිදී පුරුෂයින්ට වෙන්වූ සහ කාන්තාවන්ට වෙන්වූ යන පදනමේ සිට සියළු කාර්යය කොටස් බෙදී ඇති අතර ඒ තුළ සිට කටයුතු කිරීමට අදල සංස්කෘතික සන්දර්භය හරහා පුරුෂයා සහ කාන්තාව කුඩා කළ සිට යොමු කරනු ලබයි.

ඒ අනුව දැඩි සංස්කෘතික වපසරියක් තුළ පිහිටි ආසියාතික රටක් ලෙස හැඳින්වෙන ශ්‍රී ලංකාව තුළ කාන්තාව කුඩා කල සිට සමාජානුයෝජනය වන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී ඒකාකෘති රාමුව තුළය. "දකුණු ආසියාතික සමාජය දැඩි පීතෘ මූලික බලධාරීත්වයකින් ක්‍රියාත්මක වන රටාවක් තුළ ශ්‍රී ලංකාවට කුඩා දූපත් රාජ්‍යයක් වශයෙන් එහි බලපෑමෙන් මිදීමට හැකියාවක් නොමැත" (විතාරන,2000).

කොනෙල් ප්‍රකාශ කරන්නේ මිලිටරිය සහ පාලනය මඟින් පුරුෂාධිපත්‍යය පිළිබඳ ඒත්තු ගැන්වෙන ආයතනික සංදර්භයක් සපයන බවයි (Reit, 2017). මෙවන් වාතාවරණයක් යටතේ පුරුෂයන් උදෙසා වෙන් වූ යැයි සම්මත වෘත්තීමය ක්ෂේත්‍රයක් වන හමුද වෘත්තීය තුළ කාන්තාවක් සේවයෙහි නියැලීමේදී ඇයගේ සමාජ හා පවුල් පසුබිම තුළ සමාජානුයෝජන ක්‍රියාවලිය සහ වෘත්තීමය සමාජානුයෝජනය තුළ ඇයට දෝලනය වීමට සිදු වීම මඟින් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත සිදුවන වෙනස තුළ ඇයට විවිධ අභියෝග වලට මුහුණ පෑමට සිදුවෙන අතර එම තත්ත්වය අධ්‍යයනය කිරීමට, ඉහත අධ්‍යයන තේමාව හරහා අවධානය යොමු කර ඇත. මෙම කාන්තා බලකාය නිර්මාණය කිරීමේ මූලික පරමාර්ථය වූයේ දුරකථන ක්‍රියාකරුවන්, පරිගණක ක්‍රියාකරුවන්, හෙදියන්, ලිපිකරුවන් ලෙස හා පිරිමි සෙබළුන්ගේ සහයට යුධ පිටියට මුද හැරීම සඳහායි. පසුව මෑත කාලීනව කාන්තා සෙබළියන් ක්ෂේත්‍ර රාජකාරී සඳහා බඳවා ගන්නා ලදි.

ඒ අනුව මෙලෙස වෘත්තීය භූමිකා වෙනස් වීම හා නව භූමිකා තුළ කටයුතු කිරීමේදී මුහුණපාන්නට සිදු වන අභියෝග පිළිබඳ අවධානය යොමු කිරීම කාලීනව වැදගත් වන අතර වර්තමාන ලෝකයේ හමුද කාන්තා බලකායක් වෙනම ඒකකයක් වශයෙන් ශ්‍රී ලංකා යුධ හමුදව තුළ පමණක් ස්ථාපිතව පවතින අතර එම වාතාවරණය තුළ පුරුෂ කේන්ද්‍රීය වෘත්තීය ක්ෂේත්‍රයක් ලෙස සැලකෙන යුධ හමුදව තුළ වෘත්තීය ස්ත්‍රී භූමිකාව වන සෙබළිය අභියෝගයන්ට ලක් වන්නේද යන්න සොයා බැලීම දේශීය වශයෙන් අත්‍යවශ්‍ය කාරණයක් සේ හඳුනාගත් බැවින්ද, යුධ වැන්දඹු කාන්තාව, සොල්දදුවා, එල්.ටී.ටී.ඊ සෙබළිය පිළිබඳ අවධානය යොමු වී ඇති නමුත් රාජ්‍ය හමුදවන්හි සේවය කරන තිල යුධ හමුද සෙබළිය පිළිබඳ ශ්‍රී ලාංකීය අවධානය යොමු වීමේ රික්තකය පිරවීමේ අරමුණින් මෙම ස්වාධීන නිබන්ධය උදෙසා යුධ හමුද පරිසරය තුළ සෙබළියකට ඇති වන අභියෝග පිළිබඳ අධ්‍යයනය කිරීමට තෝරා ගන්නා ලදි.

මෙහිදී යුද්ධය හා සම්බන්ධ කතාබහකදී විශේෂ අවධානයක් යොමු නොවන තවත් කණ්ඩායමක් ලෙස හමුද සෙබළියන් දැක්විය හැකිය. ත්‍රිවිධ හමුදවන්හි සේවය කරනු ලබන සෙබළ කාන්තාවෝ යුද්ධයක් පවතින අවස්ථාවකදී ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සෙබළ සෙබළියන් යන දෙපිරිසම විසින්ම එක හා සමාන රාජකාරියක් ඉටුකළ යුතු බව සත්‍යයකි. අන් සෑම රැකියාවකම පාහේ කාන්තා පක්ෂය සේවයෙහි යොදවා ගැනීමේදී විශේෂ නීතිරීති හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලබයි. උදහරණයක් ලෙස කාන්තාවන් රාත්‍රියෙහි

සේවයේ යෙදවීම, කාන්තාවන් සඳහා විවේක කාමර සැපයීම ආදී නොයෙකුත් නිතීරීති ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටින සෙබළ කාන්තාවන්ට අදාල වේ දැයි සැලකිය යුතුය. එසේම හමුද සේවයෙහි නිරතවී සිටින කාන්තාවන් හට සේවා ස්ථානය තුළදී විවිධ කායික හා මානසික අතවරයන්ට මුහුණ පෑමට සිදුවන බවද විටින් විට වාර්තා වේ (සිල්වා, 2000). තවද මෙම අධ්‍යයන තේමාව ආශ්‍රිත පසුබිම පිළිබඳ සාකච්ඡා කිරීමේදී, ගෘහස්ථයක් ගත් විට නිෂ්පාදනය හා ප්‍රජනනය වැදගත් සාධක දෙකකි. මෙහිදී සමාජය විසින් නිෂ්පාදනය නොඑසේනම් ඉපැයීම පුරුෂයාට බාරදී ඇති අතර ප්‍රජනනය ස්ත්‍රියට බාරදී ඇත. සමාජ විද්‍යාත්මකව බලන විට ප්‍රජනනය ප්‍රධාන අංශ 3ක් යටතේ කොටස් කරගත හැකිය.

1. දේහ විද්‍යාත්මක ප්‍රජනනය (දරුවන් බිහිකිරීම, කුඩාම කාලයේ රැක බලා ගැනීම ආදිය)

2. පරම්පරාගත ප්‍රජනනය (සමාජානුයෝජනය, අධ්‍යාපනය ලබා දීම)

3. දෛනික ප්‍රජනනය (ගෘහස්ථය තුළ ඉවීම, දර එකතු කිරීම, වතුර ගෙන ඒම, ඇඳුම් සේදීම, ගෙවල් පිරිසිදු කිරීම ආදිය)

මින් නිශ්චිතවම දේහ විද්‍යාත්මක ප්‍රජනනය ස්ත්‍රිය විසින් පමණක් කළ යුතු වුවද සමාජය සිතන්නේ පරම්රාගත ප්‍රජනනය සහ දෛනික ප්‍රජනනය ද ස්ත්‍රිය විසින්ම සිදු කළ යුතු බවයි. නමුත් පුරුෂයින්ටද ඒ කටයුතු කළ හැකි බව බොහෝ දෙනා අමතක කර ඇත (හඳරාගම,2000).

මෙහිදී පැය 24 රාජකාරියෙහි යෙදී සිටින ස්ත්‍රී සෙබළිය මෙම ඉහත දක්වන ලද ප්‍රජනන කාර්යයන් උදෙසා දයකත්වය ලබා දීමේදී තම පවුල, ඒ හා බැඳුනු වගකීම් භූමිකාවන් හා සමගාමීව වෘත්තීය භූමිකාව තුළින් මතුවන අභියෝගයන්ට මුහුණ දීමට සිදුවන බව දක්නට ලැබේ. එසේ නම් ඒ අභියෝග මොනවාද, කාන්තාවක් ලෙස සමාජයෙන් පවරන ලද වගකීම හා වෘත්තීය වගකීම අතර දෝලනය වන්නට සිදු වීම තුළ ඔවුන් මුහුණ දෙන්නා වූ අභියෝග පිළිබඳ, හමුද සාමාජිකත්වය දැරීම සහ එයට අනුගත වීම තුළ ඇතිවන අභියෝග පිළිබඳ සහ සිවිල් ක්‍රියාකාරකම් සම්බන්ධව ඇතිවන අභියෝග ආදිය සම්බන්ධව අධ්‍යයනය කාලීන අවශ්‍යතාවක් ලෙස සලකා ඒ සම්බන්ධව අධ්‍යයනය කිරීමට මෙම ස්වාධීන නිබන්ධන පර්යේෂණය මඟින් අවධානය යොමු කරන්නට කටයුතු කර ඇත.

**පර්යේෂණ ක්‍රමවේදය**

යුධ හමුදව සම්බන්ධව අවධානය යොමු කිරීමේදී තිස් වසරක ත්‍රස්තවාදී යුද්ධයක් හමුවේ යුධ සෙබළාගේ සහ යුධ සෙබළියගේ වෘත්තීය භූමිකාව සුවිශේෂීය. නමුත් පශ්චාත් යුධ සමය තුල ලාංකීය සමාජයේ වැඩි අවධානයක් යොමු කෙරුනේ පුරුෂ සෙබළ භූමිකාව සම්බන්ධව අධ්‍යයනය කිරීමටයි. එහිදී ස්ත්‍රී හමුද වෘත්තීය භූමිකාව වන සෙබළිය පිළිබඳ, ඔවුන් මුහුණ දෙන්නා වූ අභියෝග සම්බන්ධව අවධානය යොමු නොවීමේ රික්තකය පිරවීමේ අදිටනින් ඒ පිළිබඳ මෙම නිබන්ධන තේමාව ඇසුරින් අධ්‍යයනය කරන ලදි. යුධ හමුදව යන්න හැඳින්වීමේ දී ගොෆ්මන් පවසන පරිදි යුධ හමුදව යනු සමස්ත ආයතනයකි. එය සංවෘත සමාජ පද්ධතියකි. (Goffman,1961). මෙම සන්දර්භය තුළ සේවයෙහි නියුක්ත පිරිස ප්‍රධාන කොටස් ද්විත්වයක් වන අතර එනම් සෙබළුන් සහ සෙබළියන්ය. එහිදී ප්‍රධාන වශයෙන් මෙහිදී අවධානය යොමු කරනුයේ සෙබළියන් (women Soldier) පිළිබඳවය. සෙබළෙකුගේ වෘත්තීය ස්ත්‍රී භූමිකාව සෙබළිය වන අතර එහිදී සෙබළියකගේ කාර්යභාරය සාම්ප්‍රදයික කාන්තාවකගේ කාර්යභාරයෙන් පැහැදිලිවම වෙනස් වේ. Hinojos (2010) සහ Whitworth (2008) ට අනුව පුරුෂාධිපත්‍යයේ ආධිපත්‍යය නිරූපණයන් වසර ගණනාවක් තිස්සේ මිලිටරි සංස්කෘතිය පුරා පැතිර ඇත. 1994 දී කොනෙල් පවසන්නේ රණශූරයා තවමත් පුරුෂත්වයේ සංකේතයක් බව දක්වන බවයි. හූපර් 1999 ට අනුව මිලිටරි සේවය යනු පුරුෂාධිපත්‍යයේ උපරිම ප්‍රකාශනයයි (Reit, 2017). මෙලෙස පුරුෂත්වය කේන්ද්‍ර කරගත් වෘත්තීයක් වශයෙන් විවිධාකාරයෙන් නිර්වචනය වන්නා වූ මෙම යුධ

හමුදාව තුළ සේවා නියුක්තියේදී ස්ත්‍රී වෘත්තීය භූමිකාව වන සෙබළියකට, යම් අභියෝගයක් මතුවේද එසේ නම් ඒ අභියෝග මොනවාද යන්න අධ්‍යයනය ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ තවමත් අවධානයට ලක් නොවීම ගැටළුවක් සේ මා හඳුනා ගත් බැවින් ඒ පිළිබඳ අධ්‍යයනය කරලීම සඳහා මා අවධානය යොමු කරන ලද අතරම ඒ සඳහා පුරුෂ කේන්ද්‍රීය වෘත්තීය ක්ෂේත්‍රයක් වන යුධ හමුද සන්දර්භය තුළ සෙබළියකට ඇති වන අභියෝග මොනවාද? යන පර්යේෂණ ගැටළුව නිබන්ධ තේමාව ආශ්‍රිත කේන්ද්‍රීය ගැටළුව වශයෙන් යොද ගන්නා ලදී. යුධමය සංකල්පය කේන්ද්‍ර කරගත් ආයතනික සන්දර්භයක් තුළ කාන්තාවක් වීම පදනම් කරගෙන ඔවුන්ට මුහුණ පෑමට සිදුවූ අභියෝග පිළිබඳ මෙහි ප්‍රධාන අරමුණ ගොඩනගා ඇති අතර එනම්, ස්ත්‍රී පුරුෂ සමාජභාවී ඒකාකෘති දැඩි ලෙස මුල් බැස ගත් පුරුෂාධිපත්‍යයමය සමාජයක එවැනි ඒකාකෘති ඉක්මවා යෑමට උත්සහ කිරීමේදී ස්ත්‍රීන් මුහුණ දෙන අභියෝගකාරී තත්ත්වයන් මොනවාද යන්න අධ්‍යයනය කිරීමයි. මෙම ප්‍රධාන අරමුණ සාක්ෂාත් කරගනු වස් අවධානය යොමු කරනු ලබන උප අරමුණු ද්විත්වයකි. එනම්, පුරුෂ කේන්ද්‍රීය වෘත්තියක් තුළ බලයේ විවිධ ස්වරූපයන් හමුද ස්ත්‍රිය කෙරෙහි අභියෝගාත්මක වාතාවරණයන් නිර්මාණය කෙරෙහි බලපාන ආකාරය අධ්‍යයනය කිරීම සහ වෘත්තීමය නිලබල රාමුව හරහා ගොඩනඟන වෘත්තීමය පෞරුෂය සෙබළ ස්ත්‍රීයගේ අස්මිතාමය අනන්‍යතාවය කෙරෙහි බලපාන ආකාරය අධ්‍යයනය කිරීමයි.

මෙහිදී යොදා ගනු ලබන පර්යේෂණ ක්ෂේත්‍රය වන්නේ ශ්‍රී ලංකා යුධ හමුදාවට අයත් ශ්‍රී ලංකා යුධ හමුද කාන්තා බලකායයි. එහිදී මෙම යුධ හමුද කාන්තා බලකායේ ප්‍රධාන මූලාස්ථානය වන කොළඹ දිස්ත්‍රික්කයේ බොරැල්ල නගරයේ පිහිටා ඇති කාන්තා බලකා මූලස්ථානය යොද ගත් අතර එහිදී සසම්භාවී නොවන නියැදි ක්‍රමය යටතේ කෝටා නියැදීම නොහොත් කොටස් නියැදීම ක්‍රමය භාවිත කිරීමට කටයුතු කර ඇත. එයට හේතුව වන්නේ මා ප්‍රධාන වශයෙන් ස්ථර ද්විත්වයක් ඔස්සේ නියැදිය සකස් කරගැනීමට කටයුතු කළ බැවිනි. එනම් නිලධාරී නිලයන් සහ සෙසු නිලයන් ආශ්‍රයෙනි. (නියැදිය සඳහා පිරිස තෝරා ගැනීමේදී අවධානය යොමු කළ යුතු නිර්ණායක පිළිබඳ මා විසින් කාන්තා බලකායේ ඉහළ නිලධාරීන් දැනුවත් කර ඇත). එමඟින් නියැදිය පක්ෂග්‍රාහී වීම වළක්වා ගත හැකිය. නියැදි ප්‍රමාණය 25ක් වූ අතර නියැදි ඒකක 15ක් සෙසු නිළයන් ආශ්‍රයෙන්ද, ඉතිරි නියැදි ඒකක 10 නිලධාරීන් ආශ්‍රයෙන් සකස් කරන ලදී. නියැදිය සමන්විත වූ ස්ත්‍රී සෙබළ වයස් ප්‍රමාණය නිලධාරී නිල - වයස 35 ත් 40ත් අතර සහ සෙසු නිල - වයස 25ත් 30ත් අතර විය. මෙහිදී ප්‍රාථමික දත්ත රැස් කරනු ලබන්නේ සම්මුඛ සාකච්ජා විධික්‍රමයට අදල තාක්ෂණික ක්‍රමයක් වන අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා ක්‍රමය ආධාරයෙනි. පර්යේෂණ ගැටළුව පිළිබඳ රැස් කරන ලද දත්ත ගුණාත්මක දත්ත වන බැවින් ඒ හා අදල දත්ත විශ්ලේෂණ ක්‍රම කෙරෙහි අවධානය යොමු කරනු ලැබීය. ගුණාත්මක දත්ත විශ්ලේෂණය සඳහා විවිධ වූ ක්‍රම ඇති අතර, මෙහිදී යොදා ගනු ලැබූ ප්‍රධාන ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමය වන්නේ තේමා අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමයයි. ඒ ඔස්සේ මෙම ස්වාධීන පර්යේෂණයේ දත්ත විශ්ලේෂණය කරනු ලැබේ. මෙහි සාරාංශගත කිරීමක් කිරීමක් පහත වගුව තුළ දැක්වේ.

| පර්යේෂණ ක්ෂේත්‍රය | නියැදි ක්‍රමය | නියැදි ප්‍රමාණය | දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා යුධ හමුදාවට අයත් ශ්‍රී ලංකා යුධ හමුද කාන්තා බලකායයි. එහිදී මෙම යුධ හමුද කාන්තා බලකායේ ප්‍රධාන මූලාස්ථානය වන කොළඹ දිස්ත්‍රික්කයේ බොරැල්ල නගරයේ පිහිටා ඇති කාන්තා බලකා මූලස්ථානය | සසම්භාවී නොවන නියැදි ක්‍රමය යටතේ කෝටා නියැදීම නොහොත් කොටස් නියැදීම. එය නිලධාරී නිලයන් සහ සෙසු නිලයන් යන ස්ථර ද්විත්වයෙන් සමන්විතය. | නියැදි ප්‍රමාණය 25කි. එනම් නියැදි ඒකක 15ක් සෙසුනිළයන් ආශ්‍රයෙන්ද, ඉතිරි නියැදි ඒකක 10 නිලධාරීන් ආශ්‍රයෙන් සකස් කරන ලදී. | මෙහි දත්ත ගුණාත්මක දත්ත වන බැවින් මෙම පර්යේෂණය සිදු කරනුයේ ගුණාත්මක පර්යේෂණයක් ලෙසිනි. එහිදී යොදා ගනු ලැබූ ප්‍රධාන ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමය වන්නේ *තේමා අන්තර්ගත විශ්ලේෂණ* ක්‍රමයයි. |

**පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය**

මෙම අධ්‍යයනය හා අදල වන සංකල්ප සහ න්‍යායික පසුබිම පිළිබඳ ජාත්‍යන්තර සහ ලාංකීය සන්දර්භය තුළ සිදු කරන ලද අනෙකුත් පර්යේෂණ ඇසුරින් සාකච්ඡාවට ලක් කිරීමේදී සංකල්පීය රාමුවට අදල වන සංකල්පයන් වශයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවී ඒකාකෘති, පුරුෂාධිපත්‍යය, බලය, වෘත්තීමය පෞරුෂය යන සංකල්පයන් කෙරෙහි අවධානය ලබා දී ඇත. මේ සම්බන්ධ සාහිත්‍ය ඇසුරින් වැඩි දුර විමසීමේදී, Helena Carries (2006) විසින් Gender and the military women in the Armed Forces if western democracies කරන අධ්‍යයනය තුළ නේටෝ රටවල ත්‍රිවිධ හමුදාවන්ට කාන්තාවන්ගේ සහභාගීත්වය පිළිබඳව අවධානය යොමු කරමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවී පරිසරයක් තුළ සෙබළියකට මතුවන අභියෝග පෙන්වා දී ඇත. එහිදී කාන්තා සෙබළියක් රැකියාව හා පවුල ඒකාබද්ධ කිරීමට යාම තුළ පුරුෂ සෙබළෙකුට වඩා දුෂ්කරතා වලට මුහුණපාන බවත් එනම් සදාචාරාත්මක මව (moral mother) හා රණශූර කාන්තාව (warrior woman) යන භූමිකා තුළ දෝලනය වීමට සිදු වීම අභියෝගයක් ලෙස පෙන්වා දී තිබේ (Carries, 2006). මෙහිදී Onra sasson (2003) විසින් Israeli Women Soldiers in Masculine Roles අධ්‍යයනය හරහා පෙන්වා දෙන්නේ සෙබළියන් තනි තනිව ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඉක්මවා ගියත් සාමූහිකව හමුදාවේ හා රජයේ පුරුෂාධිපත්‍යයට යටත්ව සිටින අතර ඒ තුළ සීමිත ආන්තීකරණයකට ලක් වන බවත් ඔවුන්ට ඇතිවන අභියෝග හමුවේ සාමූහික විඥනයක් වර්ධනය නොවන බවත් ඊශ්‍රායල හමුදාවේ ආධිපත්‍යය යුදෙව් සොල්දදුවාගේ පුරුෂාධිපත්‍යය මත ගොඩ නැගී ඇති අතර සෙබළියන්ට සටන් සොල්දදුවන්ට වඩා නිල් කරපටි සොල්දදුවන් පෙන්නුම් කරන ගෘහස්ථ පුරුෂාධිපත්‍යයේ අනුවාදයට යටත් වීමට සිදු වීමද අභියෝගයක් ලෙස අනාවරණය කර ඇත. (Reit, 2017). තවද Joshua J. Jackson (2012) ගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලද අධ්‍යයනයක් හරහා මතු කරනුයේ හමුද වෘත්තීය බලපෑම පුද්ගලයෙකුගේ කල්පවත්නා ලෝක දෘෂ්ටිය කෙරෙහිද බලපවත්වන බවයි. මිතුරන් සහ තම ආදර පාර්ශවයන් සමඟ සහයෝගී සබඳතා පවත්වා ගැනීම වෘත්තීමය පෞරුෂය හේතුවෙන් වඩා අභියෝගකාරී වන බවත් මෙම අධ්‍යයනයෙන් හෙළි වී ඇත. මිතුරන් සහ තම ආදර පාර්ශවයන් සමඟ සහයෝගී සබඳතා පවත්වා ගැනීම වෘත්තීමය පෞරුෂය හේතුවෙන් වඩා අභියෝගකාරී වන බවත් මෙම අධ්‍යයනයෙන් හෙළි වී ඇත. (Jackson et. al., 2012). විශේෂයෙන් Urgiles

(2015) විසින් සිදු කරන ලද Harresment of women in the Military by Male Military යන අධ්‍යයනය හරහා සාකච්ඡා කරනුයේ මිලිටරි පුරුෂයින් මඟින් ස්ත්‍රී සෙබළිය කෙරෙහි වාචික සහ ශාරීරිකව ලිංගික හිරිහැර සිදු වන බවයි. එම තත්ත්වයන්ට හේතුවී ඇත්තේ හමුදාව යනු විශාල වශයෙන් පුරුෂාධිපත්‍යය සහිත ආයතනයක් වීම බව පෙන්වා දෙන අතරම එය බලයේ ස්වරූපයක් වශයෙන් ක්‍රියාත්මක වන පෙන්වා දෙනු ලබයි (Urgiles, 2015).

**ප්‍රතිඵල සහ  සාකච්ඡාව**

මෙම පර්යේෂණයෙහි විශ්ලේෂණය පරිච්ඡේදයන් ද්විත්වයක් ඇසුරින් සිදු කර ඇති අතර එනම්, හමුදා සේවය සහ ස්ත්‍රීත්වය - ගැටලු සහ අභියෝග සහ හමුද සාමාජිකත්වය, ස්ත්‍රීත්වය සහ එදිනෙද ජීවිතය -ගැටලු සහ අභියෝග යන්නයි. හමුද සේවය සහ ස්ත්‍රීත්වය ඇසුරින් අනාවරණය වූයේ සෙබළියට තමන්ගේ වෘත්තීය කාර්යභාරය සහ ස්ත්‍රියක් වීම හේතුවෙන් සිවිල් සමාජයේ බල පැවැත්වෙන අධිපති පුරුෂාධිපත්‍යය බලයට යටත් වීමට සිදුවන බවයි. විශේෂයෙන් මවක්, බිරිඳක් සහ ලේලියක් වශයෙන් එම භූමිකාවන්හි කාර්යභාරය තුළදී මෙසේ අභියෝග මතුවන්නේ පුරුෂාධිපත්‍යය අධිපති බලයට නතු වීමේ අවකාශය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවී ඒකාකෘති කේන්ද්‍ර කරගනිමින් ගොඩනගන සමාජ සම්මතයන් හේතුවෙන් නිසා බව පැහැදිලිය. සාම්ප්‍රදයික ස්ත්‍රී පුරුෂ සමාජභාවී කතිකාවෙන් ඔබ්බට ගොස් පුරුෂ කේන්ද්‍රීය වෘත්තියක් තුළට මෙම සෙබළියන් ඇතුළත් වූ නමුත් වෘත්තියෙන් පිටත පරිසරය තුළත් පිතෘ මූලිකත්වය, පුරුෂ බලය මත රැකියාවෙන් ඉවත් වීමට පවා ඇයට මානසික වශයෙන් බලපෑමක් සිදු වීම මෙන්ම සෙබළියන්ට තම සැමියාගේ ක්‍රියාකලාපය තුළ අභියෝගයන් මතු වී ඇති බවත් ඔවුන්ගේ අදහස් තුළින් දැකගත හැකි විය. එමෙන්ම මාතෘත්වය සාම්ප්‍රදයිකව කාන්තාවකගේ අත්‍යවශ්‍යය භූමිකාවක් බවට පත් වීම තුළ විශේෂයෙන් සැමියාගේ දෙමාපියන්ගෙන් මෙම සෙබළියන් එම භූමිකාව තුළ පූර්ණ කාලීනව යෙදවීමට බලපෑම් සිදු වී ඇති බවද ඔවුන්ගේ ප්‍රතිචාර හමුවේ පැහැදිලි වූ කාරණයක් ලෙස හැඳින්විය හැකිය. ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන්නෙන් අදහස් කරනුයේ ලිංගිකත්වය හා බැඳි සංස්කෘතික අර්ථයන්ය. ඒ තුළ පුරුෂාධිපත්‍යය සහ ස්ත්‍රීත්වය සමාජීය වශයෙන් ගොඩ නගනු ලබයි. එය සංස්කෘතියෙන් සංස්කෘතියට වෙනස් වීමටද ඉඩ ඇත, නිදසුන් ලෙස විද්‍යාව හා තාක්ෂණය පාලනය කරනු ලබන්නේ පිරිමින් වන අතරම හමුදාව ඇතුළු බොහෝ විශාල ආයතන පාලනය කරන්නේ පිරිමින් විසිනි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනු අප අත ඇති දෙයක් නොව එය අප විසින් නිපදවන දෙයකි. මෙම ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගනිමින් ලිංගික වෙනස්කම් මත ස්ත්‍රීන් හා පුරුෂයින් ඒකාකෘති භූමිකාවන්ට වෙන් කරනු ලබයි (Fasting & Sand, 2010).

> "ඒසේ ඒකාකෘති වෙන් කිරීම තුළ පුරුෂයින්ට වෙන්වූ රැකියාවක් වන යුධ හමුදාව තුළ කාන්තාවක් සේවය කිරීමම එම කාන්තාවන් ස්ත්‍රී පුරුෂ සමාජභාවයෙන් ඔබ්බට යාමට ගත් එක් උත්සහයක් ලෙස අර්ථ දක්විය හැකිය. නමුත් අධිපති කතිකාව තුළ පවතින කාන්තාවන්ට වෙන්වූ යැයි සැලකෙන භූමිකාවන් වන මව, බිරිඳ, දියණිය සහ ලේලි යන භූමිකාද ඉටු කිරීමටද ඇය බැඳී සිටින බව මෙම ප්‍රතිචාරික අදහස් මත තව දුරටත් පැහැදිලි විය. එයට හේතුව තවමත් අප සමාජයේ පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවීය කතිකාව විසින් ගොඩ නඟන ලද කාන්තා පරමාදර්ශයන් සහ පුරුෂ බලය, සමාජයේ අධිපති කතිකාව තුළ ක්‍රියාත්මක වීම නිසාය. හේරත් (2002) විසින් පෙන්වන පරිදි "වැඩ සහ කාන්තා ජීවිතය අතර විශාල පරතරයක් ඇත්තේ නැත. කාන්තාවක් වශයෙන් උපත ලැබීමත් සමඟ ගෘහස්ථය හා සම්බන්ධ විශාල වැඩ කොටසක් ඇය වෙත පැවරේ" (පි. 01).

මෙම අදහස තුළින් ප්‍රතිචාරික අදහස් පිළිබඳ වඩාත් පැහැදිලි අවබෝධයක් ලබා ගත හැකි අතර එනම් පුරුෂ කේන්ද්‍රීය වෘත්තියකට ඇය ස්ත්‍රී පුරුෂ සමාජභාවී ඒකාකෘති අභිබවමින් යොමු වූ නමුත් කාන්තාවක් ලෙස

ඉපදීම තුළ සංස්කෘතියෙන් පිරිනමන භූමිකාවන්හි කාර්යයන් කිරීමට සිදු වී ඇත. විශේෂයෙන් පැය 24 අනිවාර්ය රාජකාරින්හි නියැලෙන සෙබළියන් ලෙසත් දින 23කට වරක් නිවාඩු ලැබෙන පිරිසක් ලෙසත් මෙන්ම හදිසි කැඳවීම් වලදී නිවාඩු නොතකා කටයුතු කිරීමට සිදුවන පිරිසක් ලෙසත්, මෙලෙස ස්ත්‍රියක් වශයෙන් අනිවාර්යෙන් හිමිවන භූමිකාවන්හි නියැලීම ඔවුන්ට සැබැවින්ම අභියෝගාත්මකය. මන්දයත් එහිදී භූමිකාවන් අතර උභතෝකෝටිකයක් උද්ගත වන හෙයිනි. සිවිල් භූමිකා අතරත් වෘත්තීය භූමිකා අතරත් එම ඝට්ටනය ඇති වේ.

තවද සමලිංගිකත්වය සමාජයෙන් බැහැර කරන ලද ප්‍රතික්ෂේපිත චර්යාවක් යන මතවාදය පුරුෂ කේන්ද්‍රීය වෘත්තීය පරිසරය තුළත් සාමාන්‍යකරණය වී ඇති අතර හමුදා ස්ත්‍රිය විසින්ම එය තවදුරටත් සාධාරණීකරණය කරමින් සමලිංගිකත්වය යනු සමාජයෙන් බැහැර කළ යුතු පාලනය කළ යුතු ක්‍රියාවක් බව පෙන්වා දෙනු ලබයි. එනම් ප්‍රධාන සමාජ පද්ධතියේ අධිපති කතිකාවතින් ඔබ්බට යාම සඳහා එහිම ප්‍රධාන සංස්ථාවක් වශයෙන් පවතින හමුදාව තුළ ඉඩ ලැබුනහොත් එහි පාලනය, විනය ගිලිහී යාමට අවකාශය ඇතැයි යන යටි අදහස තුළ සමලිංගික ක්‍රියාවන් පාලනය කිරීමට ඔවුන් යොමු වේ. විශේෂයෙන් ප්‍රතිචාරිකයන්ගේ දත්ත මත පැහැදිලිවම පෙනී යන කාරණය නම් සමලිංගිකත්වය යනු සදාචාර සම්පන්න නොවන ක්‍රියාවක් ලෙස හමුදාව තුළ අර්ථ ගන්වනු ලබන බවයි. එමෙන්ම ඒ තුළ විෂම ලිංගිකත්වය එනම් පුරුෂයෙකු සහ කාන්තාවක් අතරට සීමා වූ ලිංගිකත්වය සම්මත ක්‍රමය ලෙසත් පිළිගන්නා බව පැහැදිලි වේ. ඇතැම් සෙබළියන් පැවසුවේ ඉහත පෙන්වා දුන් පරිදි සමලිංගිකයින් යුද හමුදාව තුළදී ලේබල් වීමක් සිදු වන අතරම ඇතැමුන් ලේබල් වීම නිසාම එයට යොමු වන පිරිස්ද සිටින බවයි. තවද එය අස්වභාවික ක්‍රියාවක් යැයි හමුදා සමාජය තුළ හඳුන්වනු ලබයි. එසේ හමුදා සමාජය තුළ එවැනි මතවාදයක් ගොඩ නැගීම සම්බන්ධව අවධානය යොමු කිරීමේදී පිටත ප්‍රධාන සමාජයේ බලපෑම් ඒ තුළ ඇති බව පැහැදිලිය. මෙම අදහස් තුළ පැහැදිලි වන්නේ ශ්‍රී ලංකා සමාජය තුළ කාන්තාවන් අතර පවතින සමලිංගිකත්වය සමාජයෙන් බැහැර කරන ලද ප්‍රතික්ෂේපිත චර්යාවක් බවට පත් වීමට ප්‍රධානතම හේතුව වන්නේ පරමාදර්ශී කාන්තාව පිළිබඳ සංස්කෘතිකමය වශයෙන් සමාජය තුළ ගොඩනැගී තිබෙන ආකෘතිය බවයි. එම ආකෘතිය නිර්වචනය කරනු ලබන්නේ පුරුෂයන් විසින් වන අතර එම මතවාදය පුරුෂ කේන්ද්‍රීය වෘත්තීය පරිසරය තුළත් සාමාන්‍යකරණය වී ඇති අතර හමුදා ස්ත්‍රිය විසින්ම එය තවදුරටත් සාධාරණීකරණය කරමින් සමලිංගිකත්වය යනු සමාජයෙන් බැහැර කළ යුතු පාලනය කළ යුතු ක්‍රියාවක් බව පෙන්වා දෙනු ලබයි. විශේෂයෙන් නිලධාරී නිලයන් හරහා සෑම විටම උත්සහ දරනු ලබන්නේ හමුදාවේ පැවැත්ම උදෙසා සමලිංගික ක්‍රියාවන් පාලනය කිරීමට වන අතර එය එම නිලයන් අතර දක්නට ලැබෙන ප්‍රධානතම අභියෝගයයි. මෙහිදී පැහැදිලි වන්නේ පුරුෂ මූලික සමාජයක්, වෘත්තියක් වන යුධ හමුදාව තුළත් පුරුෂ මුලික අධිපති කතිකාව බලපැවැත්වෙන අතර ඒ තුළ සමලිංගිකත්වය පාලනයකට ලක්වන බවයි. මන්ද යත් සාම්ප්‍රදායික කාන්තා භූමිකාවෙන් ඔබ්බට සමලිංගිකත්වය විහිදෙන බැවින් වන අතරම ඒ තුළ පිළිගත් විෂම ලිංගික ධාරාව අභිබවන බැවිනි. එමෙන්ම පුළුල් සමාජ කතිකාවතක් ලෙස ගොඩ නැගුනු විෂම ලිංගික කතිකාව තුළ ක්‍රියාත්මක වන පුරුෂාධිපත්‍යය බලය හමුදාව තුළ සෙබළිය හරහා ද මතු වන බව, එය සමලිංගිකත්වය පාලනයට දරන උත්සහය තුළ කැපී පෙනේ. මෙම අදහස් තුළ පැහැදිලි වන්නේ ශ්‍රී ලංකා සමාජය තුළ කාන්තාවන් අතර පවතින සමලිංගිකත්වය සමාජයෙන් බැහැර කරන ලද ප්‍රතික්ෂේපිත චර්යාවක් බවට පත් වීමට ප්‍රධානතම හේතුව වන්නේ පරමාදර්ශී කාන්තාව පිළිබඳ සංස්කෘතිකමය වශයෙන් සමාජය තුළ ගොඩනැගී තිබෙන ආකෘතිය බවයි. එම ආකෘතිය නිර්වචනය කරනු ලබන්නේ පුරුෂයන් විසින් වන අතර එම මතවාදය පුරුෂ කේන්ද්‍රීය වෘත්තීය පරිසරය තුළත් සාමාන්‍යකරණය වී ඇති අතර හමුදා ස්ත්‍රිය විසින්ම එය තවදුරටත් සාධාරණීකරණය කරමින් සමලිංගිකත්වය යනු සමාජයෙන් බැහැර කළ යුතු පාලනය කළ යුතු ක්‍රියාවක් බව පෙන්වා දෙනු ලබයි. විශේෂයෙන් නිලධාරී නිලයන් හරහා සෑම විටම උත්සහ දරනු ලබන්නේ හමුදාවේ පැවැත්ම උදෙසා සමලිංගික ක්‍රියාවන් පාලනය කිරීමට වන අතර එය එම නිලයන් අතර දක්නට ලැබෙන ප්‍රධානතම අභියෝගයයි. එනම් ප්‍රධාන සමාජ පද්ධතියේ අධිපති

කතිකාවතින් ඔබ්බට යාම සඳහා එහිම ප්‍රධාන සංස්ථාවක් වශයෙන් පවතින හමුදාව තුළ ඉඩ ලැබුනහොත් එහි පාලනය, විනය ගිලිහී යාමට අවකාශය ඇතැයි යන යටි අදහස තුළ සමලිංගික ක්‍රියාවන් පාලනය කිරීමට ඔවුන් යොමු වේ. මෙම පාලන ක්‍රියාවලියේදී රැකියාවෙන් ඉවත් කිරීම්, දඬුවම් ලබා දීම්, දැඩි විනය හා සම්බන්ධ ක්‍රියාමාර්ග වලට යොමු වීම් සහ පුද්ගලයාගේ බාහිර ස්වරූපය පවා වෙනස් කිරීමට මෙම නිලයන්ට සිදු වන බව ඔවුන් පවසන ලද අතර එය ඔවුන්ට ඇති වන්නා වූ ප්‍රධානතම අභියෝගයයි. එනම් තම වෘත්තීය පෞරුෂයේ (මා යන අංශය) පැවැත්ම උදෙසා තම ස්වභාවික අනන්‍යතාවය (මම යන අංශය) අභියෝගයට ලක් වේ.

එපමණක් නොව යුධ සෙබළිය ලිංගික අභියෝග වලට ගොදුරු වීමට ස්ත්‍රිය පිළිබඳ ගොඩ නැගී ඇති ඒකාකෘති සහ පුරුෂාධිපත්‍යය බලය බලපානු ලබන බව හෙළි විය. තවද ලිංගික හිරිහැර තුළ ස්ත්‍රී සමලිංගික වශයෙන් ඇති වන ලිංගික හිරිහැර ද අභියෝගයක් වශයෙන් පෙන්වා දුන් අතර එනමුත් ඒ තුළ පිරිමි ලිංගික හිරිහැර වලට වඩා සමලිංගික හිරිහැර පීඩනයක් බව සඳහන් කරන ලදි. ලිංගික හිරිහැර තේරුම් ගැනීමට තිබෙන යතුර වන්නේ බලය අනිසි ලෙස භාවිතා කිරීමයි (Boland,2005). බෝලන්ඩ් පැහැදිලිව පවසන්නේ බලය යන සාධකය හරහා ලිංගික හිරිහැර ක්‍රියාත්මක වන බවයි. ඒ තුළ පැහැලිදිව අපට දක්නට ලැබෙන බල සාධකයක් නම් නිලබල ව්‍යුහය හරහා ක්‍රියාත්මක වන පුරුෂාධිපත්‍යය බලයයි. ඉහළ නිලධාරීන් විසින් තම අධිකාරීමය බලය හරහා පුරුෂාධිපත්‍යය විදහා පාමින් ලිංගික හිරිහැර සිදු කිරීමට යොමු වන බව ප්‍රතිචාරික අදහස් මත පැහැදිලි වේ. ඒ අනුව බල සබඳතා වල පවතින්නා වූ අසමානතාවය මත මෙසේ යුධ සෙබළිය ලිංගික හිරිහැර වල ගොදුරු බවට පත් වේ. මැක්ස් වේබර්ට අනුව නිලබලවාදයේ ලක්ෂණයක් ලෙස අධිකාරියේ ධූරාවලිය දැකගත හැකි අතර ඒ අනුව ඉහළ සිට පහළට බලය ගලා ගෙන යන හමුදාව නම් වූ නිලබල සංවිධානය තුළ බල අසමානතාව හේතුවෙන් සෙබළිය ලිංගික හිරිහැර හරහා අභියෝගයන්ට ලක් වීම ප්‍රබල සාධකයක් බව කිව හැකිය.

දෙවන පරිච්ඡේදය තුළදී අනාවරණය වූයේ හමුද සාමාජිකත්වයට සමාජානුයෝජනයේදී තම ස්වීයත්වය බිඳ වැටෙන අතර පෞද්ගලිකත්වය පැහැර ගැනීම, අනන්‍යතාවය බිඳ වැටීම සිදු වන බවත් ඔවුන්ට අනුව සෙබළියක් යනු පුරුෂයෙකු මෙන් සිවිල් සමාජය තුළ හඳුනා ගැනීම තුළ අනන්‍යතාවය බිඳ වැටීමකට ලක්වන බවත් මවක්, දියණියක් යන භූමිකාවන් පැහැර ගැනීමක් වෙන බවත් පෙන්වා දෙමින් ඔවුන්ගේ අභියෝගාත්මක පැතිකඩ අවධාරණය කරනු ලබයි. එසේ වන්නේ මෙම හමුද සමාජය තුළ පවතින්නා වූ අන්තර්ක්‍රියා පදනම් කරගෙන ගොඩනැගෙන්නා වූ ව්‍යුහය මඟිනි.

"යුධ හමුද වෘත්තිය තුළ "චරිත ගොඩනැංවීම", පහත් කොට සැලකීම සහ ශක්තිය, විඳදරා ගැනීම සහ දැඩි බව යන අර්ථයන් සමඟ සැබෑ මිනිසෙකු/කාන්තාවක බවට පත් කරනු ලබයි. මිලිටරි පුහුණුව මඟින් පුරුෂ අනන්‍යතාවයන් ගොඩනැගීමට අවශ්‍ය සංකේතාත්මක සම්පත් සපයනු ලබයි" (Scott, 2011). මෙම නිර්වචනය හරහා පෙන්වා දෙන ප්‍රධාන සාධකය වන චරිත ගොඩනැංවීම එනම් ප්‍රධාන සිවිල් සමාජයෙන් පරිබාහිරව හමුද සමාජය තුළ වෙනස් අනන්‍යතාවන් සහිත චරිතයක් ගොඩ නංවන බවයි. ප්‍රතිචාරික අදහස් හරහාද පැහැදිලි වූයේ මෙම කාරණයම වන අතර ඒ තුළ පුරුෂ අනන්‍යතාවන් සෙබළියන් තුළද පිහිටුවීම ඔවුන්ට අභියෝගයන් බව ඔවුන් පවසන ලදි. එලෙස පුරුෂ මූලධර්ම සහිත අනන්‍යතාවක් හමුද ස්ත්‍රියක් තුළ ගොඩනැගීමේදී ඇයගේ සිවිල් භූමිකාමය අනන්‍යතාවය සහ අස්මිතාමය අනන්‍යතාවය අභියෝගයට ලක් වේ. මෙහිදී සෙබළියන්ගේ ප්‍රතිචාර වලට අනුව ඇතැම් විට ඔවුන්ට මානසික වශයෙන් අභියෝග ඇති වන අතර එයට හේතුව ලෙස ඔවුන් විසින් පෙන්වා දෙනු ලැබුවේ හුදෙකලාව එයට බලපාන බවයි. එනම් සියළු දෙනා සමඟ පරතරයක් පවත්වා ගෙන යා යුතු හෙයින් හුදෙකලාභාවය ඇති වන බව පෙන්වා දෙනු ලබයි. පවුල තුළ මෙන් කිසිවෙකු සමඟ සමීපත්වයක් වර්ධනය කරගත නොහැකි අතර ඒ තුළ දුක් සහිත අවස්ථාවක් වූවද සඟවා ජීවත් වීමට මෙම හමුද සමාජයේ සාමාජිකයෙකු වශයෙන් සිදු වීම තුළ අභියෝගාත්මක

වාතාවරණයක් නිර්මාණය වන බවයි. ඒ අනුව යුධ හමුදාව යන පූර්ණ ආයතනය තුළ සෙබළියගේ අනන්‍යතාවය බිඳ වැටෙන්නේ සහ පෞද්ගලිකත්වය පැහැර ගැනීම මෙන්ම ස්වීයත්වය නිග්‍රහයට ලක් වන්නේ පුරුෂ අනන්‍යතා ඔවුන් තුළ ගොඩ නැගීම නිසාවෙන් වන අතර සිවිල් සමාජ ස්ත්‍රියකගේ අනන්‍යතා, භූමිකාවන් සහ අවස්ථාවන් සෙබළියට හමුද සාමාජිකත්වයට අනුගත වීම තුළ අහිමි වී යනු ලබයි. මෙහිදී ආයතනගතකරණය තුළම පමණක් අභියෝග මතුනොවන අතර ඒ තුළ බලපැවැත්වෙන අධිපති කතිකාව ද එයට හේතුවන බව පෙන්විය හැකිය. මන්ද යත් හමුදාව තුළ බලපැවැත්වෙන පුරුෂාධිපත්‍යය බලය මුල් කරගත් අධිපති කතිකාව හරහා එහි සාමාජිකයින් පුහුණු කිරීම, මෙහෙය වීම සිදු වන අතර එය පුරුෂ සෙබළ භූමිකාවන්ට වඩා ස්ත්‍රී සෙබළ භූමිකාවන්ට අභියෝගාත්මක බව ප්‍රතිචාරික අදහස් මත පැහැදිලි වේ.

සෙබළියන්ගේ ප්‍රතිචාර මත හෙළි වූ ආකාරයට හමුද අනන්‍යතාව පවත්වා ගෙන යා හැකි පරිදි ඔවුන්ගේ සිවිල් ජීවිතය තුළදීත් විලාසිතා හා රූපලාවණ්‍යය කටයුතු වල නියැලීමට සිදුව ඇත. ඒ තුළ හමුද සෙබළියක්ය යන භූමිකාවට හානියක් හෝ අපකීර්තියක් සිදු නොවිය යුතු අතර විලාසිතා ආශ්‍රයෙන් අන්තර් සම්බන්ධතා ගොඩ නැගීමේදී ද හමුද අනන්‍යතාවය ඉස්මතු විය යුතු බවත් එම සාධකය අභියෝගයක් වශයෙන් මොවුන් හඳුන්වනු ලබයි. ඒ තුළ තමන්ගේ සියළු විලාසිතාවන් හරහා සෙබළියක් යන සමාජ වෘත්තීමය තත්ත්වය නිරූපණය විය යුතුවේ. පෞද්ගලික රුචිකත්වයට අනුව තීරණ ගැනීමේදී හමුද සාමාජිකත්වය බලපෑම අභියෝගාත්මක වශයෙන් පෙන්වා දෙනු ලබයි. විශේෂයෙන් යුධ හමුදාව හරහා ගොඩනගන පුරුෂ අනන්‍යතා තුළ මෙවැනි රූපලාවණ්‍යය හෝ විලාසිතා වැනි දේ සඳහා යොමු වීම ප්‍රතික්ෂේපිත ක්‍රියාවක් වන අතර සෙබළාට වඩා ඒ තුළ සෙබළිය අභියෝගයන්ට මුහුණ දෙන බව පෙනී යයි. සිවිල් සමාජ ස්ත්‍රියක් මෙන් සෙබළියට මෙවැනි දේ සඳහා යොමු වීමේ අවකාශය අහිමි වන්නේ පුරුෂ කේන්ද්‍රීය සමාජයක සාමාජිකයෙකු මෙන්ම ඒ තුළ පුරුෂාධිපත්‍යය බලය හරහා ගොඩ නගන පුරුෂ අනන්‍යතාවන් ආරෝපණය වීම තුළ බව පැහැදිලිය. එමගින් අභියෝගාත්මක වාතාවරණයක් මතු වෙනු ලැබේ. ඒ අනුව පැහැදිලි වන්නේ හමුදාවක් තුළ වෙනම අනන්‍යතාවක් සහිත පුද්ගලයෙකු බිහි කරන බවත් සෙබළියගේ දෘෂ්ටිකෝණය තුළින් පුරුෂ අනන්‍යතා සහිත කාන්තාවක් ගොඩ නැගීම ඒ තුළ සිදු වේ. එය ඔවුන්ගේ ජීවිතයට අභියෝගාත්මකය.

**නිගමනය**

කොනෙල් අර්ථ දක්වන පරිදි හෙජමොනික් පුරුෂාධිපත්‍යය නැතහොත් ආධිපත්‍යය පුරුෂාධිපත්‍යය යනු සමාජ ඓතිහාසික සම්බන්ධතා වලදී කාන්තාව කෙරෙහි බලපැවැත්වෙන බලයයි. නිදසුන් වශයෙන් හමුදාව වැනි ආයතන වල මෙය දක්නට ලැබේ (Holmgren,n.d.). මෙසේ අර්ථ දැක්වෙන ආධිපත්‍ය පුරුෂාධිපත්‍යය මෙම යුධ සෙබළිය මුහුණ දෙන්නා වූ අභියෝගයන් සමග බැඳී පවතින බව කිව හැකිය. විශේෂයෙන් පුරුෂ කේන්ද්‍රීය වෘත්තියක් වන හමුදාව තුළින් බලාපොරොත්තු වන්නේ පුරුෂ අනන්‍යතා සහිත සාමාජිකයින් වන අතර ඒ සඳහා පුරුෂාධිපත්‍යය බලය සෙබළිය මත ක්‍රියාත්මක කරමින් එම සමාජය තුළ එවැනි අනන්‍යතාවන්ගෙන් සමන්විත පිරිසක් ගොඩනැගීම මගින් හමුද ස්ත්‍රිය සතු ස්ත්‍රීත්වය අභියෝගයට ලක් කරනු ලබයි. එහිදී පෙනී යන්නේ එතෙක් සිවිල් සමාජයේ ස්ත්‍රිය තුළ ගොඩනගන ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවී ඒකාකෘතින් යුධ හමුද සන්දර්භය තුළදී එම නීති පද්ධතිය සහ නිලබල පද්ධතිය හරහා යම් මට්ටමකට බිඳ දමනු ලබන බවයි. මෙහිදී පැහැදිලිවම එකම වෘත්තියක් තුළ සෙබළා සහ සෙබළිය යන භූමිකා ද්විත්වයම නියැළුනද පුරුෂ සෙබළ භූමිකාවට සාපේක්ෂව ස්ත්‍රී සෙබළ භූමිකාව අභියෝගයන්ට මුහුණ පානු ලබයි. මන්දයත් පුරුෂ ඒකාකෘති රැකියාවක ඇය සේවය කරන හෙයිනි. එයට ප්‍රධානම හේතුව වන්නේ කුඩා කල සිට ස්ත්‍රී ඒකාකෘතින්ට අනුව කාන්තාව සමාජානුයෝජනය වූ අතර පුරුෂ මූලධර්ම මත පදනම් වූ හමුද වෘත්තීමය නෛතික රාමුව තුළ එය බිඳ වැටීමයි.

මෙහිදී ෆූකෝ විසින් පෙන්වා දෙන විනය බලය හමුදව තුළ ක්‍රියාත්මක වන්නේ හමුද සමාජය තුළ බලපැවැත්වෙන ආධිපත්‍යය කතිකාව වන පුරුෂ බලය මූලික කරගත් කතිකාව හරහාය. එහිදී විනය රාමුවකට යටත් කරවීම තුළ ස්ත්‍රී ලිංගිකත්වය පාලනය කරනු ලබන අතර එය පාලනය කිරීමට ස්ත්‍රී සෙබළියවම යොදා ගනු ලබයි. එය සෙබළියට අභියෝගාත්මක වන අතරම එසේ වන්නේ විනය පවත්වා ගෙන යාමේ අරමුණින් අනෙකුත් කාන්තා සෙබළියන්ව පාලනය කිරීමටත් පෞද්ගලිකත්වය උල්ලංඝනය කිරීමටත් ඒ තුළ සිදු වන බැවිනි. විශේෂයෙන් ගොෆ්මන් පෙන්වා දෙන පූර්ණ ආයතන සංකල්පය තුළ ස්වීයත්වය නිග්‍රහයට ලක්වන ආකාර වන අනන්‍යතා පැහැර ගැනීම, පෞද්ගලිකත්වය බිඳ වැටීම, භූමිකා පැහැර ගැනීම වැනි කාරණා මෙම සෙබළිය මුහුණ දෙන අභියෝග ඇසුරින් පෙන්වා දිය හැකි අතර ඔහුගේ ආයතනගතකරණ න්‍යාය තුළ මෙම සංකල්ප මෙලෙස තහවුරු වන බව කිව හැකිය.

Aytd ගේ 1998 අධ්‍යයනයක් හරහා ඔහු අවධාරණය කරනුයේ හමුදවන් තුළ සමලිංගික හෝ ද්විලිංගිකයින් තර්ජනාත්මකව ලේබල්කරණයට ලක් වන අතර ඔවුන් විෂම ලිංගික පිරිමින්ගේ අතිශයින්ම ප්‍රතිවිරෝධී ඉලක්ක වෙන බවයි (Aytd,1998).

විශේෂයෙන් මෙම සොයා ගැනීම සහ බලන විට ස්ත්‍රී සමලිංගික සෙබළියද වැඩි වශයෙන් මෙම විෂමලිංගික කතිකාව හේතුවෙන් අභියෝගයන්ට මුහුණ දෙන බව පෙනේ. ඉහළ පුරුෂ නිලධාරීන් ගේ විධි විධාන වලට අනුව නිලධාරී නිලයන් හරහා සමලිංගිකත්වය විනයට බාධාවක් යන මතවාදය තුලින් පාලනයට ලක් කරනු ලබයි. ෆූකෝ විසින් අනාවරණය කරනු ලබන කතිකාව හරහා බලය ක්‍රියාත්මක වෙනු ලබන බව මේ තුළ සනාථ වෙනු ලැබේ. ඒ අනුව පුරුෂාධිපත්‍යය බල කතිකාව හමුද නෛතික රාමුව ඔස්සේ ක්‍රියාත්මක කරනු ලබන බව පැහැදිලිය.

ෆූකෝට අනුව ඉතාම සරල ආකාරයෙන් ගත් කළ විනය යනු බලය හැසිරවීමයි. විශේෂයෙන් ෆූකෝට අනුව දැනුම තුළ මානව වර්ගයාගේ බලය ස්ථානගත වෙනු ලබයි. ඒ අනුව බලය යනු දැනුමෙහි ව්‍යුහය වේ. මෙලෙස දැනුම නිෂ්පාදනය වන්නේ කතිකාව හරහාය. කතිකාවක් යනු ෆූකෝට අනුව ජීවිතයේ හෝ විෂය ශික්ෂණයේ සුවිශේෂ ප්‍රදේශයක් පිළිබඳ චින්තන රාමුවකි (සිල්වා සහ අත්තනායක, 2016).

එසේ නම් සිවිල් සමාජය තුළ ස්ත්‍රිය සහ පුරුෂයාගේ කාර්යභාරය, වගකීම්, චර්යාව ආදී දේ සම්බන්ධව ගොඩ නැගුනු ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සහ පුරුෂ ආධිපත්‍යය දැනුම් පද්ධතිය පුරුෂ මූලික වෘත්තීය ක්ෂේත්‍රයක් වන හමුද සමාජය තුළටත් අභ්‍යන්තරීකරණය වී නිලබලය සහ විනය බලය හරහා එය සෙබළිය මත ක්‍රියාත්මක වන ආකාරය සහ ඒ තුළ අභියෝගයන්ට ඔවුන් නිරාවරණය වන ආකාරය පැහැදිලිව මෙම අධ්‍යයනය මගින් අනාවරණය කළ හැකිය.

මෙහිදී පශ්චාත් ස්ත්‍රීවාදීන් පවසන ආකාරයට බලය නිසා පීඩාවට පත්වන ස්ත්‍රිය පිළිබඳ පශ්චාත් නූතනවාදී අදහස් ඔස්සේ විමසා බැලිය හැකි බව ඉහත සාධක ඔස්සේ පැහැදිලි වේ. ඒ තුළ පැහැදිලි වන්නේ බලයේ විවිධ ස්වරූපයන් හේතුවෙන් ස්ත්‍රියක් වශයෙන් සෙබළිය අභියෝගයන්ට මුහුණපාන බවයි. විශේෂයෙන් මෙහිදී ලිංගිකත්වය මුල්කර ගත් අභියෝග තුළදී සෙබළියව ලේබල්කරණයකට ලක් වන බව පැහැදිලි වන අතර ඒ තුළත් විෂම ලිංගිකත්වය සදචාර සම්පන්නයි යන කතිකාව තුළ ඔවුන් ලේබල්කරණයට ලක් කිරීම කාන්තා සෙබළියන් විසින්ම සිදු කිරීමක්ද දක්නට ලැබේ. ස්ත්‍රියක් නම් ලිංගික සබඳතා පැවැත්විය යුත්තේ පුරුෂයෙකු සමග පමණයි යන්න ඔවුන් විසින්ම සාධාරණීකරණය කිරීම තුළ පුරුෂ ආධිපත්‍යය කතිකාවට ඔවුන් නිරායාසයෙන්ම අනුගත වී ඇති බව පැහැදිලිය. එනම් වෘත්තීය පෞරුෂය හරහා වෙනම අනන්‍යතාවක් තමා (**"මා"**) වෙත අභ්‍යන්තරීකරණය කර ගැනීම මත එලෙස අනුගත වීමක් සිදු වන කිව හැකිය. විෂම ලිංගික කතිකාව පෙරදැරිව සමලිංගිකත්වය යනු ඒ තුළ අපරාධයක් මෙන්ම අපගාමී චර්යාවක් ලෙස හඳුන්වමින් ලේබල් කිරීම සිදු කරනු ලබයි.

එමෙන්ම පැහැදිලිවම ෆූකෝ පෙන්වා දෙන ආකාරයේ ජෛව දේශපාලනයක් ක්‍රියාත්මක වන බව විද්‍යාමාන වේ. ෆූකෝ 1976 ඉදිරිපත් කරන ලද මෙම ජෛව දේශපාලනය සංකල්පය මඟින් අර්ථ දක්වන්නේ මිනිස් සිරුර විනය සමඟ සමීපව බැඳී ඇති අතර ඒ තුළ දේශපාලනයක් ක්‍රියාත්මක වන බවයි. එය පහළ හෝ ක්ෂුද්‍ර මට්ටමේ සිට පුද්ගලීකරණය හරහා ක්‍රියාත්මක වේ. එනම් විනය හා සම්බන්ධ තාක්ෂණික ක්‍රම පුද්ගලීකරණය කර ගැනීම හරහා පුද්ගලයා විසින් තමාව පාලනයකට යටත් කරගනු ලබයි (Wallenstein,2013). හමුදා ස්ත්‍රියගේ අස්මිතාමය අනන්‍යතාවය එහිදී අභියෝගයට ලක් වෙන අතර ඒ තුළ තමාගේ ස්වයං ප්‍රතිරූපය පිළිබඳ තමාටම නිර්වචනය අපහසුකාරී තත්ත්වයක් නිර්මාණය කරනු ලබයි.

ෆූකෝට අනුව පුද්ගලයෙකුගේ අනන්‍යතාවය කොටස් ද්වත්වයකි. එනම් නියමිත අනන්‍යතාවය සහ විද්‍යාමාන වන සමාජ අනන්‍යතාවය වශයෙනි. සමාජය විසින් ගොඩ නඟන පුද්ගලයෙකුට නියමිතව පවතින අනන්‍යතාවය පුද්ගලයෙකුගේ විද්‍යාමාන වන අනන්‍යතාවය මඟින් නිරූපණය නොවන විට ඒ ඇතිවන හිඩැස සමාජ අවමානයට හේතුවේ. ගොෆ්මන් ට අනුව පුද්ගලයෙකුගේ සමාජ අනන්‍යතාවය සමාජය තුළ නිරූපණය වන ආකාරයට අනුව පුද්ගලයෙකුගේ සමාජ අවමානයට ලක්වීම හෝ නොවීම තීරණය වේ (ප්‍රේමරත්න, 2014). එනම් යුධ හමුද සන්දර්භය තුළ ස්ත්‍රියක් වශයෙන් පෞද්ගලික අනන්‍යතාව කප්පාදු වීම මත විවිධ සමාජ කාරණා තුළදී අභියෝගාත්මක තත්ත්වයන්ට ලක් වී ඇත. හමුදා දෘෂ්ටිවාදය ස්ත්‍රී පුරුෂ සමාජභාවය හරහා ගොඩ නැගුන පුරුෂාධිපත්‍යය බලය සමඟ බොහෝ ආකාර වලින් බැඳී පවතින අතර ඒ තුළ ස්ත්‍රියක් වශයෙන් සෙබළිය බොහෝ අභියෝගාත්මක තත්ත්වයන්ට මුහුණපාන අතරම සිවිල් සමාජයේ පුරුෂාධිපත්‍යය බල නිරූපණයන් සමඟද ඇයට ගනු දෙනු කිරීමට සිදු වී ඇත. ඒ මගින්ද ඇය අභියෝගයන්ට ලක් වන බව පැහැදිලි වන අතර එනම් සමාජයන් ද්විත්වයක් (හමුද සමාජය සහ සිවිල් සමාජය) හරහා බලපැවැත්වෙන බල ස්වරූපයන් / කාර්යභාරයන් / කතිකාවන් හරහා සෙබළිය අභියෝගාත්මක වාතාවරණයන්ට ගොදුරු වන බව කිව හැකිය.

මේ අනුව යුධ හමුදව යන පූර්ණ ආයතනය තුළ සෙබළියගේ අනන්‍යතාවය බිඳ වැටෙන්නේ සහ පෞද්ගලිකත්වය පැහැර ගැනීම මෙන්ම ස්වීයත්වය නිග්‍රහයට ලක් වන්නේ පුරුෂ අනන්‍යතා ඔවුන් තුළ ගොඩ නැගීම නිසාවෙන් වන අතර සිවිල් සමාජ ස්ත්‍රියකගේ අනන්‍යතා, භූමිකාවන් සහ අවස්ථාවන් සෙබළියට හමුද සාමාජිකත්වයට අනුගත වීම තුළ අහිමි වී යනු ලබයි. පුරුෂයින්ට ආවේණික යැයි සමාජය විසින් හඳුන්වනු ලබන මූලධර්ම කෙරෙහි හමුද ස්ත්‍රිය යොමු කරන අතර එමගින් ස්ත්‍රියක් වශයෙන් එතෙක් ගොඩනගපු තම අනන්‍යතාවය පැහැර ගැනීමකට ලක් වේ. විශේෂයෙන් මෙහි සාමාජිකයින් පුරුෂ අනන්‍යතාවන් සහිත සාමාජිකයින් බවට පත් කරලීම තුළ පුරුෂ සොල්දදුවන්ට වඩා ස්ත්‍රී සෙබළිය අභියෝගාත්මක තත්ත්වයකට මුහුණ දෙනු ලබයි. මන්ද ඒ තුළ තමන්ගේ ස්ත්‍රී අනන්‍යතාවය පැහැර ගැනීමකට ලක්වන අතර තමන් තුළ හමුදව විසින් ගොඩ නගන නව අනන්‍යතාවයට අනුව සිවිල් ජීවිතය තුළ වුවද කටයුතු කිරීමට සිදු වීම නිසාය. එනම් පවුල තුළින් උරුම වූ භූමිකාමය අනන්‍යතාවන්, වෘත්තීමය පෞරුෂය මත ගොඩනැගෙන වෘත්තීමය අනන්‍යතාවන් සහ තමා පිළිබඳ වූ අනන්‍යතාව අතර දෝලනයකි. එලෙස මෙම අනන්‍යතාවන් අතර වූ ඝට්ටනයන් හේතුවෙන් හමුද ස්ත්‍රිය අභියෝගයට ලක් වේ. හමුද ස්ත්‍රියට "මම" සහ "මා" යන ද්වන්ධය අතර දෝලනය වීමට සිදු වීම හා මෙම පුරුෂ කේන්ද්‍රීය හමුද වෘත්තිය හා අදල පෞරුෂයමය සාධක හරහා "මා" විසින් "මම" කෙරෙහි ඇති වන්නා වූ ප්‍රබල බලපෑම මත අස්මිතාමය අනන්‍යතාවය ඝට්ටනාත්මක තත්ත්වයකට භාජනය වන අතර එම සංසිද්ධිය මෙම හමුද ස්ත්‍රිය කෙරෙහි අභියෝග ඇති වීමේ ප්‍රධාන සාධකයයි. එහිදී සිවිල් සමාජය තුළින් සෞන්දර්යාත්මක සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත ගොඩනැගුනු සාම්ප්‍රදයික කාන්තා භූමිකාවන් හි නියැලෙන ස්ත්‍රියක් අපේක්ෂා කිරීමත්, යුධ හමුද පරිසරය තුළින් පුරුෂ මූලික අනන්‍යතා සහිත ස්ත්‍රියක් අපේක්ෂා කිරීමත් ස්ත්‍රියක් වශයෙන් තම පෞද්ගලික අභිලාෂ උල්ලංඝනය වීමත් යන සාධක අතර මතුවන උභතෝකෝටිකය අභියෝගාත්මක තත්ත්වයක් බිහි කරනු ලබයි.

ඒ අනුව සුවිශේෂ අනෙකා (හමුද සමාජය) තුළ පවතින ඉඟි එනම් පුරුෂාධිපත්‍යය බලය, නිලබලය සහ විනය බලය යනාදිය හරහා **"මම"** සහ **"මා"** අතර වන අන්තර්ක්‍රියාවේ ස්වභාවය තීරණය කරන අතර එහිදී ස්ත්‍රීත්වය පදනම් කරගනිමින් හමුද ස්ත්‍රිය කෙරෙහි අභියෝගයන් ඇතිවේ.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


ප්‍රේමරත්න. එම්.ජී.එල්. (2014). බලය, සමාජ අවමානය සහ මානසික රෝගාබාධ. *සමාජ විග්‍රහ: පළමු වෙළුම* (පි.52-65). සමාජ විද්‍යා අධ්‍යනංශය. කොළඹ විශ්ව විද්‍යාලය.

විතාරන, එස්. එල්. ඩී. (2000). *ශ්‍රී ලංකාවට විශේෂ අවධානයක් සහිතව තුන්වන ලෝකයේ රටවල ස්ත්‍රීන්ගේ භූමිකාවේ වෙනස්වීම් පිළිබඳ සරල විවිරණයක්. නිවේදනී, වෙළුම 7.* කාන්තා අධ්‍යාපන හා පර්යේෂණ කේන්ද්‍රය.

සිල්වා, ටී. ඩී. (2000). *යුධමය භීෂණයේ තවත් පැතිකඩක්. නිවේදනී, වෙළුම 7.* කාන්තා අධ්‍යාපන හා පර්යේෂණ කේන්ද්‍රය.

හඳරාගම, එස්. (2000). *සමකාලීන ශ්‍රී ලංකාවේ සමාජ ලිංගිකත්වය පිළිබඳ සමාජ විච්‍යාත්මක කෙටි විග්‍රහයන්. නිවේදනී, වෙළුම 7.* කාන්තා අධ්‍යාපන හා පර්යේෂණ කේන්ද්‍රය.

හේරත්,එස්. (2002). *කාන්තාව, වැඩ, රැකියාව හා සේවය. විනිවිද,* කාන්තා අධ්‍යාපන හා පර්යේෂණ කේන්ද්‍රය.

Aydt, H.K. (1998). *The Social Construction of Gender in the Military and Resistance to the Integration of Women* [ published honors thesis]. Southern Illinois University Carbondale.

Boland, M.L. (2005). *Sexuel Harassment in the work place*. An Imprint of Sourcebooks, Inc. Sphix Publishing.

Carries, H. (2006). *Gender and the Military women in the Armed Forces if western democracies*. Retrieved July 10, 2019, from https://www.taylorfrancis.com/books/mono/10.4324/9780203969038/gender-military-helena-carreiras

Fasting, K., & Sand, T. S. (2010). *Gender and Military Issues*. The Norwegian Defence University College.

Ferguson, K.E. (2001). Reading Militarism and Gender with Cynthia Enloe. *Theory & Event 5*(4), doi:10.1353/tae.2001.0037.

Goffmen, E. (1961). *Asylums: Essays on the Social Situation of Mental Patients and Other Inmates.* Anchor Books Doubleday & Company, Inc.

Holmgren, P. (n.d.). *Men, Masculinity and the Military :Deep diving into a world of men and violence.* Lund University.

Jackson, J., Thoemmes, F., Jonkmann, K., Lüdtke, O., & Trautwein, U. (2012). Military Training and Personality Trait Development: Does the Military Make the Man, or Does the Man Make the Military? *Psychological Science, 23*(3), 270-277. Retrieved February 27, 2021, from http://www.jstor.org/stable/41441784?

Merriam-Webster. (n.d.). Dictionary. In *Merriam-Webster.com dictionary*. Retrieved November 8, 2020, from https://www.merriam-webster.com/dictionary/dictionary

Reit, R. (2017). *The Relationship between the military's masculine culture and service members' help-seeking behaviors* [published master thesis]. Marquette University.

Scott, S. (2011). *Total Institutions and Reinvented Identities.* Palgrave Macmillan.

Urgiles, M. E. (2015). *Harresment of women in the Military by Male Military* [Master Thesis]. University of New Jersy.

Wallenstein, S. O. (2013). Introduction: Foucault, Biopolitics and Governmentality. In Nilson, J. & Wallenstein, S. O (Ed.), : Foucault, Biopolitics and Governmentality (pp 7-12). Södertörn University.

# සමාජ විග්‍රහ

**විමර්ශිත සංග්‍රහය**
**REFEREED JOURNAL**
**පළමු කාණ්ඩය, අටවන වෙළුම - 2022**
**ISSN 2362-0978 (print ISSN)**
**ISSN 2756-925X (e-ISSN)**


ලිපි අංක 03

## වැඩ-ජීවන සමතුලිතතාවය, අභියෝග සහ උපායමාර්ග: ඇඟළුම් කර්මාන්තශාලාවක කාන්තා කළමනාකරුවන් පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් අධ්‍යයනයක්


[3]ජේ. එම්. ආර්. ඩී. ජයකොඩි

https://orcid.org/0009-0006-7531-3572


---


***ප්‍රධාන සංස්කාරක***
ප්‍රේමකුමාර ද සිල්වා

***සහය සංස්කාරක***
ජගත් බණ්ඩාර පතිරගේ
හිරුනි කළුආරච්චි

***සංස්කාරක උපදේශක මණ්ඩලය***
එස්.ටී.හෙට්ටිගේ (සම්මානිත මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
කාලිංග ටියුඩර් සිල්වා (සම්මානිත මහාචාර්ය) පේරාදෙණිය විශ්වවිද්‍යාලය
කේ.කරුණාතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) කැලණිය විශ්වවිද්‍යාලය
සරත් අමරසිංහ (සම්මානිත මහාචාර්ය) රුහුණු විශ්වවිද්‍යාලය
යසාංජලී ජයතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
චන්ද්‍රසිරි නිරිඇල්ල (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
සුභාංගි හේරත් (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
නිශාර ප්‍රනාන්දු (ආචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
ෆර්සානා හනීෆා (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
ඉරේෂා ලක්ෂ්මන්(මහාචාර්ය)කොළඹ විශ්වවිද්‍යාලය

නාලක ජයසේන
***පරිසැලසුම් නිර්මාණය***
ප්‍රභාත් ගලගමගේ
හිරුනි කළුආරච්චි


[3]බී.ඒ.(කැළණිය), ශාස්ත්‍රපති උපාධි අපේක්ෂක, සමාජ විද්‍යා අධ්‍යනංශය, කොළඹ විශ්ව විද්‍යාලය

# සමාජ විග්‍රහ

විමර්ශිත සංග්‍රහය
**REFEREED JOURNAL**
පළමු කාණ්ඩය, අටවන වෙළුම - **2022**
**ISSN 2756-925X (e-ISSN)**
**ISSN 2362-0978 (print ISSN)**

This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License.

දැනුම වෙත ප්‍රවේශ වීමේ සීමා අතික්‍රමණය සඳහා ලොව බොහෝ ශාස්ත්‍රාලයීය ප්‍රකාශන සම්ප්‍රදායික ප්‍රකාශන අයිතිය පිළිබඳ නෛතික ආකෘතියෙන් විකල්ප ආකෘතියක් වන පොදු නිර්මාණ බලපත්‍ර ක්‍රමයට සංක්‍රමණය වී / වෙමින් ඇත. මේ අනුව විචාරාත්මක දැනුමට විවෘත ප්‍රවේශයක් ලබා දීමේ අරමුණින් "සමාජ විග්‍රහ" විමර්ශිත සංග්‍රහය, නිකුත් වන්නේ ඉහත පොදු නිර්මාණ බලපත්‍රය යටතේය.

## ලිපි විමර්ශක මණ්ඩලය

*සම්මානිත මහාචාර්ය සිරි හෙට්ටිගේ, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*මහාචාර්ය ෆර්සානා හනීෆා, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*මහාචාර්ය ඉරේෂා ලක්ෂ්මන්, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*ආචාර්ය ජගත් බණ්ඩාර පතිරගේ, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*ආචාර්ය ගයාත්‍රී විජේසුන්දර, සමාජ විද්‍යා දෙපාර්තුමේන්තුව, රුහුණ විශ්වවිද්‍යාලය*

*ආචාර්ය හේමන්ත කුමාර, සමාජ විද්‍යා දෙපාර්තුමේන්තුව, රුහුණ විශ්වවිද්‍යාලය*

## ප්‍රකාශනය

සමාජ විද්‍යා අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ-03
දුරකථනය/ෆැක්ස්: 011-2500452
විද්‍යුත් තැපැල: samajaviggraha@soc.cmb.ac.lk
වෙබ් අඩවිය: https://arts.cmb.ac.lk/sociology/

**සාරසංක්ෂේපය**

ශ්‍රී ලාංකීය කාන්තාවන්ට සමාජය තුළ සම්ප්‍රදායිකව පැවරෙන භූමිකා හේතුවෙන් රැකියාව සහ ජීවිතය අතර සමබරතාවයක් ඇති කර ගැනීම වර්තමානයේ තීරණාත්මක ගැටළුවක් බවට පත්ව ඇත. කළමනාකරණ තනතුරුවල සේවයේ නියුතු කාන්තාවන්ට මෙම ගැටළුව වඩා ප්‍රබල ලෙස බලපාන්නේ රැකියාවේ වගකීම් සහ කාර්යභාරයත් පවුල තුළ ඔවුන්ගෙන් අපේක්ෂා කරන භූමිකා සහ කාර්යභාරයත් අධික වැඩ බරක් ඇති කරන නිසා ය. වැඩ-ජීවන සමතුලිතතාවය යනු රැකියාව සහ නිවසේ වගකීම් අතර නිසි සමතුලිතතාවයක් පවත්වා ගැනීම සම්බන්ධ සංකල්පයකි. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ඇඟළුම් අංශයේ කාන්තා කළමනාකරුවන්ගේ වැඩ-ජීවන සමතුලිතතාවය පිළිබඳ අත්දැකීම් ගවේෂණය කිරීම වන අතර එම අධ්‍යයනයේ කොටසක් ලෙස මෙම ලිපිය මගින් සාකච්ඡා කරනු ලබන්නේ කාන්තා කළමනාකරුවන්ගේ වැඩ-ජීවන සමතුලිතතාවය සඳහා ඇති අභියෝග සහ උපායමාර්ග පිළිබඳව ය. කටුනායක අපනයන සැකසුම් කලාපයේ ඇඟළුම් කර්මාන්තශාලාවක සේවයේ නියුතු කාන්තා කළමනාකරුවන් 5 දෙනෙකුගෙන් සමන්විත ගුණාත්මක ප්‍රත්‍යක්ෂ අධ්‍යයනයක් ලෙස මෙම අධ්‍යයනය සිදු කරන ලදී. සහභාගීවන්නන් තෝරා ගැනීම සඳහා අරමුණු සහගත නියැදියක් භාවිතා කර ඇත. දත්ත රැස් කිරීම සඳහා අර්ධ ව්‍යූහාත්මක සම්මුඛ සාකච්ඡා, සහභාගිකයින්ගේ ජන විකාශන දත්ත ලබා ගැනීම සඳහා පසුබිම් විස්තර ප්‍රශ්නාවලියක් සහ ක්ෂේත්‍ර නිරීක්ෂණ හා ලේඛන විශ්ලේෂණය භාවිතා කරන ලදී. රැස්කර ගත් දත්ත තේමාත්මක විශ්ලේෂණ ශිල්පීය ක්‍රමය ඔස්සේ විශ්ලේෂණය කරන ලදී. කාන්තා කළමනාකරුවන්ට වැඩ-ජීවන සමතුලිතතාවය පවත්වා ගැනීමේ දී ඇති වන අභියෝග ලෙස ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා අඩු සේවා පළපුරුද්ද යන පුද්ගලයා සම්බන්ධ අභියෝග මෙන්ම පවුලේ සාමාජිකයින්ගේ ආකල්ප, පවුල තුළ භූමිකා සහ වගකීම් යන පවුල සම්බන්ධ අභියෝග සහ අවම සේවක සංඛ්‍යාවකින් වැඩ කළමනාකරණය කිරීම, රාජකාරියේ නිරත විය යුතු කාලය යනා දී රැකියා සම්බන්ධ අභියෝග හඳුනා ගන්නා ලදී. ඔවුන් විසින් වැඩ-ජීවන සමතුලිතතාවය පවත්වා ගැනීම සඳහා භාවිතා කරන උපායමාර්ග ලෙස දරුවන් කුඩා කළ සිට ස්වාධීනව වැඩ කිරීමට හුරු කිරීම, පවුල තුළ වැඩ බෙදා ගෙන කටයුතු කිරීම වැනි පෞද්ගලික ජීවිතය සම්බන්ධ උපායමාර්ග ද රැකියා ස්ථානය තුළ තම කණ්ඩායමේ සාමාජිකයින් පුහුණු කිරීම හා ආකල්පමය සංවර්ධනය, සුදුසු පුද්ගලයා රාජකාරිය සඳහා යෙදවීම, අධීක්ෂණය හා පසුවිපරම, වෘත්තීය සගයන් සමග විවෘතව අදහස් ප්‍රකාශ කිරීම සහ සාකච්ඡා කිරීම, රැකියාවේ පෙර අත්දැකීම් භාවිතා කිරීම සහ ධනාත්මකව සිතීම යනා දී රැකියා ජීවිතය හා සම්බන්ධ උපායමාර්ග ද කාර්යක්ෂම බව, මනා සන්නිවේදනය, සැලසුම් අනුව කටයුතු කිරීම සහ පෙර සූදානම වැනි පෞද්ගලික හා රැකියාව ජීවිතය යන දෙයංශය තුළම භාවිතා කරන උපායමාර්ග ද වශයෙන් ප්‍රධාන කාණ්ඩ තුනක් හඳුනා ගැනීමට හැකි විය. මේ අනුව කාන්තා කළමනාකරුවන්ගේ වැඩ-ජීවන සමතුලිතතාවය පවත්වා ගැනීමේ දී පුද්ගලයා, පවුල සහ රැකියා ස්ථානය යන පාර්ශව තුනෙහිම ලක්ෂණ, ආකල්ප සහ ප්‍රයෝගික භාවිතයන් වැනි අංග වැදගත් වන බව නිගමනය කළ හැකිය. වැඩ-ජීවන සමතුලිතතාවය ඉහළ නැංවීම සඳහා නිවාඩු පිළිබඳ වඩා නම්‍යශීලි ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම, පුහුණු කිරීම්, පවත්නා පහසුකම් සඳහා ප්‍රවේශය පුළුල් කිරීම සහ නව පහසුකම් ඇති කිරීම වැනි දෑ ප්‍රායෝගික භාවිතය සඳහා නිර්දේශ කළ හැකි ය.

**මුඛ්‍ය පද - වැඩ-ජීවන සමතුලිතතාවය, කාන්තා කළමනාකරුවන්, ඇඟළුම් කර්මාන්තය, අභියෝග , උපායමාර්ග**

**හැඳින්වීම**

වැඩ-ජීවන සමතුලිතතාවය (Work-Life Balance) නූතන සමාජයේ සාකච්ඡාවට බඳුන් වී ඇති මාතෘකාවක් වන අතර ඒ පිළිබඳ උනන්දුව පසුගිය දශක කිහිපය තුළ පුළුල් ලෙස වර්ධනය වී තිබේ. වැඩ-ජීවන සමතුලිතතාවය යනු පුද්ගලයෙකුගේ යහපැවැත්ම, රැකියාව හා සම්බන්ධ කාර්යය සාධනය සහ පවුලේ හෝ සමාජයේ ඵලදායී ක්‍රියාකාරිත්වය සඳහා වැදගත් සංකල්පයකි (Grady et al, 2008).

වර්තමාන සමාජයේ ආර්ථිකය තුළ කාන්තා ශ්‍රම බලකායෙහි සහභාගීත්වය සීඝ්‍ර ලෙස වර්ධනය වීම, සැමියා සහ බිරිඳ යන දෙදෙනාම මුදල් උපයන පවුල් බිහිවීම සහ වැඩකරන මව්වරුන් යනාදී සංසිද්ධි හේතුවෙන් වැඩ සහ පවුල් ජීවිත සමතුලිතතාව කාලීන ගැටළුවක් බවට පත් වී ඇත (Nishanthi & Thalagaspitiya, 2015). Jenson, Hagen & Reddy (1988) මෙම ප්‍රවණතාව හැඳින්වූයේ "ශ්‍රම බලකායේ ස්ත්‍රීකරණය" ලෙස ය.

කළමනාකරණ තනතුරු දැඩි මානසික පරිශ්‍රමයක් දැරිය යුතු රැකියාවක් වන අතර බොහෝ විට අධික වැඩ බර, දිගු වැඩ කරන පැය ගණන් සහ ඉලක්ක ආවරණය සමඟ සම්බන්ධ වේ. එමෙන්ම කළමනාකරණ අංශයේ නියුතු මව්වරුන් සඳහා මෙය වඩාත් බලපෑමක් සිදු කරනුයේ නිවසේදී සිදු කරන භූමිකාවේ ස්වභාවය නිසා; බිරිඳක් සහ මවක් ලෙස කටයුතු කිරීමට සිදු වීම මතය (Weerawansa & Gunasekara, 2019). South & Spitze (1994) පෙන්වා දෙන්නේ දරුවන් සිටින කාන්තා සේවකයන්ට විශාල වැඩ කොටසක් නිවසේ දී ඉටු කිරීමට සිදු වී ඇති බවත් එහෙත් පුරුෂ සේවකයන් සම්බන්ධව එසේ නොවන බවත් ය. එම නිසා කාන්තාවන්ගේ වැඩ කොටස් තුළ කාර්යය ගැටුමක් ඇති වේ. එබැවින් කළමනාකරණ තනතුරක සිටින කාන්තාවන් තම පිරිමි සගයන්ට වඩා පවුල හා දරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දැක්වීමට සිදු වේ (Blair-Loy, 2001). තවද, Rodriguez (2013) පවසන්නේ කාන්තා කළමනාකරුවන් පිරිමි කළමනාකරුවන්ට වඩා වැඩි ගැටළුවලට මුහුණ දී ඇත්තේ ඔවුන්ගේ රැකියා තත්ත්වය නොතකා පවුලේ සියලු වගකීම් ඔවුන් විසින් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කරන බැවිනි.

පූර්ණ කාලීනව වැඩ පරිසරයක් තුළ මෙන්ම ශ්‍රී ලාංකීය සමාජ සන්දර්භය තුළ දී කාන්තාව තම දෛනික කටයුතු සමබරව සිදු කරනු ලබන්නේ කෙසේ ද යන්න පිළිබඳව විමර්ශනය කිරීමට පර්යේෂකයාට අවශ්‍ය වූ අතර ඇඟළුම් අංශයේ කාන්තා කළමනාකරුවන් පිළිබඳ හා ඔවුන්ගේ වැඩ-ජීවන සමතුලිතතාවය පිළිබඳ පර්යේෂණ විරල බැවින් පර්යේෂකයා විසින් මෙවැනි අධ්‍යයනයක් සිදු කිරීමට යොමු විය.

**පර්යේෂණ ගැටළුව**

ශ්‍රී ලාංකීය ඇඟළුම් කර්මාන්තය තුළ ආරම්භයේ පටන්ම වැඩි වශයෙන් සේවා නියුක්තව සිටිනුයේ කාන්තාවන් වන අතර එම ප්‍රතිශතය 80% ක් පමණ වේ. මෙය 2015 වර්ෂයේ රටේ සමස්ත ශ්‍රම බලකායෙන් කාන්තාවන්ට හිමි වන සියයට 35ට වඩා සැලකිය යුතු ඉහළ අගයකි (Madurawala, 2017). ඇඟළුම් ක්ෂේත්‍රයේ සේවා නියුක්ත බහුතරය කාන්තාවන් වුවත් ඔවුන් බොහෝ විට නිෂ්පාදන ක්‍රියාවලියේ පහළ මට්ටමේ රැකියාවන්ට සීමා වී සිටිනු දැකිය හැකි අතර ඉහළ කළමනාකාරීත්ව රැකියාවල වැඩි වශයෙන් නිරත වී සිටින්නේ පුරුෂයන් ය (Madurawala, 2017). මෙම අංශයේ කර්මාන්ත කළමනාකරුවන් සමඟ පවත්වන ලද මූලික සම්මුඛ සාකච්ඡා තුළින් සොයා ගෙන ඇත්තේ ඉහළ පාලන ඉලක්ක, නැව් ගත කිරීම් සඳහා අවසාන මොහොත තෙක් කටයුතු කිරීම, මානව සම්පත් ප්‍රමාණවත් ලෙස සංවර්ධනය නොවීම, ශ්‍රම බලකායෙහි සේවය හැරයාම ඉහළ යාම සහ සේවයට නොපැමිණීම යනාදිය අවසානයේ වැඩ-ජීවන සමතුලිතතාවයට බලපාන බවයි (Gnanayudam & Dharmasiri, 2007).

ඒ අනුව වැඩ-ජීවන සමතුලිතතාවය පිරිමි පාර්ශවයට වඩා කාන්තා පාර්ශවයට ගැටළුවක් විය හැකි බව පැහැදිලි ය. මෙයට ප්‍රධානතම හේතුව කාන්තාවන් රැකියාවේ දී මෙන්ම නිවසේ දී ද ප්‍රධාන වගකීම් ඉටුකළ යුතු වීමයි. විවිධ සන්දර්භවල වැඩ-ජීවන සමතුලිතතාව පිළිබඳව බොහෝ පර්යේෂණ සිදු කර ඇතත්, ශ්‍රී ලංකාවේ ඇඟළුම් අංශයේ කාන්තා කළමනාකරුවන්ගේ වැඩ-ජීවන සමතුලිතතාවය පිළිබඳ පර්යේෂණ සිදු කර ඇත්තේ ඉතා සුළු පිරිසකි. මේ අනුව, මෙම අධ්‍යයනය මඟින් ඇඟළුම් ක්ෂේත්‍රය කාන්තා කළමනාකරුවන්ගේ වැඩ-ජීවන සමතුලිතතාවය පිළිබඳ ආනුභවිකව අධ්‍යයනය කිරීමෙන් පවතින දැනුම පරතරය පියවා ගැනීමට උත්සාහ කරනු ඇත.

**න්‍යායාත්මක පසුබිම**

න්‍යායාත්මක සාහිත්‍යය විමසීමෙහි දී වැඩ-ජීවන සමතුලිතතාවයේ ගතිකතාවයන් විස්තර කරන න්‍යායන් කිහිපයක් ඇති බව පෙනේ. ඒවායින් කිහිපයක් ලෙස පිටාර ගැලීමේ න්‍යාය (Spill-over Theory), ගැටුම් න්‍යාය (Conflict Theory) සහ වැඩ-පවුල් දේශසීමා න්‍යාය (Work-Family Border Theory) දැක්විය හැකිය. ඒ අනුව මෙම න්‍යායාත්මක පසුබිම මත පිහිටා අධ්‍යායනය සිදු කර ඇත.

**පිටාර ගැලීමේ න්‍යාය**

මෙම න්‍යාය මගින් සේවකයින්ගේ පෞද්ගලික සහ වෘත්තීය බැඳීම් අතර ඇති සම්බන්ධතාව පිළිබඳව පැහැදිලි කිරීමක් සිදු වේ. සෑම පුද්ගලයෙකුටම තමන්ට ආවේණික වු කුසලතා, චිත්තවේග, ආකල්ප සහ හැසිරීම් මාලාවක් ඇති අතර එමගින් එක් එක් පුද්ගලයා රැකියාව සහ ජීවිතය අතර සමබරතාව පවත්වා ගන්නා ආකාරය වෙනස් ය. මේ අනුව පිටාර ගැලීමේ න්‍යාය, ඍණාත්මක හා ධනාත්මක විය හැකිය. ඍණාත්මක පිටාර ගැලීම යන්නෙන් අදහස් කරන්නේ සේවකයා එක් විෂයයකින් ආතතියට ලක්වුවහොත්, අනෙක් විෂයය තුළ ද ඔහුට අතෘප්තියක් දැනිය හැකි බවයි. ධනාත්මක පිටාර ගැලීම යන්නෙන් අදහස් කරන්නේ සේවකයෙකු එක් විෂයයකින් තෘප්තියක් ලබන විට අනෙක් විෂයය තුළ ද සෑහීමකට පත් වන බවය.

Edwards & Rothbard (2000) පවසන පරිදි පිටාර ගැලීම යන්නෙන් අදහස් වන්නේ වැඩ සහ පවුල කෙරෙහි එම ආයතන දෙක අන්‍යෝන්‍ය වශයෙන් ඇති කරන බලපෑමය; මෙම සංකල්පය චිත්තවේග (මනෝභාවය සහ තෘප්තිය), වටිනාකම් (රැකියාවේ සහ පවුලේ වැදගත්කම) සහ කුසලතා ඔස්සේ විස්තර කරනු ලැබේ. පිටාර ගැලීම යන්න දෙයාකාරයකට අර්ථ දක්වනු ලැබේ. ඉන් පළමු වැන්න වන්නේ පවුල හා වැඩ තුළින් ලැබෙන තෘප්තිය සහ පවුල හා වැඩ පිළිබඳ වටිනාකම් අතර තිබෙන ධනාත්මක සම්බන්ධතාවයයි. දෙවැන්න වන්නේ මෙම අංශ දෙක අතර කුසලතා සහ චර්යා සම්පූර්ණයෙන්ම මාරු කර ගැනීමයි (Transference). උදාහරණයක් ලෙස රැකියාව කිරීමේ දී ඇති වන විඩාව නිවසේ දී ප්‍රදර්ශනය කිරීම සහ වැඩ කාලසටහන කෙරෙහි පවුල තුළින් යම් යම් බාධා කිරීම් ඇති වීම දැක්විය හැක.

**ගැටුම් න්‍යාය**

ගැටුම් ඇති වන්නේ රැකියාව හා ගෘහ භූමිකාවන් යම් ආකාරයකින් නොගැලපෙන විට එක් ක්ෂේත්‍රයක (රැකියා හෝ ගෘහ ජීවිතය) ඉල්ලීම් සපුරාලීම දුෂ්කර වන බැවිනි. අන්තර් භූමිකා ගැටුම් න්‍යාය යන්නෙන් අදහස් කරන්නේ එක් ක්ෂේත්‍රයක ඉල්ලීම් සපුරාලීමේ දී සිදුවන දේ අනෙක් ක්ෂේත්‍රයේ ඉල්ලීම් සපුරාලීම දුෂ්කර කරයි (Greenhaus & Beutell, 1985). සාහිත්‍යයෙහි මෙය විරුද්ධ හෝ නොගැලපීමේ න්‍යාය ලෙස ද හැඳින්වේ (Edwards & Rothbard, 2000). ගැටුම් න්‍යායයෙන් අදහස් කරන්නේ ජීවිතයේ සෑම අංශයකම ඉහළ ඉල්ලුමක් ඇති විට, සමහර දුෂ්කර තේරීම් කළ යුතු වන අතර සමහර ගැටුම් පුද්ගලයකු මත සැලකිය

යුතු බරක් පැටවිය හැකි බවයි (Guest, 2002). එනම් එක් පරිසරයක තෘප්තිය කැපකිරීම් සිදු කල යුතු වේ. අනෙක් කාරණය නම්, මෙම පරිසර දෙක එකිනෙකට නොගැලපෙන නිසා ඒවා එකිනෙකට වෙනස් ය.

ගැටුම් න්‍යාය අනුව එක් ක්ෂේත්‍රයක් සඳහා ඉහළ මැදිහත් වීමක් සිදු කරන විට අනෙක් ක්ෂේත්‍රයේ කැපකිරීම් සිදු වන අතර මෙම ප්‍රවේශයේ ප්‍රධාන පරිශ්‍රය වන්නේ එකිනෙකට සම්බන්ධ වුවත්, එකිනෙකට වෙනස් ඉල්ලීම්, වගකීම්, අපේක්ෂාවන් සහ සම්මතයන් සැලකිල්ලට ගෙන මෙම ක්ෂේත්‍ර දෙක සහජයෙන්ම නොගැලපේ. නිදසුනක් ලෙස, මෙම ප්‍රවේශය මඟින් ඉල්ලීම් කරන රැකියා අපේක්ෂාවන් තෘප්තිමත් කිරීම කෙනෙකුගේ රැකියා නොවන ජීවිතයේ අපේක්ෂාවන් සපුරාලීමට හේතු නොවනු ඇත. Greenhaus & Beutell (1985) විසින් කාලය මත පදනම් වූ ගැටුම් හඳුනාගෙන ඇත. ඒවා සපුරාලීමට ප්‍රමාණවත් කාලයක් නොමැති භූමිකාවන් දෙකෙහිම ඉල්ලීම්, හැසිරීම් මත පදනම් වූ ගැටුම් එක් පරිසරයක සුදුසු හැසිරීම් තවත් පරිසරයක අවශ්‍ය හැසිරීම් සමඟ නොගැලපේ.

**වැඩ-පවුල් දේශසීමා න්‍යාය**

මෙය නව න්‍යායක් වන අතර එය එක් විෂයයක් තුළ පුද්ගලයාගේ භූමිකාවන් පවතින්නේ කෙසේ ද යන්න පිළිබඳ අවබෝධයක් ලබා දෙයි. වැඩ-පවුල් දේශසීමා න්‍යාය යනු රැකියාව හා පවුල පිළිබඳ පෙර න්‍යායන්හි විවේචන හා හිඩැස් සඳහා පිළියමක් ලෙස නිර්මාණය කරන ලද නව න්‍යායකි Clark (2000). එය සමතුලිතතාවය ළඟා කර ගැනීම සඳහා පුද්ගලයන් වැඩ, පවුල් ක්ෂේත්‍ර සහ ඔවුන් අතර ඇති මායිම් කළමනාකරණය කරන්නේ කෙසේ ද යන්න පැහැදිලි කරන න්‍යායකි. මෙම සිද්ධාන්තයේ කේන්ද්‍රීය වන්නේ "වැඩ" සහ "පවුල" එකිනෙකට බලපෑම් කරන විවිධ ක්ෂේත්‍ර යන අදහසයි. කාර්මික විප්ලවයෙන් පසු සේවා ස්ථාන සහ නිවාස අතර ඇති වූ බෙදීම නිසා වැඩ සහ නිවස සාමාන්‍යයෙන් අරමුණ හා සංස්කෘතිය අනුව වෙනස් වී ඇත. ඔවුන්ගේ පරස්පර අරමුණු සහ සංස්කෘතීන් සැලකිල්ලට ගෙන වැඩ සහ නිවස විවිධ රටවල් දෙකකට සමාන කළ හැකි මෙන්ම පිළිගත හැකි හැසිරීම් සහ කාර්යයන් ඉටු කරන ආකාරයෙහි වෙනස්කම්වලට සමාන කළ හැකිය. එලෙස රැකියාව සහ පවුල අතර වෙනස වඩා විශාල වනවා සේම එමඟින් වඩාත් ආන්තික සංක්‍රාන්තියක් අවශ්‍ය වේ. මිනිසුන් දේශසීමා හරස් කරන්නන් වන අතර ඔවුන් මෙම සැකසුම් දෙක අතර දෛනික සංක්‍රාන්ති සිදු කරයි. බොහෝ විට ඔවුන්ගේ අවධානය, අරමුණු සහ අන්තර් පුද්ගල ශෛලිය එක් එක් අයගේ අද්විතීය ඉල්ලීම්වලට ගැලපෙන පරිදි සකස් කරයි. රැකියාවේ සහ නිවසේ බොහෝ අංශ වෙනස් කිරීම දුෂ්කර වුව ද අපේක්ෂිත සමතුලිතතාවයක් ඇති කර ගැනීම සඳහා පුද්ගලයන්ට කාර්යයේ ස්වභාවය, නිවාස ක්ෂේත්‍රය සහ ඒවා අතර මායිම්, පාලම් තරමක් දුරට හැඩගස්වා ගත හැකිය. Clark (2000) "සමබරතාවය" යන්න අර්ථ දක්වන්නේ භූමිකාව ගැටුමකින් යුත් රැකියාවේ දී සහ නිවසේ දී තෘප්තිය සහ යහපත් ක්‍රියාකාරිත්වය ලෙස ය. මෙම න්‍යායට අනුව භූමිකාවන් අතිච්ඡාදනය වන විට බොහෝ ගැටුම් ඇති වන අතර ඒවා බෙදී වෙන් කොට ඇති විට එය සේවකයාගේ වැඩ-ජීවන සමතුලිතතාවය පවත්වා ගෙන යාමේ දී දක්නට ලැබෙන ප්‍රධාන ගැටළු සහ ගැටුම්වලට ඇති ඉඩකඩ අඩු කරයි.

**පර්යේෂණ අරමුණු**

ඇඟළුම් අංශයේ කාන්තා කළමනාකරුවන්ගේ වැඩ-ජීවන සමතුලිතතාවය පිළිබඳ අත්දැකීම් ගවේෂණය කිරීම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. එම ප්‍රධාන අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් පරිදි උප අරමුණු 2 ක් පිහිටුවා ගන්නා ලදී.

01 කාන්තා කළමනාකරුවන්ගේ වැඩ-ජීවන සමතුලිතතාවය සඳහා ඇති අභියෝග හඳුනා ගැනීම

02 කාන්තා කළමනාකරුවන් තම වැඩ-ජීවන සමතුලිතතාවය පවත්වා ගැනීම සඳහා යොදා ගන්නා උපායමාර්ග හඳුනා ගැනීම

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය තුළ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයක් මෙන්ම ගවේෂණාත්මක අධ්‍යයනය වර්ගය භාවිතා කර ඇත. අධ්‍යයනය සඳහා කටුනායක අපනයන සැකසුම් කලාපය තෝරා ගන්නා ලදී. ඒ අනුව තෝරා ගන්නා ලද මැක්ස් ටෙක්ස් කර්මාන්තශාලාව (අන්වර්ථ නාමයකි) යනු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි ඇඟළුම් නිෂ්පාදනය සහ අපනයනකරුවෙකි. දිවයින පුරා නිෂ්පාදන කර්මාන්තශාලා හයක් පිහිටා ඇති අතර මූලස්ථාන කාර්යාලය හොංකොං හි පිහිටා ඇත. සමස්ත සමූහයේ කර්මාන්තශාලාවල විවිධ අංශ භාරව සමාන්‍යාධිකාරි තනතුරු 11 කටයුතු කරනු ඇත. එම තනතුරු අතරින් කාන්තාවන් විසින් තනතුරු 03ක් මෙහෙයවනු ලැබීම විශේෂත්වයක් වේ. මැක්ස් ටෙක්ස් කර්මාන්තශාලාවේ මුළු සාමාජිකයින් ගණන 1063 ක් බව 2021 අප්‍රේල් මස මාසික සේවක සංඛ්‍යා වාර්තාව අනුව පැහැදිලි විය. මුළු සේවක සංඛ්‍යාවෙන් 631 ක් ස්ත්‍රීන් වන අතර පුරුෂයන් 432ක් වේ. කළමනාකරන තනතුරු 57ක් ඇති අතර ඉන් 11ක් ස්ත්‍රීන් විසින් මෙහෙයවන අතර අනෙකුත් තනතුරු 46 පුරුෂයන් විසින් මෙහෙයවනු ඇත.

මෙම අධ්‍යයනය දී සහභාගීවන්නන් තෝරා ගැනීම සඳහා අරමුණු සහගත නියැදියක් (Purposive Sampling) භාවිතා කර ඇත. ඒ අනුව කටුනායක අපනයන සැකසුම් කලාපයේ ආයතනයක සේවයේ නියුතු කාන්තා කළමනාකරුවන් පස්දෙනෙකු සහභාගිකයින් ලෙස තෝරා ගන්නා ලදී. සහභාගිකයින් තෝරා ගැනීමේ දී ඇඟළුම් කර්මාන්ත අංශයෙහි හා අදාළ කර්මාන්තශාලාවේ කළමනාකරණ තනතුරක වසර දෙකක කාලයක් සේවය කර ඇති කාන්තාවන් සහභාගීවන්නන් වීම තෝරා ගැනීමේ ප්‍රධාන නිර්ණායකය විය. මෙහි දී සහාය කළමනාකාර තනතුරෙහි සිට සමූහ කළමනාකාර තනතුර දක්වා විවිධ මට්ටම්වල සේවයෙහි නියුතු කළමනාකාරිණියන් අධ්‍යයනයෙහි සහභාගිකයින් ලෙස ස්වේච්ඡාවෙන් සහභාගි විය.

අධ්‍යයනය තුළ ප්‍රධාන දත්ත එක් රැස් කිරීමේ ක්‍රමය ලෙස අර්ධ ව්‍යුහාත්මක සම්මුඛ සාකච්ඡා භාවිතා කළහ. සහභාගීවන්නන්ගේ ජන විකාශන දත්ත ලබා ගැනීම සඳහා පසුබිම් විස්තර ප්‍රශ්නාවලියක් භාවිතා කරන ලදී. එමෙන්ම මෙම කර්මාන්තශාලාවේ මානව සම්පත් කළමනාකාරිණිය සමඟ සම්මුඛ සාකච්ඡාවක් පැවැත් වූහ. මිට අමතරව ක්ෂේත්‍ර නිරීක්ෂණය හා ලේඛන විශ්ලේෂණය මගින් ද දත්ත රැස් කිරීම සිදු කරන ලදී. එමෙන්ම පසුබිම් විස්තර ප්‍රශ්නාවලිය හා සම්මුඛ සාකච්ඡා නියමාවලියෙහි දළ සැලැස්ම භාවිතා කරමින් නියමු පරීක්ෂාවක් සිදු කර ඇති අතර ලබා ගත් දත්ත තේමාත්මක විශ්ලේෂණ ක්‍රම ඔස්සේ විශ්ලේෂණය කරන ලදී.

**සහභාගිකයින් පිළිබඳ කෙටි විස්තරයක් (Participant Profiles)**

| අන්වර්ථ නාමය | වයස | අධ්‍යාපන මට්ටම | වැටුප් ප්‍රමාණය | විවාහක/ අවිවාහක තත්ත්වය | සමස්ත සේවා කාලය |
|---|---|---|---|---|---|
| **සිතාරා** | 25-29 | උපාධිධාරි | 120,000-160,000 | අවිවාහක | අවුරුදු 3 |
| **ප්‍රියදර්ශනී** | 40-44 | අ.පො.ස. උසස් පෙළ | 200,001-240,000 | විවාහක | අවුරුදු 23 |
| **සෙනුරි** | 25-29 | උපාධිධාරි | 80,001-120,000 | විවාහක | අවුරුදු 3 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **තිවංකි** | 45-49 | අ.පො.ස. උසස් පෙළ | 160,001-200,000 | විවාහක | අවුරුදු 28 |
| **අනුරුද්ධිකා** | 35-39 | උපාධිධාරී | 120,000-160,000 | විවාහක | අවුරුදු 12 |

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

**සහභාගිකයන්ට වැඩ-ජීවන සමතුලිතතාවය සඳහා ඇති අභියෝග**

දත්ත විශ්ලේෂණයේ දී සහභාගිකයන්ගේ වැඩ-ජීවන සමතුලිතතාවය සඳහා බලපාන ප්‍රධාන අභියෝග තුනක් හඳුනා ගත හැකි විය; පුද්ගලයා සම්බන්ධ, පවුල සම්බන්ධ හා රැකියාව සම්බන්ධ අභියෝග ලෙස ය. එම සාධක තුන පර්යේෂණ සාහිත්‍යය තුළ තිබෙන සොයාගැනීම් තුළින් ද තහවුරු කළ හැක (Weerawansa & Gunasekara, 2019).

**පුද්ගලයා සම්බන්ධ අභියෝගය**

සහභාගිකයින් හට ස්ත්‍රී පුරුෂ සමාජභාවය හේතුවෙන් රැකියා ස්ථානයේ සමාජ සම්බන්ධතා පිළිබඳ ගැටළු මතු වේ. ශ්‍රී ලාංකීය සම්ප්‍රදායික සමාජ සන්දර්භය තුළ කාන්තාව සාමාජීය හා සංස්කෘතික වශයෙන් යම් යම් කරුණු කාරණාවන්වල දී සීමා කිරීම්වලට ලක්වේ. ගෙදර දොර හා දරුවන්ගේ කටයුතු ඇය විසින්ම කළ යුතු ය යන මතයක් පවතී. නමුත් වර්තමාන සමාජ සන්දර්භය තුළ මෙම තත්ත්වය යම්තරමක් හෝ වෙනස් වී ඇති අතර පවුල තුළ කාන්තාව මුදල් උපයන්නියක් බවට පත් වී ඇත. එවැනි අවස්ථාවල දී මෙම ද්විත්ව භූමිකා අතර ගැටුමක් නිර්මාණය වී සමහර කාන්තාවන් හට තම රැකියා ජීවිතයෙන් ඉවත් වීමට සිදු වූ අවස්ථා පිළිබඳ අනුරුද්ධිකා සඳහන් කළේ ය.

> “Ladies ට ගොඩක් බලපෑම් තියෙනවනේ. අන්න ඒවගේ තැන්වල දී චුට්ටක් අමාරුයි Lady Manager කෙනෙක් විදියට වැඩ කරන්න. නමුත් අපි Strong සහ Control කරන්න දැන ගන්න ඕනා.” (සම්මුඛ සාකච්ඡාව: අනුරුද්ධිකා).

කාන්තා කළමනාකාරිණියක් ලෙස විශේෂයෙන්ම ඇඟළුම් කර්මාන්ත ක්ෂේත්‍රය තුළ රාජකාරි කටයුතු සිදු කිරීමේ දී එකිනෙකා සමඟ සම්බන්ධ වෙමින් තම කාර්යයන් ඉටු කිරීමට සිදු වේ. එහි දී විවිධ සමාජ පසුබිම්වල, අධ්‍යාපන මට්ටම් හා ආකල්ප මෙන්ම අදහස් වලින් යුතු මිනිසුන් හමුවේ. යම් යම් පුද්ගලයන්ගේ ක්‍රියාකලාපයන් යහපත් නොවුව ද ඔහු හෝ ඇය මඟහැර රාජකාරි කටයුතු සිදු කර ගැනීමට නොහැකි වන අවස්ථාවන් සඳහා මුහුණදීමට සිදුවන බව අනුරුද්ධිකා පවසයි. එවැනි අවස්ථාවල රාජකාරි කටයුත්ත සිදු කරගෙන අනවශ්‍ය දෑ පාලනය කරගෙන කටයුතු කිරීමට විශේෂයෙන් කාන්තාවක් ලෙස කටයුතු කිරීමට වගබලා ගැනීම අභියෝගාත්මක බව අනුරුද්ධිකා පවසයි.

අඩු සේවා පළපුරුද්ද වැඩ-ජීවන සමතුලිතතාවය සඳහා ඇති අභියෝගයක් ලෙස දත්ත විශ්ලේෂණයේ දී හඳුනා ගැනීමට හැකි විය.

> “වැඩ පරිසරය තුළ ඇති Barriers, වැඩ කරගෙන යද්දි එතන ඉන්න මිනිස්සුන්ගේ එන ප්‍රශ්න, පොඩි කාලපරිච්ඡේදයක් තුළ මේවාට මුහුණ දීම ලොකු අභියෝගයක් වුණා.” (සම්මුඛ සාකච්ඡාව: සෙනුරි).

සෙනුරි මෙම කර්මාන්තශාලාවේ විධායක නිලධාරිනියක් ලෙස රාජකාරි කටයුතු කිරීමට සම්බන්ධ වේ. මාස හයක පමණ ඉතා කෙටි කාලයක් තුළ කළමනාකාර තනතුරකට පත් වීම මත ඇයට මෙම ක්ෂේත්‍රය තුළ

පවතින පළපුරුද්ද අවම බව රාජකාරි කටයුතු සිදු කිරීමේ දී ප්‍රබල අභියෝගයක් වී ඇත. විශේෂයෙන්ම උපාධිධාරිණියක් වීම හා කෙටි කලකින් ඉහළ තනතුරකට පත් වීම යන හේතු සාධක මත ඇයට අනෙකුත් වෘත්තීය සගයන් සමඟ කටයුතු කිරීම මුල් කාලය තුළ තරමක් අභියෝගාත්මක වී ඇත. මෙවැනිම අත්දැකීමක් සිතාරා ද ලබා ඇති බව සම්මුඛ සාකච්ඡාවේ දී ඉදිරිපත් කරන ලදී.

**පවුල සම්බන්ධ අභියෝග**

රැකියා ක්ෂේත්‍රය පිළිබඳ පවුලේ සාමාජිකයින්ගේ ආකල්පය සහභාගිකයින්ට අභියෝගයක් වී ඇත.

> “Apparel Industry එකේ කිව්වාම අපේ ගෙදරින් වුනත් මුලින් කැමති වුනේ නෑ. Airport & Aviation යද්දී මාර proud එයාලට........ මොනවා උනත් Garment කෙල්ලෙක්නේ කියන තැන තමයි එයාලා හිටියේ.” (සම්මුඛ සාකච්ඡාව: සිතාරා)

සිතාරා රාජ්‍ය විශ්ව විද්‍යාල අධ්‍යාපනයෙන් පසු සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි මාස තුනක් පමණක් රාජකාරි කර පසුව ඇඟළුම් කර්මාන්ත ක්ෂේත්‍රය හා සම්බන්ධ වන්නේ විධායක නිලධාරිණියක් ලෙස ය. නමුත් එවැනි තනතුරක් දැරුව ද පවුල හා සමාජයෙන් ඇයට ලැබුණු පිළිගැනීම එතරම් සතුටුදායක නොවූ බව සිතාරා පවසයි. තම දෙමාපියන් රජයේ ඉහළ පෙළේ තනතුරු දරන්නන් බැවින් තම දියණිය ද ඒහා සමාන රැකියාවක් කරනු ඇතැයි යන්න ඔවුන්ගේ අපේක්ෂාව විය. නමුත් පවුල තුළ ඇයට හිමි වී තිබූ ප්‍රතිරූපය හා ඒ පිළිබඳ සමාජයේ පවතින ආකල්පයන් හි වෙනසක් ඇති කිරීමට ඇයට කළමනාකාරිණියක් ලෙස පත් වීමෙන් හැකියාව ලැබුණු බව සිතාරා පවසයි. Whitehead & Kotze (2003) සිය අධ්‍යයනයෙන් විශ්ලේෂණය කළේ නිවසේ සමාජීය අදහස් හා ආකල්ප කාන්තා සේවිකාවන්ගේ ජීවිතයේ සමගිය හා තෘප්තිය ගෙන ඒමට ඉවහල් වන බව ය.

පවුල තුළ භූමිකා සහ වගකීම් කොටස තවත් අභියෝගයක් ලෙස හඳුනා ගැනීමට හැකි විය. එහි දී ප්‍රධාන වශයෙන් බිරිඳක්, මවක් සහ ගෘහණියක් යන භූමිකාවන් තුළ වැඩ-ජීවන සමතුලිතතාවය පවත්වා ගැනීම ඔවුනට අභියෝගාත්මක වී ඇත.

> “මම Assistant Manager කෙනෙක් විදියට වැඩභාර ගනිද්දි අවිවාහකයි. දැන් විවාහකයි. ගැබිණි මවක්. දැන් මට තේරෙනවා ලොකු වගකීම් ටිකක් මගේ වටේ තියෙනවා කියලා.” (සම්මුඛ සාකච්ඡාව: සෙනුරි).

සෙනුරි විවාහ වීමට පෙර තම සම්පූර්ණ කාලයම රැකියාව සඳහා යොමු කර ඇත. නමුත් බිරිඳක් හා මවක් වීමට අපේක්ෂාවෙන් සිටින ඇයට එම ජීවිතය තරමක් අභියෝගාත්මක වී ඇත. දියණියක ලෙස තම පවුලේ පිරිස සමඟ ජීවත් වන කාලයේ දී ඇයට එතරම් වගකීමක් පවුල තුළ නොවීය. නමුත් වර්තමානයේ භූමිකා වෙනස්වීම මත ඇය විසින් ඉටුකළ යුතු වගකීම් මොනවාද යන්න පිළිබඳ පැහැදිලි අවබෝධයකින් හා වැටහීමකින් කටයුතු කරන බව පවසයි. වෘත්තීය කාන්තාවක් බහු භූමිකාවන් රඟ දක්වනු ලබන අතර එහි දී දුවෙකු, බිරිද, ගෘහණිය සහ මව ලෙස ඒවා විස්තර කළ හැකි බව දක්වා ඇත (Sandeep, 2017).

මවක් බිරිඳක් ලෙස කටයුතු කරමින් සතියේ දවස් පහ තුළ දෛනිකව පැය දොළහක සේවා කාලයක් රාජකාරි කරන ප්‍රියදර්ශනිට ද එය අභියෝගාත්මක ය. රැකියාව හා පවුල් ජීවිතය තුළ තීරණාත්මක අවස්ථාවල දී ප්‍රියදර්ශනී තම පවුලට මුල් තැන දෙමින් කටයුතු කරන කාන්තා කළමනාකාරිණියක් බව පැහැදිලි විය. සමහර අවස්ථාවන් වල දී එම භූමිකා දෙකෙහි ගැටුම් ඇති නොකර ගනිමින් ජීවිතය තුළ ඇය එක් භූමිකාවක් සඳහා තම වැඩි අවස්ථාව ලබා දී ඇත. Lambert (1990) පුද්ගලයෙකුට තමන් සෑහීමකට පත් නොවන

විෂයෙහිලා සම්බන්ධ වීම අඩු කළ හැකි අතර ඔවුන්ට වඩා තෘප්තිමත් යැයි හැඟෙන විෂයට සම්බන්ධ වීම වැඩි කළ හැකි බව දක්වා ඇත. Stone (2007) විසින් කරන ලද අධ්‍යයනය අනුව මව්වරුන් ලෙස සාර්ථකව කටයුතු කිරීමට ඇති බැවින් බොහෝ කාන්තාවන් වෘත්තීය ජීවිතයෙන් ඉවත් වන බව දක්වයි. Meyers & Gornick (2005) දක්වන්නේ ද ළමා රැකවරණය වර්තමාන වැඩ කරන මව්වරුන් හට අභියෝගයක් වන බව සඳහන් කර ඇත. එයට හේතුවක් ලෙස Nordenmark (2004) සිය අධ්‍යයනයෙන් පෙන්වා දෙන්නේ පවුල තුළ දරුවන් රැක බලා ගැනීමේ දී කාන්තාවන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කිරීම ය. ඒ අනුව කාන්තාවන් කාර්යභාරය අධික වීමෙන් පීඩා විඳින බවත් පිරිමින්ට සාපේක්ෂව ළමයින් සම්බන්ධයෙන් වැඩි කැප කිරීම් කරන බව ය (Broadbridge, 2009).

විස්තීරණ පවුලක සහාය නොලැබීම අභියෝගයක් බව දත්ත විශ්ලේෂණයේ දී හඳුනා ගැනීමට හැකි විය.

> "මට දෙමාපියන්ගෙන් කාගෙන්වත්ම උදව්වක් නැහැ. එයාලා ඉන්නේ මගේ ළඟ නොවෙයි. එයාලා හම්බන්තොට ඉන්නේ." (සම්මුඛ සාකච්ඡාව: ප්‍රියදර්ශනී).

ප්‍රියදර්ශනී හට දරුවා කුඩා අවධියේ දී රැකියාවෙන් ඉවත් වීමට සිදු වූයේ තම සැමියාගේ සහාය හැර වෙනත් සහායක් නොලැබුන නිසාවෙන් බව පවසයි. ඇයගේ දෙමාපියන් සහ සැමියාගේ දෙමාපියන් වෙනත් පළාත්වල ජීවත් වේ. එනිසා ඇයට අනිකුත් සහභාගිකයන්ට මෙන් තම දෙමාපියන්ගේ හෝ තම සැමියාගේ දෙමාපියන්ගෙන් සහායක් නොලැබේ. Whitehead & Kotze (2003) දක්වන පරිදි පවුල තුළ ආධාරක ව්‍යුහයන්ගේ සහාය නොලැබුණ හොත් වැඩ-ජීවන සමතුලිතතාවය පවත්වා ගැනීමේ දී යම් අභියෝගාත්මක බවක් ඇතිවන බව දක්වා ඇත.

**රැකියාව සම්බන්ධ අභියෝග**

සහභාගිකයින් හට පැවරී ඇති වැඩ කොටස හා ඒ සම්බන්ධ වගකීම් සෑම දිනකම අභියෝගාත්මක වී ඇත.

> "මං Plant හයකට ඉන්නේ. Plant හයේම වැඩ කටයුතු බලන්න ඕනා. Employees ලා 5000 ක් වගේ ඉන්නවා." (සම්මුඛ සාකච්ඡාව: සිතාරා).

ප්‍රධාන කර්මාන්තශාලාවෙහි කළමනාකාරිණියක් ලෙස කටයුතු කරන සිතාරා හට සමූහය සතු සියලුම කර්මාන්තශාලාවන්හි සේවක පිරිසට අදාළ වැඩ පැවරීම් කොටසක් ඉටු කිරීමට සිදු වී ඇති අතර එය දැඩි අභියෝගාත්මක බව පවසයි.

> "මම දනට වුනත් කොහේ ගියත් Laptop එක අතට අරගෙන තමා යන්නේ. ඒ කියන්නේ බෙහෙත් ටික අරන් යනවා වගේ මේක අරන් යන්නේ " (සම්මුඛ සාකච්ඡාව: අනුරුද්ධිකා).

අනුරුද්ධිකා කළමනාකාරිණියක් ලෙස සමූහය සතු කර්මාන්තශාලා සියල්ලේම අමතර ද්‍රව්‍ය සැපයුම් කිරීමේ වගකීම භාරව කටයුතු කරයි. පැවරී ඇති රාජකාරි කොටස සහ එහි වගකීම නිසා ඇය සෑම වෙලාවකම රාජකාරි කටයුත්තක් සිදු කිරීමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා සූදානම්ව සිටින බව පවසයි. නමුත් එය ජීවිතයේ කරදරයක් බාධාවක් ලෙස පිළිනොගන්නා අතර පවුලේ සාමාජිකයින් ද මේ පිළිබඳ මනා අවබෝධයකින් කටයුතු කරන බව ඇය පවසයි.

තම වෘත්තීය සගයන්ගේ පිළිගැනීම පිළිබඳ ගැටළු ද වැඩ-ජීවන සමතුලිතතාවයට බලපාන රැකියාව හා සම්බන්ධ අභියෝගයක් බව සහභාගිකයින් විසින් පවසයි. ඇඟළුම් ක්ෂේත්‍රය අන්තර් සම්බන්ධිත කාර්යබද්ධ

ක්‍රියාවලියකි. පුද්ගලයා හට තනිව ක්‍රියාකාරී වී රාජකාරී කටයුතු කළ නොහැකිය. සෑම අංශයක්ම එකිනෙකට සම්බන්ධිත සෑම ක්‍රියාවක්ම අවසාන නිෂ්පාදනය සඳහා බලපෑමක් සිදු කරනු ලබයි. එම නිසා විවිධ පුද්ගලයින් සමඟ කටයුතු කිරීමට සිදු වන අතර විවිධ පුද්ගල හැසිරීම් රටාවන් ඒ තුළ දැක ගත හැකිය.

> "…. Support කරන්නේ නෑ. මම මගේ Position එකට ඉක්මනට ආපු කෙනෙක්. මාස 3ක් විතර යනකම් මාව Accept කළේ නෑ කට්ටිය. මං සද්ද නැතුව හිටියා. දැන් Accept නොකරපු අය Accept කරනවා." (සම්මුඛ සාකච්ඡාව: සිතාරා).

විධායක නිලධාරිණියක් ලෙස මෙම ආයතනයට සම්බන්ධ වූ සිතාරා ඉතාම කෙටි කාලයකින් සිය අධ්‍යාපන සුදුසුකම්, දක්ෂතා හා හැකියා මත කළමනාකාරිණියක් බවට පත් වී ඇත. එහි දී කළමනාකරණ තනතුරුවල කටයුතු කරමින් සිටින ස්ත්‍රී-පුරුෂ දෙපාර්ශවයෙන්ම ඇයව නොපිළිගැනීම සිදු කර ඇත. ඉහළ අධ්‍යාපනික මට්ටම හා හැකියා මත කෙටි කාලයක් තුළ වෘත්තීය ජීවිතය සාර්ථක කරගත් ඇ මෙන්ම ඉහළ අධ්‍යාපනික සුදුසුකම් නොලබා සේවා පළපුරුද්ද මත කළමනාකරණ තනතුරට පත් ස්ත්‍රී-පුරුෂ දෙපාර්ශවයම ආයතනයෙහි සිටින බව ජනවිකාශන දත්තවලින් සහ මානව සම්පත් කළමනාකාරිණිය සමඟ සිදු කරන ලද සම්මුඛ සාකච්ඡාව තුළින් පැහැදිලි විය. එම හේතු නිසාම සිතාරා වැනි කළමනාකාරිණියකට මෙවැනි අභියෝගයන්ට මුහුණ දීමට සිදු වී ඇත. සෙනුරි ද මෙවැනිම වූ අත්දැකීමකට මුහුණ දී ඇති අතර ඇය වැනි ඉහළ අධ්‍යාපනයක් ලබා අඩු රැකියා පළපුරුද්දක් සහිත කාන්තාවකට පළපුරුදු සහිත පුරුෂ කළමනාකරුවන් සමඟ රාජකාරි සිදු කිරීම තරමක් අභියෝගාත්මක වී ඇත. සිතාරා හා සෙනුරි යන දෙදෙනාම එකම අංශයක් තුළින් කළමනාකාර තනතුරට උසස් වීම් ලද කාන්තාවන් වේ. එමෙන්ම ඔවුන් පෙර රාජකාරි සිදු කරන ලද දෙපාර්තමේන්තුව හා එහි ප්‍රධානියා පිළිබඳව අනිකුත් කළමනාකාර තනතුරු දරන්නන් කෙරෙහි එතරම් පැහැදීමක් නොමැති බැවින් වර්තමානයේ වෙනත් දෙපාර්තමේන්තුවක රාජකාරි කළ ද ඔවුන්ට කළමනාකාර තනතුරෙහි මුල් කාලය තුළ මෙලෙස නොපිළිගැනීමට හේතු වූ බව ඔවුන් පවසයි. මෙවැනි තත්ත්වයන් කර්මාන්තශාලාව තුළ ඇති වීමට හේතු වී ඇත්තේ පුද්ගල ආකල්ප, අදහස්, සිතුවිලි වේ. සමහර අවස්ථාවල පිරිමි කළමනාකරුවන්ගෙන් පමණක් නොව කාන්තාවකට කාන්තාවක්ම ප්‍රශ්න ඇති කරන අවස්ථා තිබෙන බව ප්‍රියදර්ශනී විසින් ද සඳහන් කරන ලදී.

අවම සේවක සංඛ්‍යාවකින් වැඩ කළමනාකරණය කිරීම ප්‍රබල අභියෝගයක් බව දත්ත විශ්ලේෂණයේ දී හඳුනා ගැනීමට හැකි විය.

> "අපේ Department එකේ ඉන්නේ තුන්දෙනයි. GM, මම Manager සහ තව Assistant Manager කෙනෙක් ඉන්නවා.' අපි තුන්දෙනා තමයි Plant හයටම වැඩ කරන්න ඕන." (සම්මුඛ සාකච්ඡාව: සිතාරා).

කර්මාන්තශාලා සමූහය සතුව පිහිටා ඇති ආයතන 6 හි රාජකාරි කටයුතු ඔවුන් විසින් ඉටු කළ යුතු වේ. ඇයගේ අංශයෙහි ඇති අනෙක් විශේෂත්වය වන්නේ සියලු දෙනාම කළමනාකරණ තනතුරු දරන්නන් මෙන්ම ඔවුන් කාන්තාවන් වීමය. ප්‍රධාන කාර්යාලයෙහි රැඳී සිට රාජකාරි කටයුතු කළ ද සතියකට හෝ දෙසතියකට වරක් අනෙකුත් පළාත් තුළ පිහිටා ඇති සමූහයෙහි සහෝදර කර්මාන්තශාලා වෙත ගොස් රාජකාරි කටයුතු කිරීමට ඔවුන්ට සිදුවේ. ආයතනයෙහි සතු විශාල වගකීම් කොටසක් මෙම කාන්තා කළමනාකාරිණියන් තිදෙනා මත පැවරී ඇති අතර එම වැඩ කළමනාකරණය කිරීම අභියෝගාත්මක වී ඇත.

> "මම වැඩ කරන්නේ එක ආයතනයක එක් නිලධාරියෙකු සමඟයි. ආයතන හයේම එහෙම තමයි." (සම්මුඛ සාකච්ඡාව: තිවංකි).

ආයතන හය තුළ විශාල වගකීම් කොටසක් තිවංකි විසින් ඉටු කළ යුතු වේ. නමුත් ඇය හා සම්බන්ධීකරණ කටයුතු සිදු කරමින් තම දෙපාර්තමේන්තුවෙහි වගකීම් ඉටු කිරීමට සෑම ආයතනයකම තවත් එක් නිලධාරියෙකු පමණක් සිටිනු ඇත. එදිනෙදා රාජකාරි වගකීම් සියල්ලම එක් නිලධාරියෙකු සමඟ සිදු කිරීම ඇයට විශාල අභියෝගයක් බව පවසයි. එම නිලධාරියා සේවයට නොපැමිණියහොත් ඊට ආසන්නතම ආයතනයෙහි නිලධාරියා මාර්ගගත ක්‍රමය ඔස්සේ හෝ අත්‍යවශ්‍ය අවස්ථාවක දී නම් එම කර්මාන්තශාලාව වෙත ගොස් රාජකාරි කටයුතු කරමින් තම දෙපාර්තමේන්තුව තුළ වැඩ ආවරණය කර ගැනීම සිදු කරන බව ඇය පවසයි.

තම රාජකාරි වේලාව ද සමහර සහභාගිකයන් සඳහා අභියෝගාත්මක වී ඇත. කාර්යාල කාර්යය මණ්ඩලයේ සාමාන්‍ය පැමිණීමේ හා පිටවීමේ වේලාව පෙරවරු 8 සිට පස්වරු 6 වේ. කර්මාන්තශාලා කාර්යය මණ්ඩලයේ පැමිණීමේ හා පිටවීමේ වේලාව පෙරවරු 7.30 සිට පස්වරු 5.30 දක්වා වේ. නමුත් මෙම ප්‍රධාන කර්මාන්තශාලාවෙහි දෛනික රාජකාරි කටයුතු පැය 12ක් එනම් පෙරවරු 7.30 සිට පස්වරු 7.30 දක්වා සිදු කෙරේ. එනිසා කර්මාන්තශාලා කාර්යය මණ්ඩලයට සාමාන්‍ය පිටවීමේ වේලාව පස්වරු 5.30 වුවත් ඔවුන් ද කර්මාන්තශාලාවේ සේවක මණ්ඩලය සමඟ දෛනික වැඩ නිමාවන වේලාව වන පස්වරු 7.30 දක්වා අනිවාර්යයෙන්ම රාජකාරි කටයුතු සිදු කිරීමට සිදුවන බව කර්මාන්තශාලා කාර්යය මණ්ඩලයට අයත් මෙම අධ්‍යයනය සඳහා සහභාගිවූ කළමනාකාරිණියක් විසින් පවසන ලද අතර ඒ බව ක්ෂේත්‍ර නිරීක්ෂණයන් හි යෙදෙන අවස්ථාවල දී දැක ගැනීමට ලැබුණි. ඒ අනුව ඇයට සතියේ දින පහ තුළ දෛනිකව රාජකාරිය සඳහාම පැය 12ක කාලයක් වැය කිරීමට සිදු වීම තරමක් අභියෝගයක් වී ඇත. Nigam (2013) සඳහන් කරන්නේ දිගු සේවා කාලයක් වැඩ කිරීම හේතුවෙන් ඉන්දියාවේ කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්වය අඩු වීමේ ප්‍රවණතාවයක් මෙන්ම කාන්තා සේවකයින්ගේ වැඩ-ජීවන අසමතුලිතතාවයට හේතු වූ බව ය. විශේෂයෙන් කාර්යාල කාර්යය මණ්ඩලය තම මව් සමාගම හා විදේශ රටවල් හි පිහිටා ඇති සමාගම සතු ආයතන සමඟ කටයුතු කිරීමට සිදුවේ. එහි දී ඔවුන් වැඩ කිරීමේ දී වේලාව වෙනස් වීමේ ගැටළුවට මුහුණ දෙයි.

> "අපි 8-6 Off වෙලා ආවට UK අය වැඩ කරනවා. එතකොට එගොල්ලන්ගේ Mail අපට එන්නේ අපි Off වුනාට පස්සේ. ඒ අතර Urgent මොනවාහරි තියෙනවා නම් ගෙදර ඇවිත් වැඩ කරනවා." (සම්මුඛ සාකච්ඡාව: තිවංකි).

කාර්යාල කාර්යය මණ්ඩලය තුළ මෙවැනි රාජකාරි වේලාවෙහි ස්වරූපයක් පැවතියත් කර්මාන්තශාලා කාර්යය මණ්ඩලය හට මෙවැනි අත්දැකීම් සඳහා මුහුණපෑමට සිදුවන අවස්ථා ඉතා විරලය. එයට හේතුව වන්නේ ඔවුන් සෘජුවම නිෂ්පාදන අංශය සමඟ පමණක් කටයුතු කරන නිසාවෙනි. ඔවුන්ගේ රාජකාරියේ බොහෝ වගකීම් කර්මාන්තශාලාව තුළ දී සිදු කිරීමට වීම විශේෂත්වයකි. සති අන්තයේ සෙනසුරාදා දිනයේ නිවසේ සිට පැය කිහිපයක් හෝ රාජකාරි කටයුතු සිදු කිරීමට වීමද සහභාගිකයන් කිහිපදෙනෙකු මුහුණ දෙන අභියෝගයකි. බස්නාහිර පළාතෙන් පිට පිහිටා ඇති අනෙකුත් කර්මාන්තශාලා තුළ දෛනික රාජකාරි වේලාව පෙරවරු 7.30 සිට පස්වරු 5.30 දක්වා වන අතර සෙනසුරාදා දින රාජකාරි දිනයක් වේ. එම හේතුව නිසා විශේෂයෙන්ම කාර්යාල කාර්යය මණ්ඩලයට සෙනසුරාදා දිනයේ දී පිට පළාත් කර්මාන්තශාලා සමඟ සම්බන්ධීකරණය වෙමින් රාජකාරි කටයුතු සිදු කිරීම වේ. එම නිසා මෙම කාණ්ඩයට අයත් කළමනාකරු තනතුරු දරන්නන් හට සම්පූර්ණ සෙනසුරාදා දිනයම නොවුනත් පැය කිහිපයක් හෝ එදින නිවසේ සිට රාජකාරි කටයුතු සිදු කරනු ලබන බව සහභාගිකයන් විසින් පවසන ලදී.

**සහභාගිකයින් තම වැඩ-ජීවන සමතුලිතතාවය පවත්වා ගැනීම සඳහා භාවිතා කරන උපායමාර්ග**

සහභාගිකයින්ට වැඩ-ජීවන සමතුලිතතාවය පවත්වා ගැනීම අභියෝගාත්මක වන බව දත්ත විශ්ලේෂණයේ දී පැහැදිලි විය. නමුත් ඔවුන් වඩා යහපත් වූ වැඩ-ජීවන සමතුලිතතාවයක් පවත්වා ගැනීම සඳහා විවිධ උපායමාර්ග භාවිතා කරනු ලැබේ. ඒ අනුව සහභාගිකයින් භාවිතා කරන්නා වූ උපායමාර්ග ප්‍රධාන වර්ග තුනක් හඳුනා ගැනීමට හැකි විය. එනම්; පෞද්ගලික ජීවිතය, රැකියා ජීවිතය සහ පෞද්ගලික හා රැකියා ජීවිතයේ දී භාවිතා කරන උපායමාර්ග ලෙස ය.

**පෞද්ගලික ජීවිතය හා සම්බන්ධ උපායමාර්ග**

තම දරුවන්ව කුඩාකල සිටම තනියම වැඩ කටයුතු කර ගැනීමට හුරු කරවීම පෞද්ගලික ජීවිතයේ දී භාවිතා කරන උපායමාර්ගයක් ලෙස හඳුනාගත හැකි විය. ප්‍රියදර්ශනීගේ වයස අවුරුදු නවයක් වන තම දෙවැනි දියණියගේ සහයෝගය උදව් උපකාර ඇයගේ යම් යම් කාර්යයන් සඳහා ලබා ගන්නා බවත් තම දියණිය විසින් ඇයට ඉටු කර ගැනීමට හැකි කාර්යයන් තනිව සිදු කර ගන්නා බව ප්‍රියදර්ශනී පවසයි. එම දියණිය, ඇයට තේ කෝප්පයක් පිළියෙල කර ගෙනවිත් දෙන ආකාරය සම්මුඛ සාකච්ඡාව සිදු කරමින් සිටින විට පවා නිරීක්ෂණය විය. තිවංකිගේ පුතා විසින් පවුල තුළ මෙවැනි තත්ත්වයක් දැක ගැනීමට හැකි විය. එම නිසා එය වැඩ-ජීවන සමතුලිතතාවය පවත්වා ගැනීමට ධනාත්මක උපායමාර්ගයක් ලෙස උපකාරී වී ඇත.

පවුල තුළ වැඩ බෙදා ගැනීම උපායමාර්ගයක් ලෙස භාවිතා කරන බව අනුරුද්ධිකා පවසයි. ඇයට විස්තීර්ණ පවුලක සහාය ලැබෙන අතර තම සැමියාගේ දෙමාපියන් ඔවුන් සමග ජීවත් වේ. එනිසා ඇයට රැකියා කටයුතු කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට හැකියාව ලැබී ඇති අතර නිවසේ කාර්යය කොටස් හා වගකීම් ඔවුන් සමග බෙදා ගනිමින් සිදු කිරීමට ඇය යොමු වී ඇත.

> “වැඩට යන දවස්වල මම නැගිටින කොට නැන්දම්මා ඔක්කොම උයලා තියෙනවා. මට බත් ටික බදින්න විතරයි තියෙන්නේ.” (සම්මුඛ සාකච්ඡාව: අනුරුද්ධිකා)

නමුත් ඔවුන්ගේ සහාය ලැබුන ද ඇය විසින් ඉටු කළ යුතු සියල්ල සිදු කරන බව පවසයි. ඊළඟ දිනට කෑම පිළියෙළ කිරීම සඳහා අවශ්‍ය සියල්ල තම සැමියා සමග පෙර දිනයේ සූදානම් කරන බවත් සෑම දිනකම රාත්‍රි ආහාරය තම සැමියා සමග පවුලේ සියලු දෙනා හට පිළියෙළ කර දෙන බවත් පවසයි. ඇය එලෙස කටයුතු කළ ද එය වගකීමක් ලෙස නොදැනෙන්නේ තම පවුලේ සියලු දෙනා වෙතින් සහායක් ලැබෙන බැවින් ය. Chandra (2012) ඉන්දියානු වැඩ කරන කාන්තාවන් තම රැකියාව සහ පවුල් ජීවිතය ඒකාබද්ධ කිරීම සඳහා භාවිතා කරන උපායමාර්ග ලෙස කලත්‍රයා, දෙමාපියන්, නැන්දම්මා වැනි සමාජ ආධාරක වලින් උපකාර ලබා ගැනීම පිළිබඳව දක්වා ඇත.

**රැකියා ජීවිතය හා සම්බන්ධ උපායමාර්ග**

වැඩ-ජීවන සමතුලිතතාවය පවත්වා ගැනීම සඳහා භාවිතා කරන දෙවැනි උපායමාර්ග වර්ගය වන්නේ රැකියා ජීවිතයේ දී භාවිතා කරන උපායමාර්ග වේ. එය නැවත අනු කොටස් තුනක් ඔස්සේ සාකච්ඡා කළ හැකිය; තම කණ්ඩායම තුළ භාවිතා කරන උපායමාර්ග, රැකියා ආයතනයේ අනිකුත් අංශ සමඟ කටයුතු කිරීමේ දී භාවිතා කරන උපායමාර්ග සහ වෙනත් භාවිතයන් වශයෙනි.

තම කණ්ඩායම පුහුණු කිරීම හා ආකල්පමය සංවර්ධනයක් ඇති කිරීම උපායමාර්ගිකව තම රැකියා ජීවිතයේ සමබරතාවය හා සාර්ථකත්වය කෙරෙහි යොදා ගන්නා බව දත්ත විශ්ලේෂණයේ දී පැහැදිලි විය.

> "......ඒ අයගේ දැනුම කොච්චර දුරට මේ ආයතනයේ වැඩ වලට සුදුසු ද? එහෙම නැතිනම් Training කරන්න ඕන ද? මෙයාලාගේ ආකල්ප හොඳ නැත්නම් කොහොමද ආකල්ප හදන්නේ? ඉස්සෙල්ලා ඉන්න අයව හඳුනාගෙන තමයි මම රැකියාවේ හැමදාම සාර්ථක වුනේ." (සම්මුඛ සාකච්ඡාව: ප්‍රියදර්ශනී).

තම කණ්ඩායම පිළිබඳ මනා අවබෝධයක් ලබා ගනිමින් ඔවුනට අවශ්‍ය වෘත්තීමය දැනුම, කුසලතා සංවර්ධනය මෙන්ම තම කණ්ඩායමෙහි සාමාජිකයින්ගේ ආකල්පමය සංවර්ධන තුළින් සාමාජිකයින්ගේ පෞද්ගලික හා වෘත්තීමය දියුණුව කරා යොමු කරවමින් ප්‍රියදර්ශනි ද තම වෘත්තිය සාර්ථකත්වය කරා යොමු වන බව පවසයි. ඒ බව රාජකාරි දිනක දී ඇය විසින් සිදු කරනු ලබන උදෑසන රැස්වීමක් නිරීක්‍ෂණය කිරීමෙන් ද පැහැදිලි විය. තිවංකි පවසන්නේ ද තමාගේ රැකියාව පිළිබඳ හොඳ දැනුමක් අවබෝධයක් තමාට තිබෙන බවත් එලෙසම තම කණ්ඩායමේ සාමාජිකයින් හට ද තම අංශයට අදාළ ඕනෑම කාර්යයක් සිදු කිරීමට හැකි වන පරිදි දැනුම ලබා දී පුහුණු කර ඇති බව පවසයි. කණ්ඩායම් සාමාජිකයා සතුව දැනුම කුසලතා ඌනතාවයක් ඇත්නම් කළමනාකාරිණියක් නායිකාවක් සහ පුහුණුකරවන්නියක් ලෙස තමා මැදිහත් වෙමින් සාමාජිකයින් සංවර්ධනය කරා යොමු කරවා ගැනීම තුළ ඇයගේ වැඩ-ජීවන සමතුලිතතාවයට යහපත්ව පවත්වා ගැනීමට කටයුතු කරයි.

සුදුසු පුද්ගලයා රාජකාරිය සඳහා යෙදවීම උපායමාර්ගයක් ලෙස සහභාගිකයින් භාවිතා කරයි. එහි දී තම කණ්ඩායමට සාමාජිකයින් බඳවා ගැනීම් සිදු කරන අවස්ථාවන්හි දී පළමු සම්මුඛ පරීක්‍ෂණයෙහි සාමාජිකාවක් වශයෙන් ඔවුන් සම්බන්ධ වන බව පවසයි. එම නිසා සුදුසු පුද්ගලයා තම කණ්ඩායමට බඳවා ගැනීමට එමගින් හැකියාව ලැබේ. ඒ තුළින් බඳවා ගත් නවකයින් නිවැරදි මඟ පෙන්වීම හා පුහුණු කිරීම් ඔස්සේ නිවැරදිව රාජකාරිය සඳහා යොමු කරවීමට හැකියාව ලැබේ.

අධීක්‍ෂණය හා පසු විපරම රැකියා ජීවිතයේ දී භාවිතා කරන තවත් උපායමාර්ගයක් ලෙස ක්‍රියාවට නඟන බව දත්ත විශ්ලේෂණයේ දී පැහැදිලි විය.

> "හැම තැනදීම අපි අනිත් අය Monitor කරන්න ඕනා. එයාලගේ මොනව ද අඩුපාඩු තියෙන්නේ කියලා එයාලා ගැන හොඳ Follow up එකක් තියෙන්න ඕනා. ඒ Monitoring එකයි Follow up එකයි හරියට කරගෙන යනවා නම් ගොඩක් වෙලාවට Plan එකක් Achieve කරන එක අමාරු නෑ." (සම්මුඛ සාකච්ඡාව: ප්‍රියදර්ශනි).

තම කණ්ඩායමේ සාමාජිකයන් හට යම්කිසි කාර්යයක් පැවරූ පසු එය ඉටු කිරීමට මොනයම් හෝ ගැටළු අඩුපාඩු තිබේ දැයි පරීක්‍ෂා කරමින් කාර්යය සාර්ථකව කර ගැනීම දක්වා පසුවිපරමකින් යුතුව කටයුතු කිරීම හරහා වැඩ කළමනාකරණය කර ගත හැකි බව ප්‍රියදර්ශනී පවසයි. අනුරුද්ධිකා ද අධීක්‍ෂණය හා පසුවිපරම සාර්ථකව යොදා ගන්නා කළමනාකාරිණියකි. නවක සාමාජිකයෙකු තම කණ්ඩායම සමඟ සම්බන්ධ වූ විට ඇය මාස එකහමාරක් පමණ දැඩි ලෙස අධීක්‍ෂණය හා පසුවිපරම් සිදු කරයි. එහි දී ඇය නවකයින්ගේ සෑම කාර්යයක්ම අධීක්‍ෂණය කොට පසුදා වන විට එහි නිරවද්‍යතාවය තහවුරු කරගනී. එසේ දැඩි කැපවීමකින් ඇයට කටයුතු කිරීමට සිදු වී ඇත්තේ සමූහයේ කර්මාන්තශාලා හය සඳහාම අවශ්‍ය අමුද්‍රව්‍ය මිල දී ගැනීම හා බෙදා හැරීම සම්බන්ධීකරණ කටයුතු ඇයගේ රාජකාරි වගකීමක් වන නිසාත් මේ සියලු කාර්යයන් මූල්‍යමය වශයෙන් ඒකාබද්ධ වී ඇති නිසා ය. යම් අවස්ථාවක දී නවක සාමාජිකයන් විසින් වරදක් සිදු වී ඇත්නම් එය ඔවුනට පැහැදිලි කර දෙන අතර වැරදි අතපසුවීම් නැතිනම් සාමාන්‍ය පරිදි රාජකාරි කිරීමට අවස්ථාව සලසා දෙනු ලැබේ. දැඩි පරිශ්‍රමයකින් යුතුව තම කණ්ඩායම තුළ විශ්වාසය හා ගුණාත්මකභාවය ඇති කරවීම පිණිස මෙලෙස කටයුතු කරන බවත් ඔවුනට තනිව කටයුතු කිරීමට හැකි මට්ටමට පැමිණි පසු දෛනිකව සිදු කරන

මෙම අධීක්ෂණය හා පසුවිපරම තරමක් දුරට අඩු කරමින් තනිව රාජකාරි කිරීමට හැකි ඉඩ ප්‍රස්තාව ඔවුනට සලසා දෙයි. එසේ නොවුනහොත් කළමනාකාරිණියක් ලෙස ඇයට සැමදා ඔවුන්ගේ රාජකාරි කටයුතු සිදු කිරීමට සිදුවන බවත් ඔවුන් ද රාජකාරිය හා වගකීම පිළිබඳ අවබෝධයක් නොමැති තත්ත්වයකට පත්වන බැවින් මෙවැනි උපායමාර්ගයක් භාවිතා කරමින් තම වැඩ-ජීවන සමතුලිතතාවය පවත්වා ගැනීමට තම සාමාජිකයින් යොමු කරවනු ලැබේ. තිවංකි ද තම කණ්ඩායම් සාමාජිකයින් හට වැඩ කාල සටහන් (Work Schedule) ලබා දී ඒවා දෛනිකව පසුවිපරම් කර කාර්යය පිළිබඳ තොරතුරු යාවත්කාලීන කර ගැනීම සිදු කරනු ලබයි.

සහභාගිකයින් තම වැඩ-ජීවන සමතුලිතතාවය පවත්වා ගැනීම සඳහා රැකියා ජීවිතයේ දී භාවිතා කරන දෙවන උපායමාර්ගය වන්නේ අනිකුත් අංශ සමඟ භාවිතා කරන උපායමාර්ග වේ. තම වෘත්තීය සඟයන් පිළිබඳ මනා අවබෝධයකින් යුතුව කටයුතු කිරීම උපායමාර්ගයක් ලෙස ඔවුන් භාවිතා කරයි.

> “Lady කෙනෙක් Profession එකක ඉන්න කොට මිනිස්සු ගැන නම් හොඳට දැන ගන්න ඕනා.” (සම්මුඛ සාකච්ඡාව: අනුරුද්ධිකා).

ඇයට කාන්තා කළමනාකාරිණියක් ලෙස විවිධ මට්ටම්වල සිටින පුද්ගලයින් සහ විවිධ අංශ සමඟ කටයුතු කිරීමට සිදු වේ. එහි දී තම කාර්යය සාර්ථකව ඉටුකර ගැනීමට නම් ඔවුන් පිළිබඳ මනා අවබෝධයකින් සිටිය යුතුවේ. එවිට තම කාර්යයන් ඉතා පහසුවෙන් සිදු කර ගැනීමට හැකියාව ලැබෙන අතර උපායශීලීව මිනිසුන් හැසිරවීම සිදු කළ යුතුය. කාන්තා කළමනාකරුවන් ලෙස කර්මාන්තශාලාවේ පහළම සේවකයාගේ සිට ඉහළම නිලධාරියා දක්වා මනා අවබෝධයකින් කටයුතු කළ යුතු වේ. නමුත් එය ඉතා අසීරු කාර්යයක් බව ඇය පවසයි.

නම්‍යශීලීත්වය උපායමාර්ගයක් ලෙස රැකියා ආයතනයේ අනිකුත් අංශ සමඟ කටයුතු කිරීමේ දී භාවිතා කරන බව සෙනුරි පවසයි. විශේෂයෙන්ම ඇයගේ රාජකාරි වගකීම් අනුව ආයතනයේ පහළම මට්ටමේ සේවකයාගේ සිට ඉහළම නිලධාරියා සමඟ කටයුතු කිරීමට සිදුවේ. විවිධ අධ්‍යාපනික සමාජ මට්ටම්වල සිටින පුද්ගලයින් ඇයට එහි දී මුණ ගැසෙනු ඇත. ඒ සියලුදෙනා සමඟ කටයුතු කිරීමට නම්‍යශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම රාජකාරි කටයුතු සාර්ථක කර ගැනීමට දායක වී ඇති බව ඇය පවසයි.

තම වෘත්තීය ජීවිතය තුළ දී අනිකුත් වෘත්තීය සගයන් සමඟ කටයුතු කිරීමේ දී භාවිතා කරන සාර්ථක උපායමාර්ගයක් ලෙස විවෘතව අදහස් ප්‍රකාශ කිරීම සහ සාකච්ඡා කිරීම හඳුනා ගැනීමට හැකි විය.

> “මොනවා හරි ප්‍රශ්නයක් වුනොත් Openly කථා කරනවා........ එක පාරටම බෑ කියන්නේ නෑ. පුළුවන් දේ මොකක් ද කියලා මම උත්සාහ කරලා බලනවා. එතන දී මම අභියෝග ජය ගන්නවා.” (සම්මුඛ සාකච්ඡාව: ප්‍රියදර්ශනී).

ඇයගේ රැකියා ක්ෂේත්‍රය ඍජුවම නිෂ්පාදන අංශය හා සම්බන්ධ වේ. නිවැරදි තාක්‍ෂණය භාවිතා කරමින් ගුණාත්මක ඇඟළුමක් නිම කිරීමට අවශ්‍ය මූලික අඩිතාලම දමමින් දෛනික නිෂ්පාදන ඉලක්කයන් සපුරා ගැනීමට අවශ්‍ය තාක්‍ෂණික සහාය ලබා දීම ඇය විසින් සිදු කළ යුතුය. මෙවැනි අවස්ථාවන්වල අනෙකුත් කළමනාකාර මට්ටමේ නිලධාරීන් මෙන්ම අනෙක් වෘත්තීමය සගයන් සමඟ ද කටයුතු කිරීමට සිදු වන අතර සාර්ථක රාජකාරියක් සලසා දීම සඳහා ඔවුන් සමඟ විවෘතව සාකච්ඡා කොට ගැටළු ඇත්නම් ඒවා විසඳා තම අංශයෙහි දායකත්වය නිෂ්පාදන අංශයට ලබා දීමට ඇය නිරතුරුවම උත්සාහ දරයි. ඒ අනුව පැහැදිලි වන්නේ සාමූහික තීරණ ගැනීම හා විවෘතව කතා කිරීම සාර්ථක උපායමාර්ගයක් වන බව ය.

වැඩ-ජීවන සමතුලිතතාවය පවත්වා ගැනීම සඳහා භාවිතා කරන උපායමාර්ග යටතේ සාකච්ඡා කරනු ලබන තෙවන අනු කොටස වන්නේ වෙනත් භාවිතයන් වේ. එනම්; තම කණ්ඩායම තුළ හෝ ආයතනයේ අනිකුත් අංශ සමඟ කටයුතු කිරීමේ දී භාවිතා කරන උපායමාර්ග ගණනයට අයත් නොවන ඒවා වේ.

සහභාගිකයන් අතුරින් තිවංකි වසර 28 ක් එකම ආයතනය තුළ සේවා පළපුරුද්දක් ලබා ඇති අතර ප්‍රියදර්ශනිගේ ඇගැළුම් ක්ෂේත්‍රයේ සමස්ත පළපුරුද්ද වසර 23 ක් වේ. එමෙන්ම අනුරුද්ධිකා ද මෙම ආයතනය තුළ වසර 12ක සේවා කාලයක් සම්පූර්ණ කොට ඇත. ඒ අනුව ඔවුන්ගේ මෙම දීර්ඝකාලීන රැකියා පළපුරුද්ද හා අත්දැකීම් උපායමාර්ගයක් ලෙස රැකියා ජීවිතයේ වැඩ-ජීවන සමතුලිතතාවය පවත්වා ගැනීම සඳහා ඔවුන් විසින් භාවිතා කර ඇත. මෙම සහභාගිකයින් තිදෙනාගෙන් දෙදෙනෙකුම පළමු රැකියාව ලෙස මෙම ආයතනය හා සම්බන්ධ වෙමින් වර්තමානය දක්වාම සේවය කරමින් සිටියි. එම නිසා ආයතනික සංස්කෘතිය ඔවුනට වඩාත් හුරුපුරුදු වීමත් එහි ලද දීර්ඝ කාලීන අත්දැකීම් අනුව තම රාජකාරී වගකීම් ඉටු කිරීමට හැකිවීම වැඩ-ජීවන සමතුලිතතාවය සඳහා ධනාත්මකව බලපා ඇති බව පෙනේ.

ධනාත්මක සිතා කටයුතු කිරීම උපායමාර්ගයක් ලෙස භාවිතා කරන බව සිතාරා පවසයි. විශේෂයෙන් රැකියා ජීවිතය තුළ අත්විඳිනු ලබන දැඩි ආතතිය ද තම ජීවිතයට වාසිදායකව සිතා ඇය කටයුතු කරයි.

> “ගෙදර ගිහින් වැඩ කරනවා කියලා හිතාගෙන හිටියොත් මගේ Capacity හැදෙන්නේ නෑ. වැඩ වැඩි වෙන එක මං Advantage එකක් විදියට අරගෙන කොහොමහරි අර Time එකේ දී කර ගන්නවා.” (සම්මුඛ සාකච්ඡාව: සිතාරා).

ඇයගේ සේවා අංශය තුළ සාමාජිකයින් තිදෙනෙක් පමණක් සිටින බැවින් රැකියා ආතතිය වැඩි බව පවසයි. එනිසා රාජකාරි කටයුතු එම වේලාව තුළ නිමකොට නිවසේ දී තම අධ්‍යාපනික කටයුතු කිරීම සඳහා යොමු වේ. එයින් පැහැදිලි වන්නේ රැකියාවෙහි අභියෝග භාරගෙන තම රැකියා ජීවිතයෙහි සාර්ථකත්වය කරා ගමන් කිරීමටත් මානසිකව යහපත් මට්ටමක සිටීමටත් මෙම උපායමාර්ගය උපකාරී වන බව ය. Pareek (1994) විසින් කරන ලද අධ්‍යයනයේ දී, මුහුණ දීමේ උපායමාර්ග (Coping Strategies) ප්‍රධාන කොටස් දෙකකට බෙදා දක්වා ඇති අතර එහි එක් කණ්ඩයක් වන්නේ “ඵලදායී” මුහුණ දීමේ උපායමාර්ග වේ. ඔහු ප්‍රකාශ කළේ ඵලදායී මුහුණ දීමේ උපායමාර්ග යනු “ආතතිය” පිළිබඳ ගැටළුව අභියෝගයක් ලෙස ගෙන කටයුතු කරන ප්‍රවේශයක් වන බව ය. ප්‍රියදර්ශනී ද තම ජීවිතය තුළ යම්කිසි නිෂේධාත්මක සිදුවීමකට මුහුණපෑමට වුවහොත් එය ධනාත්මක සිදුවීමක් බවට පත් කරන ගෙන කටයුතු කරන බව පවසයි.

**පෞද්ගලික හා රැකියා ජීවිතය යන දෙයංශය තුළ භාවිතා කරන උපායමාර්ග**

රාජකාරි ජීවිතය හා පෞද්ගලික ජීවිතය අතර සීමා මායිම් හඳුනා ගෙන කටයුතු කිරීම සහභාගිකයින් තම වැඩ-ජීවන සමතුලිතතාවය පවත්වා ගැනීම සඳහා භාවිතා කරන උපායමාර්ගයක් ලෙස හඳුනා ගැනීමට හැකි විය.

> “අපේ Job එක මොකක් ද? Job එකෙන් එහා අපේ පවුල් ජීවිතය මොකක් ද? ඒ දෙක හරියට කරගෙන Job එකේ දේවල් ඒ වැඩකරන අතරතුර කරගෙන එතනින් එහාට ගෙදර ආවට පස්සේ Job එකේ කොටසක් ගෙදර අරගෙන එන්න හොඳ නෑ.” (සම්මුඛ සාකච්ඡාව: ප්‍රියදර්ශනී).

පවුල් ජීවිතය තුළ හා රැකියා ජීවිතය තුළ වසර විසි ගණනකට එහා අත්දැකීම් ඇති ඇය වැඩ-ජීවන සමතුලිතතාවය පවත්වා ගැනීම සඳහා මෙම ක්ෂේත්‍ර දෙකෙහි මායිම් හොඳින් අවබෝධ කරගෙන ඒ ඔස්සේ

කටයුතු කරයි. නිවසට පැමිණි පසු ඇය සෑම වේලාවක දීම මුල්තැන ලබා දෙන්නේ තම දරුවට සහ සැමියාට මෙන්ම නිවසේ අනිකුත් වැඩකටයුතුවලට බව පවසයි. එමෙන්ම රැකියා ආයතනයට යනවිට හා එහි සේවය කරන අතරතුර තම රැකියා භූමිකාව නියමාකාරයෙන් සිදු කිරීමට උත්සහ කරයි. එසේ නොවුනහොත් මේ ක්ෂේත්‍ර දෙක අතර ගැටුම් ඇතිවීමට ඉඩකඩ ඇති අතර වැඩ-ජීවන සමතුලිතතාවය පවත්වා ගැනීමට නොහැකි බව ඇය පවසයි. Clark (2000) එක් විෂයයක් තුළ පුද්ගලයාගේ භූමිකාවන් පවතින්නේ කෙසේ ද යන්න පිළිබඳ අවබෝධයක් ලබා දෙමින් වැඩ-පවුල් දේශසීමා න්‍යාය (Work-Family Border Theory) නිර්මාණය කර ඇත. එය සමතුලිතතාවය ළඟා කර ගැනීම සඳහා පුද්ගලයන් වැඩ-පවුල් ක්ෂේත්‍ර සහ ඒ අතර ඇති මායිම් කළමනාකරණය කරන්නේ කෙසේ ද යන්න සාකච්ඡා කර ඇත. මෙම න්‍යායට අනුව භූමිකාවන් අතිච්ඡාදනය වන විට බොහෝ ගැටුම් ඇති වන අතර ඒවා බෙදී වෙන් කොට ඇති විට එය සේවකයාගේ වැඩ-ජීවන සමතුලිතතාවය පවත්වා ගෙන යාමේ දී දක්නට ලැබෙන ප්‍රධාන ගැටළු සහ ගැටුම්වලට ඇති ඉඩකඩ අඩු කරයි. වැඩ-ජීවන සමතුලිතතාවය හා සම්බන්ධ ගැටුම් න්‍යායයෙන් (Conflict Theory) අදහස් කරන්නේ ගැටුම් ඇති වන්නේ රැකියාව හා ගෘහ භූමිකාවන් යම් ආකාරයකින් නොගැලපෙන විට එක් ක්ෂේත්‍රයක ඉල්ලීම් සපුරාලීම දුෂ්කර වේ (Greenhaus & Beutell, 1985). එම නිසා රැකියා හා පවුල් ජීවිතයේ සීමා මායිම් පිළිබඳ මනා අවබෝධයකින් යුතුව කටයුතු කිරීම වැඩ-ජීවන සමතුලිතතාව සඳහා ඉවහල් වන බව පෙනේ.

කාර්යක්ෂම බව පෞද්ගලික හා රැකියා ජීවිතය තුළ උපායමාර්ගයක් ලෙස භාවිතා කරන බව දත්ත විශ්ලේෂණයේ දී හඳුනා ගැනීමට හැකි විය. Piotrokowski et al. (1987) වැඩ කරන කාන්තාවන් ආතතියට මුහුණ දීම සඳහා භාවිතා කරන උපායමාර්ගයක් ලෙස කාර්යක්ෂමතාව වැඩි කිරීම දක්වා ඇත. එමෙන්ම උපායමාර්ගයක් ලෙස මනා සන්නිවේදනය ද හඳුනා ගැනීමට හැකි විය. වයස විසිගණන්වල මුල් භාගයේ පසුවන සෙනුරි ප්‍රථම දරු ප්‍රසූතිය සඳහා සූදානමින් සිටියි. නමුත් මෙවැනි තත්ත්වයක සිටිය ද තම සැමියා හා ඔහුගේ දෙමාපියන් සමඟ ඇය සතු රාජකාරි වගකීම් හා වැඩ පරිසර පිළිබඳ කරුණු අවබෝධ කර දීම සාර්ථක සිදු කරගැනීමට හැකියාව ලැබී ඇත්තේ මනා සන්නිවේදන කුසලතාවන් ඇය සතු වීම නිසා බව පවසයි. විශේෂයෙන් කොවිඩ් 19 වසංගත තත්ත්වයක් රට තුළ පවතින කාලවකවානුවක දී පවා සමූහය සතු අනිකුත් කර්මාන්තශාලාවලට ගොස් කටයුතු කිරීමට ඇයට සිදු විය. මෙවැනි පසුබිමක් තුළ තම ඉහළ කළමනාකාරිත්වයට මෙන්ම තම පෞද්ගලික ජීවිතයේ සමීපතමයන්ට කරුණු පහදා දෙමින් ධනාත්මක වැඩ-ජීවන සමතුලිතතාවයක් පවත්වා ගැනීමට ඇයට හැකියාව ලැබී ඇත.

වැඩ පරිසරය තුළ තමන්ට හිමි ඉලක්කයන් සපුරා ගැනීම සඳහා ඔවුන් විසින් මාසික, සති හා දෛනික සැලසුම් අනුව කටයුතු කරනු ඇත. ක්ෂේත්‍ර නිරීක්ෂණයේ දී සහභාගිකයින්ගේ කාර්යාල තුළ එම විස්තර ප්‍රදර්ශනය කර තිබෙන බව දක්නට ලැබුණි. එමෙන්ම වෘත්තීය ජීවිතය තුළ තමාට ඉහළට යාම සඳහා අවශ්‍ය සුදුසුකම් මොනවද යන්න පිළිබඳ මනා අවබෝධයකින් හා එයට තම පවුල තුළ නිර්මාණය කර ගත යුතු පරිසරය හැඩගස්වා තම රැකියා ජීවිතයේ විවිධ භූමිකාවන් සාර්ථකව සමතුලිත කරගෙන යහපත් ජීවිතයක් ගත කරන බව ප්‍රියදර්ශනී පවසයි. වෙක්ස්ලි සහ යුක්ල් (උපුටා ගැනීම නිරිඇල්ල, 2019. පි.213) දක්වා ඇති ආකාරයට ඵලදායී නායකයකුට හෝ කළමනාකරුවෙකුට දියුණුවීමේ හෝ උසස්වීමේ අභිලාෂය යන ගුණාංගය තිබිය යුතු බව දක්වා ඇත. තම පෞද්ගලික ජීවිතය තුළ දී ද ඉලක්ක සපුරා ගැනීමට සැලසුම් අනුව ක්‍රියාත්මක කළ යුතු බව සිතාරා පවසයි.

> “Pesonal Life එකට Plan එකක් තියාගන්න ඕනා. සතියේ දී මේ මේ ටික මට තියෙනවා කරගන්න. ලබන අවුරුද්දේ මම ඉන්නේ මේතැන. තව අවුරුදු දෙකකින් මම මෙතන කියන

Goal එක තියාගෙන දවස ගානේ Balance කරගෙන යන්න ඕනා.” (සම්මුඛ සාකච්ඡාව: සිතාරා).

එහි දී ජීවිතය තුළ ඊළඟ අදියරට ගමන් කිරීමේ දී කුමන අඩුපාඩු සහ ගැටළු තමන් හට පවතී දැයි අවබෝධයකින් යුතුව එම අඩුපාඩු සාර්ථකව සපුරා ගනිමින් සහ ගැටළුවලට විසඳුම් ලබා දීමෙන් වැඩ-ජීවන සමතුලිතතාවය පවත්වා ගත හැකිවේ.

සෙනුරි, පෞද්ගලික ජීවිතයේ දී භාවිතා කරන උපායමාර්ගයක් ලෙස පෙර සූදානම පිළිබඳ අදහස් ප්‍රකාශ කරන ලදී. තමා හා සැමියා එකම ක්ෂේත්‍රයක රැකියාව කරන බැවින් ඔවුන් උදෑසන හයට පමණ රැකියාව සඳහා පිටත් වේ. එමෙන්ම නිවසට නැවත පැමිණෙන විට ද රාත්‍රී අට පමණ වන බැවින් මෙම පෙර සූදානම ඔවුන්ගේ එදිනෙදා කටයුතුවලට ඉතා වැදගත් සාධකයක් බව පවසන ලදී. ආහාර සැකසීමට අවශ්‍ය දෑ කලින් දවසේ සූදානම් කර තැබීම, දෙදෙනාගේ ඇඳුම් පැළඳුම් සතියටම අවශ්‍ය වන ලෙස සකස් කර පිළියෙල කර තිබීම යනාදිය ඔවුන් විසින් සිදු කරනු ලැබේ.

**නිගමනය**

වැඩ-ජීවන සමතුලිතතාවය පවත්වා ගැනීම සඳහා පවුල තුළ පුද්ගලයාට තිබෙන වගකීම් සහ පවුලෙන් ලැබෙන සහයෝගය මෙන්ම රැකියා ස්ථානය වගකීම් හා එහි සිටින පුද්ගලයින්ගෙන් ලැබෙන සහාය බලපාන බව මෙම අධ්‍යයනය තුළින් පැහැදිලි කර ගැනීමට හැකි විය. විවාහයට එළඹීම, දරුවන් ලැබීම වැනි භූමිකා වෙනස් වන අවස්ථාවල කාන්තා කළමනාකරුවන්ගේ වැඩ-ජීවන සමතුලිතතාවයට අදාළ වගකීම් හා කාර්යය කොටස් වැඩි වීමක් දක්නට ලැබෙන බව පැහැදිලි වේ. පවුල සහ රැකියා ස්ථානයේ සිටින පුද්ගලයින්ගේ ආකල්ප හා චර්යා මෙන්ම කාන්තා කළමනාකරුවන්ට එම ක්ෂේත්‍ර දෙකෙහි පැවරෙන කාර්යය කොටස වැඩ-ජීවන සමතුලිතතාවය සඳහා පවත්නා ප්‍රධාන අභියෝගයන් වේ. පවුල තුළ සහ රැකියා ස්ථානය යන ක්ෂේත්‍ර දෙක තුළ කාර්යය කොටස් තමන් විසින්ම සිදු කිරීමට උත්සාහ නොකර සුදුසු පරිදි වගකීම් හා කාර්යය කොටස් බෙදා හදා ගැනීම කාන්තා කළමනාකරුවන්ගේ වැඩ-ජීවන සමතුලිතතාවය සඳහා භාවිතා කරන උපායමාර්ගයකි. එහි දී සුදුසු පුද්ගලයන් සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම තුළින් එනම් නිවස තුළ දී තම දරුවන්ට මෙන්ම රැකියා ස්ථානයේ දී තම කණ්ඩායම සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම හෝ පුහුණු වීම සඳහා යොමු කිරීම උදාහරණ වශයෙන් දැක්විය හැකිය. කාන්තා කළමනාකරුවන් තුළ පවත්නා පුරුදු, හැකියා හා ගුණාංග වැඩ-ජීවන සමතුලිතතාවය පවත්වා ගැනීම සඳහා ඔවුන් උපායමාර්ගිකව භාවිතා කරන බව පෙනේ. ප්‍රතිපත්ති, ප්‍රතිලාභ, සේවා සහ විවිධ වැඩ සටහන් ඔස්සේ කාන්තා කළමනාකරුවන්ගේ වැඩ-ජීවන සමතුලිතතාවය පවත්වා ගැනීම සඳහා ඔවුන්ට අවශ්‍ය සහාය රැකියා ස්ථානය විසින් ලබා දිය හැකිය.

මෙම කර්මාන්තශාලාවේ සතියේ දිනවල පැයක් වැඩිපුර වැඩ කොට සෙනසුරාදා දින නිවාඩු ලබා දී ඇත. මෙවැනි ක්‍රියා පිළිවෙලවල් අනුගමනය කිරීම සේවකයින්ගේ වැඩ-ජීවන සමතුලිතතාවය සඳහා සහාය දැක්වීමට ආයතනය විසින් ගත හැකි ක්‍රියාමාර්ගයක් ලෙස නිර්දේශ කළ හැක. එමෙන්ම සේවකයින් ආතතියට පත් නොවී ඉතා පහසුවෙන් කාර්යයට ප්‍රමුඛත්වය දීමට උපකාරී වන ඵලදායී කාල කළමනාකරණ ශිල්පීය ක්‍රම පුහුණු කිරීම නිර්දේශ කෙරේ. රජයේ හා ආයතනය විසින් අනුමත නිවාඩු ලබා ගැනීමේ දී වඩා ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට කටයුතු කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

මෙම අධ්‍යයනයේ නියැදිය එක් කර්මන්තශාලාවකට සීමා වී ඇත. එහෙත් විවිධ ඇඟළුම් කර්මාන්තශාලාවල කාන්තා කළමනාකරුවන් නියැදි ලෙස භාවිතා කරමින් සංසන්දනාත්මක අධ්‍යයනයක් සිදු කළ හැකි ය. වඩා සාමාන්‍යකරණය කළ හැකි සොයාගැනීම්වලට එළඹීම සඳහා වඩා විශාල නියැදියකින් යුක්ත ප්‍රමාණාත්මක අධ්‍යයනයක් සිදු කිරීම යෝජනා කළ හැකිය. ආධුනික කාන්තා කළමනාකරුවන් ලෙස රැකියාව ආරම්භ

කරන කාන්තාවන් නියැදියක් ලෙස ගෙන ඔවුන්ගේ වැඩ-ජීවන සමතුලිතතාවය පිළිබඳ අන්වායාම අධ්‍යයනයක් (Longitudinal Study) තුළින් ගවේෂණය කිරීම වැදගත් විය හැක. මෙහි දී සංසිද්ධිය පිළිබඳව අන්වික්ෂීය (Microscopic) පර්යාලෝකයකින් විභාග කර බැලිය හැකි ය.

*ස්තුතිය - මෙම අධ්‍යයනය සාර්ථකව සිදු කිරීම සඳහා ප්‍රතිපෝෂණ ලබා දුන් මහාචාර්ය එන්. චන්ද්‍රසිරි නිරිඇල්ල මහතා හට ස්තුතිපූර්වක වෙමි.*

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


නිරිඇල්ල, එන්.සී. (2019). වැඩ, වැඩ සංවිධාන, වැඩ කරන කාන්තාව සහ සංස්ථාමය සමාජ වගකීම, සරසවි, නුගේගෝඩ.

Blair-Loy, M. (2001). Cultural constructions of family schemas: The case of women finance executives. *Gender & society*, *15*(5), 687-709.

Broadbridge, A. (2009). Flexible Work Practices: Women Only?. *The International Review of Retail, Distribution married women without children, Women in and Consumer Research*, *19*(3), 289.

Chandra, V. (2012). Work–life balance: eastern and western perspectives. *The International Journal of Human Resource Management*, *23*(5), 1040-1056.

Clark, S. C. (2000). Work/family border theory: A new theory of work/family balance. *Human relations*, *53*(6), 747-770.

Edwards, J. R., & Rothbard, N. P. (2000). Mechanisms linking work and family: Clarifying the relationship between work and family constructs. *Academy of management review*, *25*(1), 178-199.

Gnanayudam, J., & Dharmasiri, A. (2007). The influence of quality of work-life on organizational commitment: a study of the apparel industry. *Sri Lankan Journal of Management*, *12*(3), 4.

Grady, G., Kerrane, M., Darcy, C., & McCarthy, A. (2008). *Work Life Balance:Policies and Initiatives in Irish Organisations: A Best Practice Management Guide*. Oak Tree Press.

Greenhaus, J. H., & Beutell, N. J. (1985). Sources of conflict between work and family roles. *Academy of management review*, *10*(1), 76-88.

Jenson, J., Hagen, E., & Reddy, C. (1988). *Feminization of the labor force: Paradoxes and promises*. Oxford University Press, USA.

Lambert, S. J. (1990). Processes linking work and family: A critical review and research agenda. *Human relations*, *43*(3), 239-257.

Madurawala, S. (2017). The Dwindling Stitching Hands--labour shortages in the apparel industry in Sri Lanka. *South Asia Economic Journal*, *18*(2), 214-229.

Meyers, M., & Gornick, J. (2005). Policies for reconciling parenthood and employment: Drawing lessons from Europe. *Challenge, 48*(5), 39-61.

Nigam, A. (2013). Falling female labour force participation rate a puzzle. *The Hindu Business Line*.

Nishanthi, H. P. M., & Thalgaspitiya, U. K. (2015). Impact of Work and Family Life Balance on Job Engagement of Machine Operators of the Apparel Sector in Dehiowita Divisional Sector, Kegalle District in Sri Lanka. In *Proceedings of International HR Conference* (Vol. 2, No. 1).

Nordenmark, M. (2004). Balancing work and family demands: Do increasing demands increase strain? A longitudinal study. *Scandinavian journal of public health*, *32*(6), 450-455.

Pareek, U. (1994). *Making organizational roles effective*. Tata McGraw-Hill.

Piotrokowski, C.S., Rapoport, R.N. and Rapoport, R. (1987). "Families and work. In:Sussman M.B. and S.K. Steinmetz (eds.)". *Handbook of Marriage and the Family.*New York: Plenum, pp.251-283.

Rodriguez, J. K. (2013). Joining the dark side: Women in management in the Dominican Republic. *Gender, Work & Organization*, *20*(1), 1-19.

Sandeep (2017). "Role of women in Indian Society". Short Essay and Paragraph for Students. Retrieved from https://www.iaspaper.net/role-ofwomen-in-indian/.,accessed on 03-04-2021.

South, S. J., & Spitze, G. (1994). Housework in marital and nonmarital households. *American Sociological Review*, 327-347.

Stone, P. (2007). "Opting out? Why women really quit careers and head home". Berkeley, CA: University of California Press.

Weerawansa, S., & Gunasekara, H. (2019). Work-Life Balance of Mothers in Managerial Sector of Apparel Industry. Chaina-USA Business Review, Vol.18, No.1, 1-11.

Whitehead, T., & Kotze, M. E. (2003). Career and life-balance of professional women: a South African study. *SA Journal of Human Resource Management*, *1*(3), 77-84.

# සමාජ විග්‍රහ

**විමර්ශිත සංග්‍රහය**

**REFEREED JOURNAL**

**පළමු කාණ්ඩය, අටවන වෙළුම - 2022**

**ISSN 2362-0978 (print ISSN)**

**ISSN 2756-925X (e-ISSN)**

ලිපි අංක 04


## ශ්‍රී ලාංකීය රජයේ පාසල් විචාරශීලී චින්තකයින් බිහි කිරීමට සමත් ද?


[4]ජේ. එම්. ආර්. ඩි. ජයකොඩි, එස්. ඒ. එස්. කේ. පෙරේරා

https://orcid.org/0009-0006-7531-3572 & https://orcid.org/0000-0001-7272-4129



***ප්‍රධාන සංස්කාරක***

ප්‍රේමකුමාර ද සිල්වා

***සහය සංස්කාරක***

ජගත් බණ්ඩාර පතිරගේ

හිරුනි කළුආරච්චි

***සංස්කාරක උපදේශක මණ්ඩලය***

එස්.ටී.හෙට්ටිගේ (සම්මානිත මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය

කාලිංග ටියුඩර් සිල්වා (සම්මානිත මහාචාර්ය) පේරාදෙණිය විශ්වවිද්‍යාලය

කේ.කරුණාතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) කැලණිය විශ්වවිද්‍යාලය

සරත් අමරසිංහ (සම්මානිත මහාචාර්ය) රුහුණු විශ්වවිද්‍යාලය

යසාංජලී ජයතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

චන්ද්‍රසිරි නිරිඇල්ල (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය

සුභාංගි හේරත් (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය

නිශාර ප්‍රනාන්දු (ආචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය

ෆර්සානා හනීෆා (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය

ඉරේෂා ලක්ෂ්මන්(මහාචාර්ය)කොළඹ විශ්වවිද්‍යාලය

***භාෂා සංස්කරණය***

නාලක ජයසේන

***පරිසැලසුම් නිර්මාණය***

ප්‍රභාත් ගලගමගේ

හිරුනි කළුආරච්චි



[4]බී.ඒ.(කැළණිය), ශාස්ත්‍රපති උපාධි අපේක්ෂක, සමාජ විද්‍යා අධ්‍යනාංශය, කොළඹ විශ්ව විද්‍යාලය.

අධ්‍යාපනවේදී( විශේෂ)කොළඹ, කථිකාචර්ය, ද්විතීක හා තෘතීයික අධ්‍යනාංශය, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය.

,

# සමාජ විග්‍රහ

**විමර්ශිත සංග්‍රහය**
**REFEREED JOURNAL**
**පළමු කාණ්ඩය, අටවන වෙළුම - 2022**
**ISSN 2756-925X (e-ISSN)**
**ISSN 2362-0978 (print ISSN)**

This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License.

දැනුම වෙත ප්‍රවේශ වීමේ සීමා අතික්‍රමණය සඳහා ලොව බොහෝ ශාස්ත්‍රාලයීය ප්‍රකාශන සම්ප්‍රදායික ප්‍රකාශන අයිතිය පිළිබඳ නෛතික ආකෘතියෙන් විකල්ප ආකෘතියක් වන පොදු නිර්මාණ බලපත්‍ර ක්‍රමයට සංක්‍රමණය වී / වෙමින් ඇත. මේ අනුව විවාරාත්මක දැනුමට විවෘත ප්‍රවේශයක් ලබා දීමේ අරමුණින් "සමාජ විග්‍රහ" විමර්ශිත සංග්‍රහය, නිකුත් වන්නේ ඉහත පොදු නිර්මාණ බලපත්‍රය යටතේය.

## ලිපි විමර්ශක මණ්ඩලය

*සම්මානිත මහාචාර්ය සිරි හෙට්ටිගේ, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*මහාචාර්ය ෆර්සානා හනීෆා, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*මහාචාර්ය ඉරේෂා ලක්ෂ්මන්, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*ආචාර්ය ජගත් බණ්ඩාර පතිරගේ, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*ආචාර්ය ගයාත්‍රී විජේසුන්දර, සමාජ විද්‍යා දෙපාර්තුමේන්තුව, රුහුණ විශ්වවිද්‍යාලය*

*ආචාර්ය හේමන්ත කුමාර, සමාජ විද්‍යා දෙපාර්තුමේන්තුව, රුහුණ විශ්වවිද්‍යාලය*

## ප්‍රකාශනය

සමාජ විද්‍යා අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ-03
දුරකථනය/ෆැක්ස්: 011-2500452
විද්‍යුත් තැපැල: samajaviggraha@soc.cmb.ac.lk
වෙබ් අඩවිය: https://arts.cmb.ac.lk/sociology/

**සාරසංක්ෂේපය**

තිරසාර සංවර්ධනයක් සාක්ෂාත් කර ගැනීම සහ සමාජ, සංස්කෘතික, ඓතිහාසික ඒකාග්‍රතාව සංවර්ධනය කිරීම සඳහා ඕනෑම රටක අධ්‍යාපන ක්‍රමය ඉතා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන අතර එය බොහෝ විට සමාජයේ පසුබිම ලෙස හැඳින්වේ. අප රට තුළ ක්‍රියාත්මක නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය තුළින් ශ්‍රී ලාංකීය රජයේ පාසල් විචාරශීලී චින්තකයින් බිහි කිරීමට සමත් ද යන්න ගවේෂණය කිරීම මෙම ලිපියේ අරමුණයි. සාහිත්‍ය විමර්ශනය මගින් මෙම ලිපියට අදාළ දත්ත එක්රැස් කිරීම සිදු කොට විවේචනාත්මකව සාකච්ඡා කර ඇත. විචාරශීලී චින්තනය යනු විශ්වාසය සහ ක්‍රියාව සඳහා මාර්ගෝපදේශයක් ලෙස නිරීක්ෂණ, අත්දැකීම්, පරාවර්තනය, තර්කනය හෝ සන්නිවේදනය මගින් රැස් කරන ලද, හෝ ජනනය කරන ලද තොරතුරු ක්‍රියාකාරීව සහ දක්ෂ ලෙස සංකල්පගත කිරීමේ, විශ්ලේෂණය කිරීමේ, සංස්ලේෂණය කිරීමේ සහ/හෝ ඇගයීමේ බුද්ධිමය විනයානුකූල ක්‍රියාවලියකි. එහි ආදර්ශමත් ස්වරූපයෙන්, එය විෂය කරුණු බෙදීම් ඉක්මවා යන විශ්වීය බුද්ධිමය වටිනාකම් මත පදනම් වේ. ප්‍රගතිශීලීවාදය හා පරමාදර්ශවාදය ඇතුළු සාම්ප්‍රදායික න්‍යායන් මෙන්ම තොරතුරු සැකසීම න්‍යාය සහ බ්ලූම්ස්ගේ ඉගෙනුම් හැකියා වර්ගීකරණය වැනි ප්‍රජානන න්‍යායන් මගින් විචාරශීලී චින්තනය පිළිබඳව න්‍යායාත්මක අදහස් ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලාංකීය අධ්‍යාපනය ඔස්සේ රජයේ පාසල් තුළ විචාරශීලී චින්තකයන් බිහිකිරීමට අධ්‍යාපනය තුළින් අපේක්ෂිත ජාතික අරමුණු අටක් රජය විසින් හඳුන්වා දී ඇත. එහි අංක පහ යටතේහි විචාරශීලී චින්තනය පිළිබඳව දක්වා ඇත. ජාතික අරමුණු සාක්ෂාත් කර ගැනීම දීර්ඝ කාලීන ක්‍රියාවලියක ප්‍රතිඵලයක් වන බැවින් කෙටිකාලීන වශයෙන් එම අරමුණු කරා යොමු වීමට අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන මූලික නිපුණතා හතක් ද දක්වා ඇති අතර එහි දෙවන නිපුණතාවය යටතේ විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය පිළිබඳ සාකච්ඡා කොට ඇත. ඒ අනුව පැහැදිලි වන්නේ රජයේ පාසල්වල ඉගෙනුම ලබන ළමුන් තුළ විචාරශීලී චින්තනය සංවර්ධනය කිරීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය පසුබිම ශ්‍රී ලාංකීය රජය විසින් නිර්මාණය කර දී ඇති බවය. ශ්‍රී ලංකාවේ රජයේ පාසල් පද්ධතිය තුළ විෂයමාලාව ක්‍රියාත්මක කරනු ලබන ආකාරය, විෂයමාලා ප්‍රලේඛනවල පවත්නා දුබලතා, ගුරුවරුන් බඳවා ගැනීමේ පටිපාටිය, අධ්‍යාපන පද්ධතිය තුළ ක්‍රියාත්මක සංස්කෘතික සන්දර්භය, පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ භාවිතා කරනු ලබන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම හා ක්‍රම ශිල්ප, ශිෂ්‍ය කාර්යසාධනය ඇගයීමේ ක්‍රමවේද ශිෂ්‍යයින් තුළ විචාරශීලී චින්තනය සංවර්ධනය කිරීම ප්‍රශස්ත මට්ටමකින් සිදු නොවීමට හේතු වේ. එම නිසා අව්‍යාජ තක්සේරු ක්‍රම (Authentic Assessment Strategies) , ශිෂ්‍ය කාර්යසාධනය සඳහා විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම අනිවාර්ය අංගයක් බවට පත් කිරීම, විභාග ක්‍රමය තුළ පවත්නා දුබලතා හා විෂයමාලාවෙහි බර තැබීම වෙනස් කිරීම ශ්‍රී ලාංකීය පාසල් අධ්‍යාපනය තුළ ක්‍රියාත්මක කළ යුතු වේ.

**මුඛ්‍ය පද - විචාරශීලී චින්තනය, රජයේ පාසල්, අධ්‍යාපනයෙහි ජාතික අරමුණු, අධ්‍යාපනයෙහි මූලික නිපුණතා**

**හැඳින්වීම**

ළමුන්ට තමා ජිවත්වෙන සමාජය තුළ වගකීමක් සහිත පුද්ගලයන් ලෙස කටයුතු කරමින් ජීවිතය ඵලදායී හා තෘප්තිමත් ලෙස ගත කිරීමට අවශ්‍ය දැනුම සහ නිපුණතාවලින් ඔවුන් සන්නද්ධ කිරීම අධ්‍යාපන ක්‍රියාවලිය තුළින් සිදුවිය යුතු යැයි අපේක්ෂා කෙරේ. ඒ සඳහා අවශ්‍ය දැනුම සහ නිපුණතාවලින් ඔවුන් සන්නද්ධ කළ යුතු වේ. එබැවින් පාසල් අධ්‍යාපන පද්ධතියේ සෑම සංරචකයක්ම එක් එක් ළමයාගේ අධ්‍යාපන සංවර්ධන අවශ්‍යතා සැපයීම පිණිස සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. පුළුල් අවබෝධයකින් යුක්තව පවත්නා වටපිටාව පිළිබඳව විචාරශීලීව, තර්කානුකූලව, විශ්ලේෂණාත්මකව සිතා බලා කටයුතු කළ හැකි පරිදි පාසල් ළමයා සංවර්ධනය කිරීම පාසල් අධ්‍යාපනය තුළින් සිදු කළ යුතුවේ. මෙම සියලු අපේක්ෂණ සාක්ෂාත් කර ගැනීම සඳහා ශිෂ්‍යයා තුළ සංවර්ධිත චින්තන හැකියාවක් තිබීම අවශ්‍ය වේ. එබැවින් ඉහළ මට්ටමේ චින්තන හැකියා සංවර්ධනය කිරීම ඉතා වැදගත් වන අතරම එබඳු චින්තන කුසලතාවයන්ගෙන් එකක් වන්නේ විචාරශීලී චින්තනයයි.

ශ්‍රී ලාංකීය රජයේ පාසල් විචාරශීලී චින්තකයින් බිහි කිරීමට සමත් ද යන්න විමසීම මෙම ලිපියෙහි අරමුණ වේ. ඒ සඳහා පළමුව විචාරශීලී චින්තනය යන සංකල්පය නිර්වචනය කිරීමත් විචාරශීලී චින්තනය පිළිබඳව ඇති විවිධ න්‍යායාත්මක අදහස් විමසා බැලීමත් සිදු කිරීම තුළින් විචාරශීලී චින්තනය පිළිබඳව පුළුල් දැනුම් පසුබිමක් ඇති කර ගැනීමට අදහස් කරනු ලැබේ. දෙවනුව ශ්‍රී ලංකාව තුළ හා සමස්ත ලෝකය තුළ අධ්‍යාපන ක්‍රියාවලිය ඔස්සේ විචාරශීලී චින්තනය සංවර්ධනය කිරීම සඳහා පවතින ප්‍රතිපත්තිමය පසුබිම සාකච්ඡා කරනු ලැබේ. තෙවනුව ඉහත කී ප්‍රතිපත්තිමය පසුබිම මත ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා රජයේ පාසල් අධ්‍යාපනය තුළින් විචාරශීලී චින්තකයින් බිහි කිරීමට ඇති හැකියාව විමර්ශනය කරනු ලැබේ.

**විචාරශීලී චින්තනය නිර්වචනය කිරීම**

විචාරශීලී චින්තනය යනු කුමක් ද යන්න සහ එම චින්තනයට අදාළ ක්‍රියාකාරකම් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම සඳහා මෙම සංකල්පය පිළිබඳව පළ කර ඇති පිළිගත් නිර්වචන කිහිපයක් කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු වේ. විචාරශීලී චින්තනය යන සංකල්පය නිර්වචනය කිරීමේදී ප්‍රධාන වශයෙන් අධ්‍යයන ක්ෂේත්‍ර දෙකක් ඔස්සේ එය සිදු කළ හැකිය. එනම් දර්ශනය සහ මනෝ විද්‍යාත්මක ප්‍රවේශය වේ (Lewis & Smith, 1993). මෙයට අමතරව Sternberg (1986) පවසන පරිදි තෙවන ප්‍රවේශයක් ලෙස අධ්‍යාපන කේෂ්ත්‍රය තුළ ද විචාරශීලී චින්තනය පිළිබඳ සාකාච්ඡා කොට ඇත. දාර්ශනික ප්‍රවේශය ඔස්සේ සොක්‍රටීස්, ප්ලේටෝ, ඇරිස්ටෝටල් සහ වඩාත් මෑතකදී මැතිව් ලිප්මන් සහ රිචඩ් පෝල් යන දාර්ශනිකයින්ගේ විග්‍රහයන් ඉතා වැදගත් තැනක් ගනු ලැබේ. මෙම සංකල්පය පිළිබඳව අර්ථ දැක්වීම් ඉදිරිපත් කර ඇති මනෝවිද්‍යාඥයින් කිහිපදෙනෙකු ලෙස ස්ටර්න්බර්ග්, හැල්පර්න් සහ විලින්හැම් දැක්විය හැක. බෙන්ජමින් බ්ලූම් සහ ඔහුගේ සහායකයින් අධ්‍යාපනය යන විෂය ක්ෂේත්‍රය තුළ විචාරශීලී චින්තනය පිළිබඳ අර්ථකථන සපයා ඇත.

දාර්ශනික ප්‍රවේශය ඔස්සේ විචාරශීලී චින්තනය පිළිබඳව ඉදිරිපත් කර ඇති නිර්වචන කිහිපයක් සලකා බලමු. Lipman (2003) පවසන්නේ නිර්ණායක මත පදනම් වන, ස්වයං නිවැරදි කිරීම සිදු කරනු ලබන සහ සන්දර්භයට සංවේදී වන විනිශ්චය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සපයන සිතීම විචාරශීලී චින්තනය වන බවය. ඒ අනුව පුද්ගලයා තම අභිමතයන් මත නොපිහිටා යම් යම් නිර්ණායක පාදක කරගනිමින් තමා සිතනු ලබන කාරණයට අදාළව සන්දර්භයට සංවේදී වෙමින් සිදු කරන ස්වයං නිවැරදි කිරීමේ සිතුවිල්ල විචාරශීලී චින්තනය බව පැහැදිලි වේ. Ennis (2015) විචාරශීලී චින්තනය යනු විශ්වාසය සහ ක්‍රියාකාරිත්වය සඳහා මාර්ගෝපදේශයක් ලෙස නිරීක්ෂණය, අත්දැකීම, ප්‍රත්‍යාවේක්ෂණය, තාර්කිකව හේතු දැක්වීම හෝ සන්නිවේදනය භාවිතයෙන් එක්රැස් කරනු ලබන හෝ උත්පාදනය කරනු ලබන තොරතුරු ක්‍රියාකාරී ලෙස

සහ කුසලතා පූර්ණ ලෙස සංකල්පීකරණය, භාවිතය, විශ්ලේෂණය කිරීම, සංස්ලේෂණය කිරීම සහ/හෝ ඇගයීම යනාදී ක්‍රියාකාරකම් සිදු කරනු ලබන බුද්ධිමය වශයෙන් පාලනය කරන ලද ක්‍රියාවලියක් බව පවසයි. ප්‍රමුඛ ප්‍රගතිශීලී චින්තකයෙකු වන Dewey (1933) විචාරශීලී චින්තනය ලෙස දක්වන්නේ විශ්වාසයක් හෝ පිළිගත් දැනුමක් සඳහා සහාය වන පදනම සහ එම විශ්වාසය හෝ දැනුම යොමු වන නිගමනවල දිශානතිය පිළිබඳ අවබෝධය තුළින් එම විශ්වාසය හෝ දැනුම ක්‍රියාකාරී ලෙස දිගු කාලීන හා පරීක්ෂාකාරී ලෙස සලකා බැලීම ය. ඒ අනුව විචාරශීලී චින්තනය යනු තාර්කිකව තමා තුළ ලෝකය පිළිබඳව ඇති අවබෝධය සහ විශ්වාස මෙන්ම එම අවබෝධාත්මක පදනම මත පිහිටා සිදුකරන ක්‍රියාකාරීත්වය සඳහා මඟ පෙන්වීමක් ලෙස තාර්කිකව ප්‍රස්තුත ඇගයීම සහ විනිශ්චය කිරීමේ ශික්ෂණයෙන් යුතු මානසික ක්‍රියාකාරකමක් ලෙස දැක්විය හැක.

මනෝ විද්‍යාත්මක හා අධ්‍යාපන යන විෂය ක්ෂේත්‍ර තුළ විචාරශීලී චින්තනය පිළිබඳව ඉදිරිපත් කර ඇති නිර්වචන කිහිපයක් ද සලකා බැලීම වැදගත් වේ. Willingham (2007) පවසන පරිදි ගැටළුවක දෙපාර්ශවයම දැකීම, ඔබගේ අදහස් තහවුරු හරණය කරන, නවමු සාක්ෂිවලට විවෘත වීම, අගති විරහිතව හේතු දැක්වීම, සාක්ෂි සැපයීම මගින් ප්‍රකාශ තහවුරු කරන ලෙස ඉල්ලා සිටීම, තිබෙන කරුණු මත පදනම්ව නිගමන සහ අනුමාන ගොඩ නැගීම, ප්‍රශ්න විසඳීම ආදී ක්‍රියාවලි විචාරශීලී චින්තනය යන සංකල්පයට අයත් වේ. අධ්‍යාපන ප්‍රවේශය තුළ විචාරශීලී චින්තනය නිර්වචනය කිරීමේදී බෙන්ජමින් බ්ලූම් සහ ඔහුගේ සහායකයින්ට අනුව විශ්ලේෂණය, සංස්ලේෂණය සහ ඇගයීම යන හැකියා කෙරෙහි අවධානය යොමු කර ඇත. මේ අනුව පෙනී යන්නේ විචාරශීලී චින්තනය ඉතා සංකීර්ණ ඉහළ මට්ටමේ හැකියාවන්ගෙන් සමන්විත වූ කුසලතාවයක් බවයි.

**විචාරශීලී චින්තනය: න්‍යායාත්මක පසුබිම**

ප්‍රගතිශීලීවාදය හා පරමාදර්ශවාදය ඇතුළු සාම්ප්‍රදායික න්‍යායන් මෙන්ම තොරතුරු සැකසීම න්‍යාය සහ බ්ලූම්ස්ගේ ඉගෙනුම් හැකියා වර්ගීකරණය වැනි ප්‍රජානන න්‍යායන් මගින් විචාරශීලී චින්තනය පිළිබඳව න්‍යායාත්මක අදහස් ඉදිරිපත් කර ඇත. දෙවන ලෝක යුද්ධයෙන් පසු දශකයේ සිට ප්‍රගතිශීලී ව්‍යාපාරයේ අනුග්‍රහය යටතේ විචාරශීලී චින්තනය ප්‍රවර්ධනය කර ඇත. පොදුවේ ගත් කල ප්‍රගතිශීලී න්‍යාය අවධාරණය කරන්නේ සිතන දේට වඩා සිතිය යුතු ආකාරයයි (Ozman & Craver, 2008). පහසුකම් සපයන්නන් ලෙස ගුරුවරුන් විසින් දත්ත සොයා ගැනීමට, විශ්ලේෂණය කිරීමට, අර්ථ නිරූපණය කිරීමට සහ ඇගයීමට සිසුන්ට සහාය විය යුතුය. ළමයින් කේන්ද්‍ර කරගත්, ක්‍රියාකාරකම් කේන්ද්‍ර කරගත් සහ නිර්මාණාත්මක විෂයමාලා ලෙස විෂයමාලා ප්‍රවේශයන් කිහිපයක් ප්‍රගතිශීලී ව්‍යාපාරයෙන් ඉස්මතු කොට දක්වා ඇත (Ozman & Craver, 2008). ප්‍රගතිශීලීවාදය සහ එයට පදනම් වන මූලධර්ම වඩ වඩාත් සංකීර්ණ සමාජයකට දායක වීම සඳහා සිසුන් තුළ සංවර්ධනය කළ යුතු ආකල්ප හා කුසලතා කෙරෙහි ඇඟවුම් කරයි.

පරමාදර්ශවාදීහු මනසෙහි සාවිඥානික තර්කනය අවධාරණය කරන බැවින් ඔවුන් අධ්‍යාපන ක්‍රියාවලිය තුළ සිතන ආකාරය සහ අදහස්වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා අවධානය යොමු කරති (Ozman & Craver, 2008). සාහිත්‍යය, ඉතිහාසය, දර්ශනය සහ ආගම වැනි විෂයයන් ඉගැන්වීම සඳහා දේශන, සාකච්ඡා සහ සොක්‍රටික් සංවාද වැනි ඉගැන්වීමේ ක්‍රම යොදාගත යුතු බව ඔවුහු නිර්දේශ කරති. මනසෙහි නෛසර්ගිකව පවතින සංකල්ප සහ අදහස් සවිඥානික මනසට ගෙන ඒම සඳහා ස්වයං විග්‍රහය, ප්‍රතිභානය, තීක්ෂණ බුද්ධිය, තර්කනය ආදිය භාවිතා කිරීම ද නිර්දේශ කරති. මෙබඳු අධ්‍යාපනයක් තුළින් විචාරශීලී චින්තනය සංවර්ධනය කළ හැකි බව පැහැදිලිය (Nora & Cohen, 1999).

තොරතුරු සැකසුම් න්‍යාය සිසුන් තොරතුරු සමග අන්තර්ක්‍රියා කරන ආකාරය තේරුම් ගැනීම සඳහා අධ්‍යාපනඥයින්ට ප්‍රයෝජනවත් වේ. මෙම න්‍යාය මූලික වශයෙන් මතකයට සම්බන්ධ වේ. තොරතුරු සැකසුම් න්‍යායවාදීන් විශ්වාස කරන්නේ බාහිර පරිසරයෙන් ලබා ගන්නා තොරතුරු අවධානය, සංජානනය, මතක තබා ගැනීම සහ ආවර්ජනය වැනි පියවර ඔස්සේ සංකීර්ණ ක්‍රියාවලියක් හා සම්බන්ධ වන බවයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම න්‍යාය ක්‍රියාත්මක කිරීම මගින් අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සහ අනවශ්‍ය තොරතුරු බැහැර කිරීම සේම ලබා ගත් තොරතුරු අර්ථකථනය කිරීම සඳහා සිසුන්ට මඟ පෙන්වීමට ගුරුවරුන් සන්නද්ධ කළ හැකිය. ඉහත දැක්වූ පියවර ඔස්සේ සංවර්ධනය කරගත් මතකය ගැටළු විසඳීම, නිර්මාණශීලී චින්තනය සහ ඉගෙනුම් මාරුව (Transfer of Learning) වැනි ඉහළ ප්‍රජානන ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා පදනම ලෙස භාවිත කළ හැක. ඒ හරහා සිසුන් තුළ විචාරශීලී චින්තනයක් නිර්මාණයට මඟ සැලසේ.

වර්ෂ 1956 දී Benjamin Bloom විසින් ප්‍රජානන කුසලතා සහ ඉගෙනුම් හැසිරීම් මට්ටම් පිළිබඳව වර්ගීකරණයක් නිර්මාණය කරන ලදී. එය Bloomගේ වර්ගීකරණය (Bloom’s Taxonomy) ලෙස හැඳින්වේ. එම වර්ගීකරණයට අනුව චින්තන හැකියා මට්ටම් හයක් ඇත (රූප සටහන අංක 01 බලන්න). ඒවා පිරමීඩාකාර රූප සටහනක් ලෙස දක්වනු ලබන අතර එහි පහළින්ම දක්වා ඇත්තේ වඩාත් ප්‍රාථමික චින්තන හැකියාය. පිරමීඩයේ ඉහළ මට්ටම්වලින් වඩා සංකීර්ණ චින්තන හැකියා දැක්වේ (Bloom, Engelhart, Furst, Hill, & Krathwohl, 1956). විශ්ලේෂණය, සංස්ලේෂණය සහ ඇගයීම වැනි ඉහළ ප්‍රජානන හැකියා සංවර්ධනය තුළින් සිසුන් තුළ විචාරශීලී චින්තනය අවදි කළ හැක.




රූප සටහන අංක 01: ප්‍රජානන හැකියා පිළිබඳ Bloomගේ වර්ගීකරණය.

Marx & Engels (1848) සඳහන් කරන්නේ සමබර පෞරුෂයක් ගොඩනැගීම අධ්‍යාපනයේ මූලික අරමුණක් විය යුතු බවය. මාක්ස්වාදයට අනුව සෑම පුද්ගලයකුම එක හා සමාන බවත් පුද්ගලයකු සතු ශක්තීන් දියුණු කළ යුතු බවත් පිළිගැනුණි. බුද්ධිමය ශක්තිය දියුණු කිරීම අධ්‍යාපනයේ කොටසක් ලෙස සලකනු ලැබීය. ශිෂ්‍යයාගේ වයසට අනුව එක් දිනකට පැය කිහිපයක් නිෂ්පාදන ක්‍රියාවලියට සහභාගී විය යුතු බව ඔහු පෙන්වා දුන් අතර මෙමඟින් විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමේ හා උපකරණ භාවිත කිරීමේ හැකියාව ඇති කිරීම අපේක්ෂා කරනු ලැබීය. ශිෂ්‍යයා ක්‍රියාකාරකම්වල යෙදුනු විට ඔහු හා බාහිර ලෝකය අතර සෘජු සම්බන්ධතාවයක් ගොඩනැගේ. එමගින් ඉන්ද්‍රියානුබද්ධව දැනුම ලබා ගැනීමටත් යථාර්ථය

පහසුවෙන් අවබෝධ කර ගැනීමටත් අවස්ථාව සැලසේ. මෙමගින් පූර්ණ වර්ධිත මිනිසුන් ලෙස ජීවත් වීමට අවස්ථාව සැලසීම අපේක්ෂා කෙරෙන අතර විචාරශීලී චින්තනමය හැකියාව ද සංවර්ධනය කළ හැකිය.

**විචාරශීලී චින්තනය සංවර්ධනය කිරීම: ප්‍රතිපත්තිමය පසුබිම**

ශ්‍රී ලාංකීය අධ්‍යාපනය ඔස්සේ රජයේ පාසල් තුළ විචාරශීලී චින්තකයන් බිහිකිරීමට ඇති පසුබිම සාකච්ඡා කිරීමෙහි දී ඒ සඳහා දැනට පවතින ප්‍රතිපත්තිමය පසුබිම පරීක්ෂා කිරීම වැදගත් වේ. අධ්‍යාපනය තුළින් අපේක්ෂිත ජාතික අරමුණු අටක් රජය විසින් හඳුන්වා දී ඇත. එහි අංක පහ යටතේහි දක්වා ඇත්තේ "සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණාත්මක හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම් හා වගවීම් ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම ලෙස" ය (ජාතික අධ්‍යාපන ආයතනය, 2018, පි.VII ). එයින් පැහැදිලි වන්නේ සමස්ත සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය තුළින් ශිෂ්‍යයා තුළ විචාරශීලී චින්තනය ඇති කිරීමට අපේක්ෂා කරන බවයි. ජාතික අරමුණු සාක්ෂාත් කර ගැනීම දීර්ඝ කාලීන ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැකිය. එම නිසා කෙටිකාලීන වශයෙන් එම අරමුණු කරා යොමු වීමට අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන මූලික නිපුණතා හතක් ද දක්වා ඇත. එහි දෙවන නිපුණතාවය වන්නේ "පෞරුෂත්වය වර්ධනයට අදාළ නිපුණතා" ය. මෙහිදී නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, තීරණ ගැනීම, ගැටළු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි කුසලතා සහ චිත්තවේගී බුද්ධිය ශිෂ්‍යයා තුළ ඇති කිරීමට බලාපොරොත්තු වේ (ජාතික අධ්‍යාපන ආයතනය, 2018). මෙම ජාතික අරමුණු සහ මූලික නිපුණතා පිළිබඳව ගුරුවරුන් දැනුවත් කිරීම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ මගින් සිදු කරනු ලැබේ. එම මග පෙන්වීම්වලට අනුව තමන්ගේ ඉගෙනුම්-ඉගැන්වීම් කටයුතු සකස් කර ගැනීම ගුරුභවතුන්ගේ වගකීම වෙයි. මෙයින් පැහැදිලි වන්නේ රජයේ පාසල්වල ඉගෙනුම ලබන ළමුන් තුළ විචාරශීලී චින්තනය සංවර්ධනය කිරීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය පසුබිම ශ්‍රී ලාංකීය රජය විසින් නිර්මාණය කර දී ඇති බවය.

ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය තුළ තිබෙන විෂයයන් සතර තුළින්ම සමබර පෞරුෂයක් සහිතව දරුවන් සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. මෙහිදී එක් එක් විෂයට අදාළ ඇතැම් කුසලතා විචාරශීලී චින්තනය දියුණු කිරීම සඳහා වැදගත් වේ (වගු අංක 01 බලන්න).

වගු අංක 01: ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාව හා සබැඳි විචාරශීලී චින්තන කුසලතා

| විෂය | විචාරශීලී චින්තනය හා සම්බන්ධ කුසලතා |
|---|---|
| මව් භාෂාව | -තර්කානුකූලව සහ නිර්මාණාත්මකව සිතීම<br>-ලිඛිත සහ අවාචික සන්නිවේදනයන්හි දී අවබෝධ කරගැනීම<br>-ප්‍රශ්න ඇසීම සහ පිළිතුරු දීම<br>-තොරතුරු සෙවීම, සංවිධානය කිරීම, ඇගයීම සහ භාවිතය |
| ගණිතය | -තර්කානුකූලව සිතීම<br>-ගෝලීයකරණය වූ පරිසරය තුළ එදිනෙදා ජීවිතයේ සැබෑ ගැටළු විසඳීම<br>-ඵලදායීව තර්ක කිරීම<br>-තර්කානුකූලව සම්බන්ධතා ගොඩනැගීම |
| ආගම | -පොදු සංස්කෘතියකට අනුගත වීම<br>-සැමට පිළිගත හැකි සිරිත් විරිත් පුරුදු පුහුණු කිරීම<br>-සුසංවාදය හා ගැටුම් නිරාකරණය කිරීම |
| පරිසරය ආශ්‍රිත | -පරිසරය, ජීවන ක්‍රියාවලිය, සජීවී දේවල්, ද්‍රව්‍යවල ගුණාංග සහ භෞතික |

| | |
|---|---|
| ක්‍රියාකාරකම් | ක්‍රියාවලිය පිළිබඳව නිරීක්ෂණය<br>-විද්‍යාත්මක විමර්ශන කුසලතා |

මූලාශ්‍රය: ජාතික අධ්‍යාපන ආයතනය (2018).

කනිෂ්ඨ ද්විතීයික අවධිය ළමයෙකු තුළ සැලකිය යුතු කායික හා මානසික මෙන්ම සමාජීය සංවර්ධනයේ වෙනස් වීම් සිදුවන කාලයක් වන අතර මෙම වෙනස්වීම් සහ ඒවායින් පැන නගින තත්ත්ව සමග කටයුතු කිරීමට ශිෂ්‍යයාට ඉවහල් වන අංග අවශ්‍යයෙන්ම අධ්‍යාපන ක්‍රියාවලියට ඇතුළත් කළ යුතුය. ශ්‍රී ලාංකීය රජයේ පාසල්වල ක්‍රියාත්මක කනිෂ්ඨ ද්විතීයික විෂයමාලාව තුළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තාක්ෂණවේදය අනිවාර්ය විෂයයන් වේ. මෙම විෂයයන් ඇතුළු සමස්ත විෂයමාලාව තුළින් කනිෂ්ඨ ද්විතීයික පාසල් ශිෂ්‍යයාගේ නිරවද්‍යතාව පිළිබඳ හැඟීම, තර්කනය, ගැටළු විසඳීම යන හැකියා කෙරෙහි අවධානය යොමුකොට ඇත. කනිෂ්ඨ ද්විතීයික අවධියේ සිටින ශිෂ්‍යයන්ට සමෝධානිත තේමා ප්‍රවේශයකින් පොදුවේ විශාල යහපතක් වනු ඇත. එහෙත් මීට පෙර විෂය නිර්දේශවල අන්තර්ගත වූ ඇතැම් සමෝධානිත විෂයයන් වෙන් වෙන් වූ විෂයයන් වශයෙන් වර්තමාන කනිෂ්ඨ ද්විතීයික විෂයමාලාව තුළ දක්නට ලැබේ. උදාහරණයක් ලෙස සමෝධානිත විෂයක් ලෙස තිබූ සමාජ අධ්‍යයනය විෂය වර්තමානයේදී ඉතිහාසය, භූගෝලය සහ පුරවැසි අධ්‍යාපනය යනුවෙන් විෂයයන් තුනක් ලෙස ඉදිරිපත් කර ඇත. එහෙත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව (2016) සඳහන් කරන පරිදි සමෝධානිත විෂයයන් ආදේශ කිරීමෙන් තර්කානුකූල චින්තකයින් සමාජයට බිහිකරලීමට වඩා වැඩි හැකියාවක් ඇත.

ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනයෙහි පළමු අවධි දෙක වන ප්‍රාථමික සහ කනිෂ්ඨ ද්විතීයික අංශ සඳහා ක්‍රියාත්මක කරනු ලබන විෂයමාලාව සලකා බැලීමේදී පෙනී යන්නේ විචාරශීලී චින්තකයින් බිහි කිරීමෙහිලා එහි ඇතැම් දුබලතා පැවතියත් ඒ සඳහා අවශ්‍ය පසුබිම ද බොහෝ දුරට නිර්මාණය කර ඇති බවයි. පසු ළමාවිය සහ නව යොවුන්විය මුල් භාගයෙහි පසුවන ශිෂ්‍යයින් තුළ විචාරශීලී චින්තනය සංවර්ධනය කිරීම තුළින් ඵලදායී ලෙස ඉදිරි අධ්‍යාපන කටයුතුවල නියැලීමට අවශ්‍ය පදනම මේ තුළින් දැමිය හැකිය.

ශ්‍රී ලාංකීය අධ්‍යාපන පද්ධතිය තුළ පමණක් නොව ගෝලීය වශයෙන් ද විචාරශීලී චින්තනයේ වැදගත්කම අවධාරණය කොට ඇත. එනිසාම වර්තමානයේ පවත්නා අවශ්‍යතාවලට මුහුණ දීමට ගුරුවරුන් සංවර්ධනය කිරීම සඳහා 21 වන සියවසේ සිසුන්ගේ අවශ්‍යතා පිළිබඳව දැනුවත් කිරීම සලකා බැලිය. ලොව පුරා ආයතන 60ක් හරහා පර්යේෂණ 250කින් කරන ලද "ඇගයීම සහ ඉගැන්වීම පිළිබඳව 21 වන සියවසේ කුසලතා ව්‍යාපෘතිය" මෙයට කදිම නිදසුනකි. එහිදී ජාත්‍යන්තර වශයෙන් 21 වන සියවසට අදාළ කුසලතා පුළුල් ප්‍රභේද හතරකට වර්ගීකරණය කර ඇත. එහි පළමුවැන්න චින්තන විධි වේ. නිර්මාණශීලී බව, විචාරාත්මක චින්තනය, ගැටළු විසඳීම, තීරණ ගැනීම සහ ඉගෙනීමට ඉගෙනීම යන කරුණු එයට ඇතුළත් වේ (Trilling & Fadel, 2009). ඒ අනුව ගුරුවරුන්ගේ කුසලතා සංවර්ධනය කිරීම තුළින් එවැනිම හැකියවන් හා කුසලතාවන් ශිෂ්‍යයා තුළ ප්‍රගුණ කිරීමට ඉතා පහසු වීමෙන් ශිෂ්‍යයා තුළ ද විචාරශීලී චින්තනය සංවර්ධනය කළ හැකි බව ගෝලීය වශයෙන් ද පිළිගෙන ඇත.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

**ශ්‍රී ලාංකීය රජයේ පාසල් තුළින් විචාරශීලී චින්තකයින් බිහි කිරීම: ප්‍රායෝගික තත්ත්වය**

මෙවැනි පසුබිමක් මත ප්‍රායෝගික අධ්‍යාපන ක්‍රියාවලිය තුළ විචාරශීලී චින්තකයින් බිහිකිරීම කුමන තත්ත්වයක පවතින්නේ ද යන්න පිළිබඳව විමසා බැලීම ඉතා වැදගත් වේ. මෙහිදී ශ්‍රී ලංකාවේ රජයේ පාසල්

පද්ධතිය තුළ විෂයමාලාව ක්‍රියාත්මක කරනු ලබන ආකාරය, විෂයමාලා ප්‍රලේඛනවල පවත්නා දුබලතා, ගුරුවරුන් බඳවා ගැනීමේ පටිපාටිය, ශ්‍රී ලාංකීය අධ්‍යාපන පද්ධතිය තුළ ක්‍රියාත්මක සංස්කෘතික සන්දර්භය, පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ භාවිතා කරනු ලබන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම හා ක්‍රම ශිල්ප, ශිෂ්‍ය කාර්යසාධනය ඇගයීමේ ක්‍රමවේද ශිෂ්‍යයින් තුළ විචාරශීලී චින්තනය සංවර්ධනය කිරීම සඳහා දායකවේ ද යන්න විමර්ශනය කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

ශ්‍රී ලාංකීය රජයේ පාසල් තුළින් විචාරශීලී චින්තකයින් බිහි කිරීමේහි දී පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක විෂයමාලාව ප්‍රබල බලපෑමක් ඇති කරයි. විෂයමාලාව යනු අපේක්ෂිත ඉගෙනුම් අත්දැකීම්වල ව්‍යුහාත්මක පෙළ ගැසීමකි (ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, 2016). ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන්නේ නිපුණතා පාදක අධ්‍යාපනයක් බැවින් ශිෂ්‍යයින්ගෙන් කුසලතා සංවර්ධනය කිරීම එහි දී ප්‍රමුඛතාවයක් ගනී. මෙම ප්‍රවණතාව මගින් තාක්ෂණයෙන් සංතෘප්ත ලෝකයක් තුළ ජීවත්වීම සඳහා අනුවර්තනය වීම පිණිස 21 වන සියවසට අදාළ කුසලතාවලින් සමන්විත ශිෂ්‍යයන් පිරිසක් බිහිකිරීමට අපේක්ෂා කරනු ලැබේ. එසේ වුවද ප්‍රයෝගිකව ගත් කල විෂයමාලාවේ අන්තර්ගතය ප්‍රමාණය ඉක්මවීම නිසාත් විෂය කරුණු ඉගෙනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු වීම නිසාත් වසරක් සඳහා නියමිත අන්තර්ගතය ආවරණය කිරීම අපහසු වන අතර මෙම තත්ත්වය ගුරුවරුන් සහ ශිෂ්‍යයන්හට දැඩි පීඩනයක් එල්ල කරයි (ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, 2016). මේ අනුව පංති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ක්‍රියාත්මක කෙරෙන ඉගෙනුම් අත්දැකීම් තුළින් විචාරශීලී චින්තනය වැනි කුසලතා සංවර්ධනය කිරීම පිළිබඳ පවතින ජාතික අරමුණු සහ මූලික නිපුණතා පිළිබඳ අවධානය යොමු කිරීම සාර්ථකව සිදු නොවන බව පෙනේ.

විෂයමාලා ප්‍රලේඛනවල පවත්නා දුබලතා ශිෂ්‍යයන් තුළ චින්තනමය හැකියාව දියුණු කිරීමට බාධාවක් වී ඇත. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවලින් විෂය අන්තර්ගතය අරබයා බොහෝ තොරතුරු දෙන නමුත් විචාරශීලී චින්තනය සංවර්ධනය වන ආකාරයේ අධ්‍යාපනික ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට ගුරුවරුන්හට මාර්ගෝපදේශ සැපයීම මඳ බවක් දක්නට ලැබේ. උදාහරණයක් ලෙස අට ශ්‍රේණියෙහි පුරවැසි අධ්‍යාපනය විෂයට අදාළ එක් නිපුණතා මට්ටමක් වන්නේ පොදු සේවා සපයන ආයතන හා බැඳුණු වගකීම් හා යුතුකම් විමර්ශනය කිරීමය (ජාතික අධ්‍යාපන ආයතනය, 2016). නමුත් මෙම ගුරු මාර්ගෝපදේශයෙහි එම පාඩමට අදාළ සුදුසු ඉගෙනුම්-ඉගැන්වීම් අත්දැකීම් හා ඉගැන්වීම් ශිල්ප ක්‍රම පිළිබඳව සඳහන් කර නොමැති තරම්ය. ඇගයීම් සහ තක්සේරුකරණය පිළිබඳ ඉතා සීමිත මග පෙන්වීමක් සපයා ඇත. ගුණාත්මක යෙදවුම් යටතේ පාඩමට අදාළ ඡායාරූප හා පුවත්පත් වාර්තා යනාදිය භාවිතයට උපදෙස් දී තිබුන ද ගුරුවරුන් විසින් එම උපදෙස් ප්‍රයෝගිකව භාවිතා කරන තත්ත්වයක් බොහෝ විට දක්නට නොලැබේ. එයට ප්‍රධාන හේතුවක් වන්නේ රජය විසින් හෝ පාසල විසින් එබඳු ගුණාත්මක යෙදවුම් සපයා නොතිබීමත් බොහෝ විට ගුරුවරුන්ගේ මට්ටමින් හෝ එවැනි ඉගෙනුම් සම්පත් නිර්මාණය කිරීමට සහ එබඳු සම්පත් එකතුවක් පවත්වාගෙන යාමට උනන්දු නොවීමත් නිසාය. ඉහත උදාහරණයේ දැක්වූ පාඩම සඳහා වෙන්කර ඇත්තේ කාලච්ඡේද දෙකකි. Pithers & Soden (2000) පවසන පරිදි සමීක්ෂණ ප්‍රශ්න ඉදිරිපත් කිරීම, ස්වාධීන පර්යේෂණ පැවැත්වීමට ශිෂ්‍යයින් යොමු කිරීම, ප්‍රශ්න කිරීමට හෝ අභියෝග කිරීමට ඔවුන් දිරිමත් කිරීම සහ පසුව ඔවුන්ගේම කරුණු පදනම් කරගත් තොරතුරු ඉදිරිපත් කිරීම මගින් විචාරශීලී චින්තනය ක්‍රියාත්මක කළ හැකිය. එහෙත් ඉහත උදාහරණයෙහි දැක් වූ පාඩමෙහි අන්තර්ගතය පිළිබඳ අවධානය යොමු කිරීමේදී පැහැදිලි වන්නේ ශිෂ්‍යයා විචාරශීලී චින්තනය සඳහා අභිප්‍රේරණය කරමින් ගුරු මාර්ගෝපදේශයෙහි සඳහන් විෂය කරුණු සියල්ල ශිෂ්‍යයාහට අවබෝධ කරවීම සඳහා එම කාලය ප්‍රමාණවත් නැති බවය.

රජයේ පාසල් පද්ධතිය සඳහා ගුරුවරුන් බඳවා ගැනීමේ ක්‍රමවේදය එම ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ගුණාත්මකභාවය කෙරෙහි බලපාන අතර එය ඔවුන්ගේ ශිෂ්‍යයින් තුළත් විචාරශීලී චින්තනය සංවර්ධනය

කිරීම කෙරෙහි ද බලපාන බව පෙනී යයි. වර්තමානයේ ශ්‍රී ලංකාවේ ගුරුවරුන් බඳවා ගැනීම ප්‍රධාන වශයෙන් ක්‍රියාපටිපාටි දෙකක් ඔස්සේ සිදුවේ. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල ඩිප්ලෝමාධාරීන් හා විධිමත් පූර්ව-සේවා ගුරු අධ්‍යාපනයක් නොමැති උපාධි හෝ ඩිප්ලෝමාධාරීන් වශයෙනි (ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, 2016). ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල ඩිප්ලෝමාධාරීන් ගුරුවරුන් ලෙස පාසල් පද්ධතියට එක් වන්නේ ඔවුන්ගේ ගුරු භූමිකාව පිළිබඳ වසර තුනක පුහුණුවකින් පසුවය. එබැවින් ඔවුන්හට නිර්මාණශීලී ඉගෙනුම් අත්දැකීම් තුළින් ශිෂ්‍යයාගේ විචාරශීලී චින්තනය සංවර්ධනය කිරීම සඳහා සැලකිය යුතු මට්ටමක හැකියාවක් පවතී. අනෙක් වර්ගයේ ගුරුවරුන් බඳවා ගන්නා විට ඉගැන්වීම ගැන විධිමත් වෘත්තීමය අධ්‍යාපනයක් ඔවුනට ලබා දෙන්නේ නැත. එම නිසා ශිෂ්‍යයන්ගේ විභව්‍යතා හඳුනා ගැනීමට අපහසුවීම හේතුවෙන් වෘත්තිය තුළ ඔවුන්ගේ කාර්යසාධනය අඩු වනු දක්නට ලැබේ. එමෙන්ම මෙලෙස විධිමත් ගුරු අධ්‍යාපනයක් නොලැබූ ගුරුවරුන් හට සිසුන් තුළ විචාරශීලී චින්තන හැකියා සංවර්ධනය වන ආකාරයට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප සහ කුසලතා නොමැති බව බොහෝ විට දක්නට ලැබේ (Sethunga, Wijesundera, Kalamany & Karunanayake, 2014; Lekamge, Gunawardena, Karunanayaka & De Zoysa, 2008). විශේෂයෙන්ම පාසල් අධ්‍යාපනයේ මුල් භාගය ගත කරන දරුවන් තුළ විචාරශීලී චින්තනය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පසුබිමක් නිර්මාණය නොවීම තුළින් පසුකාලීනව ද එම කුසලතාවය දියුණු කිරීම අපහසුවනු දක්නට ලැබේ.

ශ්‍රී ලාංකීය අධ්‍යාපන පද්ධතිය තුළ ක්‍රියාත්මක සංස්කෘතික සන්දර්භය ද විචාරශීලී චින්තකයින් බිහි කිරීමට ගැටළුකාරී තත්ත්වයක් වර්ධනය කර ඇත. විශේෂයෙන්ම ශ්‍රී ලංකාව හා ඉන්දියාව වැනි රටවල ක්‍රියාත්මක වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනයකි. එහිදී ගුරු ආධිපත්‍යය සමස්ත පංති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළම දක්නට ලැබේ (පෙරේරා, 2016). ගුරුවරයාගේ භූමිකාව ප්‍රධාන වශයෙන්ම දැනුම සම්ප්‍රේෂණය කිරීමේ ක්‍රියාවලිය මූලික කරගෙන ක්‍රියාත්මක වේ. ඉතා මෑතක් වන තුරු ශ්‍රී ලාංකීය පාසල් තුළ ගුරුවරයා විෂය ප්‍රවීණයෙකු ලෙසත් ශිෂ්‍යයා පෙර දැනුමක් නොමැති ව ඉගෙනුම් ක්‍රියාවලියට සම්බන්ධ වන බවත් සලකා ශිෂ්‍යයා ක්‍රියාකාරකම් තුළින් ඉගෙනීම වෙනුවට සවන් දීමෙන් හා සටහන් ලිවීමෙන් ගුරුවරයා සතු දැනුම උකහා ගන්නා පංති කාමර වතාවරණයක් ක්‍රියාත්මක විය. මෙබඳු වතාවරණයක් යටතේ ශිෂ්‍යයා හට විචාරශීලී චින්තනයකින් යුතුව කටයුතු කිරීමට අවකාශය නො ලැබෙන බව පැහැදිලිය. මෑතක දී හඳුන්වා දෙන ලද නිපුණතා පාදක විෂය මාලාව තුළින් වඩා ශිෂ්‍ය කේන්ද්‍රීය වූ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් ශ්‍රී ලාංකීය පාසල් පද්ධතියට හඳුන්වාදීමට අපේක්ෂා කළද එම ඉගෙනුම්-ඉගැන්වීමේ අපේක්ෂිත පරිවර්තනය බොහෝ පාසල්වල සිදු වී නොමැති බව Gunawardena, Wijetunge & Perera (2003) විසින් සිදු කරන ලද අධ්‍යයනයෙන් අනාවරණය විය . මෙම අධ්‍යයනයට අනුව බොහෝ පන්ති කාමර ක්‍රියාකාරකම් මේසය, කළු පුවරුව, පොත සහ ගුරුවරයා කේන්ද්‍රගත ඒවා බව දක්නට ලැබුණි. ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනයක් රට තුළ ක්‍රියාත්මක වීම කෙරෙහි පවත්නා ආර්ථික පසුබිම ද ප්‍රබල බලපෑමක් එල්ල කොට ඇත. ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය තුළ ගුරුවරයාට හා ශිෂ්‍ය හට තම අධ්‍යාපන ක්‍රියාවලිය සර්ථකව සිදු කර ගැනීමට අවශ්‍ය ඉගෙනුම් සම්පත් ඉහළ මට්ටමක පැවතිය යුතුවේ. ඉගෙනීම සඳහා සහෝපකාරී වන භෞතික හා මානසික ඉගෙනුම් පරිසරයක් ශිෂ්‍යයා හට අත්විඳීමට නොමැති වතාවරණයක් තුළ විචාරශීලී චින්තකයින් බිහිකිරීම ඉතා දුෂ්කර කර්තව්‍යයකි. උදාහරණයක් ලෙස සීමිත ඉඩ පහසුකම් වලින් යුත් පංති කාමරයක් තුළ ශිෂ්‍යයින් 45 දෙනෙකු හට කළු ලැල්ල භාවිත කරමින් මිනිත්තු 40 පාඩමක් ඉගැන්වීමේදී ශිෂ්‍යයාගේ විචාරශීලී චින්තනය පුබුදුවමින් ඉගැන්වීම සාර්ථක ක්‍රමවේදයක් නොවේ. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ ඵලදායීතාවය පිළිබඳ Gunawardena, Wijetunge & Perera (2003) විසින් සිදු කරන ලද අධ්‍යයනයේදී සොයා ගන්නා ලද්දේ ක්‍රියාකාරකම් කාමර ලබා දී ඇත්තේ පාසල් 300 කට පමණක් බවය. මේ අනුව පෙනී යන්නේ නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමයක් හඳුන්වා දුන්න ද ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ වර්තමානයේ ද බොහෝ විට ක්‍රියාත්මක වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනයක් බවත් වඩා ශිෂ්‍ය කේන්ද්‍රීය වූ අධ්‍යාපන

ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමට සහෝපකාරී වන පසුබිමක් නිර්මාණය වී නොමැති බැවින් විචාරශීලී චින්තකයින් බිහි කිරීමට ද බලපෑමක් එල්ල වන බවත් ය.

පාසල් ශිෂ්‍යයින් තුළ විචාරශීලී චින්තනය සංවර්ධනය කිරීම සඳහා පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ භාවිතා කරනු ලබන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම හා ක්‍රම ශිල්ප ද ප්‍රබල බලපෑමක් ඇති කරනු ලැබේ. ගැටළු පාදක කරගත් ඉගෙනුම් ප්‍රවේශයක් ඔස්සේ ගැටළු විසඳීම, ගැටළුවකට තිබිය හැකි විවිධ විසඳුම් ඇගයීමට ලක් කිරීම, තැත්වැරද ඉගෙනුම් ක්‍රම (Trial and Error) යොදා ගැනීම , කණ්ඩායම් වැඩ, සමපදස්ථයන්ගෙන් ඉගෙනීම, විමසීම් පදනම් කරගත් ඉගෙනීම (Inquiry based Learning) ආදී ක්‍රම තුළින් ශිෂ්‍යයින් තුළ විචරශීලී චින්තනය සංවර්ධනය කළ හැකිය (පෙරේරා, 2016; Fung, 2014; Zaini, 2016). එහෙත් ශිෂ්‍යයා තුළ විචාරශීලී චින්තනය සංවර්ධනය වන ආකාරයට මෙබඳු ඉගෙනුම්-ඉගැන්වීම් ප්‍රවේශ, ක්‍රම සහ ක්‍රම ශිල්ප භාවිතා කිරීම ශ්‍රී ලාංකීය රජයේ පාසල් පද්ධතිය තුළ සාර්ථකව සිදු නොවන බව අදාළ සාහිත්‍යය විමර්ශනය කිරීමේදී පෙනී යයි. මෙබඳු ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම භාවිතය සඳහා ක්‍රමානුකූලව ශිෂ්‍ය ස්වායත්ත බව සංවර්ධනය කිරීම අත්‍යවශය වේ. නමුත් ශ්‍රී ලාංකීය අධ්‍යාපන සන්දර්භය තුළ පන්ති කාමර අධ්‍යාපනය තුළින් ශිෂ්‍ය ස්වායත්ත බව සංවර්ධනය කිරීමට ඇති අභියෝගයක් ලෙස තර්කනයට හා විචාරශීලී චින්තනයට ශිෂ්‍යයන් තුළ හුරුවක් නොතිබීම, ශිෂ්‍යයා ඉගෙනුම් පරිසරය තුළ නිෂ්ක්‍රීය භූමිකාවකට හුරු වී තිබීම හා ඉගෙනුම සඳහා වන පෙළඹවීම මඳ වීම යන කරුණු බලපාන බව පෙරේරා (2016) පවසා ඇත. මේ අනුව පෙනී යන්නේ ශිෂ්‍යයා තුළ විචාරශීලී චින්තනය සංවර්ධනය කිරීමත් විචාරශීලී චින්තනය සංවර්ධනය කිරීමත් අතර ඇත්තේ අවියෝජනීය චක්‍රීය සම්බන්ධතාවයක් බව කිව හැකිය. එහෙත් ශිෂ්‍යයාගේ විචාරශීලී චින්තනයත් ස්වායත්ත බවත් සංවර්ධනය කිරීමට බධාකාරී වන සාධක බොහෝමයක් තිබේ. මෙම සාධක වර්ග 3ක් පෙරේරා (2016) හඳුන්වා දී ඇත. එනම් ශිෂ්‍යයා හා සම්බන්ධ සාධක ( උදා.-ශිෂ්‍යයාගේ ඉගෙනුම සඳහා වන පෙළඹවීම මඳ බව, ඉගෙනීම පිළිබඳ ස්වයං ඇගයීමක් නොමැති බව), ආයතනික සාධක ( උදා.-ස්වයං ඇගයීම, නිර්මාණශීලී චින්තනය වැනි කුසලතා දිරිමත් නොකර ආයතනික සම්ප්‍රදායන්) සහ ගුරු සාධක ( උදා.-ගුරුවරුන් තුළ තිබෙන ඍණාත්මක ආකල්ප, ගුරු ස්වායත්ත බව පහළ මට්ටමක පැවතීම) වේ. ශ්‍රී ලාංකීය සන්දර්භය සලකා බලන විට ද ඉහත සඳහන් කළ බධාකාරී සාධක මෙම සන්දර්භයට අදාළ වන බව පෙනේ. මෙහිදී ගුරු-ශිෂ්‍ය දෙපාර්ශවයම ක්‍රම ක්‍රමයෙන් ස්වායත්ත බව සංවර්ධනය කිරීම කෙරෙහි පුහුණු කළ යුතුවේ. එමෙන්ම ගුරුවරුන්ගේ ආකල්පමය වෙනසක් සිදු විය යුතුය. බොහෝ අවස්ථාවල ඉහත සඳහන් කළ ආකාරයේ විචාරශීලී චින්තනය සංවර්ධනය කිරීම සඳහා යොදා ගත හැකි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම භාවිතයෙහි අඩුවක් දක්නට ලැබේ. මෙයට හේතුව එබඳු ක්‍රමවේද භාවිතය පිළිබඳ ඔවුන් සතු ඍණාත්මක ආකල්පයි. අනෙක් අතට ඇතැම් අවස්ථාවල ගුරුවරයා සතුව විචරශීලී චින්තනය සංවර්ධනය කිරීම සඳහා යොදා ගතයුතු ශිල්ප ක්‍රම පිළිබඳ දැනුමක් පැවතිය ද විෂය නිර්දේශ ආවරණය කිරීම කෙරෙහි වැඩි අවධනයක් යොමු කිරීම මත විචරශීලී චින්තනමය සංවර්ධන ක්‍රියාවලියක් සිදු නොවේ.

වර්තමානයේ ශ්‍රී ලාංකීය රජයේ පාසල් තුළ පවත්නා ශිෂ්‍ය කාර්යසාධනය ඇගයීමේ පටිපාටිය ද විචාරශීලී චින්තකයින් බිහිකිරීම පිළිබඳව ප්‍රබල බලපෑමක් ඇති කරනු ලබන බව පෙනේ. අධ්‍යාපන ක්‍රියාවලිය තුළ ක්‍රියාත්මක සම්භවන තක්සේරු ක්‍රමත් (උදා.-ගුරු නිරීක්ෂණය, වාචික ප්‍රශ්න කිරීම, පන්ති කාමර සාකච්ඡා, ගොනුගත තක්සේරුව සහ ගෙදරවැඩ) සම්පිණ්ඩිත තක්සේරු ක්‍රමත් (උදා.-ඒකකයක්, වාරයක් හෝ වසරක් අවසානයේදී පවත්වන ලිඛිත හෝ ප්‍රායෝගික පරීක්ෂණ) ශ්‍රී ලාංකීය රජයේ පාසල් තුළ ක්‍රියාත්මක වේ. ශිෂ්‍යයන් කොතරම් හොඳින් විෂයමාලාවේ ඉගෙනුම් ඉලක්ක මුදුන්පත් කරගෙන ඇත්ද යන්න ගැන අවසන් නිගමනයන්ට පැමිණීමට ගුරුවරුන්ට, ශිෂ්‍යයන්ට සහ දෙමව්පියන්ට මේවායින් ලබාදෙන තොරතුරු භාවිත කළ හැකි වේ. තක්සේරු කිරීමෙහි ප්‍රධාන අරමුණ ශිෂ්‍ය ඉගෙනීම වැඩිදියුණු කිරීම වන අතර වෙන් වෙන්ව පවතින එහෙත් එකිනෙකට සම්බන්ධ තක්සේරු අරමුණු තුනක් ගැන නූතන ශාස්ත්‍රීය ග්‍රන්ථවල පැහැදිලි කර

තිබේ. එනම්, ඉගෙනීම පිණිස තක්සේරුව (Assessment for Learning), ඉගෙනීම ලෙස තක්සේරුව (Assessment as Learning) සහ ඉගෙනීම පිළිබඳව තක්සේරුව (Assessment of Learning) යනුවෙනි (ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, 2016).

සම්භවන තක්සේරු ක්‍රමය විශේෂයෙන්ම ඉගෙනීම පිණිස සිදුකරන තක්සේරුවක් වන බැවින් පාසල් ශිෂ්‍යයා තුළ විචාරශීලී චින්තනය සංවර්ධනය කිරීමෙහිලා ප්‍රබල භූමිකාවක් නිරූපණය කිරීමට එයට හැකියාවක් ඇත. එවැනි තක්සේරු ක්‍රම සාමාන්‍ය පරීක්ෂණවලට සීමා නොවිය යුතු අතර ශිෂ්‍යයන්ට ඔවුන්ගේ විශ්ලේෂණ හා සංස්ලේෂණ කුසලතා විදහා  දැක්වීමට අවශ්‍ය අළුත් විධි ඇතුළත් විය යුතුය. Zhang (2003) පරමාදර්ශී විචාරශීලී චින්තකයාගේ ලක්ෂණ ලෙස විමසිලිමත් වීම, හොඳින් දැනුවත් වීම, විවෘත මනසක් තිබීම නම්‍යශීලි වීම, ඇගයීමට සාධාරණ මනසක් තිබීම, නැවත සලකා බැලීමට කැමති වීම, අදාළ තොරතුරු සෙවීමට කඩිනම් වීම, නිර්ණායක යොදා ගැනීමේදී සාධාරණ වීම සහ විමර්ශනය කරනු ලබන විෂය හා තත්ත්වයන් පිළිබඳව නිවැරදි ප්‍රතිඵල ලබා ගැනීමට නොපසුබට වීම ආදිය සඳහන් කරයි. මේ අනුව නිවසේදී, සමාජය තුළදී, සමපදස්ථයන් සමඟ ක්‍රීඩා කිරීමේදී හා අන්තර් ක්‍රියාකාරකම්වලදී ලැබෙන අත්දැකීම් සහ මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික මාධ්‍යයන් හරහා ඉදිරිපත් කරන තොරතුරු පංති කාමර ඉගෙනුම හා සම්බන්ධ කරන ආකාරයේ ව්‍යාපෘති, පැවරුම්, ගැටළු විසඳුම වැනි ක්‍රමවේද ඔස්සේ සම්භවන තක්සේරුව ක්‍රියාත්මක කළ හැකිය. වර්තමාන ශ්‍රී ලාංකීය ගුරුවරුන් විසින් භාවිතා කරනු ලබන සම්භවන තක්සේරු ක්‍රම කිහිපයක් ලෙස දෙන ලද මතෘකාවකට අදාළව කරුණු ගවේෂණය කර පොත් පිංචක් නිර්මාණය කිරීම, කණ්ඩායම් ඉදිරිපත් කිරීම් සිදු කිරීම, නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදවීම දැක්විය හැක. මේ අනුව පෙනී යන්නේ ශ්‍රී ලාංකීය රජයේ පාසල්වල ක්‍රියාත්මක වන සම්භවන ඇගයීම් ක්‍රම තුළින් ශිෂ්‍යයින්ගේ විචාරශීලී චින්තනය සංවර්ධනය සඳහා යම්තාක් දුරකට අවස්ථා සැලසෙන බවයි. මේ තත්ත්වය ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, කැනඩාව, ස්කැන්ඩිනේවියානු රටවල් සහ ඕස්ට්‍රේලියාව වැනි සංවර්ධිත රටවල්වල තත්ත්වය හා සැසඳීමේදී පෙනී යන්නේ එම රටවල් ඇගයීම් ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීමට අව්‍යාජ තක්සේරු ක්‍රම භාවිතා කරන බවයි (ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, 2016). මෙහිදී පංති කාමරයේ ඉගෙනගත් දෙය සැබෑ ලෝකයේ ගැටළු සහ සංසිද්ධීන් සමග සම්බන්ධ කරන ආකාරයේ ක්‍රියාකාරකම් තුළින් ශිෂ්‍ය කාර්යසාධනය අගයනු ලබන බැවින් ශිෂ්‍යයා තුළ විචාරශීලී චින්තනය සංවර්ධනය වීමට අවශ්‍ය අවස්ථා සැලසේ. එබැවින් මෙවැනි අව්‍යාජ තක්සේරු ක්‍රම ශ්‍රී ලංකීය පාසල් අධ්‍යාපනය තුළ ද ක්‍රියාත්මක කළ යුතුය.

පාසල පදනම් කරගත් විෂය සමගාමී ක්‍රියාකාරකම් වන ක්‍රීඩා, රංග කලා, සමිතිසමාගම් හා ශිෂ්‍යභට පුහුණුව වැනි පාසල් නායකත්ව වැඩසටහන් ළමයාගේ සමස්ත පෞරුෂ සංවර්ධනයට අති මහත් අගයක් එකතු කරයි. එමගින් ශිෂ්‍යයෝ අක්‍රීය නිරීක්ෂකයන් වෙනුවට, මනෝචාලක කුසලතා වර්ධනය කරගන්නා සක්‍රීය සහභාගීවන්නන් බවට පත්වෙති. ඇමෙරිකා එක්සත් ජනපදයේ සහ කැනඩාවේ සියලුම පාසල්වල සෑම ශිෂ්‍යයෙකු සඳහාම අවම කාර්යසාධන ප්‍රමිතීන් සකස් කර තිබේ. උදාහරණයක් ලෙස ශිෂ්‍යයෙකු අවම වශයෙන් ක්‍රීඩා කටයුතු දෙකකට හා ප්‍රජා ව්‍යාපෘති කටයුතු දෙකකට සහභාගී වනු ඇතැයි බලාපොරොත්තු වේ (ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, 2016). ශ්‍රී ලාංකීය රජයේ පාසල් පද්ධතිය තුළ ද මෙවැනි විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වන නමුත් ඉහත දැක්වූ සංවර්ධිත රටවල් මෙන් ශිෂ්‍ය කාර්යසාධනය සඳහා අනිවාර්ය අංගයක් බවට ඒවා තවමත් පත්වී නොමැත. එවැනි විෂය සමගාමී ක්‍රියාකාරකම් වඩාත් හොඳ ප්‍රජානන කාර්යසාධනයකට දායක වන අතරම එය චිත්තවේගී සහ කායික යෝග්‍යතාව මෙන්ම විචාරශීලී චින්තනය ද සංවර්ධනය කරයි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනයෙහි පවත්නා ප්‍රධාන සම්පිණ්ඩිත ඇගයීම් ක්‍රමය වන විභාග ක්‍රමවේදය ශිෂ්‍යයා තුළ විචාරශීලී චින්තනය ඇති කිරීම කෙරෙහි බලපානු ලබන ප්‍රධාන සාධකයක් වේ. ශ්‍රී ලාංකීය

පාසල් අධ්‍යාපන පද්ධතිය තුළ ප්‍රසිද්ධ විභාග තුනක් පවත්වයි; එනම් පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය, අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සහ අ.පො.ස. උසස් පෙළ විභාගයයි. මෙම ප්‍රසිද්ධ විභාග තුනෙහිදී ශිෂ්‍යයාගේ 'ජයග්‍රහණය' තහවුරු කර ගැනීම පිණිස දෙමව්පියන්ගෙන් එල්ලවන පීඩනයත් පාසල් අතර ඉහළ ප්‍රතිඵල පෙන්වීම සඳහා පවත්නා තරගකාරී බවත් ශිෂ්‍යයින් තුළ උවමනාවට වඩා ආතතියක් ඇති කරයි. මෙහිදී එම එක් එක් විභාගය පැවැත්වීමේ අරමුණු පවා පාසල් පද්ධතියේ පාර්ශවකරුවන් විසින් අමතක කරනු බව පෙනේ. උදාහරණයක් ලෙස පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය අරමුණු දෙකක් සඳහා එනම්, ආර්ථික වශයෙන් ගැටළු ඇති පවුල්වල සහජ හැකියා ඇති ළමයින්ට ශිෂ්‍යත්ව ලබා දීමට සහ ජනප්‍රිය පාසල්වල ද්විතීයික අධ්‍යාපනය සඳහා ශිෂ්‍යයන් තෝරා ගැනීමට පවත්වනු ලැබේ. එහෙත් ආර්ථික අපහසුතා නැති පවුල්වල ළමුන් ද ජනප්‍රිය පාසල්වල සිසුන් හට ද මෙම විභාගය ඉහළින් සමත්වීම සඳහා දෙමාපියන් සහ පාසල් විසින් දැඩි පීඩනයක් එල්ල කරනු ලබන බව දක්නට ලැබේ. මේ අනුව පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල ප්‍රාථමික සහ ද්විතීයික යන අංශ දෙකෙහිදීම විභාග ක්‍රමය සමස්ත පාසල් පද්ධතියෙහිම පාර්ශවකරුවන්ගේ දැඩි අවධානයක් යොමු වන සංරචකයක් වන බවයි. එබැවින් මෙම විභාගාභිමුඛ අධ්‍යාපනය ශිෂ්‍යයා තුළ විචාරශීලී චින්තනය සංවර්ධනය සඳහා කෙතෙක් දුරට දායකවන්නේ ද යන්න විමර්ශනය කිරීම වැදගත් වේ. මෙම විභාගවල තිබෙන බහුවරණ, ගැළපීම් සහ අවබෝධය මනින ප්‍රශ්න තුළින් පහළ මට්ටමේ ප්‍රජානන හැකියා පමණක් බොහෝ දුරට ඇගයීමට ලක් කරනු ලැබේ. රචනා ලිවීම, ගණිත ගැටළු විසඳීම සහ සාහිත්‍යය විචාර වැනි ප්‍රශ්න තුළින් ඉහළ මට්ටමේ ප්‍රජානන හැකියා ඇගයීමට ලක් කළ හැකිය. එහෙත් විශාල විෂය නිර්දේශයක් ආවරණය කළ යුතු නිසාත් සෑම වසරකදී එකම ආකාරයේ විචාරාත්මක ප්‍රශ්න ලබා දීම නිසාත් ගුරුවරුන් යම් යම් ඉලක්ක ප්‍රශ්න කෙරෙහි අවධානය යොමු කර එම ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුරු ඇතැම් පොත් පත්වලින් ලබාගෙන ඒවා ශිෂ්‍යයින්ට සටහන් ලෙස ලබා දීමත් ශිෂ්‍යයින් එම සටහන් වනපොත් කොට නැවත විභාගයේදී පිළිතුරු ලෙස ලිවීමත් බොහෝවිට දක්නට ලැබේ. මේ අනුව පෙනී යන්නේ ශිෂ්‍යයාගේ විචාරශීලී චින්තනය අවදි කළ හැකි ආකාරයේ විභාග ප්‍රශ්නවලට පිළිතුරු සම්පාදනය කිරීම සඳහා සිසුන් පුහුණු කිරීමේදී ගුරුවරු ගන්නා ප්‍රවේශය පහළ මට්ටමේ ප්‍රජානන හැකියා එනම්, මතක තබා ගැනීම සහ අවබෝධය පමණක් සංවර්ධනය කරන බවයි. ගුරුවරුන් විසින් විෂය නිර්දේශය ආවරණය කිරීමේදී ද මූලිකවම අවධානය යොමු කරන්නේ විභාගය සඳහා සිසුන් සූදානම් කිරීම කෙරෙහිය. මෙය විභාගයෙහි අහිසි බලපෑමක් ලෙස හැඳින්විය හැක (Negative Washback Effect of Examination) (Buck, 1988). මේ අනුව පෙනී යන්නේ ශ්‍රී ලාංකීය රජයේ පාසල් පද්ධතිය තුළ පවත්නා සම්පිණ්ඩිත ඇගයීම් ක්‍රමවේදය ඔස්සේ විචාරශීලී චින්තකයින් බිහි කිරීමට යම් හැකියාවක් තිබුන ද එම විභාග ක්‍රමය තුළ පවත්නා ඇතැම් දුබලතා නිසාත් විෂයමාලාවෙහි බර තැබීම නිසාත් පාසල් පද්ධතියේ පාර්ශවකරුවන්ගේ වැරදි ආකල්ප සහ පුරුදු නිසාත් ඒ සඳහා මනා පිටුබලයක් නොලැබෙන බවය.

**නිගමනය**

ශ්‍රී ලාංකීය රජය විසින් අධ්‍යාපන ප්‍රතිපත්ති නිර්මාණයේදී ජාතික අරමුණු, නිපුණතා හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ තුළින් විචාරශීලී චින්තකයෙකු බිහි කරලීම උදෙසා අවශ්‍ය ප්‍රතිපත්තිමය පසුබිම නිර්මාණය කර දී ඇති බව පැහැදිලි වේ. එහෙත් ප්‍රායෝගිකව අධ්‍යාපන ක්‍රියාවලිය තුළ එම අරමුණු හා නිපුණතා සාක්ෂාත් කර ගැනීමට නොහැකි තත්ත්වයක් පවතින බව පෙනී යයි. එයට හේතුවී ඇත්තේ විෂයමාලා අන්තර්ගතය, විෂයමාලා ප්‍රලේඛන, ගුරුවරුන් බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය, අධ්‍යාපන පද්ධතිය තුළ ක්‍රියාත්මක සංස්කෘතික සන්දර්භය, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ භාවිත කරනු ලබන ක්‍රම ශිල්ප හා ශිෂ්‍ය කාර්යසාධන තක්සේරු ක්‍රමවල පවත්නා යම් යම් දුර්වලතා බව පැහැදිලි වේ. ඒ අනුව පැහැදිලි වන්නේ ශ්‍රී ලාංකීය රජයේ පාසල් තුළින් විචාරශීලී චින්තකයින් බිහි කිරීම යම්තාක් දුරකට සිදු වන නමුත් එබඳු

චින්තකයින් බිහි කිරීම ප්‍රශස්ත මට්ටමකින් සිදු කිරීම සඳහා අධ්‍යාපන ක්‍රමයත් පාසල් පද්ධතියේ පාර්ශවකරුවන්ගේ දැනුවත්භාවයත් සංවර්ධනය විය යුතු බවයි.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


ජාතික අධ්‍යාපන ආයතනය. (2016). *ගුරු මාර්ගෝපදේශය: පුරවැසි අධ්‍යාපනය - අට වන ශ්‍රේණිය.* මහරගම: කර්තෘ.

ජාතික අධ්‍යාපන ආයතනය. (2018). *පොදු ගුරු මාර්ගෝපදේශය: තුන් වන ශ්‍රේණිය.* මහරගම: කර්තෘ.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව. (2016). *ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා යෝජනා.* නුගේගොඩ: කර්තෘ.

පෙරේරා. එස්.ඒ.එස්.කේ. (2016). *ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළින් ශිෂ්‍ය ස්වායත්ත බව සංවර්ධනය කිරීම. අධීක්ෂා, කලාපය-6, පි.15-27.* නාවල : ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.

Bloom, B.S., Engelhart, M.D., Furst, E.J., Hill, W.H., & Krathwohl, D.R. (1956). *Taxonomy of educational objectives: The classification of educational goals.* London: Longmans.

Buck, G. (1988). Testing Listening Comprehension in Japanese University Entrance Examinations. *JALT Journal 10*, 15-42.

Dewey, J. (1933). *Experience and education*. New York: Macmillan.

Ennis, R. H. (2015). Critical Thinking. *The Palgrave Handbook of Critical Thinking in Higher Education*. New York: Palgrave Macmillan.

Fung, D. (2014). Promoting critical thinking through effective group work: A teaching intervention for Hong Kong primary school students. *International Journal of Educational Research*, *66*, 45-62.

Gunawardena, C.  Wijetunge, S. and Perera, L (2003) Evaluation of the Effectiveness of the Implementation of Educational Reforms at Secondary School level (Grade 6-11) NEREC

Lekamge, D., Gunawardena, C., Karunanayaka, S., & De Zoysa, S. (2008). *A study on instructional strategies used by teachers for development of higher order cognitive skills in students. Nawala: Faculty of Education, The Open University of Sri Lanka.*

Lewis, A., & Smith, D. (1993). Defining higher order thinking. Theory into Practice, 32(3), 131–137.

Lipman, M. (2003). *Thinking in Education.* New York: Cambridge University Press.

Marx, K., & Engels, F. (1848). *Manifesto of the Communist Party by Karl Marx and Frederick Engels February 1848.* Retrieved from https://www.marxists.org/archive/marx/works /download /pdf/Manifesto.pdf

Nora, L., & Cohen, M. (1999). *Section III – Philosophical Perspectives in Education.* Colombus: College of Education and Human Ecology, The Ohio State University. Retrieved from https://oregonstate .edu/instruct/ed416/PP2.html

Ozman, H.A., & Craver, S.M., (2008). *Philosophical Foundations of Education.* NJ: Pearson.

Pithers, R.T., & Soden, R. (2000). Critical Thinking in Education: A review. *Education Research, 42*(3), 237-249.

Sethunga, P., Wijesundera, S., Kalamany, T., & Karunanayaka, S. (2014). *Study on the professional development of teachers and teacher educators in Sri Lanka*. Nugegoda: National Education Commission.

Sternberg, R. J. (1986). Critical thinking: Its nature, measurement, and improvement National Institute of Education. Retrieved from https://files.eric.ed.gov/fulltext/ED272882.pdf

Trilling, B., & Fadel, C. (2009). *21st Century Skills: Learning for Life in Our Times.* San Francisco: Jossey-Bass.

Willingham, D.T. (2007). Critical Thinking: Why is it so hard to teach? American Educator, p. 8-19.

Zaini, M. (2016). Guided inquiry based learning on the concept of ecosystem toward learning outcomes and critical thinking skills of high school students. *IOSR Journal of Research & Method in Education (IOSR-JRME), 6*(6), 50-55.

Zhang, L. (2003). Contributions of thinking styles to critical thinking dispositions. *Journal of Psychology*, *137*(6), 517-543.

# සමාජ විග්‍රහ

**විමර්ශිත සංග්‍රහය**
**REFEREED JOURNAL**
**පළමු කාණ්ඩය, අටවන වෙළුම - 2022**
**ISSN 2362-0978 (print ISSN)**
**ISSN 2756-925X (e-ISSN)**

ලිපි අංක 05

## විශ්‍රාමිකල වියපත්භාවීය සංසිද්ධියට මුහුණපාන කාන්තාවන්ගේ සමාජ ආර්ථීක ගැටළු (විශ්‍රාමික විශ්වවිද්‍යාල ආචාර්යවරියන් ආශ්‍රයෙන් සිදුකරනු ලබන අධ්‍යනයක්)

[5]ඒ. ආර්. එම්.ඩී. කේ අබේසිංහ

https://orcid.org/0000-0001-5107-346X

*ප්‍රධාන සංස්කාරක*

ප්‍රේමකුමාර ද සිල්වා

*සහය සංස්කාරක*

ජගත් බණ්ඩාර පතිරගේ
හිරුනි කළුආරච්චි

*සංස්කාරක උපදේශක මණ්ඩලය*

එස්.ටී.හෙට්ටිගේ (සම්මානිත මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
කාලිංග ටියුඩර් සිල්වා (සම්මානිත මහාචාර්ය) පේරාදෙණිය විශ්වවිද්‍යාලය
කේ.කරුණාතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) කැලණිය විශ්වවිද්‍යාලය
සරත් අමරසිංහ (සම්මානිත මහාචාර්ය) රුහුණු විශ්වවිද්‍යාලය
යසාංජලී ජයතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
චන්ද්‍රසිරි නිරිඇල්ල (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
සුභාංගි හේරත් (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
නිශාර ප්‍රනාන්දු (ආචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
ෆර්සානා හනීෆා (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
ඉරේෂා ලක්ෂ්මන්(මහාචාර්ය)කොළඹ විශ්වවිද්‍යාලය

*භාෂා සංස්කරණය*

නාලක ජයසේන

*පරිසැලසුම් නිර්මාණය*

ප්‍රභාත් ගලගමගේ
හිරුනි කළුආරච්චි

[5] බී.ඒ. (කොළඹ), සහකාර කථිකාචාර්ය, සමාජ විද්‍යා අධ්‍යනංශය, කොළඹ විශ්ව විද්‍යාලය

# සමාජ විග්‍රහ

විමර්ශිත සංග්‍රහය

**REFEREED JOURNAL**

**පළමු කාණ්ඩය, අටවන වෙළුම - 2022**

**ISSN 2756-925X (e-ISSN)**

**ISSN 2362-0978 (print ISSN)**

This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License.

දැනුම වෙත ප්‍රවේශ වීමේ සීමා අතික්‍රමණය සඳහා ලොව බොහෝ ශාස්ත්‍රාලයීය ප්‍රකාශන සම්ප්‍රදායික ප්‍රකාශන අයිතිය පිළිබඳ නෛතික ආකෘතියෙන් විකල්ප ආකෘතියක් වන පොදු නිර්මාණ බලපත්‍ර ක්‍රමයට සංක්‍රමණය වී / වෙමින් ඇත. මේ අනුව විචාරාත්මක දැනුමට විවෘත ප්‍රවේශයක් ලබා දීමේ අරමුණින් “සමාජ විග්‍රහ” විමර්ශිත සංග්‍රහය, නිකුත් වන්නේ ඉහත පොදු නිර්මාණ බලපත්‍රය යටතේය.

## ලිපි විමර්ශක මණ්ඩලය

*සම්මානිත මහාචාර්ය සිරි හෙට්ටිගේ, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*මහාචාර්ය ෆර්සානා හනීෆා, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*මහාචාර්ය ඉරේෂා ලක්ෂ්මන්, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*ආචාර්ය ජගත් බණ්ඩාර පතිරගේ, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*ආචාර්ය ගයාත්‍රී විජේසුන්දර, සමාජ විද්‍යා දෙපාර්තුමේන්තුව, රුහුණ විශ්වවිද්‍යාලය*

*ආචාර්ය හේමන්ත කුමාර, සමාජ විද්‍යා දෙපාර්තුමේන්තුව, රුහුණ විශ්වවිද්‍යාලය*

## ප්‍රකාශනය

සමාජ විද්‍යා අධ්‍යයනාංශය

කොළඹ විශ්වවිද්‍යාලය

කොළඹ-03

දුරකථනය/ෆැක්ස්: 011-2500452

විද්‍යුත් තැපැල: samajaviggraha@soc.cmb.ac.lk

වෙබ් අඩවිය: https://arts.cmb.ac.lk/sociology/

**සාරසංක්ෂේපය**

සමාජයේ ඉහළ සමාජ, ආර්ථික, අධ්‍යාපනික තත්වයක් සහිත, විශ්වවිද්‍යාල කථිකාචාර්යවරියන්ගේ විශ්‍රාම දිවියේදී සහ වියපත්භාවීය සංසිද්ධියට මුහුණ පෑමේදී සහ සිය ශ්‍රම බලකායෙන් ඉවත්වීම තුළ ඇතිවන ගැටළු, අභියෝගයන් මොනවාද? යන ප්‍රධාන පර්යේෂණ ගැටලුවට කේන්ද්‍ර වෙමින්, මෙම පර්යේෂණය සිදුකෙරිණ. වියපත් ස්ත්‍රී ජනගහනය විශාලනය වීමේ විශ්වීය සංසිද්ධියේදී, ශ්‍රී ලංකාවද ඉදිරියෙන් සිටී. එය ස්ත්‍රියට අවධානමක් නිර්මාණය කරන බැවින්, එතරම් ආඩම්බර වියයුතු කාරණයක් නොවේ. වියපත්භාවය; පුරුෂයාට සාපේක්ෂව, ස්ත්‍රියව අභියෝගයට ලක්කරන බවට කතිකාවක් පවතී. පොදු සමාජ සංදර්භයෙහි වියපත්භාවය; ස්ත්‍රිය අභියෝගයට ලක්කරනා කාරණා තුළම, විශ්‍රාමික විශ්වවිද්‍යාල කථිකාචාර්යවරිය ද ස්ථානගත විය. නමුත්, ඔවුන්ගේ ඉහළ සමාජ, ආර්ථික, අධ්‍යාපනික තත්වයන්හිලා එකී අභියෝගාත්මක කාරණයන්හි බලපෑම විවිධ විය. එකී පසුබිම තුළ, සමස්ත කාන්තා පරපුරෙහි සුභවාදී අනාගතය වෙනුවෙන්, වියපත්භාවය; කාන්තාව මත ඇතිකරන බලපෑම පිළිබඳ, පර්යේෂණාත්මක දැනුම් නිෂ්පාදනය කිරීම ප්‍රධාන අරමුණයි. ප්‍රධාන පර්යේෂණ ප්‍රශ්න තුනක් හරහා පර්යේෂණය සිදුකෙරිණ. විශ්‍රාමික කථිකාචාර්යවරියන් මුහුණපාන සමාජ, ආර්ථික, සංස්කෘතික, සෞඛ්‍යමය අභියෝග මොනවාද? ඔවුන්ගේ පශ්චාත් විශ්‍රාමික ජීවිතය සංවිධානය කරගැනීම කෙසේද? සිය ජීවිතය කළමනාකරණය කරගැනීමෙහිලා උසස් අධ්‍යාපනයේ, වෘත්තීයේ දායකත්වය කෙසේද? යන පර්යේෂණ ප්‍රශ්න හරහා පර්යේෂණ ගැටළුව ආවරණය කළෙමි. පර්යේෂණයේදී අරමුණුසහගත නියැදියක් තෝරාගැනීම, දුරකථන සම්මුඛ සාකච්ඡා පැවැත්වීම, ආඛ්‍යාන විශ්ලේෂණය හරහා දත්ත විශ්ලේෂණය කිරීම, මූලික විධික්‍රමවේදයන් වේ. පර්යේෂණයට අදාළ න්‍යායාත්මක සාකච්ඡාවේදී; ස්ත්‍රීවාදී, කෘත්‍යවාදී න්‍යායාත්මක ප්‍රවේශයන් ඉවහල් කරගැනිණ. ප්‍රධාන පර්යේෂණ සොයාගැනීම් වශයෙන්, වියපත්භාවය; විශ්‍රාමික ශාස්ත්‍රාලික කාන්තාවන් මත ඇති කරන ගැටළු, අභියෝග කෙරෙහි ඔවුන්ට සිය උසස් අධ්‍යාපනය, වෘත්තීය පිටුවහලක් වී ඇත. පර්යේෂණයේ අවසන් නිගමනය වශයෙන්, ස්ත්‍රියගේ වියපත්භාවය හා වියපත්භාවය සමඟ ඇතිවන අභියෝග සඳහා සාර්ථකව මුහුණ පෑමට සිය උසස් අධ්‍යාපනය වැදගත් සාධකයක් වී ඇත. කෙසේනමුත්, කවර සමාජ, ආර්ථික තත්වයක් සහිත වුවද වියපත්භාවය; කාන්තාව මත ඇති කරන බලපෑම, අවධානම අධික වේ. එකී අවධානම අවම කරගැනීමට, ප්‍රථමයෙන් වියපත්භාවය සහ කාන්තාව පිළිබඳ නීති, අණපණත්, ප්‍රතිපත්ති යාවත්කාලීන විය යුතුව ඇත. ඒ සඳහා, ස්ත්‍රීන්ගේ විවිධත්වයට ආමන්ත්‍රණය කරන්නා වූ නව පර්යේෂණ, දැනුම් නිෂ්පාදනය වියයුතු බවට යෝජනා කරමි. ස්ත්‍රියටක වියපත්භාවයෙහි පවතින අවධානම අවම කරගනිමින්, අභියෝගතා ජයගැනීමට, ඇයගේ වියපත්භාවය පිළිබඳ සුභවාදී හෙටක් වෙනුවෙන් දායක කරගත හැකි, දැනුම නිෂ්පාදනය කිරීමක් වශයෙන් මෙම පර්යේෂණය සිදුකෙරිණි.

**මුඛ්‍ය පද : අභියෝග, වියපත්භාවය, විශ්‍රාමය, ශාස්ත්‍රාලික කාන්තාවන්, ශ්‍රම බලකාය**

**හැඳින්වීම**

ලෝකය පුරා වියපත් ස්ත්‍රී ජනගහනය විශාලනය වීම යන ගෝලීය කාරණාවෙහි දී, ශ්‍රී ලංකාව ද ඉදිරියෙන් සිටී (සිද්ධිසේන, 2004). වියපත් කාන්තා ජනගහනය විශාලනයවීමේ දී ඇතිවන සමාජ අසමතුලිතතාවයන්, අර්බුදයන් හා අභියෝගයන් පිළිබඳ අතිශයින් අවධානයට ගතයුතු කාලය එළඹී ඇත. විශේෂයෙන්ම දැනුම, උගත්කම, වෘත්තීය සහ ඉහළ සමාජ අනන්‍යතාවයක් සහිත කාන්තාවක් වීම තුළ ස්ත්‍රිය, සිය ශ්‍රම බලකායෙන් ඉවත්වීම සහ වියපත්භාව සංසිද්ධියට මුහුණපාන්නේ කෙසේද යන්න මෙම පර්යේෂණයේ ගැටලුවයි.

**අරමුණු**

ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ, වියපත් කාන්තා විශ්‍රාමික වෘත්තිකයන්ගේ ගැටලු හඳුනාගනිමින්, ශ්‍රී ලාංකේය සමාජයේ වියපත්භාවයට පත් කාන්තා ආචාර්යවරියන් උදෙසා යම් සුහසාධන වැඩපිළිවෙලක් ඇති කිරීම අරමුණුකොට ගනිමි.

**ක්‍රමවේදය**

සමස්ත පර්යේෂණ ක්‍රියාවලියේදී ප්‍රධාන විධික්‍රමය, දුරකථන සම්මුඛ සාකච්ඡා විය. දුරකථන සම්මුඛ සාකච්ඡාව මෙහෙයවා ගැනීමෙහිලා ව්‍යුහාත්මක නොවූ පොදු මාර්ග නිර්දේශයක් තාක්ෂණික ශිල්ප ක්‍රමයක් වශයෙන් භාවිත විය. පර්යේෂණයේදී සසම්භාවී නොවන, අරමුණු සහගත නියැදි ක්‍රමය සහ හිමබෝල නියැදීම ප්‍රධාන විය. අරමුණු සහගත නියැදීමකින් දුරකථන සම්මුඛ සාකච්ඡා 15 ක් සඳහා විශ්‍රාමික විශ්වවිද්‍යාල ආචාර්යවරියන් තෝරා ගැනිණ. ශ්‍රී ලංකා රජයේ ප්‍රධාන විශ්වවිද්‍යාල කිහිපයකින් විශ්‍රාම ගත් වයස අවුරුදු 65 වයස් කාණ්ඩයේ විශ්වවිද්‍යාල ආචාර්යවරියන් නියැදිගත කළෙමි. විශ්‍රාමික විශ්වවිද්‍යාල ආචාර්යවරියන් අයත් වූ විශ්වවිද්‍යාල පද්ධතිය, ප්‍රධාන පර්යේෂණ ක්ෂේත්‍රය විය. ගුණාත්මක තොරතුරු විශ්ලේෂණයේදී පුද්ගල ජීවන ඉතිහාසයන් සහිත ආඛ්‍යානයන් පෙළගැස්වීමට ආඛ්‍යාන විශ්ලේෂණ ක්‍රමය භාවිත විය. ආඛ්‍යාන විශ්ලේෂණයේ එන තේමා විශ්ලේෂණ මට්ටම තුළින්, ප්‍රධාන පර්යේෂණ ප්‍රශ්න තේමාවන්ට බණ්ඩනය කළෙමි.

**සාහිත්‍ය විමර්ශනය**

වියපත්භාවය, ශ්‍රම බලකායෙන් ඉවත්වීම; කාන්තාව මත ඇතිකරන බලපෑම පිළිබඳ සාර්ව මට්ටමින් කතිකාවට ලක් වූ ව්‍යුහවාදී පර්යාලෝකය තුළින් ගිඩ්න්ස් (1991) විසින් "Introduction to Sociology" ග්‍රන්ථයෙහි වියපත් ජනගහනය විශාලනය වීමේ විශ්වීය අභියෝගය පිළිබඳ "සමාජ හුදෙකලාව" යන සංකල්පයන් ආශ්‍රයෙන් සාකච්ඡා කරන්නේය. ගිඩ්න්ස් විසින් "Who suffers more? Women or Men?" එනම්, වියපත්භාවය සමඟ වැඩි වශයෙන් පීඩා විඳින්නේ පුරුෂයාද? ස්ත්‍රියද? යන පැනය යොමුකරමින්, පුරුෂයාට සාපේක්ෂව ස්ත්‍රිය වියපත්භාවය මත ඇතිකරන බලපෑම්වලට ලක්වීම පෙන්වා දේ (Giddens et al.1991). නමුත් ඔහු ඒ පිළිබඳ පර්යේෂණාත්මක අනාවරණයක් නොකිරීමෙන්, න්‍යායාත්මක සාකච්ඡාව තුළ යම් හිදැසකි.

කෘත්‍යවාදී න්‍යාය ප්‍රවර්ධනය කරමින්, ව්‍යුහාත්මක කෘත්‍යවාදී පර්යාලෝකයක් සහිත, Phillipson සහ Baars (2007) විසින් වයස්ගත පුද්ගලයන්ගේ සමාජ අනුවර්තනයන් වීම සහ වයස්ගතවීමේ පුද්ගල අත්දැකීම් කෙරෙහි වූ බලපාන සමාජ ව්‍යුහමය සාධක සහ එකී ව්‍යුහාත්මක සාධක මගහැර යාම, නොසළකා හැරීම යනු සමාජ පද්ධතියට සුවිශාල අර්බුද ඇතිකරන්න බවට ඔවුහු පෙන්වා දෙති (Phillipson සහ Baars, 2007 උපුටාගන්නේ Rowson, 2013 ගෙනි) . මේ න්‍යායාත්මක සාකච්ඡාවන් මෙම පර්යේෂණයේ දී පුද්ගල වයස්ගත වීම සහ අවධානම් සමාජ කණ්ඩායම් බවට පත්වීමක් ගම්‍ය කරවයි. නමුත් ස්ත්‍රිය සුවිශේෂීකොටගෙන නොමැති බැවින්, මෙම් පර්යේෂණය ඉන් වෙනස් වේ.

ස්ත්‍රීවාදී පර්යාලෝකයකින් J.Brooks Bouson විසින් "Shame and the Aging Woman" (2016) කෘතියෙහි, 21 ක් වන සියවසයට අයත් සමාජය තුළ ස්ත්‍රිය වයස්ගතවීමේදී යම් සමාජ අගතීන්ට පාත්‍රවන බවත්, විශාල සංස්කෘතික අවප්‍රමාණයකට ලක්වන බවත්, වියපත්භාවය සමඟ කාන්තාව මුහුණපාන අභියෝග කායික හා මානසික වශයෙන් අනාවරණය කර තිබේ.

**ප්‍රතිඵල සහ සාකච්ජාව**

**ශ්‍රම බලකායෙන් ඉවත්වීම සහ වියපත්භාවය, කාන්තාව මත ඇති කරනු ලබන බලපෑම්**

**සෞඛ්‍යමය අභියෝග**

සමාජ, පන්ති, තත්වයන්, තරාතිරමයන් මත පුද්ගලයන්ගේ සමාජ, ආර්ථික තත්වයන් වෙනස් වුවද, පන්ති, තරාතිරමකින් තොරව සමාජ, සංස්කෘතික, ආර්ථික හා සෞඛ්‍යමය අර්බුදයන් ඇතිවීම පොදු තත්වයකි. එහිදී විශ්‍රාමික විශ්වවිද්‍යාල කථිකාචාර්යවරියන්ගේ කායික, මානසික සෞඛ්‍ය ගැටළු අතර සිය දරුවන්ගේ විදේශගතවීම, විශේෂයෙන්ම මානසික සෞඛ්‍යමය ගැටලු තත්වයන්ට යම්කිසි ආකාරයකට බලපෑම්කාරී බවට පර්යේෂණාත්මක අනාවරණයක් පහත ප්‍රස්තාර අංක 01 අනුව ප්‍රත්‍යක්ෂ විය.

ප්‍රස්තාර අංක 01

දරුවන්ගේ විදේශගතවීම සහ මානසික සෞඛ්‍ය ගැටළු




මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර පර්යේෂණ අධ්‍යනය, 2020

නියැදිගත බහුතරයක් ප්‍රතිග්‍රාහකයින්ගේ මානසික තත්වයන් කෙරේ දරුවන්ගෙන් වෙන්වීම, සාම්ප්‍රදායික පවුලේ කෘත්‍ය වෙනස්වීම් ආදී ව්‍යුහාත්මක සාධක නිශේධනාත්මකව බලපෑම්කාරී ඇ වී ඇති බවට කල්පනය කළ හැක. ගිඩින්ස් (1991) පෙන්වා දෙන, පුරුෂයාට සාපේක්ෂව ස්ත්‍රිය වියපත්භාවය මත අභියෝගයට ලක්වීම, චිත්තවේගීමය හුදෙකලාව, සමීපතමයන් නොමැතිවීම, සමාජ හුදෙකලාවීම, සමාජ ජාලයක් නොමැතිවීම ආදී වයස්ගතවීම තුළ නොවැළක්විය හැකි විශ්වීය කාරණා පිළිබඳ න්‍යායාත්මක සාකච්ඡාව නැවත ප්‍රත්‍යක්ෂ කිරීමක් ලෙස ඉහත පර්යේෂණාත්මක ප්‍රතිඵලය ඉදිරිපත් කළ හැක.

නියැදිගත සමස්තයක්, සිය ආර්ථිකය පිළිබඳ තෘප්තිමත් නොවෙති. මේ සඳහා යැපුම් ආර්ථිකය, දරුවන්ගේ විවාහ, අධ්‍යාපන කටයුතු වෙනුවෙන් විශාල මූල්‍යමය වියදම් දැරීම, ස්වාධීන ආර්ථික සැලසුම්කරණයන් අවම වීම හා ආර්ථික කළමනාකරණයෙහි ඇති දුර්වලතා ආදී සමාජ, සංස්කෘතික හා ආර්ථික සාධක බලපා ඇත. තවදුරටත්, ස්ත්‍රිය සිය කලත්‍රයා, දරුවන්ගෙන්, පවුලෙන් සුරක්ෂණය ලබනවාට වඩා ඇය විසින් පවුල

සුරක්ෂණය කිරීමේ කාර්යයෙහි නිරතවෙති. ශ්‍රම බලකායෙන් ඉවත් වුවද, තවදුරටත් සිය පවුලේ කටයුතුවල නැවත නියැලීමෙන් වැටුප් රහිත සුරැකුම් ආර්ථිකයකට ඔවුන්ගේ භූමිකා පරිවර්තනය වී ඇත. එය Phillipson සහ Baars (2007) විසින් වයස්ගතවීමේ පුද්ගල අත්දැකීම් කෙරෙහි වූ බලපාන සමාජ ව්‍යුහමය සාධකයන් තුළින් පුද්ගලයාට සමාජ අර්බුද ඇති කරන බවට වූ න්‍යායාත්මක විග්‍රහයන්, ඉහත පර්යේෂණ ප්‍රතිඵලයන් හරහා නැවත සනාථ වීමකි.

**ආර්ථිකමය අභියෝග**

වියපත්වීමේ සංසිද්ධියත් සමඟ, ජ්‍යෙෂ්ට පුරවැසි කාණ්ඩයට අයත්වීම, ශ්‍රම බලකායෙන් ඉවත්වීම, සමඟ ඔවුන්ගේ යහජීවනය සඳහා වන අපේක්ෂාවන් කලකිරවනසුළු විය හැක. වියපත්වීම සමඟ මතුවන ගැටලු සහ ඉදිරි දැක්මේ ඌණතාවන්, වැඩ ජීවිතය අතරතුරදී පිළිවෙලක් නොමැති ආදායම් ලැබීම් හා වත්මන් අවශ්‍යතා සපුරාලීම සඳහා නිරන්තර පීඩනයට පත්වීම, දරුවන් මත බලාපොරොත්තු තබාගැනීම සහ සාම්ප්‍රදායික පවුල් ව්‍යුහයෙහි වෙනස් වීම මත වැඩිහිටියන්ගේ සමාජ, ආර්ථිකමය සුරක්ෂිතතාවය පිළිබඳ ප්‍රශ්න කිරීම් අභියෝගයන් ලෙස මතුව තිබෙනු ඇත (එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල, 2004). මේ පිළිබඳ ප්‍රධාන පර්යේෂණ දත්ත දායකයින්ගේ පහත ගුණාත්මක කාරණයන් තුළින් ගම්‍ය වන සාධක පවතී.

> ”retire වෙනකොට professor ට 60000 කටත් අඩු පඩියක් තිබුණේ. provident fund එක වියදම් උනා. මේ සංවිධානයටයි, මගේ අසනීපවලටයි යන වියදම වැඩියි. දැන් අයටනම් පෙන්ෂන් හොඳ නිසා අවුලක් නෑ. අපි හුගක් පරණ නිසා pension නැනේ. අපිට නම් රැකවරණයක් නෑ. ළමයිට උගන්නලා පිටරට යැව්වා. වැඩේ තියෙන්නේ එයාල හැමෝම පිටරටම marry කළා. දැන් ඉතින් එන්න, බලන්න වෙලාවක් නෑ”(දුරකථන සම්මුඛ සාකච්ඡා, එලීනා, අවුඃ 90).

> ”මං විශ්‍රාම යද්දී මුකුත් Plan කරල තිබ්බේ නෑ. මුදල් සංචිත නෑ, වැය කිරීම් පවත්වාගෙන යනවා විතරයි. මේ දැන් වෙනකොටවත් මම කිසිම ඉතිරි කිරීමක් පවත්වාගෙන යන් නෑ. මේ තියෙන සෞඛ්‍ය තත්ත්ව නිසා නැවත රැකියාවකට යන්නෙත් නෑ”(දුරකථන සම්මුඛ සාකච්ඡා, ධම්මිනී , අවුඃ 76).

> ”හිතට හරි නැති එක දෙයක් තියෙනවා. විශ්‍රාම වැටුපක් නෑ. provident fund එක ලක්ෂ 8 ක් හම්බුණා. gratuity ලක්ෂ 3ක් හම්බුණා. ඒත් කරපු සේවයට මදි. මේවා රජයේ, රටේ තත්ව අනුව වෙනස් වෙන්න ඕන. අසාධාරණයි. රුපියල් 50000 පඩියෙන් තමා retire උනේ. අපිට ඉතින් provident fund එක ලැබුණේ. Provident මෙබා එක විශ්‍රාම ගිය අවුරුද්දෙම ලැබුණා. Pension එකත් නැහැනේ. සල්ලි නැනේ. රස්සාවක් කරන් නැනේ. ඔය ඉඳලා හිටලා Exam වලට ගිහිල්ලා ඔය පොඩි ගාණක්, ඒවා ඉතින් ගෙදර වියදමට, පිංකම් කරනවා මිසක් ලොකු දෙයක් කරන්න මුදල් නැහැනේ. ඉතින් 1978 ඉඳලා මං සල්ලි එකතු කළා. මොකද මගේ 80 වෙනි ජන්ම දිනය එනකොට ලොකු සාංඝික දානයක් දෙන්න, පිරිතක් කියනවයි කියල ලෑස්ති කරගත්තා. එහෙම ඉන්නකොට මං ගිය අවුරුද්දේ බලවත් විදියට ලෙඩ උනානේ. නිව්මෝනියා තත්වෙකට එනකම්. ඒ පාර මට අර තිබ්බ්ච ශක්තිය හුගක් දුරට අඩුවෙලා ගියා ඒ පාර ඒකත් එහෙනම් කරන්න වෙන් නෑ කියල හිතා ගත්ත. එහම ඉන්නකොට ආපහු ලෙඩ උනා. hospital එකේ හිටියා. ගොඩාක් අමාරු උනා. දැන් ජ්ර එකත් නැතිව ඉන්නේ. මහත්තයාගේ වාහනේ ලැබුණා. driver කෙනෙක් අවුරුදු අටක් විතර තියාගෙන වාහනේ පාවිච්චි කළා. ඒත් දැන් නඩත්තු කිරීමේ ගැටලු නිසා ඒකත් අයින් කළා”(දුරකථන සම්මුඛ සාකච්ඡා, ඉන්ද්‍රා, අවුඃ 80).

ඒ අනුව, ඉහත ප්‍රතිග්‍රාහක ප්‍රතිචාරයන්ගෙන් පිළිඹිබු වන්නේ ද ශරීර සෞඛ්‍යමය තත්වයන් පිරිහීම, එදිනෙදා ජීවන බර අධික වීම ආදී තත්වයන් තුළදී, විශ්‍රාමික ශාස්ත්‍රාලික කාන්තාවන් සිය ශ්‍රම බලකායෙන් ඉවත්වීම තුළ, වියපත් සංසිද්ධියට මුහුණ පාන්නා වූ ජ්‍යෝෂ්ඨ පුරවැසියකු වීම තුළ හා, විශේෂයෙන්ම කාන්තාවක් වීම තුළ ආර්ථිකමය අර්බුදකාරීත්වයන්ට සිය විශ්‍රාමික ජීවිතයේදී මුහුණ පාන්නට වී ඇති බවයි. එය එතරම් සාධනීය ලක්ෂණයක් නොවනු ඇති බව අවධාරණය කරමි.

ප්‍රස්තාර අංක 02 - සෞඛ්‍ය අර්බුද මත නැවත ප්‍රතිආර්ථික ක්‍රියාවලන්ට දායක නොවීම




මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර පර්යේෂණ අධ්‍යනය, 2020

ප්‍රස්තාර අංක 02 න් දක්වා පරිදි, තම ආර්ථික තත්වය පිළිබඳ සෑහීමකට පත් නොවන ප්‍රතිග්‍රාහකයන්ගෙන් 73% ක ප්‍රමාණයක් විවිධ වූ කායික හා මානසික රෝගවලින් පෙළේ. ඒ අනුව, මෙම පරීක්ෂණය නිගමනය කරනු ලබන්නේ යම් ප්‍රතිග්‍රාහයෙක් ඔහුගේ ආර්ථිකය පිළිබඳ සෑහීමකට පත් නොවුනද, නැවතත්, සක්‍රීයව ආදායම් ඉපයීමේ ක්‍රියාවලියට සහභාගී නොවන්නේ ඔවුන්ගේ පවතින විවිධ වූ මානසික හා කායික රෝග නිසා විය හැකි බවයි.

ඉහත නිගමනයට අමතරව, විශේෂයෙන්ම, වයස්ගත දෙමාපියකු විශ්‍රාම වැටුපක් ලබන අවස්ථාවක ඔහු හෝ ඇය ඉන් කොටසක් පරම්පරා දෙකක් හෝ තුනක් සහිත ගෘහ කුටුම්භයක වියදම් සඳහා යොදා ගැනීමට ඉඩ තිබේ (එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල, 2004). මෙකී කාරණයේ සත්‍ය අසත්‍යතාවය පිළිබඳ, නියැදි ප්‍රතිග්‍රාහක ප්‍රතිචාරයන් ඔස්සේ විමසා බැලිය හැක.

> ”university අයගේ ළමයිට කොහොමත් උගන්නනවා, ඉගෙන ගන්නවානේ. එයාල ගොඩක් අය පිටරට යවනවා ඉගෙන ගන්න. මගෙ ළමයි දෙන්න නම් මෙහෙ තාම ඉගෙන ගන්නවා. ලොකු පුතා පිටරට යන්න ඉන්නේ. පොඩි පුතා නම් අපි ළඟ ඉඳී. අනාගත සැලසුම් නෑ. අවිනිශ්චිතයිනේ. ළමයිගෙ උදව් තියෙයි කියල බලාපොරොත්තුවෙන් ඉන්නේ”(දුරකථන සම්මුඛ සාකච්ඡා, අනෝමානී, අවුඃ 70).

> ”මගේ එක දැන් දුවක් විවාහ කරල දීල දැන් ඔස්ට්‍රේලියාවෙ ඉන්නේ. පුතා ඇමෙරිකාවල. ළමයි බලන්නත් ගියා. දැන් යන්න බෑ. මේ තියෙන සෞඛ්‍ය තත්ත්ව නිසා යන්නෙත් නෑ. parental migration වලට උනත් පිටරට නම් යන් නෑ. දරුවන්ගෙන් ඉල්ලනෙත් නෑ”(දුරකථන සම්මුඛ සාකච්ඡා, ගුණවතී, අවුඃ 80).

> "මහත්තයාගේ Pension එක තියෙනවා, ගුරු පඩිය. පොඩි පොඩි අඩුපාඩුකම් තියෙනවා. ළමයින්ගේත් උදව් ගන්නවා. විශ්‍රාම ගියාට පස්සේ යමක් කරන්න, මුණ දෙන්න දැන් ඒ තිබුණු පන්නරය නෑ වගේ"(දුරකථන සම්මුඛ සාකච්ඡා, අනෝමානී, අවුඃ 70).

ඉහත ප්‍රකාශයන් හරහා ගම්‍ය වන තවත් එක් සුවිශේෂී කාරණයක් වේ. එනම්, ශ්‍රී ලාංකේය සමාජ ප්‍රස්තුතය තුළ පවතිනා ඇතැම් සමාජ, සංස්කෘතික සංදර්භයන් තුළ තත්ව, කාර්යය, භූමිකා සහ යුතුකම් වගකීම් වශයෙන් පවත්නා මා පිය දූ දරු සබඳතා මත පදනම් ආර්ථික කළමනාකරණයන් ඇති බව පොදු තත්වයකි.

ඒ පිළිබඳ පහත ප්‍රකාශනයන්ගෙන් ගම්‍ය වේ. එහිදී එක් එක් ප්‍රතිචාරයන් සමඟ අනාවරණය වූ පොදු කාරණා වන්නේ, දෙමාපියන් විසින් සිය දරුවන් වෙත උසස් අධ්‍යාපනයන් ලාබදීමේ, අවාහ විවාහ කරදීමේ උන්නදුන් සහිත බවයි. මේ තත්වය ඉතා සාමන්‍ය තත්වයක් බව ඇතැමෙකුට පෙනී යා හැක. නමුත් මෙහිදී විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්, තමා ආර්ථික සමාජමය තත්වයන්ගේ සිට ඉහළට සිය දරුවන්ගේ අනාගතය සැලසුම් කිරීමේ, ස්ථාවර කිරීමේ උනන්දුන් මත සිය ආර්ථික කළමනාකරණයන් සිදුකර ඇත.

> "university අයගේ ළමයිට කොහොමත් උගන්නනවා, ඉගෙන ගන්නවානේ ...එයාල ගොඩක් අය පිටරට යවනවා ඉගෙන ගන්න" (දුරකථන සම්මුඛ සාකච්ඡා, අනෝමානී, අවුඃ 70).

අනෝමානී මහත්මිය සඳහන් කරනා එම වාක්‍ය ඛණ්ඩය තුළින්, ගම්‍ය වන්නේද බොහෝදුරට ශ්‍රී ලාංකේය පොදු සමාජ සංදර්භය තුළ මා පියන් තමා ලද සමාජ, ආර්ථික තත්වයන්ටත් ඔබ්බට ගිය දරුවන්ගේ සුභවාදී අනාගතය සඳහා කටයුතු කරන ආකාරයකි.

එවැනි මා පිය භූමිකාවන් සිදුකරන පිරිසක් නියැදිගත ප්‍රතිග්‍රාහකයන් අතරද නියෝජනය වූ බව ඉහත ප්‍රකාශයන් අතුරින් ගම්‍ය විය. එහිදී මෙකී සමාජ ආර්ථික වශයෙන් දීර්ඝකාලීනව දරුවන් රැක බලාගැනීමේ යැපුම් ආර්ථික තත්වයන් ශ්‍රී ලාංකේය සමාජයන් තුළ සුලභ කාරණයකි. නියැදිගත ඇතැම් විශ්‍රාමික විශ්වවිද්‍යාල කථිකාචාර්යවරියන්ගේ දෙමාපිය භූමිකාව තුළ, තමා විශ්‍රාම ලබන විටද, සිය දරුවන්ගේ උසස් අධ්‍යාපනය, විදේශගත වීම් හා අවාහ විවාහ කටයුතු සඳහා සිය අර්ථ සාධක දීමනා ලාබදෙමින් සිය ආර්ථික කටයුතු සිදුකර ඇත. පවුල හා ඥාතීත්වය පදනම් කරගත් පරම්පරාවන් අතර හා පරම්පරාවන් තුළ පවත්නා අනෝන්‍ය උදව් උපකාර වර්තමාන ශ්‍රී ලංකාව තුළ වයස්ගත ජනගහනයට රැකවරණය සැපයීම සම්බන්ධ ගැටලුකාරීත්වයක් ඉස්මතු වේ (එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල, 2004) යන්න පිළිබඳ පර්යේෂණ දත්ත හරහා ද පැහැදිලි වේ.

ඒ අනුව, දරුවන් දෙමාපියන් මත සේම, දෙමාපියන් දරුවන් මත අධි අපේක්ෂා තබාගැනීම මත, යැපුම් සමාජ, ආර්ථික කණ්ඩායම් නිර්මාණය වීම හේතුකොටගෙන සිය විශ්‍රාම දිවිය, මහලු විය, අනාගතය අවිනිශ්චිත වූ, අර්බුදකාරීත්වයට පත් වූ කාරණා පර්යේෂණය තුළින් ගම්‍ය වේ. මෙකී මූල්‍යමය හා ආර්ථිකමය අස්ථාවරත්වයන්ට මූලික වන්නා වූ ප්‍රධාන සමාජ, සංස්කෘතික හා ආර්ථික කාරණා වේ. ඒ අතර, ඇතැමුන් තමා ආර්ථිකමය වශයෙන් ශක්තිමත් බවට තහවුරු කරන සාධකය වන්නේ සිය කලත්‍රයාගේ, දරුවන්ගේ හෝ ඥාතීන්ගේ ආර්ථික සහයෝගිතා ක්‍රියාකාරකම් තුළින් බවටද ගම්‍ය වන අවස්ථා වේ.

එබැවින් එකී සමාජ, ආර්ථික, භූමිකා මත තවදුරටත් තමා වෙනුවෙන්, සිය වියපත්භාවය වෙනුවෙන් ආර්ථිකමය සැලසුමක් හෝ, ආර්ථික සුරක්ෂිත තාවයන් පවත්වා ගැනීම අරභයා කිසිඳු ආර්ථික කළමනාකරණයක් නොකරන විශ්‍රාමික කාන්තා ආචාර්යවරියන් නියැදි නියෝජනය වේ. එකී තත්වයන්මත ද, ප්‍රතිග්‍රාහකයින් අතරින් බහුතරය සිය විශ්‍රාමික ජීවිතයේ ආර්ථිකමය වශයෙන් අස්ථාවර වීම් පිළිඹිබු කරති.

**විශ්‍රාම ජීවිතය සහ කාල කළමනාකරණය**

ප්‍රස්තාර අංක 03 විශ්‍රාමයෙන් පසු ශාස්ත්‍රීය කටයුතුවල ක්‍රියාකාරී වීම.




මුලාශ්‍රයඃ ක්ෂේත්‍ර පර්යේෂණ අධ්‍යනය, 2020

බොහෝ ශාස්ත්‍රාලීන් විශ්‍රාමයෙන් පසුවද, ශාස්ත්‍රීය කටයුතුවල ක්‍රියාකාරී වනු ඇත (Rowson, 2013). ඒ අනුව, පර්යේෂණයට අදාළ ප්‍රතිග්‍රාහකයිගෙන් බහුතරයක් නැවත ශාස්ත්‍රීය කටයුතුවලට ප්‍රවේශ වෙමින් සිය කාල කළමනාකරණයන් සිදුකරගෙන ඇති බවට ඉහත (ප්‍රස්තාර අංක 03) දැක්වේ. විශ්‍රාමික ජීවිතයෙන් පසු 50% කට ආසන්නව, සැළකිය යුතු ප්‍රමාණයක් සිය විශ්‍රාමික ජීවිතයෙන් පසු අවධියේදී ශාස්ත්‍රීය කටයුතු සඳහා දායක වෙමින් සිය එදිනෙදා ජීවිතය සමබරතාවය පවත්වාගෙන ඇත. එහිදී ඔවුහු ආර්ථික ලාභ අපේක්ෂාවෙන් ඔබ්බට යම්කිසි මානසික තෘප්තියක් සඳහා සිය විශ්‍රාම ජීවිතය හැඩ ගස්වා ගැනීමේ සාධනීය කාරණා අනාවරණය විය.

> ”Campus යද්දී ලොකු මානසික තෘප්තියක් තිබුණා. මානසික සුවය; මං ඒක බලාපොරොත්තුවෙන් හිටියා. වැඩ කරන කාලේ තිබුණ ලොකු බරින් දැන් අපි නිදහස්. දැනටත් PHD ළමයින්ගේ දේවල්වලට සම්බන්ධ වෙනවා. මම සමාජ වැඩ කටයුතු කරනවා, Counseling කරනවා. ජීවත් වෙන විදිය අනිත් අයට කියා දෙන්න මගේ අත්දැකීම් බෙදාගන්නවා. ඒක මට ලොකු තෘප්තියක්”(දුරකථන සම්මුඛ සාකච්ඡා, වර්ණා, අවුඃ 65).

> ”ශිෂ්‍යයන් හමුවේ රැඳීමේ නිරතුරු ආශාව තවමත් තිබෙනවා. වෙනස්වීම් වලින් මේ ගමන කඩා බිඳ වැටෙන්නේ නැතිව ගලාගෙන යනවා. ජීවිතේ තෘප්තිමත්ව ගෙවන්න තමා සැලසුම් කරන්නේ. ශිෂ්‍යන් ඇසුරේ කල්ගත කරන්න ලැබෙන එක තමා ලොකුම තෘප්තිය. අදටත් කොළඹ විශ්වවිද්‍යාලයේ අලුත් ශිෂ්‍යාවන්ට මුල්ම දේශනය කරන්න, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ හඳුන්වාදීමේ දේශනය කරන්න, පාසල්වල නිරතුරු කලා උළෙල, සාහිත්‍ය උළෙල, කාන්තා දිනය, උත්සව වලට මං සහභාගී වෙනවා. උදේ අටට නොවුනට, ජීවිතය සංවිධානාත්මකව ගලා යනවා”(දුරකථන සම්මුඛ සාකච්ඡා, කුසුම්, අවුඃ 70).

> ”විශ්‍රාම ගන්න දවස් වෙද්දී මගේ අසම්පූර්ණ වැඩ කරන්න ගොඩක් කාර්යය බහුල උනා. අන්තිම මොහොත වෙනකම් කරන්න තිබුණා. retired කියල වෙනසක් නෑ. academic වැඩ කරනවා. විශ්‍රාම ගත්තට පස්සෙ project meetings වලට යනවා world bank එකත් එක්ක කරන research වලට දැනට විවෘත විශ්වවිද්‍යාලයේ, ජාතික අධ්‍යාපන ආයතනයේ (NIE) එකේ, කොළඹ අධ්‍යාපන පීඨයේ, Faculty of Graduate Studies එකේ වැඩ කරනවා. කරන වැඩ

ගැන තෘප්තියක් තියෙනවා. මම වැඩ කරන විදිය, පෞරුෂයේ බලපෑම, හිතින් ගතින් ශක්තිමත්ව, සැලසුම් කරන දේ හරියට කරනවා. තව ටික කාලයයි වැඩ එනව ඇත්තේ. බලාපොරොත්තුව නිදහසේ දරුවන්ට උදව් කරගෙන ඉන්න(දුරකථන සම්මුඛ සාකච්ඡා, ලේඛම්, අවුː 75).

ඉහත ප්‍රකාශයන් හරහා නැවත ශ්‍රම බලකායට එක් නොවීම තුළ ඔවුන්ගේ සමාජ, ආර්ථික ක්‍රියාකාරීත්වය ශූන්‍ය වන බවටද තර්ක කළ නොහැක. මන්ද රැකියා සඳහා යොමු නොවුවද, නියැදියෙන් අඩක් වූ පිරිසක් ශාස්ත්‍රීය කටයුතු සඳහා යෙදීමෙන් සහ ශාස්ත්‍රීය කටයුතුවල නොයෙදෙන සෙසු පිරිස්ද ක්‍රමානුකූලව සිය ජීවිත විශ්‍රාමයට හැඩගස්වා ගෙන ඇති බවක් ඉහත ප්‍රතිග්‍රාහක අදහස් තුළින් ගම්‍යමාන වේ. විශේෂයෙන්ම, කෘත්‍යවාදී පර්යාලෝකය දෙසට යොමු වුවහොත්, වයෝවෘද්ධ විද්‍යාඥයින්ගේ (Gerontologist) අවධානම යොමු වූ මෙම "ක්‍රියාකාරීත්ව සහ විසර්ජන න්‍යායන්හි" ඇති ප්‍රායෝගික සත්‍යතාවයන් පිළිබඳ, පර්යේෂණාත්මකව සනාථ වීමක් ලෙස මෙය සැළකිය හැකිය.

එනම්, ඔවුන් නැවත රැකියා සඳහා, ආර්ථික කටයුතුවල ක්‍රියාකාරී නොවීම හේතුකොටගෙන, ඔවුන්ගේ සමාජ දායකත්වය, සේවා පළපුරුද්ද, විශේෂඥ දැනුමේ විවිධත්වයන් සමාජයට අහිමි වී ගොස් ඇතිද? ඔවුන් සමාජයට ඵලදායී නොවන වයෝවෘද්ධ කාණ්ඩයන් බවට ඇතැමෙකුට පූර්ව විනිශ්චයන් හෝ දුර්මතයන් දැක්විය හැකිය. නමුත්, මෙම පර්යේෂණය ඔස්සේ ඔවුහු කිසිඳු ලාභ ප්‍රයෝජනයකින් තොර, සමාජයට නිහඬ සේවයක් කරමින්, ශාස්ත්‍රීය කටයුතුවල නියැලෙමින්, තමාටත්, සමාජයටත් ඵලදායී ආකාරයෙන්, සමාජයේ තවත් එක් යැපුම් කාණ්ඩයක් වී, රටට බරක් නොවීමට සිය අධ්‍යාපනය, වෘත්තීය ඉවහල් කරගනිමින් විශ්‍රාමික ජීවිතය සංවිධානය කරගෙන ඇති බවට දත්ත අනාවරණය විය.

කෘත්‍යවාදී න්‍යායාත්මක සාකච්ඡාවට අනුව, පුද්ගලයන් වයස්ගතවනවිට සමාජ භූමිකාවන් වෙනස්වන අතර, වැඩිහිටියන් විසින් ඉටුකරන භූමිකාවන් සමාජයට යම් කෘත්‍යයක් සිදුකරන බවට (පාසන්ස්, 1960 උපුටාගන්නේ Giddens et al.1991) වූ ප්‍රකාශය, ඉහත විශ්‍රාමික, වියපත්භාවීය සංසිද්ධියට මුහුණපාන, ජ්‍යේෂ්ඨ පුරවැසි කාන්තා ආචාර්යවරියන් විසින් සිය පශ්චාත් විශ්‍රාමික ජීවිත සංවිධානය කරගැනීම්, තවදුරටත් ශාස්ත්‍රීය කටයුතුවල නිමග්න වීමෙන්, ග්‍රන්ථ රචනයෙන් සමාජයට සිදුකරනා කෘත්‍ය හරහා පැහැදිලි වේ. ග්‍රන්ථ රචනය, විෂය නිර්දේශ සැකසීම, උපාධි නිබන්ධන අධීක්ෂණ ආදී ශාස්ත්‍රීය කටයුතු තුළින් සමාජයට නැවත සිය මෙහෙවර, සේවය ලබාදීමක් සිදුකිරීම ප්‍රකට කෘත්‍යයක් ලෙසත්, එකී සමාජ දායකත්වය හරහා සමාජයට නැවත දැනුම නිෂ්පාදන කර්තව්‍යයේ යෙදීමත්, සහ සමාජයට බරක් නොවෙමින් සිය ජීවිත, කාලය තමන් විසින්ම කළමනාකරණය කරගැනීමත් නිලීන කෘත්‍යයන් ලෙසත් ගම්‍ය වේ. ඒ අනුව, Powell (2001) වැනි කෘත්‍යවාදීන් තර්ක කරනා පරිදි, ඔවුහු සමාජයේ ඵලදායී නොවන සමාජිකයන් ය' යන දුර්මතයට නිසි පිළිතුරක් හමුවූ අවස්ථාවක් ලෙස, පර්යේෂණයට අදාළව සිදුවූ දත්ත අනාවරණය වැදගත්කොට සළකමි (Powell, 2001 උපුටාගන්නේ Giddens et al.1991).

එසේනම්, ශාස්ත්‍රීය කටයුතු සඳහා සම්බන්ධ නොවූ පාර්ශවයන් සිය ජීවිතය, කාල කළමනාකරණය සිදුකරගෙන ඇත්තේ කෙසේද? සැබවින්ම ඔවුහු බහුතරයක් විශ්‍රාම ජීවිතයෙහි විවේකය ගත කිරීමට ඵලදායී විනෝදාංශයන් තෝරාගෙන ඇත. ඇතැමුන් ආගමික වශයෙන් ඔවුන්ගේ විශ්‍රාම කාල කළමනාකරණය කරගෙන ඇත. ආගමික වතාවත්හි නිරතවීම තුළින් යම් තෘප්තියක්, ආධ්‍යාත්මික විශ්වාස පද්ධතීන් ඇගයීමක්, ස්වභාව ධර්මයට අනුගත වීමක්, මල්, බෝග වගා කිරීම් හා ව්‍යායාම කටයුතු සමඟ නිරෝගී දිවිපෙවෙතක් ගත කිරීමේ අභිප්‍රායයක් ඇත. ශාස්ත්‍රීය කටයුතුවලින් ඉවත් වූ ප්‍රතිග්‍රාහකයින් අතර බහුතරයක් මල් වැවීම, ගෙවතු වගා, මැහුම් ගෙතුම්, පොත් කියවීම, යනාදී සිදුකර ඇත.

**ආගම හා අභිචාර කටයුතුවල නිරතවීම**

"විශ්‍රාම ගැනීමෙන් පසු කඳුළු හෙළුවේ නෑ. විශ්වවිද්‍යාලයටත් සම්බන්ධ වෙලා පොත් 15 ක් විතර ලීවා. 2018-2019 කාලයේ ශාස්ත්‍රීය, ආගමික වශයෙන් ලිපි ලීවා. භික්ෂු විද්‍යාලයට තවමත් සේවය කරනවා. ප්‍රතිලාභයකුත් බලාපොරොත්තු වෙන් නෑ. බලාපොරොත්තු වෙන්නේ ආධ්‍යාත්මික වශයෙන් ලබාගත යුතු දෑ වෙනුවෙන් . විශ්‍රාම ගිය අවුරුද්දෙම බුදුගෙය හොඳට හදලා අටවිසි බුද්ධ පූජා, කඨින පිංකම් කළා. අර්ථ සාධක මුදල්, පොත්වලින් ලැබෙන මුදල්වලින් ආරණ්‍ය සේනාසන, බෝධි රෝපණ වගේ ආගමික මුලපුරන දේවල් කළා. ධර්ම දානයට පොත් මුද්‍රණය කරවන්න මගේ පෞද්ගලික ධනය යෙදෙව්වා. මට ධර්ම ග්‍රන්ථ ලියන්න ආරාධනා පවා ආවා. ඉතිහාසයට වෙනස්ම විෂය පරාසයකින් මන් ලියන්න ගත්තා. මම දුෂ්කර පළාත්වල ආගමික වශයෙන් නිහඬ සේවයක් කරන්නේ. දඹදිව වන්දනා, පිළිකා සරණ සංගමයේ අනුශාෂක විදියට අනන්ත අප්‍රමාණ පිංකම් කරනවා. මහ මුදලක් නැතත්, කණකර විකුණලා සල්ලි අරන් පිං කරනවා"(දුරකථන සම්මුඛ සාකච්ඡා, ඉන්ද්‍රා, අවුː 80).

"හොයා හොයා පන්සල් ගානේ යන් නෑ. උදේ හවස බුදුන් වඳිනවා. අවුරුදු පතා දාන දෙනවා. මහලු නිවාසවලට, නෑදැයන්ට, ළමයිට, අසනීප අයට බෙහෙත් අරන් දීල උදව් කරනවා"(දුරකථන සම්මුඛ සාකච්ඡා, අනෝමානී, අවුː 70).

"මම බණ සිල් හැමවිටම ගන් නෑ. බණ තෝරලා අහනවා. පන්සලට ගිහින් බෝධිය යට ඉන්න ආසයි. බෝධිය දිහා බලාගෙන ඉන්න හරිම ආසයි. මාසෙකට දානේ දෙනවා. මේ දවස්වල යන්න විදියක් නෑ කොරෝනා නිසා. ස්වභාවධර්මයට කිට්ටු කෙනෙක්ට තනිකමක්, දුකක් දැනෙන්නේ නෑ"(දුරකථන සම්මුඛ සාකච්ඡා, නාලනිකා, අවුː 80).

මෙහිදී ආගමික අභිචාර විධි හා විශ්වාස මත, ආගමික, සංස්කෘතික කටයුතුවල නියැළීමෙන් සිය දෛනික ජීවිත කළමනාකරණය කරගැනීමෙහිලා ඔවුහු කෙතරම් සාධනීය මට්ටමක සිටිනවා යන්න ඉහත ප්‍රතිග්‍රාහක ආඛ්‍යානයන් ඔස්සේ පිළිබිඹු විය. ඒ අනුව, කෘත්‍යවාදී පර්යාලෝකයකින්, මෙකී කාරණය දෙස දෘෂ්ටිගත වුවහොත්, සැබවින්ම එකී ආගමික, අභිචාරයන් යම් කෘත්‍යාත්මක කාර්යයක් සිදුකර ඇත. ඒ අනුව, ඔවුන්ගේ විශ්‍රාමික ජීවිතය සංවිධානය කරගැනීම සඳහා ප්‍රකට කෘත්‍යයක් සිදුකිරීමට ආගමික, අභිචාර්යන් ප්‍රමුඛ වී ඇති බව ගම්‍ය වේ.

**විවේකය හා විනෝදාංශ ක්‍රියාකාරකම්**

"විශ්‍රාම ගැනීම මට ප්‍රශ්නයක් උනේ නෑ. විශ්‍රාම ගන්න කලින් අපි ශාස්ත්‍රීය කටයුතුවල, මොනවගේ හරි යෙදිලා හිටියේ.අපි මොනවා හරි කරන්න ඕන. මම විශ්‍රාම වෙනකොට මහත්තයාත් විශ්‍රාම අරන්. මම කෘෂිකර්මාන්තය කරපු කෙනෙක්. ඉතින් මම විනෝදයට මල් වවනවා. පොත් කියවනවා. කුරුල්ලන්ට කන්න දීලා අහස දිහා බලාන ඉන්න මං හරි කැමතියි. මගේ වෘත්තියත් එක්ක මං පරිසරයට සංවේදී"(දුරකථන සම්මුඛ සාකච්ඡා, නාලනිකා, අවුː 80).

"විශ්‍රාම ගත්තාම මුලින් හිතුණේම මෙච්චර ගොඩක් වැඩ කරලා කොහොමද නතර කරන්නේ කියල. ඒත් අක්කාගේ ළමයි, මුණුපුරන් එක්ක ඉද්දි ඒකාකාරී බව අඩුවුණා. මගෙත් එක්ක ගොඩක් යාළුවොත් retire උනනිසා යාලුවෝ ආශ්‍රය වැඩි වුණා. මහත්තයත් retire නිසා දෙන්නම ගෙදර නිසා balance කරගන්න පුළුවන්. ශාස්ත්‍රීය ජීවිතය කාර්යය බහුලයි. ගෙදර අයත් එක්ක ඉන්න ගමන් දෙකම balance කරන්න ඕන. retire වෙන්න කලින් pressure තිබුණා. retire උනාට පස්සේ මහත්තයත් එක්ක ව්‍යායාම කරනවා. යාළු මිත්‍රයෝ එකතු වෙලා විනෝද චාරිකා යනවා, පිංකම් කරනවා"(දුරකථන සම්මුඛ සාකච්ඡා, අනෝමානී, අවුː 70).

"විශ්‍රාම ගන්න කලින් අවුරුද්දට දෙක තුනක් එරසව ගියේ. දැන් යාලුවෝ එක්ක ගොඩක් trip get together යනවා. අදහස් අතින් ගැළපෙන යාලුවෝ ටිකක් ඉන්නවා. එයාල එක්ක එකතුවෙලා විශ්වවිද්‍යාල, පාසල්වලට ශිෂ්‍යත්ව දෙනවා. 63 නේ Pera batch එකෙන් කරන, උත්සව, සල්ලි දීමනාවලට, trip වලට, පැදුරට සහභාගී වෙනවා. මගෙම යාලුවෝ සමහර අය දිහා බලනකොට, සමාජයේ ඉහළ අතුවලට නගින්න, ඇඳුම් විලාසිතා කරන්න තියෙන උනන්දුව මට නෑ. ඉතින් මගේ ජීවිතේ තෘප්තිමත්ව ගත වෙනවා"(දුරකථන සම්මුඛ සාකච්ඡා, ගයානි, අවු: 73).

ඉහත ප්‍රකාශයන් තුළින්, ශ්‍රම බලාකයෙන් ඉවත්වීම, ජ්‍යේෂ්ඨ පුරවැසි කාණ්ඩයට අයත්වීම හෝ කාන්තාවක් වීම තුළ ඔවුන් සිය සමාජ ආර්ථික තත්වය, අධ්‍යාපනය මත පදනම්ව යම්කිසි ජීවිත සැලසුම්කරණයකට යොමු වී ඇත. ඇතැමුන් නැවත රැකියාවන් සඳහා යොමුවෙමින් නැවතත් ක්ෂේත්‍රයෙහි ශාස්ත්‍රීය කටයුතු, පරිපාලනමය කටයුතු සිදුකරමින් සිය දෛනික ජීවිතය සංවිධානය කරගෙන ඇතිසේම, ඇතැමුන් ලාභ ප්‍රතිලාභ ආපේක්ෂාවන්ගෙන් තොරව, ශාස්ත්‍රීය කටයුතුවලත්, සමාජ සේවා කටයුතු වලත් නිරත වෙමින් එදිනෙදා ජිවතය ගත කරන්නට වෙති. ඇතැමුන් ආගමික කටයුතු සිදුකරගනිමින්, විවේක කාලය ඵලදායීව ගතකරමින් සිය විශ්‍රාමික ජීවිතය සංවිධානය කරගෙන ඇති බවට ඉහත ප්‍රතිග්‍රාහක ප්‍රකාශයන්ගෙන් සනාථ වේ.

පවුලේ ඉල්ලුම සහ පවුලේ ප්‍රධාන කටයුතු තුළ නැවත අනුග්‍රහය දැක්වීමේ, භූමිකා පරිවර්තනය වීමේදී සිය දරු මුණුපුරන් රැකබලාගැනීමේ වැටුප් රහිත සුරැකුම් ආර්ථිකයකට ඔවුහු සිය විශ්‍රාමික ජීවිතයේ දෛනික කාල සටහනෙන් වෙන්කොට ඇත. ඒ අනුව, නැවතත් පැහැදිලි වන කාරණය වන්නේ, දුරකථන සාකච්ඡා පවත්වමින් වුවද, ලද ගුණාත්මක දත්තයන්හි සියුම් නිරීක්ෂණයන් පාදක කොටගනිමින් නියැදිගත ප්‍රතිග්‍රාහකයන්ගේ විශ්‍රාමික ජීවිතයෙහි ඇති කාල කළමනාකරණය කරගැනීම්, සංවිධානය කරගැනීම, වැඩ පරිසරයෙන් වෙනස් වූ නව තත්ව, කාර්යය හා භූමිකාහි පරිවර්තනයවීම් ආදී සමාජ, ආර්ථික ගම්‍යවීම් පිළිබඳ පුළුල් අදහසක් ලබා ගත හැකි බවයි.

**උසස් අධ්‍යාපනය, වෘත්තීය මත පදනම් වූ විශ්‍රාම දිවියෙහි ඇති තෘප්තිමත්භාවය**

ප්‍රධාන දත්ත දායකයින් සිය විශ්‍රාම ජීවිතය සංවිධානය කරගනු ලබන්නේ හෝ යම් තෘප්තිමත්භාවයක් ලබන්නේ, හුදෙක් පෞද්ගලික අංශයේ හෝ රැකියාවක නියුතු වීමෙන්ම පමණක් නොව. ඔවුහු සිය දැනුම්, කුසලතා, අත්දැකීම, පුහුණුව මත ලද අධ්‍යාපනය සහ වෘත්තිය; විශ්‍රාමයට පූර්වයේ වැඩ පරිසරය තුළ සේම, විශ්‍රාමයෙන් පසු ජීවිතයට ද ප්‍රතිලාභ ළඟා කරගැනීමට භාවිතා කරගෙන ඇති බවක් පහත ප්‍රතිග්‍රාහක ප්‍රකාශයන්ගෙන් ගම්‍ය වේ.

"ඇමෙරිකාවේ ඉඳලා PHD එක අරන් ලොකු පරාසයක ඉගෙනුමක් ලැබුවා Agriculture ගැන. එහෙ ඉඳලා මෙහෙ එනවිට වැඩ කරන්න පුරුදු උනේ ඒ experience එකෙන්. විශ්‍රාම යනකොට අපි මොනව හරි කරන්න ඕන. මමයි, මහත්තයයි තීරණය කළා මගේ ගම රත්නපුරෙන් තේ, කුරුඳු ඉඩම් වගා කරවන්න. අපි දෙන්නම plantaion ගැන දැනුමක් තියෙන දෙන්නෙක්. අපි එහෙ පොඩි ගෙයකුත් ගත්තා. සිරිපාද කඳුවැටිය දිහා බලන් ඉඳලා සතුටින් ඉන්නවා. නැවත ගමට යාමට ලැබීම වාසනාවක්. ගමේ මිනිසුන්ගේ සැළකීම හරි වටිනවා. අපිට ආර්ථික දුෂ්කරතා නෑ. මොනවාගේ හරි යෙදිලා හිටියේ. වෙනත් ආදායම් විදියට මේ ඉඩම් වගා කටයුතු කරනවා. සතුටක් විදියට..තේ, කුරුඳු කියන්නේ රටටත් ආදායමක්. Envioronment එකටත් හොඳ දෙයක්. අපි නිසා ගමේ තවත් මිනිස්සුන්ට රැකියා ලැබිල තියෙනවා. ඒකම කොච්චර සතුටක්ද? මගේ ජීවිතේ හැරිලා බලනකොට ගඩොල් ගොඩක්, යකඩ ගොඩක් කරපු එක ගැන මට ලොකු සතුටක් දැනෙනවා"(දුරකථන සම්මුඛ සාකච්ඡා, නාලනිකා, අවු: 80).

නාලනිකා මහත්මියගේ ඉහත ප්‍රකාශය තුළින් ගම්‍ය වන්නේ ඇය ලද විශේෂඥ දැනුම භාවිතයට ගනිමින් සිය විශ්‍රාමික ජීවිතයේ අනාගතය සැලසුම් කර ඇති බවකි. කෘෂිකාර්මික අංශය පිළිබඳ තමා සතු දැනුම ඵලදායී භාවිතයකට, ආයෝජනයකට ලක් කරමින් වියපත්භාවය මත බලපෑම්කාරී තත්වයන්ට මුහුණ පෑම පිණිස, සිය අධ්‍යාපනික විෂය පරිපථය හා වෘත්තීය ක්ෂේත්‍රය ඉවහල් කොටගෙන ඇත. එහිදී ඔවුහු ආර්ථිකමය වශයෙන් ශක්තිමත් වීමට, මානසික තෘප්තියක් ලැබීමට, ජීවිතයෙහි සතුට පිළිබඳ තක්සේරුවක් ලබාදීමට සිය දැනුම, උසස් අධ්‍යාපනය සහ වෘත්තීය පෙරදැරි කොටගත් ප්‍රායෝගික භාවිතය පිටුවහලක් වී ඇති බව ගම්‍ය වේ. සිය විශ්‍රාමික ජීවිතයේ සිදුකරන ආර්ථික සැලසුමක් පවා සිය විෂය කාරණා, දැනුම් මත පදනම්ව පරිසර හිතකාමී තීරණ ලබාගනිමින් සිය ජීවන සුවය අපේක්ෂා කරන ජ්‍යේෂ්ඨ පුරවැසියන් ලෙස හඳුනාගත හැක. එසේනම්, වියපත්භාව සංසිද්ධියට මුහුණපාමින් සිටින කාන්තාවන් වශයෙන් සිය විශ්‍රාමික ජීවිතයේ සමබරතාවය, තෘප්තිමත්භාවය ලැබීමට තමා ලද අධ්‍යාපනය, වෘත්තීය මනාව උපයෝගී කරගත් ප්‍රතිග්‍රාහක ආඛ්‍යානයන් ඉතා සුවිශේෂී වනු ඇත.

වියපත්භාවය; කාන්තාව මත ඇති කරන බලපෑම්කාරී, නිශේධනාත්මක තත්වයන් තුලනාත්මකව පාලනය කරගැනීමට හැකි වූ ආකාරය ප්‍රතිග්‍රාහකයන්ගෙන් හඳුනාගත හැක. ඔවුන් සිය උසස් අධ්‍යාපනය සහ උසස් අධ්‍යාපනයම සිය වෘත්තීය කරගැනීම තුළ, න්‍යායාත්මක වශයෙන්ද, ප්‍රායෝගික වශයෙන් ද අදාළ විෂය ප්‍රස්තුතය පිළිබඳ ඥාණ ගවේෂකයෝ, විශේෂඥයෝ වෙති. එකී ලද ශාස්ත්‍රීය බහුශ්‍රැතභාවය, ඔවුන්ගේ විශ්‍රාමික ජීවිතය තෙක්ම, තමාට පිටුවහලක් වෙමින්, සිය ප්‍රතිරූපය සමාජයේ ඉහළ ස්ථරයන් කරා ස්ථානගත කර ඇති ආකාරය ප්‍රකාශයන්ගෙන් ගම්‍ය වේ.

ඉහත සියළුම සෞඛ්‍ය, සමාජ, ආර්ථික, සංස්කෘතික අභියෝග හමුවේ ආචාර්යවරියන් බහුතරයක්, සිය ජීවිතය නැවත සැලසුම් කරගනිති. ඔවුහු ආගමික, අභිචාර, ඇගයුම් විශ්වාස පද්ධතීන්, වගා කටයුතු, කියවීම, ලිවීම, මැහුම් ගෙතුම් ආදී විනෝදාංශ ක්‍රියාකාරකම් තුළින් කාලය කළමනාකරණය කරගනිති. ඔවුන්ගේ වියපත්භාවය මත ඇතිවන අභියෝගයන්ට මුහුණ පෑමට, සිය උසස් අධ්‍යාපනය හා වෘත්තීය පිටුවහලක් කරගෙන ඇත. වියපත්භාවය, කාන්තාව මත ඇති කරන සමාජ සංස්කෘතික, ආර්ථික, සෞඛ්‍යමය තත්වයන්ට ඔවුහු ද මුහුණපාති. නමුත්, සිය විශ්‍රාම ජීවිතය කළමනාකරණය කරගැනීමට ඔවුහු සිය දැනුම්, කුසලතා භාවිතයට ගෙන ඇත.

**නිගමනය**

අවසාන වශයෙන්, නිගමනය කළ හැක්කේ ස්ත්‍රියගේ වියපත්භාවය සමඟ ඇතිවන අභියෝග සඳහා සාර්ථකව මුහුණ පෑමට උසස් අධ්‍යාපනය වැදගත් සාධකයක් වී ඇත. කෙසේ නමුත්, ඔවුන්ගේ යහ පැවැත්ම වෙනුවෙන්, විශේෂයෙන් ඔවුන්ගේ කායික මෙන්ම, මානසික සෞඛ්‍යය යහපැවැත්ම, ජීවිතයේ ගුණාත්මකභාවය ඉහළ දැමීමට තවදුරටත්, පර්යේෂණ කටයුතු සිදුකළ යුතුව ඇත. මන්දයත් පවතින සමාජ ගතිකත්වයන් සමඟ, වියපත් ස්ත්‍රී ජනගහන විශාලනය සමඟ, ස්ත්‍රියකට සිය වියපත්භාවයට ද ශක්තිමත්ව මුහුණදීමේ පරිසරයන් සමාජය විසින් නිර්මාණය කළ යුතුව ඇත. උසස් අධ්‍යාපනය හෝ වෘත්තීය සුදුසුකම්ගෙන්, එක් ස්ත්‍රියකට පමණක් අනාගතයේ දී තම වියපත්භාවය, තමා වෙත ඇතිකරන අභියෝගයන් ජයගත නොහැක. ඔවුන්ට සමාජයේ, රාජ්‍යයේ සුරක්ෂණය අවශ්‍ය ය. එබැවින් මේ පර්යේෂණය සිදු කරනුයේ ද, ස්ත්‍රියට සිය වියපත්භාවය පිළිබඳ සුභවාදී දැක්මෙන් බැලීමට හෙටදිනක් වෙනුවෙන් දැනුම නිෂ්පාදනය කිරීමක් වශයෙනි.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


සිද්ධිසේන, කේ. ඒ. පී. (2004) . *ශ්‍රී ලංකාවේ ප්‍රජා විද්‍යානුකූල වයස්ගත වීම : ශ්‍රී ලංකාවේ වයස්ගතවීමේ ජනගහනය ගැටලු හා අනාගත අපේක්ෂාවන්* . කොළඹ : එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල.

Bouson, J.B. (2016) . *Shame and the Ageing Woman : Confronting and Resisting Ageism in Contemporary Women's Writings-Palgrave studies in Affect Theory and Literary Criticism* . Germany:Springer Publishing.

Giddens, A. , Duneier, M . , Appelbaum , R .P & Carr, D. (1991). *Introduction to Sociology* (9th ed.) . New York : ww.Norton & company.

Rowson, I .(2013). *Retired Academics and Professional Continuity : A cross - Cultural Comparison*. England : Keele University. Retrieved from :https://eprints.keele.ac.uk/3815/1/RowsonPhD2013.pdf

# සමාජ විග්‍රහ

**විමර්ශිත සංග්‍රහය**
**REFEREED JOURNAL**
**පළමු කාණ්ඩය, අටවන වෙළුම - 2022**
**ISSN 2362-0978 (print ISSN)**
**ISSN 2756-925X (e-ISSN)**

ලිපි අංක 06

## ශ්‍රී ලාංකීය රාජ්‍ය පාසල් අධ්‍යාපනය සහ ක්‍රියාකාරිත්වය මඟින් විචාරශීලි චින්තකයින් බිහි කිරීමේ ශක්‍යතාවය පිලිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

[6]කේ. කේ. එච් පවිත්‍රා
https://orcid.org/0000-0003-3390-3495

***ප්‍රධාන සංස්කාරක***
ප්‍රේමකුමාර ද සිල්වා

***සහය සංස්කාරක***
ජගත් බණ්ඩාර පතිරගේ
හිරුනි කළුආරච්චි

***සංස්කාරක උපදේශක මණ්ඩලය***
එස්.ටී.හෙට්ටිගේ (සම්මානිත මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
කාලිංග ටියුඩර් සිල්වා (සම්මානිත මහාචාර්ය) පේරාදෙණිය විශ්වවිද්‍යාලය
කේ.කරුණාතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) කැලණි විශ්වවිද්‍යාලය
සරත් අමරසිංහ (සම්මානිත මහාචාර්ය) රුහුණු විශ්වවිද්‍යාලය
යසාංජලී ජයතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
චන්ද්‍රසිරි නිරිඇල්ල (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
සුභාංගී හේරත් (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
නිශාර ප්‍රනාන්දු (ආචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
ෆර්සානා හනීෆා (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
ඉරේෂා ලක්ෂ්මන්(මහාචාර්ය)කොළඹ විශ්වවිද්‍යාලය

***භාෂා සංස්කරණය***
නාලක ජයසේන
***පරිසැලසුම් නිර්මාණය***
ප්‍රභාත් ගලගමගේ
හිරුනි කළුආරච්චි

[6] සහය කථිකාචාර්ය : සමාජ විද්‍යා අධ්‍යයනාංශය, ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ විද්‍යාව (ගෞරව) කොළඹ විශ්වවිද්‍යාලය, ශාස්ත්‍රපති උපාධි අපේක්ෂක (සමාජ විද්‍යාව) කොළඹ විශ්වවිද්‍යාලය

# සමාජ විග්‍රහ

**විමර්ශිත සංග්‍රහය**

**REFEREED JOURNAL**

**පළමු කාණ්ඩය, අටවන වෙළුම - 2022**

**ISSN 2756-925X (e-ISSN)**

**ISSN 2362-0978 (print ISSN)**

This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License.

දැනුම වෙත ප්‍රවේශ වීමේ සීමා අතික්‍රමණය සඳහා ලොව බොහෝ ශාස්ත්‍රාලයීය ප්‍රකාශන සම්ප්‍රදායික ප්‍රකාශන අයිතිය පිළිබඳ නෛතික ආකෘතියෙන් විකල්ප ආකෘතියක් වන පොදු නිර්මාණ බලපත්‍ර ක්‍රමයට සංක්‍රමණය වී / වෙමින් ඇත. මේ අනුව විචාරාත්මක දැනුමට විවෘත ප්‍රවේශයක් ලබා දීමේ අරමුණින් "සමාජ විග්‍රහ" විමර්ශිත සංග්‍රහය, නිකුත් වන්නේ ඉහත පොදු නිර්මාණ බලපත්‍රය යටතේය.

## ලිපි විමර්ශක මණ්ඩලය

*සම්මානිත මහාචාර්ය සිරි හෙට්ටිගේ, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*මහාචාර්ය ෆර්සානා හනීෆා, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*මහාචාර්ය ඉරේෂා ලක්ෂ්මන්, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*ආචාර්ය ජගත් බණ්ඩාර පතිරගේ, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

*ආචාර්ය ගයාත්‍රී විජේසුන්දර, සමාජ විද්‍යා දෙපාර්තුමේන්තුව, රුහුණ විශ්වවිද්‍යාලය*

*ආචාර්ය හේමන්ත කුමාර, සමාජ විද්‍යා දෙපාර්තුමේන්තුව, රුහුණ විශ්වවිද්‍යාලය*

## ප්‍රකාශනය

සමාජ විද්‍යා අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ-03
දුරකථනය/ෆැක්ස්: 011-2500452
විද්‍යුත් තැපැල: samajaviggraha@soc.cmb.ac.lk
වෙබ් අඩිවිය: https://arts.cmb.ac.lk/sociology/

**සාරසංක්ෂේපය**

කාලානුරූපව වෙනස්වන අධ්‍යාපන සංස්ථාවේ කාර්යභාරය පිළිබඳව විවිධ බුද්ධිමතුන් බහුවිධ දෘෂ්ටිකෝණයන් මගින් කරුණු දක්වා තිබේ. සමාජ සංස්ථාවන් අතර ප්‍රධානතම සංස්ථාවක් වශයෙන් අධ්‍යාපනය හරහා මිනිසාගේ ද්විතියික අවශ්‍යතාවයක් වන දැනුම සොයා යාමට ඇති අභිලාෂයන් සන්තර්පණය කරවයි. ඒ අනුව රටකට අවැසි, උගත්කමින් පරිපූර්ණ, යහපත් ආකල්පයන්ගෙන්, සදාචාරාත්මක බවින් පෝෂිත ක්‍රියාශීලි පරපුරක් නිර්මාණය කිරීම සඳහා පාදක වන්නේ එම රටෙහි ක්‍රියාත්මක වන අධ්‍යාපන ක්‍රමයයි. සංවර්ධනය වෙමින් පවත්නා රාජ්‍යයන් අතර ශ්‍රී ලංකාව සුවිශේෂී සුබසාධක සේවාවන් සපයන රාජ්‍යයක් වශයෙන් හඳුනාගත හැකි ය. නිදහස් අධ්‍යාපනය ආදී සමාජ සුබසාධක සේවා ආශ්‍රයෙන් පන්නරය ලද ලාංකේය පුරවැසියන් සතුව ඉහළ සාක්ෂරතාවයක්ද හඳුනාගත හැකි ය. රටෙහි මානව ප්‍රාග්ධනයට ප්‍රමුඛස්ථානයක් ලබාදෙමින් 1945 දී රජය විසින් විශ්වීය වශයෙන් නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තියක් හඳුන්වා දීම තුළින් මේ සඳහා මූලික අඩිතාලම නිර්මාණය වූ බව පෙන්වාදිය හැකි ය. අධ්‍යාපනය සඳහා සාධනීය තත්ත්ව නිර්මාණය වීමට අවශ්‍ය රාජ්‍ය පාසල් බිහිවීමත් සමඟ අධ්‍යාපනය සඳහා ප්‍රවිෂ්ට වූ ප්‍රමාණය සහ එහි ඵල නෙලාගන්නා ප්‍රමාණයෙහි ඉහළ යෑමක් සිදුවූ බව කිව හැකි ය. කෙසේ නමුත්, මෙම රජයේ පාසල් හරහා සැබවින්ම නිදහස් චින්තනයකින් යුතු සිසු පිරිසක් නිර්මාණය කරනවාද යන්න හඳුනාගැනීම කාලීන අවශ්‍යතාවයක් බව පෙන්වාදිය හැකි ය. ඒ අනුව මෙම ලිපියේදී “ශ්‍රී ලාංකීය රජයේ පාසල් විචාරශීලි චින්තකයින් බිහි කිරීමට සමත් ද?” යන ගැටලුව සඳහා විසඳුම් ගොනු කිරීම සිදු කෙරේ. ''ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාසල් හරහා ළමුන්ගේ තීරණ ගැනීමේ හැකියාව කෙරෙහි බලපෑම් කරන ආකාරය විමසා බැලීම" මෙම පර්යේෂණය සඳහා උපයුක්ත කරගත් මූලික පර්යේෂණ අරමුණ වශයෙන් පෙන්වා දිය හැකි ය. මෙහිදී පර්යේෂණ ක්ෂේත්‍රය වශයෙන් උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් නොච්චියාගම ප්‍රදේශයේ පිහිටා තිබෙන එක්තරා රජයේ පාසලක් තෝරාගත් අතර, සසම්භාවී නොවන නියැදි ක්‍රමයට අයත් අරමුණු සහගත නියැදිකරණය උපයෝගී කරගනිමින් 30 දෙනෙකුගෙන් යුත් පර්යේෂණ නියැදිය සකස් කරගන්නා ලදි. ප්‍රතිචාරිකයින් සමඟ සිදුකළ ගැඹුරු සම්මුඛ සාකච්ඡා හරහා රැස් කරගත් දත්ත තේමා විශ්ලේෂණ ක්‍රමවේදය ඔස්සේ විශ්ලේෂණය කළ අතර එහිලා, අධ්‍යාපනයේ තත්කාලීන විකාශනය, අධ්‍යාපනය තුළ පවතින විචාරශීලීත්වය, පොදු සමාජ කථිකාව සහ යථාර්ථය මෙන්ම අධ්‍යාපනය තුළ පවතින නිදහස යන ප්‍රස්තුත විමසීම සිදු කරන ලදි. ඒ අනුව, උක්ත ගැටලුව යෝග්‍ය න්‍යායාත්මක විග්‍රයන්ටද නතු කරගනිමින් ශ්‍රී ලාංකේය සමාජ සන්දර්භය ඇසුරින් සම්පාදනය කිරීම මුඛ්‍ය වශයෙන්ම මෙම ශාස්ත්‍රීය ලිපියේදී සිදු කෙරෙනු ඇත. අධ්‍යාපනයේ නිදහස යන්නෙන් මූල්‍ය බරපැන අවම වීම පමණක් නොව, සිසුන් තුළ නිදහස් විචාරශීලි චින්තනයට අවශ්‍ය පසුබිම සකස් කිරීම, විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය අවස්ථාවන් සළසා දීම ආදී කරුණු රාශියක් අන්තර්ගත වේ. මෙහිදී පොදු සමාජ කථිකාව සහ යථාර්ථය එකිනෙකින් විතැන් වන්නේ එකී වචනාර්ථය සහ සැබෑ තත්ත්වය අතර තිබෙන පරස්පරභාවය හේතුවෙනි. එම නිසාම තරඟකාරී විභාග මූලික කරගත් අධ්‍යාපන ක්‍රමවේදයන් වෙනසකට ලක් කර රටෙහි අනාගත ශ්‍රම බලකායට අනගි දායකත්වයක් ලබාදිය හැකි විචාරශීලි චින්තකයින් බිහි කරගැනීම සඳහා සුදුසු නව ක්‍රමවේදයක් නිර්මාණය කර ගැනීමට ශ්‍රී ලාංකීය රාජ්‍ය පාසල් පද්ධතිය හරහා උත්සාහ ගතයුතු බවත්, එය කාලීන සමාජ අවශ්‍යතාවයක් බවත් අවසාන වශයෙන් නිගමනය කළ හැකි ය.

**මුඛ්‍ය පද - සුභසාධන සේවා, රාජ්‍ය පාසල්, නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය, සාක්ෂරතාවය, විචාරශීලි චින්තකයින්**

## හැඳින්වීම

### අධ්‍යාපනය යනු

විද්වත් සමාජයක් බිහිකිරීමේ මූලික අඩිතාලම වශයෙන් වර්තමානයේ හඳුනාගන්නා අධ්‍යාපනය පිළිබඳව සාකච්ඡාවන් ලොව පුරාම නිර්මාණය වීම ආරම්භ වන්නේ විසිවන සියවස මුල් භාගයේ සිටය. එබැවින් සුභසාධන රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන රාජ්‍යයන්ගේ මූලික සමාජ අවශ්‍යතාවයක් වශයෙන් අධ්‍යාපනය ලබාදීම සමාජගත කර තිබෙන අතර, වර්තමානය වන විට යාවත්කාලීන වෙමින් නිර්මාණය වන 2030 වර්ෂය සඳහා ඉටු කරගැනීමට නියමිත තිරසර සංවර්ධන ඉලක්ක අතරටද අධ්‍යාපනය මූලික ද්විතියික අවශ්‍යතාවයක් වශයෙන් අන්තර්ගත කර ඇත්තේ යම් රටක් අත් කරගන්නා සංවර්ධනය, ආර්ථික, පාරිසරික මෙන්ම සමාජීය වශයෙන්ද තුලනාත්මක සංවර්ධනයක් විය යුතු හෙයිනි. මන්දයත්, උක්ත සංවර්ධන තත්ත්ව සාධනීය වීමට නම් රටක සාක්ෂරතාවය ඇතුළු අධ්‍යාපන මූලිකාංග අත්කරගත් ප්‍රජාවක් සිටිය යුතු අතර, ඔවුන් හමුවේ පමණක් භෞතික සංවර්ධනය සඵලදායී වන හෙයිනි. එසේම සමාජ සංස්ථාවක් වශයෙන් අධ්‍යාපනය, "සමාජයට ප්‍රවිෂ්ට වන නව සාමාජිකයින්ට සමාජය තුළ ජීවත්වීමට අවශ්‍ය කරන නොයෙක් දැනුම, අත්දැකීම් ලබාදීමේ කාර්යභාරයන් ඉටු කරමින් පවතී" (මහීස්, 2017: 63).

ඒ අනුව, මේසා වැදගත්කමක් නිමග්නව පවතින අධ්‍යාපනය සම්බන්ධව විවිධ සමාජ කථිකාවන් නිර්මාණය වෙමින් ඒවා හා සමගාමීව එහි මූලික නිර්වචනයද වෙනස් වී තිබේ. ඒ අනුව, මූලිකවම අධ්‍යාපනය යනු, "පුද්ගලයෙකුගේ දැනුම, කුසලතා සහ පුද්ගලික බුද්ධි පරාසයන් පුළුල් කරගැනීමේ අවස්ථාවන් සලසා දෙන සහ ප්‍රවර්ධනය කරන්නාවූ සමාජ සංස්ථාවක්" වශයෙන් නිර්වචනය වී තිබේ (Giddens and Sutton, 2013: 870). McMahon (1999) ප්‍රකාශ කරන ආකාරයට, "බොහෝ ආර්ථික සංවර්ධනයන්ගේ කේන්ද්‍රීය තේමාව වන්නේ අධ්‍යාපනය" වේ. Talcott Parsons පවසන ආකාරයට, නූතන කාර්මික සමාජයේ ජීවත්වීමට අවශ්‍ය නවීකරණය පදනම් වූ පොදු ජීවන රටාව පුද්ගලයින් ලබන්නේ අධ්‍යාපනය හරහාය (Giddens, 1993).

අධ්‍යාපනය යන්න අපට තුන් ආකාරයකින් හඳුනාගත හැකිය. ඉන් පළමුවැන්න පවුල තුළින් ලැබෙන අධ්‍යාපනයයි. පවුල තුළින් ලැබෙන අධ්‍යාපනය ඉතාමත් වැදගත් බව සමාජ විද්‍යාඥයින්ගේ පිළිගැනීමයි. පුද්ගලයෙකුගේ චරිතය ගොඩනැගෙන්නේත්, ඔහු විසින් පිළිපැදිය යුතු සාරධර්ම සකස් වන්නේත් පවුලේ අධ්‍යාපනයට අනුවය. දෙවැන්න පාසැල විශ්වවිද්‍යාලය ආදී අධ්‍යාපන ආයතනයි. නූතන කාර්මික සමාජයේ අධ්‍යාපනය සම්බන්ධයෙන් ප්‍රමුඛත්වයක් ලැබෙන්නේ මේ ආයතනයන් වලට වේ. මෙහිදී විශේෂ අවධානයක් යොමු වන්නේ පුද්ගලයාට යම්කිසි වෘත්තීය සුදුසුකමක් ලබාදීම සඳහා වේ. මෙම අධ්‍යාපනය සාර්ථකද යන්න මනිනු ලබන්නේ ඔහුගේ වෘත්තීය හැකියාව සහ සමත්වන විභාග අනුවය. තුන්වැන්න මහා සමාජයයි. පුද්ගලයා මරණය දක්වාම සමාජයේ සාමාජිකයෙකු ලෙස දැන කියාගත යුතු බොහෝ දේ ඇති අතර එය සමාජය තුළ ජීවත් වීමෙන් ඉගෙනගත යුතුය. ඔහු තමා ඇතුළත් වන සමාජයට ගැලපෙන ආකාරයෙන් ජීවත් වීමට ඉගෙනගත යුතුය. මේ සඳහා පවුලෙන්, පාසලෙන් හා උසස් අධ්‍යාපන ආයතන වලින් ලැබෙන අධ්‍යාපනය බෙහෙවින් ඉවහල් වේ.

ඒ අනුව විමසා බැලීමේදී අධ්‍යාපනය යනු පරම්පරාවන් විසින් සමාජ ජීවිතයට සූදානම් නොවී ඇති බාල පරම්පරාව වෙත පවත්වාගෙන යනු ලබන බලපෑමයි. සමස්ත වශයෙන් දේශපාලන සමාජය විසින්ද, ඔහුට අනාගතයේ ජීවත්වීමට සිදු වන සුවිශේෂී වටපිටාව මගින්ද, අපේක්ෂා කරන ශාරීරික වූත්, බුද්ධිමය වූත්, සදාචාරාත්මක වූත්, වටිනාකම් මතු කර ගැනීමටත් දියුණු කර ගැනීමටත් වේ (සේනාධීර,2010:22).

Bowles සහ Gintis (1976) ප්‍රකාශ කරන ආකාරයට, අධ්‍යාපනය හරහා සමාජානුයෝජනයට එහා ගිය සැඟවුණු කාර්යයන් ඉටු කරමින් සිටී. එනම්, ඔවුන් දක්වනුයේ අධ්‍යාපනය හරහා ධනවාදී සමාජයට අවශ්‍ය පුද්ගලයින් සකස් කරනු ලබන බවයි. Kelegama (2006) පෙන්වා දෙන ආකාරයට, දරිද්‍රතාවය අවම කළ හැකි ප්‍රධාන සාධකයක් වශයෙන් ඵලදායි අධ්‍යාපන ක්‍රමය හඳුනාගත හැකි අතර, තවදුරටත් ලංකාවේ අධ්‍යාපන පද්ධතිය ඉතා ඉක්මනින් වෙනස් විය යුතු බව ඔහු පෙන්වා දේ. මහත්මා ගාන්ධි විසින් අධ්‍යාපනය නිර්වචනය කර ඇත්තේ, "ජීවත්වීම සඳහා ජීවන අත්දැකීම් මගින් මුළු ජීවිතය පුරාම ක්‍රියාත්මක වන වර්ධනයක් අපේක්ෂා කරන ක්‍රියාවලියක්" වශයෙනි. ඒ අනුව අධ්‍යාපනය යන්න අනාගතය සඳහා සුභවාදී දැක්මක් සහිතව ක්‍රියාත්මක වන දෙයක් වශයෙන් මේ ඔස්සේ කිව හැකි ය.

ඒ අනුව අධ්‍යාපනය ලොව විවිධ රටවල විවිධ ආකාරයෙන් අර්ථ ගැන්වී තිබෙන අතර, පොදුවේ ගත් කල සමාජ වෙනස සඳහා අත්‍යවශ්‍ය කාරකයක් වශයෙන් අධ්‍යාපනය ඉස්මතු කර තිබේ. තිරසාර සමාජයක් සඳහා අධ්‍යාපනය සහ නිදහස තුලානාත්මක වශයෙන් පැවතිය යුතු බව ලෝකය පුරාම කතිකාවක් නිර්මාණය වීම සමඟ මේ සම්බන්ධ සාකච්ඡාවට ලැබෙන වැදගත්කම ක්‍රම ක්‍රමයෙන් ඉහළ යාමක් සිදුවී ඇත.

**ශ්‍රී ලාංකේය සුබසාධක රාජ්‍යය සහ රාජ්‍ය පාසල් අධ්‍යාපනය**

"ශ්‍රී ලාංකීය රජයේ පාසල් විචාරශීලී චින්තකයින් බිහි කිරීමට සමත්ද?" යන ගැටලුව සඳහා විසඳුම් ගොනු කිරීමට මූලික අඩිතාලම වශයෙන්, පළමුවෙන්ම ශ්‍රී ලාංකේය සුබසාධක රාජ්‍ය පිළිබඳවත් එමඟින් සපයන සුබසාධක සේවාවක් වන අධ්‍යාපනය පිළිබඳවත් හඳුනාගැනීම වැදගත් වනු ඇත. ඒ අනුව ශ්‍රී ලංකාව තුළ සුබසාධක සේවාවක් ලෙස සැපයෙන අධ්‍යාපනය ලබාදෙන එක් ආයතන ප්‍රවර්ගයක් වශයෙන් ශ්‍රී ලාංකේය රජයේ පාසල් පෙන්වාදිය හැකිය. මෙම ශාස්ත්‍රීය ලිපිය තුළ ප්‍රථමයෙන්ම සුබසාධක රාජ්‍ය සංකල්පය විග්‍රහ කරන අතර, එම විග්‍රහය හරහා සුබසාධක සේවාවක් වශයෙන් අධ්‍යාපනය ලබාදෙන රාජ්‍ය පාසල් සංකල්පය හැඳින්වීමට පදනමක් සකස් කරගනු ලැබේ.

රාජ්‍යය පිළිබඳ විමසීමේදී රාජ්‍යයේ කෘත්‍යාත්මක පැතිකඩ ගුරුකොට ගනිමින් ගොඩනැඟී ඇති සංකල්ප අතර රාජ්‍යය සුබසාධකවාදය මුල් තැන්හි ලා දැක්විය හැකිය. රාජ්‍යය යනු මිනිසාගේ පොදු සුභසිද්ධිය සඳහා මිනිසා විසින්ම පිහිටුවාගත් ආයතනයකි (ප්‍රනාන්දු,1981). රාජ්‍යය පිළිබඳව ලොව පිළිගත් ලිබරල් මතවාදය වනුයේ එය සුභසාධක රාජ්‍යයක් විය යුතු බවයි. එබැවින් ලෝකයේ බහුතර රාජ්‍යය ගණනාවක්ම තමන් සුභසාධකවාදය ගරු කරන පාලන ක්‍රමවේදයක් ලෙස පෙන්වා දෙයි (Mahajan,1998:647). ලිබරල් න්‍යාය පෙන්වා දෙන පරිදි රාජ්‍යය යනු මනුෂ්‍යය නිර්මාණයකි. එබැවින් සෑම මිනිසෙකුම කිසියම් රාජ්‍යයක සාමාජිකයෙකු බවට පත්වීම නිරායාසයෙන්ම සිදුවේ. එබැවින්ම රාජ්‍යය සහ මිනිසා අතර පවතින සබැඳියාව අන් කවර සංවිධානයක් හා පවතින බැඳීමට වඩා සුවිශේෂී වන්නකි. රාජ්‍යයේ බලය ශ්‍රේෂ්ඨ වූවකි. සියලුම සංවිධාන අතර උත්තරීතර සංවිධානය වූ රාජ්‍යයට එය සතු ස්වාධිපත්‍යය පවරන ලද්දේ මිනිසා විසිනි. එබැවින්ම රාජ්‍යය මිනිසාගේ ජීවිතය, නිදහස, දේපල හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ නියමුවාද වේ (Johari,1982:411).

ශ්‍රී ලාංකේය සුභසාධක රාජ්‍ය පිළිබඳව අවධානය යොමු කිරීමේදී එය යටත් විජිත යුගයෙන් ඇරඹී නූතනය දක්වාම විවිධ වෙනස්කම්වලට භාජනය වෙමින් විකාශනය වන්නක් ලෙස හැඳින්විය හැකි ය. විශේෂයෙන්ම බ්‍රිතාන්‍ය පාලන සමය තුළ වූ ප්‍රතිසංස්කරණ කාලානුරූපව වර්ධනය වූ ලාංකේය සුබසාධනවාදයට පදනම සැපයීය. ඩොනමෝර් ප්‍රතිසංස්කරණ (1931-1947) සමඟම පැමිණි පවුල් සුබසාධක සේවා, දුප්පත්කම පිටුදැකීමේ ක්‍රියාමාර්ග, සමාජ සුරක්ෂිතභාවය, අධ්‍යාපන හා සෞඛ්‍ය ප්‍රතිසංවිධාන මූලික වශයෙන්ම සමාජ යුක්තිය, සමානාත්මතාව හා සාධාරණත්වය යන මතවාද සංවර්ධනයට බලපාන ලදි. එය

නිදහස් ශ්‍රී ලංකාව තුළ දේශපාලන හා සමාජ-ආර්ථික ප්‍රතිඵත්තීන් සැකසීමේදී සුවිශේෂී බලපෑමක් සිදු කරන ලදි (හඳරාගම සහ රත්නායක,2011).

ශ්‍රී ලංකාව තුළ නිදහසෙන් පසුවද සුබසාධක සේවා පිළිබඳ මූලික ආදර්ශය සපයා ගෙන ඇත්තේ එක්සත් රාජධානියෙනි. ඒ අනුව 1945 කන්නන්ගර (Kannangara Report) වාර්තාව අනුව පනවන ලද 1945 නිදහස් අධ්‍යාපන පනත, 1943 අයිවෝර් ජෙනින්ස්ගේ (Ivor Jennins) වාර්තාව මත පදනම්ව 1948 පිහිටවූ සමාජ සේවා දෙපාර්තමේන්තුව සහ 1950 කම්ප්ස්ටන් වාර්තාව (Cumpston Report) අනුව 1953 සෞඛ්‍ය පනත වර්තමානය දක්වාත් පවතින ලාංකේය සුභසාධනයේ සුවිශේෂ පියවරයන් වන්නේය (Jayasuriya,2000:8).

නිදහස් අධ්‍යාපන පනත ක්‍රියාත්මක වීමත් සමඟ ශ්‍රී ලංකාවේ සුබසාධනයට අවශ්‍ය ස්ථිර පදනම සැකසිණි. සමාජ චල්‍යතාවට මග පාදමින් දිගුකාලීන අරමුණු සාක්ෂාත් කරගනු වස් ඇරඹූ මෙම පනත පසු කාලීනව තවදුරටත් දේශපාලන ප්‍රතිසංස්කරණ ඔස්සේ ශක්තිමත්ව අද වන විටත් ලංකාව තුළ නොබිඳිය හැකි සුවිශේෂී සුබසාධක සේවාවක්ව පවතී. ඒ අනුව අධ්‍යාපනය පිළිබඳව වන ජාතික පද්ධතියක් පිහිටුවීම, අධ්‍යයන මාධ්‍යය පිළිබඳ තීරණ ගැනීම, මධ්‍යම පාසල් ව්‍යාප්ත කිරීම සහ නිදහස් මූලික අධ්‍යාපනයක් ලැබීමේ අයිතිවාසිකම් තහවුරු කිරීම මේ හරහා සිදු විණ. 1956 භාෂා පනත සමඟ අත්වැල් බැඳ ගනිමින් නව ප්‍රතිසංස්කරණයන් ද සහිතව සියලු පුරවැසියන්ටම අධ්‍යාපනය සඳහා වන නිදහස් ප්‍රවේශය තහවුරු කිරීම මේ හරහා සිදු විණ. 1977 විවෘත ආර්ථික ප්‍රතිපත්ති ඇති කිරීමත් සමඟම යම් යම් වෙනස්කම් ඇති වුවද මූලිකවම නිදහස් අධ්‍යාපන වරප්‍රසාද අද දක්වාම පුරවැසියන් භුක්ති විඳින සුවිශේෂී සුභසාධක සේවාවක් වේ (Peiris,1993).

ඒ අනුව සුබසාධක සේවාවක් වශයෙන් අධ්‍යාපනය පිළිබඳව සහ ශ්‍රී ලංකාවේ පවතින නිදහස් අධ්‍යාපන ක්‍රමවේදයත් රාජ්‍ය පාසල් පිළිබඳවත් හඳුනාගැනීම මෙහිදී බෙහෙවින් වැදගත් වනු ඇත. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලබාදීම ආරම්භය මෑත කාලයේ සිදුවූවක් නොවන අතර, විජයාවතරණයට පෙර සිටම විවිධ ආකාරයෙන් අධ්‍යාපනය ලබාදීම සිදුවී තිබෙන බවට ඓතිහාසික ලිපි ලේඛන (උදා: දම්පියා අටුවා ගැටපදය) සාක්ෂි දරයි. එම දේශීය අධ්‍යාපනය ක්‍රමයේ විපර්වර්තනය බටහිර අධිරාජ්‍යවාදීන්ගේ ආගමනයත් සමඟ වෙනස් වන අතර, ධනාත්මක සහ ඍණාත්මක යන දෙආකාරයේම සමාජ වෙනස්කම් ඇතිවීමට එය බලපෑම් කරන ලදි. එනම් දේශීය අධ්‍යාපන ක්‍රම සහ දැනුම පරිහානියට යාම ඍණාත්මක ලෙස හඳුනාගත හැකි අතර, ඉංග්‍රීසි අධ්‍යාපනය ප්‍රමුඛ දැනුම සහිතව සමාජ චල්‍යතාවයක් සඳහා ප්‍රජාව ඉදිරිගාමී කිරීමට ඒ ඔස්සේ වක්‍රව ඇතිවූ බලපෑම, මූලිකවම ධනාත්මක ලෙස ගත හැකිය (අබේවර්ධන, 2019).

ශ්‍රී ලංකාව තුළ බටහිර ක්‍රමයට අනුව ප්‍රථම පාසැල ආරම්භ කරන ලද්දේ 1543 පෘතුග්‍රීසීන් විසින්ය. ඒ මූලික ආරම්භයේ පටන්ම දේශීය අධ්‍යාපන ආයතන වන බෞද්ධ පන්සල් පාසල් හා පිරිවෙන්ද, හින්දු ගුරුකුල මගින්ද, මුස්ලිම් මද්රාසා වැනි පාසල් ක්‍රමයන් යටත්විජිත පාලන සමයේදී, බටහිර ක්‍රමයේ පාසල් ක්‍රමය ඉදිරියට පැමිණියේය. යටත්විජිත සමයේ පැවති ද්විත්ව සමාජ ක්‍රමය පාසල් මඟින් අනුමත කර තිබූ බව පෙනේ. ඉංග්‍රීසි මාධ්‍යය පාසල් සුපිරි පංතියට සේවය කළේය. වහලාගේ භාෂාව නමින් පාසල් විශේෂයක් දේශීය සාමාන්‍ය සිංහල හා දෙමළ ජනතාවට සීමා විය. 40 දශකයේ වේගවත් වෙනසක් ඇති වුනේ ඉංග්‍රීසි මාධ්‍යය මධ්‍ය මහා විද්‍යාල ගම්බද පළාත්වල ආරම්භ කිරීමත් 1945 දී නිදහස් ඉංග්‍රීසි අධ්‍යාපනය ස්ථාපනය කිරීමත් සමඟය (උඩගම, 2003: 46). ඒ අනුව විමසා බැලීමේදී පශ්චාත් යටත්විජිත අවධිය තුළ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සුවිශේෂී පෙරළියක් සිදුවී තිබෙන බව හඳුනාගත හැකි ය. ශ්‍රී ලංකාවේ පශ්චාත් යටත් විජිත යුගයේ අධ්‍යාපන නවෝදයක් ආරම්භ වුයේ 1931 හඳුන්වා දෙන ලද ඩොනමෝර් ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵලයක් වශයෙන් ආරම්භ කරන ලද රාජ්‍ය මන්ත්‍රණ සභා යුගයේදීය. ඒ යටතේ අධ්‍යාපනය සඳහා විශේෂ

කාරක සභාවක් පත්වූ අතර, අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් ආචාර්ය සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතා (1931-1947) පත්විය. ලංකාවේ අධ්‍යාපන නීතියේ මූලික පදනම වශයෙන් 1939 අංක 31 දරණ අධ්‍යාපන ආඥා පනත නීතිගත වීමත්, 1943 පත් කරන ලද අධ්‍යාපනය පිළිබඳ විශේෂ කාරක සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමත් මෙම කාල වකවානුවේදී සිදුවූ විශේෂ සිදුවීම් විය. නිදහස් අධ්‍යාපනයේ පියා වශයෙන් විරුදාවලි ලත් ආචාර්ය සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතා, "*ප්‍රජාතන්ත්‍රවාදී ජීවිතයට යෝග්‍ය වූ අධ්‍යාපනයේ දියුණුව කවර ලෙසකවත් සීමා නොකරමු. ප්‍රධාන පරමාර්ථ දෙකක් වූ, චරිත පුහුණුවත්, පුරවැසියෙක් මෙන් යහපත් පැවැත්මත් ඉගැන්වීම අපි තරයේ මතක් කර සිටිමු*" ලෙස අධ්‍යාපනයේ වැදගත්කම එවකට අභිමතානුකූලව දක්වනුයේ එවන් සන්දර්භයකදීය (බණ්ඩා, 1994).

මෙම අධ්‍යාපනය පිළිබඳ විශේෂ කාරක සභා වාර්තාවේ ඉතාම වැදගත් යෝජනාව වූයේ සියලුම රජයේ සහ ආධාර ලබන පාසල්වල අධ්‍යාපනයත්, විශ්වවිද්‍යාල අධ්‍යාපනය නොමිලයේ ලබාදීම පිළිබඳවත් වන යෝජනාවයි. එවකට වන විටත් ස්වභාෂා සහ ද්විභාෂා පාසල්වල අධ්‍යාපනය නොමිලයේ ලබාදුන් නමුත්, රජයේ මෙන්ම පෞද්ගලික අංශයේද, විවිධ වෘත්තීන් වලද උසස් තලවලට ප්‍රවේශ විය හැකි ඉංග්‍රීසි මාධ්‍ය අධ්‍යාපනය ලබාගත හැකි වූයේ මුදල් ගෙවා අධ්‍යාපනය ලබාගත් පුද්ගලයින්ට පමණි. ඒ අනුව 1947 අංක 26 දරණ නිදහස් අධ්‍යාපන පනත නීතිගත කිරීමත ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසයේ දීර්ඝකාලීන ප්‍රතිඵල ඇතිකළ ප්‍රතිඵත්තිමය තීරණයකි (වාලට් සහ දයාපාල, 2013:1346).

ඉහත දැක්වූ පරිදි යටත්විජිත පාලන සමයේ සිට වර්තමානය දක්වාම විවිධ වෙනස්කම් සහිතව සංශෝධන ගණනාවක් සහිතව ලාංකේය රාජ්‍ය පාසල් අධ්‍යාපනය ක්‍රියාත්මක වී ඇති අතර, ඒ තුළ නිදහස් අධ්‍යාපනය විවිධ නීතිරීති වලට ගොනු කිරීමත්, ශිෂ්‍ය භූමිකාව ප්‍රති-අර්ථකථනය කිරීමත් මෙන්ම, ඉගෙනුම් ක්‍රම හා විෂය පථය වෙනස් වීමට හා පුළුල් වීමට ලක් වීමත් සිදු වී තිබේ. එම අධ්‍යාපන ක්‍රමවේදයන් වර්තමානයේදීත් වෙනස් වෙමින් ඉදිරියට ගමන් කරන බව පෙන්වාදිය හැකි ය. ඒ අනුව, මෙසේ වෙනස් වෙමින් ඉදිරියට ගමන්ගන්නා රාජ්‍ය පාසල් හරහා ලබාදෙන නිදහස් අධ්‍යාපනය, සැබැවින්ම විචාරශීලි චින්තකයින් බිහි කිරීමට සමත්ද යන්න විමසීම මෙම පර්යේෂණ ලිපියේ මුඛ්‍ය අරමුණ වන අතර, ඒ සඳහා අවශ්‍යය පසුබිම් සම්පාදනය කරනු වස් උක්ත සාකච්ඡාව තුළ අධ්‍යාපනය යනු කුමක් ද යන්න පිළිබඳවත්, ශ්‍රී ලාංකේය සුබසාධක රාජ්‍යය තුළ රාජ්‍ය පාසල් අධ්‍යාපනය පිළිබඳවත් හඳුනා ගැනීම සඳහා අවධානය යොමු කර තිබෙන බව කිව යුතුය.

## පර්යේෂණ ක්‍රමවේදය

### පර්යේෂණ ක්ෂේත්‍රය

මෙහිදී මා විසින් මාගේ පර්යේෂණ ක්ෂේත්‍රය වශයෙන් යොදාගන්නා ලද්දේ උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් නොච්චියාගම ප්‍රදේශයේ පිහිටා තිබෙන එක්තරා රජයේ පාසලකි. එම පාසැල මාගේ පර්යේෂණ ක්ෂේත්‍රය වශයෙන් යොදා ගැනීමට මූලික වශයෙන් හේතු වූයේ එම පාසැලේ සිසුන් අධ්‍යාපනික අංශයෙන් මෙන්ම විෂය බාහිර ක්‍රියාකාරකම් සහ ක්‍රීඩා කටයුතු යන සියලුම අංශයන්ගෙන් ප්‍රදේශයේ පාසල් අතර ප්‍රමුඛත්වය හිමිකරගැනීමට සමත් වී තිබීමයි. එමෙන්ම 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය මෙන්ම සාමාන්‍ය පෙළ විභාගය යන කඩයිම් විභාගයන් වලින් ඉහළ ප්‍රතිඵල ලබා ගනිමින්, කලා විෂය ධාරාව යටතේ මෙම පාසැල තුළම උසස් පෙළ හදාරන පළමු කණ්ඩායම මෙම පාසලේ අධ්‍යාපනය ලැබීම ද මෙම පාසැල පර්යේෂණ ක්ෂේත්‍රය වශයෙන් තෝරා ගැනීම සඳහා මූලිකවම බලපෑම් කරන ලදි. එසේම ශ්‍රී ලාංකීය රජයේ පාසල් විචාරශීලි චින්තකයින් බිහිකරනවාද යන ගැටලුව පිළිබඳව විමසීමේදී ඒ හා අදාළ වන දත්ත

පාසලක් ඇසුරින් රැස් කර ගැනීම වඩාත් පහසු වන බැවින් මාගේ පර්යේෂණ ක්ෂේත්‍රය වශයෙන් මෙම පාසැල යොදාගන්නා ලදී.

**නියැදිය**

මෙහිදී මාගේ සංගහනය වශයෙන් අදාල පාසලේ අධ්‍යාපනය හදාරන සිසු සිසුවියන් කණ්ඩායම, ඔවුන්ට උගන්වන ආචාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ දෙමාපියන් තෝරා ගන්නා ලදි. මා විසින් තෝරාගත් සමස්ත සංගහනයම අධ්‍යයනය කිරීම ප්‍රායෝගික වශයෙන් අපහසු වන බැවින් නියැදි දෝෂ අවම වන පරිදි මාගේ පර්යේෂණ නියැදිය තෝරා ගන්නා ලදි. පර්යේෂණ නියැදිය තෝරා ගැනීමේදී සසම්භාවී නොවන නියැදි ක්‍රමයට අයත් අරමුණු සහගත නියැදිකරණය යොදා ගන්නා ලදී.

- තෝරාගත් පාසලේ උසස් පෙළ කලා විෂය ධාරාව හදාරන සිසු සිසුවියන් කණ්ඩායම – සිසුන් 5, සිසුවියන් 7

  2018 වසර දක්වාම මෙම පාසල තුළ පැවතියේ සාමාන්‍ය පෙළ දක්වා වන පන්ති පමණක් වන අතර, 2017 වසරේ මෙම පාසැලේ සාමාන්‍ය පෙළ සමත් සිසු සිසුවියන් වෙනුවෙන් ආරම්භ කරන ලද උසස් පෙළ පන්තිය තුළ මෙම පාසැලේ පළමු උසස් පෙළ සිසු සිසුවියන් කණ්ඩායම ඉගෙනුම ලබයි. එම කණ්ඩායමේ සියලුම සිසු සිසුවියන් මාගේ පර්යේෂණ නියැදිය තුළට අන්තර්ගත කරගන්නා ලදි.
- අදාල පාසැලේ විදුහල්පතිතුමිය
- එම උසස් පෙළ පන්තියේ සිසු සිසුවියන්ට ඉගැන්වීම් කටයුතු කරන ගුරු භවතුන් (ගුරුවරියන් 1 සහ ගුරුවරුන් 2)
- සිසුන් 12 දෙනාගේ මව හෝ පියා යන දෙදෙනාගෙන් එක් අයෙක් අඩංගු වන සේ දෙමාපියන් 12 දෙනෙක්

**දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම**

ප්‍රාථමික දත්ත සහ ද්විතීයික දත්ත මත පදනම්ව මෙම පර්යේෂණය දියත් කරන ලදී. ප්‍රාථමික දත්ත පර්යේෂණ ක්ෂේත්‍රය තුළින් රැස් කරගත් අතර, ද්විතීයික දත්ත මූලාශ්‍ර වශයෙන් ශාස්ත්‍රීය ග්‍රන්ථ, ලිපි, පරිවර්තන මෙන්ම පර්යේෂණ තේමාව හා සම්බන්ධ සඟරා ලිපි යන ද්විතියික මූලාශ්‍රයන්හි ලේඛනගත දත්ත උපයුක්ත කරගන්නා ලදී.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

ශ්‍රී ලාංකීය රජයේ පාසල් විචාරශීලි චින්තකයින් බිහි කිරීමට සමත්වේද යන්න පිළිබඳව විමසීමේදී මූලිකවම අවධානය යොමු කල යුතු පාර්ශවයන් වශයෙන් පාසල් ගුරුවරුන් සහ පාසල් විෂයමාලාව වැදගත්වන බව පෙන්වාදිය හැකිය. මන්දයත් පාසල් ගුරුවරුන් සහ පාසැල් විෂයමාලාව හරහා දරුවට සෘජු බලපෑමක් එල්ලවන බැවිනි. පාසැල තුළින් මහා සමාජයට පිවිසෙන දරුවා ඒ සඳහා සූදානම් කිරීමේදී මූලික අඩිතාලම සපයනු ලබන්නේ පාසල් විෂයමාලාව තුළින් වන අතර, එම විෂයමාලාව දරුවන් වෙත රැගෙන යනු ලබන්නේ පාසැල් ගුරුවරුන් විසිනි. රාජ්‍ය පාසල් හරහා විචාරශීලි චින්තකයින් බිහි කිරීමේ ශක්‍යතාවය පිළිබඳව විමසීමේදී ගුරුවරුන් සහ පාසල් විෂයමාලාව යන පාර්ශවයන් හරහා සිදුවන බලපෑම මෙහිදී අධ්‍යයනය කරන ලදි.

බොහෝ දුරට පාසල් මගින් සමාජයේ පවතින අපේක්ෂාවන් සහ භූමිකාවන් ශිෂ්‍යයන් තුළින් අත්දැකීමට, නැතහොත් විනිවිද දැකීමට උත්සුක වේ. එවන් තත්ත්වයක් වශයෙන් අධ්‍යාපනය තුළ මෙන්ම අධ්‍යාපනය තුළින් ස්ත්‍රී - පුරුෂ සමාජභාවීය ඒකාකෘති (Gender Stereotypes) සහ භූමිකා ස්ථාපිත කිරීමට ගන්නා උත්සාහයන් පාසල් විෂයමාලාවන් තුළ බොහෝ දුරට හමුවේ. මෙම විෂයමාලාවන් අන්තර්ග්‍රහණය කරගන්නා ගුරුවරුන් හරහා එම ආකල්ප සිසුන් වෙත ගමන් කරන බැවින් පාසල් විෂයමාලාව සහ ගුරුවරුන් සිසුන්ගේ විචාරශීලී චින්තනයේ වර්ධනය පිළිබඳව තීරණය කරනු ලබන ප්‍රබල සාධකයන් බවට පත්වේ.

*"මම පොඩි කාලේ ආස උනේ පොලීසියට යන්න. ලොකු උනාම කවුද වෙන්න ආස කියලා අහද්දී මම කිව්වේ පොලීසියේ ලොක්කෙක් වෙනවා කියලා. මම ඒක කියද්දී යාලුවෝ හැමෝම හිනා උනා කෙල්ලෝ එහෙම වෙන්නේ නෑ කියලා. සර්ලා මිස්ලා උනත් ගොඩක් හොඳයි කිව්වේ ටීච කෙනෙක් වෙනවා කිව්ව යාළුවන්ට. අපේ පොඩි කාලේ පොත් වලත් ටීචගේ රූපෙ ඉන්නේ ගෑනු ළමයෙක්. ඉතින් මම හිතුවා ගෑනු ළමයෙක්ට හරිම රස්සාව ගුරු වෘත්තීය කියලා. මම හොඳට වැඩ කරලා කැම්පස් ගිහින් ටීච කෙනෙක් වෙනවා"(A[1], සම්මුඛ සාකච්ඡා දත්ත: 2020).*

Ivan Illich (1973) ප්‍රකාශ කරන ආකාරයට, පාසල්වල "සැඟවුණු විෂය මාලාවක්" ("Hidden Curriculum") පවතින අතර එමගින් ශිෂ්‍යයන්ගේ භූමිකා හා සමාජය තුළ ඔවුන් සිටිය යුතු ස්ථානය ආදිය අන්තර්ගතකරණය කිරීම සිදු කෙරේ. ඒ අනුව ස්ත්‍රී - පුරුෂ සමාජභාවීය සමාජීය භූමිකාවන් සමාජය තුළ ස්ථාපිත කිරීමටත්, ඒ හරහා ළමුන්ගේ නිදහස් විචාරශීලී චින්තනයට බාධා කිරීමත් අධ්‍යාපන ක්‍රමය හරහා වක්‍රව හෝ සිදු කෙරෙන බව කිව හැකි ය. ලංකාවේ බොහෝ රාජ්‍ය පාසල්වල විනය පද්ධතියක් ලෙස හඳුනාගන්නා නමුත් ස්ත්‍රී - පුරුෂ සමාජභාවීය විෂමතා කුළු ගන්වන නීතිරීති පවතින අතර, ද්විතියික අධ්‍යාපනය තුළින්ම සිදුවන එම බාධා කිරීම් අධ්‍යාපනයේ නිදහස මෙන්ම සිසුන්ගේ විචාරශීලී චින්තනයද සීමා කිරීමට බලපාන බව කිව හැකිය. ගැහැණු ළමුන් සහ පිරිමි ළමුන් සඳහා විශේෂීකරණය වූ රැකියාවන් වෙන් වෙන් වශයෙන් අභ්‍යන්තරීකරණය කිරීම පාසල මගින් සිදු කෙරෙනුයේ ඒ ආකාරයෙනි. උදාහරණ වශයෙන්, ගෘහ විද්‍යාව වැනි විෂයක් ඉගෙනීමට වඩාත් ගැහැණු දරුවන් පොළඹවන අතර, පිරිමි දරුවන් එම විෂය හැදෑරීමට යොමු වීම එතරම් සුදුසු නොවන්නක් ලෙස දකී. කාන්තාවක් අනාගතයේ මවක්, බිරිඳක් වශයෙන් ඉටු කළ යුතු වගකීම් සඳහා පමණක් උක්ත විෂය යෝග්‍ය බව දැකීමක් එසේ පාසල් තුළ ගුරුවරුන් අතරින් පවා දැකීම හඳුනාගත හැකිය. එසේම, ගැහැණු ළමුන් සඳහා විශේෂිත ක්‍රීඩා හැර පිරිමි ළමුන් නියැලෙන ක්‍රීඩාවන්හි නිරත වීම නුසුදුසු ලෙස දැකීමක් පාසල් තුළ පවතී. එය අධ්‍යාපන පද්ධතියේ ගැටලුවකට වඩා පාසල් තුළ ගුරුවරුන් සහ අනන්‍ය සංස්කෘතිය තුළින් බොහෝ දුරට නිර්මාණය කරන්නක් වුවත්, අධ්‍යාපනයේ නිදහස සීමා කිරීමටත් අනාගතයේ මහජන සමාජයට මුහුණදෙන දරුවාගේ විචාරශීලී චින්තනය කෙරෙහි අගතිකාමී ලෙස බලපෑම් කිරීමත් එමගින් කළ හැකිය.

ස්ත්‍රීවාදී න්‍යායධාරීන්ට අනුව, අධ්‍යාපනය තුළ කාන්තාවන්ගේ හැකියාවන්, දක්ෂතාවයන් ඔවුන් කාන්තාවන් නිසාවෙන්ම සීමා කරනු ලබන අතර, අධ්‍යාපන ආයතන තුළ කාන්තාවන්ට පුරුෂයන්ට මෙන් සමසේ අධ්‍යාපන ඉලක්කයන් සපුරාගැනීමටත් පූර්ණ ලෙස සහභාගී වීමටත් යම් යම් සීමා පනවා ඇත (Silver, 2012). මෙමගින් ඉහත දක්වන ලද සම්මුඛ සාකච්ඡා දත්තය සහ ඒ දත්තය සම්බන්ධයෙන් උක්ත දක්වන ලද විග්‍රහය තවදුරටත් සනාථ කරවයි.

එසේම පාසල් අධ්‍යාපනය තුළ විචාරශීලී චින්තනය සඳහා බලපානු ලබන තවත් අංශයක් වශයෙන් "සංස්කෘතික බාධාකාරී තත්ත්වයන්" ("Cultural Restrictions") හඳුනාගත හැකිය. Pierre Bourdieu (1990) ප්‍රකාශ කරන ආකාරයට පාසල් සතුව සංස්කෘතික ප්‍රතිනිෂ්පාදනය (Cultural Reproduction) භූමිකාවක් වශයෙන් පවතින අතර, එහිදී ආකල්ප, අගයන් සහ පුරුදු අභ්‍යන්තරීකරණය කිරීම සිදුවේ. යහපත් අගයන්, ආකල්ප සහ පුරුදු අභ්‍යන්තරීකරණය කිරීම පාසලක් මඟින් සිදුවන විට එය ඉතාම ධනාත්මක වන නමුත්, ආගම පදනම් කරගෙන බිහිවන පාසල් මඟින් සිදුවන සංස්කෘතික ප්‍රතිනිෂ්පාදනය සෑම අවස්ථාවකදීම ධනාත්මක නොවිය හැකි ය.

> *"ළමයින්ට උගන්නද්දී හැම ජාතියකටම ආගමකටම ගරු කරන්න උගන්නනවා අපි. එත් ඒ වැඩේ ප්‍රයෝගිකව සිද්ද වෙනවා අඩුයි. අපි අධ්‍යාපන චාරිකා යද්දී බස් නතර කරන්නේ සිංහල කඩ තියෙන තැන් බලලා. සමහර තැන් වල නතර වෙන්න හදද්දී ළමයින්ම විරුද්ධ වෙනවා මෙතන බෑ මේ හරියේ සිංහල කඩ නෑ කියලා. ඒ වෙලාවට ළමයින්ට හරි වැරදි කියලා දෙනවට වඩා අපිත් කරන්නේ වෙන තැනක නතර කරන එක. අපිත් සිංහල බෞද්ධ මානසිකත්වේ ඉඳලා ළමයින්ට ඒක එපා කියන්න බෑනේ දරුවෝ. එයාලා ලොකු උනාම එයාලගේ දරුවන්ටත් උගන්නන්න ඕනා මේක සිංහල බෞද්ධ රටක් කියන එක" (A[10], සම්මුඛ සාකච්ඡා දත්තඃ 2020).*

ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාර සමඟ ශ්‍රී ලංකාවේ ආගම සහ ජාතිය පදනම් කරගත් පාසල් බිහිවීම ආරුමුග නාවලර්, සිද්දි ලෙබ්බේ වැනි විද්වතුන්ගේ මූලිකත්වයෙන් සිදු කෙරුණද, වර්තමානයේ එනම් 2019 මැයි මස ලංකාවේ ඇතිවූ ආගමික අන්තවාදය මුල් කරගත් ප්‍රචණ්ඩකාරීත්වයන් එක් අතකින් රාජ්‍ය නියාමනය යටතේ ක්‍රියාත්මක වන ආගමික වශයෙන් වෙන් වෙන්ව පවතින පාසල් තුළින් සිදුවූ නිශේදනාත්මක සංස්කෘතික ප්‍රතිනිෂ්පාදනයේ අතුරු ප්‍රතිඵලයක් ලෙස ආසන්නතම කාල වකවානුව විමසීමෙන් කිව හැකි ය. ආගමික වශයෙන් වෙන් වෙන්ව පවතින පාසල් හරහා විවිධ ජනවර්ග වලට අයත් සිසුන්ට සහයෝගයෙන් කටයුතු කිරීමේ ඉඩ ප්‍රස්තාවන් අහිමිවන අතර උක්ත දත්තය ඔස්සේ ගම්‍යමාන වන පරිදි සිසුන් තුළ වර්ධනය විය යුතු සෑම අංශයක් කෙරෙහිම අවධානය යොමු කර විචාරශීලී ලෙස තීරණ ගැනීමේ හැකියාව යටපත් කරවමින්, සිසුන් තුළ ස්වජාතිකත්ව ආකල්ප පමණක් අභ්‍යන්තරීකරණය කිරීමට ඇතැම් පාසල් ගුරුවරුන් හරහා වක්‍රව හෝ දායකත්වයක් ලැබෙන බව පැහැදිලි වේ.

Ivan Illich (1973) ඉදිරිපත් කරන මීට අදාළ තවත් අදහසක් වන්නේ, පාසල් හරහා අසමානතාවයන් ප්‍රවර්ධනය කරවන බවයි. ඒ අනුව, සංස්කෘතික ප්‍රතිනිෂ්පාදනය ඔස්සේ අධ්‍යාපනය තුළින් සමාජ අසමානතාවය කුළු ගන්වන්නේ නම් එය අධ්‍යාපනය හරහා සිසුන් වෙත ලැබිය යුතු විචාරශීලීව තීරණ ගැනීමේ ශක්‍යතාවය ශූන්‍ය කරන්වන්නක් බව කිව යුතුය. මන්දයත් ඒ හරහා සංස්කෘතික අගතීන් කිසිදු විචාරශීලීත්වයකින් තොරව ඉදිරි පරපුර වෙතද සම්ප්‍රේෂණය කරනු විනා අධ්‍යාපනයේ නියම ඵල නෙලාගැනීමට සිසුන්ට ඉඩක් නොලැබී යාමේ හැකියාවක් පවතින බව පෙන්වාදිය හැකිය.

එසේම අධ්‍යාපනය තුළින් ලැබිය යුතු විචාරශීලී චින්තනය තීරණය කිරීමට බලපෑම් කළ හැකි කාරණයක් වශයෙන් සමාජ අපගාමීත්වයන් (Social Deviances) දක්විය හැකිය. එනම් සමාජීය වශයෙන් නිර්මාණය වී තිබෙන පූර්ව විනිශ්වයන් හෝ අගතීන් හරහා විචාරශීලීත්වය යටපත් වෙමින් සිසුන්ගේ චින්තනය සීමා කිරීමට ලක්වන අවස්ථා පවතී. මෙය ශ්‍රී ලංකා සන්දර්භයේ උදාහරණයක් ඇසුරින් වඩාත් පැහැදිලි කළ හැකි ය. ඍජුවම පෙන්වාදිය නොහැකි වුවත් ඇතැම් පාසල් ගුරු භවතුන් විසින් සිසුන්ව තම පෞද්ගලික අගයන් මත ඇගයීමට ලක් කරන ආකාරයක් හඳුනාගත හැකි ය. මේ සඳහා බොහෝ දුරට බලපෑම් කරනු ලබන්නේ ශිෂ්‍යයාගේ පවුල් පසුබිම, දෙමාපියන්ගේ රැකියාව හෝ දරුවාගේ පාසැල තුළ

හැසිරීමයි. මෙම පූර්ව විනිශ්චයන් හරහා අදාළ සිසුවා විසින් සිදු කරන සෑම ක්‍රියාවකම වරදක් හඳුනාගැනීමට ගුරුවරයා පෙළඹෙන අතර සිසුවාගේ දක්ෂතා පවා එමඟින් යටපත් වී යා හැකි ය. එම නිසාම තමා කුමන ක්‍රියාවක් සිදු කලද දෝෂාරෝපණයට ලක්වන බව දන්නා සිසුවා තීරණ ගැනීමටත් ඒවා ක්‍රියාවේ යෙදවීමටත් පසුබට වේ. සමාජ අගතීන් හමුවේ සිසුවාගේ විචාරශිලීත්වය සීමා කිරීමකට ලක් කර තිබේ. D. C. Merton සහ D. R. Watson විසින් දක්වන කාරණයක් වන්නේ සමස්ත සමාජයේ විද්‍යමාන වන සමාජ විෂමතාවයන්ගේ මූලයන් දක්නට ලැබෙන අධ්‍යාපනයේ විෂම අවස්ථා ඉවත් කිරීම, හානි පූරක අධ්‍යාපන වැඩසටහන් වැනි පැලැස්තර දැමීමෙන් අපේක්ෂා නොකළ යුතු බවයි (ගුණවර්ධන, 1995:89). ඒ අනුව සමාජීය අගතීන්ගෙන් පාසල් ගුරුවරුන් සහ අධ්‍යාපනය නිදහස් කරගැනීම තුළින් පාසැල තුළ සිසුන්ගේ විචාරශීලි චින්තනය සකස් කිරීම සඳහා නිදහස් සන්දර්භයක් සකස් කළ හැකි වනු ඇත.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාසල් අධ්‍යාපනයේ තථ්‍ය ස්වරූපය විමසීමේදී මේ සම්බන්ධයෙන් පවතින පොදු සමාජ කතිකාව ආමන්ත්‍රණය කිරීම අවශ්‍ය වේ. එසේ සළකා බලන විට පෙනී යන කාරණයක් වන්නේ, නිදහස් අධ්‍යාපනය ලෙස ලාංකේය ප්‍රජාව හඳුනාගන්නේ වචනාර්ථයෙන්ම "රජය විසින් ලබාදෙන නොමිලයේ ලබාදෙන අධ්‍යාපනය" ("Government nonpaying education = Free Education") යන්න වන බවයි. නමුත්, අධ්‍යාපනය මූල්‍යමය බරපැනින් නිදහස් වූ පමණින්ම සැබෑ ලෙසම නිදහස්ද යන්න විමසීම අවැසි වේ. ඒ අනුව පොදු සමාජ කතිකාව සමාජ විද්‍යාත්මක පරිකල්පනය තුළින් විමසීම ඔස්සේ යථාර්ථය ආමන්ත්‍රණය කිරීම තුළින්, එනම් පවතින අධ්‍යාපන පද්ධතිමය සහ ප්‍රායෝගික අර්බුද ආමන්ත්‍රණය කිරීම තුළින් සාකච්ඡා පාත්‍ර ගැටලුව සඳහා විසඳුම් සෙවිය හැකිය. එනම්, මූලිකවම, මූල්‍යමය බරපැනින් යම්තාක් දුරකට නිදහස් වූ පමණින් රාජ්‍ය පාසල් අධ්‍යාපනය නිදහස් යයි පැවසීම අනුචිත බව මගේ හැඟීමයි. මූල්‍යමය අංශයෙන් පමණක් යම් නිදහසක් දී සිසුන්ගේ හැඟීම් සහ හැසිරීම පිළිගත් සමාජ රාමුවට අනුගත වන පරිදි සමාජානුයෝජනය කරවමින් සිසුන්ගේ විචාරශීලි චින්තනයන් යටපත් කරවන අධ්‍යාපනික ක්‍රමවේදයන් සැබැවින්ම නිදහස්ද යන්න විමසීම කාලෝචිත වේ.

> *"ආදරේ කරද්දී ප්‍රශ්න ආවම හැම පැත්තම හිතලා බලන්න ළමයින්ට පුලුවන් උනා නම් අද මේ තරමට ජීවිත නැතිකර ගන්නවද? ප්‍රශ්නයක් ආවම විතරක් නෙමෙයි සාමාන්‍ය ජීවිතේදි උනත්, හැමදෙයක් ගැනම සාධාරණව හිතලා ගන්න ඕන හොඳම තීරණේ ගන්න විදිහ ළමයින්ට ඉස්කෝලෙන් උගන්නන්න ඕනා. එත් ඉස්කෝලෙන් ළමයින්ව හිරකරන තරමට ළමයින් කරන්නේ ප්‍රශ්න ආවම ජීවිත නැතිකරගන්න එක තමා විසඳුම කියලා හිතන්න පෙළඹෙන එක. අනිත් වැඩේ රජයේ පාසල් වලත් ප්‍රසිද්ධම ගෑනු ළමයි පිරිමි ළමයි වෙන වෙනම තියලා උගන්නන ඉස්කෝල.ඒ ළමයින්ට තේරුමක් නෑ මේවා ගැන. මිශ්‍ර ඉස්කෝල වල වගේ ළමයි දෙගොල්ලෝ එකට ආශ්‍රය කරලා ඉන්න තිබුනා නම් වැරදි තීරණ ගන්න එක අඩුවෙන්න පුළුවන් මම හිතන විදිහට නම්" ($A^5$, සම්මුඛ සාකච්ඡා දත්තඃ 2020).*

මූලිකවම රාජ්‍ය පාසල් අධ්‍යාපනයේ පාත්‍ර පිරිස් නොහොත් ප්‍රතිලාභ ලබාගැනීමට අපේක්ෂිත කණ්ඩායම වන ශිෂ්‍යයින් අධ්‍යාපනය තුළින් විචාරශීලි චින්තන හැකියාව වර්ධනය කර ගන්නේද යන්න අංශ ගණනාවක් ඔස්සේ විග්‍රහ කළ හැකිය. පාසැල තුළ සිසුන්ව හසුරුවන ආකාරය විග්‍රහ කරන විට අධ්‍යයනය කල යුතු වැදගත් කරුණක් වන්නේ පාසලේදී දැඩි ලෙස විනයානුකූල බවට පත් කිරීමටත්, දඬුවම් කිරීම් සිදුවීමත් හේතුවෙන් ළමුන් මානසික මෙන්ම, කායික හා පෞරුෂමය ගැටලුවලටද මුහුණදීමයි. Illich (1973), සිය "Deschooling Society" කෘතිය හරහා පාසල ප්‍රතික්ෂේප කරනුයේ ඔහු දක්වන අධ්‍යාපනික පරමාදර්ශ වලට අනුකූල වීමට පාසල්වලට නොහැකි වී හෙයිනි. ඔහු දක්වන පරිදි පාසල් මඟින් සිසුන්ව අධිශික්ෂණය (Indoctrinate) කිරීම හා අවරෝධනය කිරීම සිදුවේ. උක්ත කරුණ ලාංකේය සන්දර්භය ඇසුරින් විමසන විට

උක්ත දැක්වූ දැඩි විනයානුකූල කිරීම් සහ දඬුවම් වලට ලක් කිරීම් තුළින් පාසල හරහා ශිෂ්‍යයාට අධ්‍යාපනය තුළ තිබෙන නිදහස අහිමි කර තිබෙන බවත්, සිසුන්ව විචාරශීලී චින්තකයින් වීම කරා මෙහෙයවීමට වඩා පවතින නීති පද්ධතිය කිසිදු විචාරයකින් තොරව පිළිගැනීම සඳහා පොළඹවන බවත් කිව හැකිය. නිරන්තර බියෙන් සහ තැතිගැනීමෙන් යුතුව කටයුතු කරන ශිෂ්‍යයෙක් හට පාසල තුළ නිදහස් මනසකින් අධ්‍යාපන කටයුතුවල නියැලීමට හැකියාවක් නොමැත. අනෙක් අතට පාසල් තුළ සිදුවන ගුරුවරුන්ගේ අඩත්තේට්ටම් හේතුවෙන් මානසික වශයෙන් දීර්ඝ කාලීන අවපීඩන තත්ත්වයන්ට මුහුණ දී අධ්‍යාපන කටයුතු අසාර්ථක කරගත් ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු ලාංකේය සන්දර්භය තුළ හමු වන්නේ එහෙයිනි. එවැනි සිදුවීම් තුළින්ද ගම්‍යමාන වන්නේ උක්ත බලපෑම් ඔස්සේ සිසුන්ගේ විචාරශීලී චින්තනය වර්ධන ක්‍රියාවලියට නිශේධනාත්මක බලපෑමක් එල්ලවන බවයි.

ඒ අනුව පාසල් තුළ පවතින ශිෂ්‍ය නායකයාගේ සිට විදුහල්පතිවරයා දක්වා වූ ධූරාවලිගත ක්‍රමය මඟින් ශිෂ්‍යයින් පීඩාවට පත් වීමටත්, ඔවුන්ගේ අධිකාරී බලය හමුවේ පීඩනයෙන් සහ බියෙන් පසුවීමත් සිදු වේ නම් එය සිසුන්ගේ විචාරශීලී චින්තනයේ වර්ධනය සීමා වීමට එය හේතුවකි. Michael Foucault (1979) විසින් දක්වන ආකාරයේ දැඩි නිරීක්ෂණයට ලක්වන පරිසරයක් තුළ පාසල් හරහා කීකරු සිරුරු (Docile Bodies) බිහිවීම සිදුවන බව කිව හැකිය. සරලවම දැක්වුවහොත් Foucault පෙන්වා දෙන තමා විසින්ම තමාව පාලනය කරගැනීම හෙවත් "ජෛව දේශපාලන" ක්‍රියාවලිය රාජ්‍ය පාසල් තුළ දක්නට ලැබේ. එනම්, පාසල මුල් කරගත් දැඩි පාලනයට ලක් කිරීම් හේතුවෙන් කල් යත්ම පාලනය කිරීමක් සිදු නොවන විටත් ස්වයං පාලනයක් සහිතව ක්‍රියාත්මක වීමට හුරු වීමක් සිදුවන බවයි. එය සමාජ පර්යාය පවත්වාගෙන යාම සඳහා විනයානුකූල කිරීමක් වශයෙන් වැදගත් වන නමුත්, අධ්‍යාපනයේ නිදහස මෙන්ම සිසුන්ගේ නිදහස් විචාරශීලී චින්තනය සීමා වීමට ඒ හරහා අවස්ථාව නිර්මාණය වීම අර්බුදකාරී වන බව පෙන්වාදිය හැකිය.

Bowles සහ Gintis (1976) විසින්ද මෙම තත්ත්වය හා සමගාමී වන අදාළ කරගත හැකි න්‍යායාත්මක පසුබිමක් සකස් කරයි. පාසල් තුළ පවතින සැඟවුණු විෂය මාලාව ධූරාවලිය පිළිගැනීමට අනුබල දෙන බව ඔවුන් දක්වන අතර, පාසල සංවිධානය වී ඇත්තේ අධිකාරය හා පාලනය පිළිබඳ ධූරාවලි මූලධර්මය මතයි. හිරිහැරයක් නොමැතිව සිටීමට, අධීක්ෂකයින්ගේ හා පාලකයින්ගේ බලාධිකාරයට අවනත වීමට වැඩපොලෙහි ඇතිවන සම්බන්ධතා සඳහා මොවුන් මෙලෙසින් සූදානම් කරනු ලැබේ (Bowles and Gintis (1976) උපුටාගත්තේ, ගුණවර්ධන, 1995: 27)

ඒ අනුව, උක්ත දත්තය ඔස්සේ දැක්වූ පරිදි කාන්තා පාසල් සහ පිරිමි පාසල් වශයෙන් බෙදා වෙන් කරන ලද පරිසරයක අධ්‍යාපනය ලබාදීමේ සංස්කෘතියක් ඇතැම් රාජ්‍ය පාසල් තුළ නිර්මාණය වී තිබීමත් රාජ්‍ය පාසල් හරහා විචාරශීලී චින්තකයින් නිර්මාණයට බාධාකාරී වන බව හඳුනාගත හැකිය. Talcott Parsons ප්‍රකාශ කරන ආකාරයට, පාසල් මඟින් සමාජයේ මූලික වටිනාකම් පිළිබඳව යෞවනයන් හට සමාජානුයෝජනය ලබා දේ (Parsons (1961) උපුටාගත්තේ, ගුණවර්ධන, 1995: 16). ඒ අනුව මේ ආකාරයෙන් කාන්තා පාසල් සහ පිරිමි පාසල් වශයෙන් වෙන් කර අධ්‍යාපනය ලබාදීම තුළ අධ්‍යාපනය හරහා සිදුවන මූලික කෘත්‍යයක් වන උක්ත සඳහන් සමාජානුයෝජන කෘත්‍ය එක් පිරිසක් වෙත ලඝු වීම සිදුවේ. එහිදී විරුද්ධ ලිංගික පිරිස් සමඟ සමාජානුයෝජනය වීමට බාධා පමුණුවන අතර, එය පසු කාලීනව සමාජය සමඟ මුසුවීමේ අර්බුද නිර්මාණය කරනු ලැබේ. අධ්‍යාපනය තුළ පැවතිය යුතු නිදහසත් සමඟ වර්ධනය වන කුසලතාවක් වශයෙන් පෙන්වාදිය හැකි විචාරශීලී චින්තනයේ වර්ධනය තීරණය වීමට හුදෙක්ම විෂය මාලා පමණක් නොව මෙකී සමාජානුයෝජන කාර්යය වැනි තත්ත්වද අවශ්‍ය වේ. මූලිකවම සාධනීය තත්ත්ව පැවතිය හැකි නමුත් මෙසේ බෙදා වෙන් කරන ලද පාසල් හරහාද සිසුන්ගේ විචාරශීලිත්වය වර්ධනයට නිශේධනාත්මක බලපෑමක් එල්ල කරමින් සිසුන්ගේ ශක්‍යතාවයන් සීමාකාරී බවට පත් කරවන බව කිව යුතුය.

රාජ්‍ය පාසල් අධ්‍යාපනය හරහා විචාරශීලී චින්තකයින් බිහි කිරීමේ ශක්‍යතාවය පිළිබඳව විග්‍රහ කිරීමේදී වැදගත් වන තවත් අංශයක් වන්නේ අධ්‍යාපනය හා තරඟකාරීත්වයයි. Bowles සහ Gintis (1976) දක්වන කාරණයක් වන්නේ පාසල තුළින් සිසුන් අකමැති දේට කැමති කරවන කළමනාකරණ රාමුවක් ක්‍රියාත්මක කෙරෙන බවයි. ඒ අනුව, අධ්‍යාපනය තුළ පවතින තරඟකාරීත්වයට සිසුන් අකමැති වූවද ඔවුන්ට එයට අනුගත වීමට සිදුවේ. ලංකාවේ ජනප්‍රිය පාසැල් වෙත ප්‍රවිෂ්ට වීමට සියලුම සමාජ මට්ටම්වල ළමුන්ට හැකිවන්නේ පහ ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය තුළින්ය. ඒ සඳහා රාජ්‍ය පාසල් මුල් කරගෙන කොතෙක් වැඩසටහන් ක්‍රියාත්මක වුවත්, ඊට අමතරව දරුවන් බාහිර පන්ති හරහා මෙන්ම සම්මන්ත්‍රණ ආදිය ඔස්සේද ඊට සූදානම් වීම ඇරඹෙන්නේ ඇතැම් විට පළමු ශ්‍රේණියේ හෝ දෙවෙනි ශ්‍රේණියේ සිටමය. මේ හේතුවෙන් ළමා කාලය ළමයෙක් ලෙස ගත කිරීමට දරුවාට හිමිවන නිදහස අහිමි වන අතර, එයට රාජ්‍ය පාසල තුළ සිදුවන අධ්‍යාපනය ලබාදීම තුළින් දැඩි බලපෑමක් ඇති නොවුනත්, අදාළ විභාගය සඳහා ඇති තරඟකාරීත්වය රාජ්‍ය අධ්‍යාපන පද්ධතිය තුළින් ඇති කරවන ලද්දක් වන හෙයින්, එය ළමුන්ගේ අධ්‍යාපනය තුළ ඇති නිදහස සීමා කරවීමට මෙන්ම කිසිදු විචාරශීලිත්වයකින් තොරව තරඟයට අනුගත වීමට සිසුන්ව පෙළඹවීමට එම ක්‍රමය හේතු වී තිබේ. අනෙක් අතට පාසල් සතුව පවතින විෂම පහසුකම් හමුවේ වුවත් මෙම විභාගය සමත් වීමේ අවශ්‍යතාවයක් එකම මට්ටමකින් සමාජය තුළ නිර්මාණය වී තිබේ.

මෙම තත්ත්වයම සාමාන්‍ය පෙළ විභාගයත්, උසස් පෙළ විභාගයත් කේන්ද්‍ර කරගෙන ඇතිවී තිබෙන අතර, එම විභාග හේතුවෙන් ඇතිවන පීඩනය මත පාසල් සිසුන් විසින් සියදිවි නසාගත් අවස්ථාද ලංකාවේ පවතී. පාසැල් හරහා විචාරශීලී බුද්ධිය මෙහෙයවා තීරණ ගැනීමට සිසුන්ව පුරුදු පුහුණු කිරීම නිසි පරිදි සිදුවූවා නම් විභාගයක් අසමත් වූ පමණින් සිසුවෙකු තම දිවි හානි කරගැනීමට පෙළෙඹේදැයි යන්න විමසා බැලිය යුතුය. එසේම, John Dewey විසින් පාසල්වල සිදුවන මෙම කටපාඩම් කිරීම් විවේචනය කළ අතර, ප්‍රගතිශීලී ඉගැන්වීමේ ක්‍රම අධ්‍යාපනය සඳහා අවශ්‍ය බව ඔහු අවධාරණය කර තිබේ (ගුණවර්ධන, 1995). නමුත් උක්ත දැක්වූ ප්‍රධාන කඩයිම් විභාග ද්විත්වයේදීම බොහෝ දුරට තරඟකාරී ක්‍රමය තුළ කටපාඩම් කිරීම තුළින් විභාග සමත්වීමට දැඩි ප්‍රයත්නයක් දැරීම සිදුවේ. මේ හරහා අධ්‍යාපනයේ ගුණාත්මකභාවයට බාධා ඇතිවන අතර, අනෙක් අතට දිගින් දිගටම විභාග ක්‍රමයටම අනුවර්තනය කරවන නිදහසක් නොමැති අධ්‍යාපනයක් ඇති කරවයි. එනම් අධ්‍යාපනය තුළ ඇති නිදහස මෙන්ම සිසුන්ගේ විචාරශීලිත්වයද බොහෝ දුරට සීමා කිරීමට රාජ්‍ය පාසල් අධ්‍යාපනය තුළ පවතින මෙම තරඟකාරී විභාග ක්‍රමය හේතු වේ.

> *"ළමයින්ට ක්‍රීඩා වලට තියා හුස්ම ගන්නවත් වෙලාවක් තියෙනවද මේ විභාග පස්සේ දිව්ල්ල එක්ක. ළමයින්ගේ විතරක් නෙමෙයි අම්මලා තාත්තලගේත් ඔළුවේ තියෙන්නේ විභාග පාස් වෙන එක විතරයි. ක්‍රීඩා වැඩකට ළමයින්ව යොමු කරන්න ගොඩක් දෙමව්පියෝ කැමති නෑ. ක්‍රීඩා වැඩ වලට ගියාම අපේ ඇඟ විතරක් නෙමෙයි හිතත් හොඳටම හැදෙනවා. දැන් ළමයින්ගේ ඇඟ විතරක් නෙමෙයි හිතන විදිහත් හරියට හැදෙන්නේ නැත්තේ ක්‍රීඩා වැඩකටවත් යන්නේ නැති නිසා" (A[1], සම්මුඛ සාකච්ඡා දත්තඃ 2020).*

සිසුන් වෙත දැඩි වැඩ කොටසක් පැවරීමත්, විෂය නිර්දේශය ඉතා ඉක්මනින් ඉගෙනීම පවතින තරඟය සමඟ ගමන් කිරීමට අත්‍යවශ්‍ය වීමත් අධ්‍යාපනය තුළ ශිෂ්‍යයාට පවතින නිදහස සීමා කිරීමට බලපායි. මෙහි පුළුල් විෂය පථය ඉගෙනීමට සැළකිය යුතු කාලයක් සහ කැපවීමක් අවශ්‍ය වන හෙයින් ශිෂ්‍යයාගේ අධ්‍යාපනය පොත පතට පමණක් සීමා වූවක් බවට පත්වීම වැළැක්වීමට නොහැකි දෙයක් වී තිබේ. එනම්, අධ්‍යාපනය තුළ විෂය කරුණු පමණක් නොව විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා යොමු වීමද සඵලදායී අධ්‍යාපනයක් සඳහා අත්‍යවශ්‍ය වන නමුත්, අධ්‍යාපනය තුළ නිදහස සීමා වීමට පුළුල් විෂය පථයත්, ඒ සඳහා ලබාදී තිබෙන මූලිකත්වයත් බලපා තිබේ. විෂය නිර්දේශයට මූලිකත්වය දී කටයුතු කිරීම නිසා සිසුන්ට සිදු

වන්නේ ක්‍රීඩා කටයුතු සහ අනෙකුත් විෂය බාහිර ක්‍රියාකාරකම් වලට වැය කල යුතු කාලයද තම අධ්‍යාපන කටයුතු සඳහා වැය කිරීමටයි. Kelegama (2006) ප්‍රකාශ කර තිබෙන ආකාරයට මෙම තත්ත්ව වෙනස් කර ලාංකේය අධ්‍යාපන පද්ධතිය නැවත කාලීනව සකස් විය යුතු වේ.

එසේම, පාසැල තුළ අධ්‍යාපන රටාව විමසීමේදී පුළුල් විෂය නිර්දේශයක් ආවරණය කල යුතු වීම නිසා, විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා වේලාවක් වෙන් කල නොහැකි ආකාරයක් හඳුනාගත හැකිය. ගුරුවරයෙක් හට සීමිත කාල සීමාවක් තුළ විශාල විෂය මාලාවක් ඉගැන්වීමට සිදුවන අතර, එය ශිෂ්‍යයාගේ නිදහස පමණක් නොව ගුරුවරයගේද නිදහස සීමා කරවන සාධකයක් බවට පත්වී තිබේ. වර්තමාන ලාංකේය අධ්‍යාපන විෂය මාලාව ප්‍රමාණයට වඩා වැඩි වන බවත්, ශිෂ්‍ය සහභාගීත්වය සඳහා ඉතා සීමිත ඉඩක් පමණක් පවතින බවත්, පොත පතට කේන්ද්‍රීය වූ බැවින් ජාතික තතත්ව හා නොගැලපෙන බව බොහෝ දෙනාගේ පිළිගැනීමයි (Liyanage, 2014: 127). විෂය මාලාව ප්‍රමාණයට වඩා වැඩි වීම හේතුවෙන් අධ්‍යාපන ක්‍රමය තුල ශිෂ්‍ය සහභාගීත්වය අවම මට්ටමක පැවතීමද සිසුන්ගේ විචාරශීලි චින්තනය වර්ධනයට බාධාකාරී වන බව පැහැදිළිවම පෙන්වාදිය හැකිය.

> *"අපි පොඩි කාලේ කුප්පි ලාම්පුවට අත අල්ලනකොට අපේ අම්මලා වංගියක් දෙකක් එපා කොලුවෝ කියනවා. අවසාන වතාවේ අපි පාඩම ඉගෙනගන්නේ අත පහන් දැල්ලට පිච්චිලා ගියාම. අපිට ඕන තරම් සෙල්ලම් කරන්න දුන්නා. ගමේ ඇවිදලා වැවේ පැනලා නාලා අපි සැහෙන දේවල් ඉගෙනගත්තා. අම්මලා අපිව හොයන්නේ ඇඳිරි වැටෙද්දී. ඒකට දැන් අපේ දරුවන්ට අපි ගමේ ඇවිදින්න වැවේ පැනලා නාන්න ඉඩ දෙන්නේ නෑ. කටපාඩම් කරලා විභාග ලියවන්න ටියුෂන් යවද්දි ඕවා කරන්න වෙලාවක් නෑ. කොළඹ ඉස්කෝල වල ශිෂ්‍යත්ව ළමයින්ට හාතාවාරිය පැලත් ගෙනල්ලා උගන්නනකොට පෙන්නනවලු ළමයි දන්නේ නැති නිසා. තව ටික කාලෙකින් මේ ගම්වල තියෙන ඉස්කෝල වලත් එහෙම වෙයි" (A[8], සම්මුඛ සාකච්ඡා දත්තඃ 2020).*

බොහෝ අවස්ථාවන් වල අප අන්‍යයන් හරහා ලබා ගන්නා දැනුමට වඩා අපගේ ස්වයං අත්දැකීම් සහ අධ්‍යයන තුළින් ලබා ගන්නා දැනුම විචාරශීලි චින්තකයින් බිහි කිරීමේ පදනම සකස් කරන බව පෙන්වා දිය හැකි ය. John Dewey පෙන්වාදෙන ආකාරයට මිනිසුන් අන්‍යයන්ගෙන් අසා ඉගෙන ගන්නවාට වඩා දේවල් උගත යුත්තේ අත්දැකීමෙනි. මේ තුළින් පුද්ගලයාගේ ගැටලු විසඳීමේ ශක්තියත් විචාර බුද්ධියත් වර්ධනය වේ (Ryan, 1995). උස්වත්ත ආරච්චි (2007) ප්‍රකාශ කරන ආකාරයට, යම් රටක අධ්‍යාපනය කෙරෙහි එම රටේ රාජ්‍ය ප්‍රතිපත්ති සහිත දේශපාලනය සහ එම දේශපාලනයට අදාළ සංස්කෘතිය හෝ ආර්ථිකය ආදී සෑම දෙයක්ම බලපානු ලැබේ. එම නිසා රටක දේශපාලන නියෝජිතයින් පත් කර ගැනීම සඳහා වන ක්‍රියාවලියේදී දේශපාලන සාක්ෂරතාව ඉතා වැදගත් වේ. මෙම දේශපාලන සාක්ෂරතාව වර්ධනය සඳහා විචාරශීලි චින්තනය තුළින් ප්‍රබල බලපෑමක් සිදු කරනු ලබයි. දේශපාලනික තීන්දු තීරණ හරහා අධ්‍යාපන විෂය මාලා වෙනස් කිරීම් කාලයෙන් කාලයට සිදු වන අතර, අර්බුදකාරී කාල වකවානු වලදී සිදුවන අධ්‍යාපන මඟහැරීම් සම්පූර්ණ කිරීම සඳහා වැඩපිළිවෙලක් හඳුන්වා දෙන්නේද දේශපාලනය හරහාය. අනෙක් අතට, ප්‍රතිපත්තිමය තීරණ හරහා විෂය නිර්දේශ වෙනස් කිරීම හෝ යාවත්කාලීන කිරීම නිසියාකාරව සිදු කිරීම් වලදීද වැඩි මැදිහත්වීමක් සිදු කරනුයේ අදාළ ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයින්ට නොව, දේශපාලනික බල අධිකාරිත්වය සහිත පිරිස්ය. John Dewey පෙන්වාදෙන ආකාරයට සාර්ථක ප්‍රජාතන්ත්‍රවාදයක් සඳහා අවශ්‍ය වන්නේ තම අත්දැකීම් තුළින් විචාරශීලි බුද්ධිය වර්ධනය කරගත් තනිව තීරණ ගත හැකි පුද්ගලයින්ය (Dewey, 1938). නමුත් වර්තමාන අධ්‍යාපන ක්‍රියාවලිය තුළ තරගකාරී අධ්‍යාපන ක්‍රමවේද හමුවේ කටපාඩම් සංස්කෘතියක් බිහිවී ඇති අතර තම අත්දැකීම් තුළින් පරිසරයෙන් ඉගෙනීමට ඇති ඉඩ ප්‍රස්තාවන් සිසුන්ට

අභිමි කර තිබේ. මෙවැනි පසුබිමක් තුළ වර්තමාන අධ්‍යාපන ක්‍රමය තුළ රාජ්‍ය පාසල් පද්ධතිය හරහා විචාරශීලි චින්තකයින් බිහි කරවීම ගැටලුකාරී මට්ටමක පවතින බව පෙන්වාදිය හැකි ය. මන්දයත් අනවරත අරගලයක නියැලෙමින් තරගකාරීව කටපාඩම මත විභාග ජය ගන්නා සිසුන් තුළින් ඔවුන් කටපාඩම් කළ දේ පවා ප්‍රායෝගික තලයේ ක්‍රියාත්මක කරවීම ගැටලුකාරී වන බැවිනි.

තරගකාරී විභාග රටාව කේන්ද්‍ර කරගත් වත්මන් පාසල් අධ්‍යාපනය තුළ විෂය බාහිර ක්‍රියාකාරකම් වෙත සිසුන් යොමු කිරීමේදී දෙමාපියන්ගේ භූමිකාවද බෙහෙවින් වැදගත් වේ. පෙර සඳහන් කළ තරගය හමුවේ තම දරුවා හට අධ්‍යාපනය තුළ ඉහළ සාර්ථකත්වයක් ළඟා කරදීමට දෙමාපියන් නිතැතින්ම උත්සුක වන අතර, මේ හේතුවෙන් පාසල් පදනම් කරගත් අධ්‍යාපනයේ ඉදිරියට ගමන් කිරීමට තම දරුවාව මෙහෙයවීමට දෙමාපියන් උත්සාහ කරයි. Fred Clarke ප්‍රකාශ කරන ආකාරයට දෙන ලද සමාජයක අරමුණු හා පරමාදර්ශ පිළිගැනීම සහ සාමාන්‍ය දැනුම සම්ප්‍රේෂණය කිරීම් පිළිගත හැකි ආකාරයට පුද්ගලයෙක්ව පාලනය කිරීම මගින් “උගත් සමාජයක්” (Educative Society) නිර්මාණය වේ (Clarke q.f. Chanley, 2015). මෙම උගත් සමාජය නිර්මාණය කිරීම සඳහා පරපුරෙන් පරපුරට දැනුම සම්ප්‍රේෂණය කිරීමෙහිලා දෙමාපියන්ගේ කාර්යභාරය ඉතා වැදගත් වේ. එනම්, ඔවුන් තම දරුවන් හට අධ්‍යාපනය ලබාදීමට නිතැතින්ම උත්සුක වේ. රාජ්‍ය පාසල් අධ්‍යාපනය හරහා විචාරශීලි චින්තකයින් බිහි කිරීමේ ශක්‍යතාවය සම්බන්ධ මෙම සාකච්ඡාවේදී විෂය බාහිර ක්‍රියාකාරකම් වෙත සිසුන් යොමු කිරීම සඳහා දෙමාපියන් කුමනාකාරයේ දායකත්වයක් දක්වයිද යන්න අවධානය යොමු කළ යුත්තකි. උක්ත දත්තය ඔස්සේ පෙන්වාදුන් පරිදි දෙමාපියන් තරගකාරී අධ්‍යාපන රටාව කෙරෙහි පමණක් අවධානය යොමු කරවමින් විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා දරුවන් යොමු කරවීමට පසුබට වන ආකාරයක් හඳුනාගත හැකිය. මෙවැනි බලපෑම් හේතුවෙන් පොත පතේ දැනුමෙන් පමණක් පෝෂණය වූ සිසු පිරිසක් අනාගත සමාජයට දායක වන අතර, ඉහළ ප්‍රතිඵල පැවතියද අවශ්‍ය අවස්ථාවට සුදුසු තීරණ ගැනීමේ හැකියාවක් නොමැති කණ්ඩායමක් ශ්‍රම බලකායට එකතු වන ආකාරයක් හඳුනාගත හැකිය. එම තත්ත්වය රටක් වශයෙන් ගත් කල හානිදායක වේ. එම නිසාම පොත පතේ දැනුමට සමගාමීව ක්‍රීඩා කටයුතු වැනි විෂය බාහිර ක්‍රියාකාරකම් වල නිරත වීමට පාසල් කාලය තුළ සිසුන්ට අවස්ථාව සළසා දීම තුළින්, සියලුම කරුණු විමසා බලා අවශ්‍යය සුදුසුම තීරණය ගන්නා විචාරශීලි චින්තකයින් රාශියක් අනාගත ශ්‍රම බලකායට එක්කරගත හැකි බව පැහැදිළිවම පෙන්වාදිය හැකිය.

## නිගමනය

ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාසල් අධ්‍යාපනය හරහා සැබැවින්ම විචාරශීලි චින්තකයින් බිහි කරනු ලබයිද? යන ගැටලුව සඳහා පිළිතුරු සැපයීමට සමස්ත විග්‍රහය තුළින් උත්සාහ කෙරිණි. නිදහස් අධ්‍යාපනය යන්න හුදෙක්ම මුදල් නොගෙවා ලබාගන්නා අධ්‍යාපනය ලෙස පොදු සමාජ කථිකාව තුළ හැඳින්වූවත්, අධ්‍යාපනයේ නිදහස මුදල් නොගෙවා එය ලබාගැනීම තුළින් පමණක්ම නිර්ණය නොවේ. අධ්‍යාපනයේ නිදහස යන්න ඉතා පුළුල් පරාසයක විහිදී පවතින අර්ථ රාශියකින් යුක්ත වූවක් වශයෙන් හැඳින්වීම වඩාත් සුදුසු වේ. අධ්‍යාපනයේ නිදහස යන්නෙන් මූල්‍ය බරපැන අවම වීම පමණක් නොව, සිසුන් තුළ නිදහස් විචාරශීලි චින්තනයට අවශ්‍ය පසුබිම සකස් කිරීම, විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය අවස්ථාවන් සළසා දීම සහ ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැළසීම ආදී කරුණු රාශියක් අන්තර්ගත වේ. මූලිකවම පොදු සමාජ කථිකාව සහ යථාර්ථයක් එකිනෙකින් විතැන් වන්නේ එකී වචනාර්ථය සහ සැබෑ තත්ත්වය අතර තිබෙන පරස්පරභාවය හේතුවෙනි.

දෙමාපියන් ඇසුරින් ප්‍රාථමික සමාජානුයෝජනයට ලක්වන දරුවා පාසල් අධ්‍යාපනයට ප්‍රවිෂ්ට වීමත් සමඟ රාජ්‍ය පාසල් අධ්‍යාපනයේ ප්‍රතිලාභ අත් කරගැනීමට හිමිකම් ලබයි. සුබසාධක රාජ්‍යයක් වන ශ්‍රී ලංකාව

රාජ්‍ය සුබසාධන සේවාවක් වශයෙන් අධ්‍යාපන සේවාව සපයනු ලබන අතර එය ක්‍රියාත්මක කරන එක් ආකාරයක් වශයෙන් රාජ්‍ය පාසල් හඳුනාගත හැකිය. නමුත් මූල්‍ය බරපැන අවම වූ පමණින්ම අධ්‍යාපනය නිදහස් බව තීරණය කළ නොහැක. සැබවින්ම නිදහස් අධ්‍යාපනය යනු මූල්‍යමය අංශයෙන් පමණක් නොව චින්තනය අතින්ද නිදහස් අධ්‍යාපන ක්‍රමයක් ලෙස හැඳින්වීම වඩාත් සුදුසු වේ. එවිට දැනුමින් පරිපූර්ණ විචාරශීලී චින්තකයින් බිහිවනු ඇත. රාජ්‍ය පාසල් අධ්‍යාපනය තුළ පවතින විභාග කේන්ද්‍ර කරගත් අධ්‍යාපන රටාව, විෂය බාහිර ක්‍රියාකාරකම් වෙනුවෙන් අවම කාලයක් වෙන් කිරීම ආදී තත්ත්වයන් මෙන්ම ස්ත්‍රී - පුරුෂ සමාජභාවීය සමාජ නිර්මිතයන්, සංස්කෘතික බාධාකාරී තත්ත්වයන් මෙන්ම සමාජ අගතීන් ආදී එක් එක් පරාසයන් තුළින් අධ්‍යාපනය සඳහා තිබෙන නිදහස සීමා කර තිබෙන අතර, එවැනි බාධක නිසා ශ්‍රම බලකායට අත්‍යවශ්‍ය වන විචාරශීලී චින්තකයින් බිහිවීම සීමා වී ඇති ආකාරයක් හඳුනාගත හැකිය. රාජ්‍ය පාසල් නියාමනය වීමේදී මෙකී සමාජ සාධක ආමාන්ත්‍රණය කිරීමකින් තොරව රාජ්‍ය පාසල් අධ්‍යාපනය හරහා විචාරශීලී චින්තකයින් බිහි කිරීමේ ශක්‍යතාවය තහවුරු කළ නොහැකි වී තිබේ. එසේම අධ්‍යාපනය තුළ ශිෂ්‍යයාට, ගුරුවරයාට මෙන්ම දෙමාපියන්ට ඇති නිදහස එකිනෙකට බද්ධ වූ සමාජ - සංස්කෘතික, ආර්ථික හා දේශපාලනික මානයන් තුළ දැඩි ලෙස සීමා වෙමින් පවතින බවක් පෙනී යන අතර එම තත්ත්වයද රාජ්‍ය පාසල් තුළින් විචාරශීලී චින්තකයින් බිහි කිරීමේ ප්‍රවණතාවය තවදුරටත් සීමා කරන බව පෙන්වාදිය හැකිය..

වත්මන් රාජ්‍ය පාසල් අධ්‍යාපනය තුළින් විචාරශීලී චින්තකයින් බිහි කිරීමේ ශක්‍යතාවය ඉහළ සාධන මට්ටමක නොපවතින බව පැහැදිලිවම පෙන්වාදිය හැකි නමුත්, රාජ්‍ය සුබසාධන සේවාවක් වශයෙන් ක්‍රියාත්මක වන නිදහස් අධ්‍යාපනය තුලින් ප්‍රතිලාභ ලැබූ සහ එහි වරප්‍රසාද යම් මට්ටමකින් හෝ භුක්ති විඳීමට ප්‍රජාවට ඇති අවකාශ අමතක කළ නොහැකිය. කන්නංගර ප්‍රතිසංස්කරණ හරහා පූර්ණ වශයෙන් ගෙවීම් වලින් නිදහස් කළ අධ්‍යාපනයක් හඳුන්වා දුන් නමුත්, වත්මන් සංකීර්ණ සමාජ - දේශපාලන තත්ත්ව හමුවේ, ඊට අනුගත වෙමින් එහි ස්වරූපය වෙනස් වෙමින් පවතී. එබැවින් අධ්‍යාපනයේ නිදහස යන්න ආර්ථික මානයෙන් පමණක් ආමන්ත්‍රණය නොකරමින්, සමාජ සහ සංස්කෘතික සාධක සමඟ එය විග්‍රහයට ලක් කිරීම කාලීන සමාජ අවශ්‍යතාවයක් ලෙස පෙන්වාදිය හැකිය. වර්තමාන සමාජ සන්දර්භය තුළ පවතින දේශපාලන - ආර්ථික අවශ්‍යතා මත සියලුම දෙනා එයට අනුවර්තනය වීම බෙහෙවින් වැදගත් වේ. එම නිසාම තරඟකාරී විභාග මූලික කරගත් අධ්‍යාපන ක්‍රමවේදයන් වෙනසකට ලක් කර රටෙහි අනාගත ශ්‍රම බලකායට අනගි දායකත්වයක් ලබාදිය හැකි විචාරශීලී චින්තකයින් බිහි කරගැනීමට ශ්‍රී ලාංකීය රාජ්‍ය පාසල් පද්ධතිය හරහා උත්සාහ ගතයුතු බවත්, එය කාලීන සමාජ අවශ්‍යතාවයක් බවක් පෙන්වාදිය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අබේවර්ධන, ඩී. වයි. (2019). ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාසල් අධ්‍යාපනය සැබැවින්ම නිදහස්ද?ඃ සමාජ විද්‍යාත්මක විමසුමක්. සන්ධාරා ශාස්ත්‍රීය සඟරාව. හෝමාගමඃ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.

ගුණවර්ධන, සී. (1995). අධ්‍යාපනය හා සමාජ සාධක. කොට්ටාවඃ සාර ප්‍රකාශකයෝ.

බණ්ඩා, ටී. (1994). ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලිපි සරණිය. කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ප්‍රනාන්දු, දයා, එස්. (1981). දේශපාලන න්‍යායවාද. ගාල්ලඃ කතෘ ප්‍රකාශන.

මහීස්, එම්. ටී. එම්. (2017). අධ්‍යාපනය සහ සමාජ අසමානතාවය. අධ්‍යාපන ප්‍රතිභා 09. අධ්‍යාපනවේදී කලා සංසදයඃ කොළඹ විශ්වවිද්‍යාලය.

සේනාධීර, ස. (2010). අධ්‍යාපනය සඳහා සමාජානුයෝජන කාරකවල වැදගත්කම . කොළඹ 10ඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

හඳරාගම, එස්. සහ රත්නායක, එස්. (2011). සංවර්ධන සමාජ විද්‍යාව. බත්තරමුල්ලඃ සමීර ප්‍රකාශන.

Bourdieu, P. (1990). *Reproduction of Society (2nd ed.)*. London: Sage Publication.

Bowles, S. and Gintis, H. (1976). *Schooling in Capitalist America*. New York: Basic Books.

Dewey, J. (1938). *Experience & Education.* New York: Kappa Delta Pi.

Foucault, M. (1972). *"The Discourse in Language" in the Archelogy of Knowledge and the Discourse on Language*. Translated by A. M. Sheridan Smith. New York: Pantheon.

Ennis, R. H. (2011). *Critical thinking: reflection and perspective*. *Inquiry* 26,1 and 2.

Foucault, M. (1979). *"Truth and Power", in working papers, (ed.). Meaghan Morris and Paul Patton.* Sydney: Ferral Publication.

Giddens, A. (1993). *Sociology*. London: Blackwell Publications.

Giddens, A. and Sutton, P. (2013). *Sociology*. 7th ed. Hoboken, John Wilsey & Sons.

Illich, I. (1973). *Deschooling Society*. Harmondsworth: Penguin Books.

Jayasuriya, L. (2000). *Welfarism and Politics in Sri Lanka: Experience of a Third World Welfare State*. The School of Social Policy of University of Western: Australia.

Johari, J. C. (1982). *Comparative Politics.* New Delhi: Sterling Publications.

Kelegama, S. (2006). *Contemporary Economic Issues: Sri Lanka in the Global Context*. Colombo 07: IPS Publication Unit.

Liyanage, K. (2014). *Education System of Sri Lanka: Strengths and Weaknesses*. Beijing: Institute of Developing Economies.

Mahajan, V.D. (1998). *Political Theory*. New Delhi: Chand and Company.

McMahon, W. W. (2002). *Education and Development: Measuring the Social Benefits* Measuring the Social Benefits. US: Oxford University Press. Available on: https://books.google.lk/books?id=WfqaPwAACAAJ [Accessed on: 01st August, 2020).

Peiris, G. H. (1993). Government and Social Welfare. In K. M. De Silva ed, *Sri Lanka: Problems of Governance*. Colombo: International Center for Ethnic Studies.

Ryan, A. (1995). John Dewey and the High Tide of American Liberalism. New York: W. W. Norton

Silver, H. (2012*). The Contexts of Social Inclusion*. Department of Economic and Social Affairs. DESA Woring Paper No. 144. USA: United Nations. Available on: https://www.un.org/en/development/desa/papers/ [Accessed on: 25th June, 2020].

සමාජ විද්‍යා අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ - 03
දුරකථනය/ෆැක්ස් : 011-2500452
විද්‍යුත් තැපෑල : samajaviggraha@soc.cmb.ac.lk